(iv) 2019 වර්ෂයේ ලකුණු 100ට ඉහළ ලබා ගත් අයදුම්කරුවන් බඳවාගෙන ඇති බැවින්, 2024 වර්ෂයේ විභාගයෙන්ද ලකුණු 100ට ඉහළ ලබා ගත් අයදුම්කරුවන් බඳවා ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019 மற்றும் 2024ஆம் ஆண்டுகளில் அரசாங்க முகாமைத்துவ சேவைக்கான பரீட்சைகள் நடாத்தப்பட்டன என்பதை அறிவாரா;

(ii) அத்தகைய ஒவ்வொரு பரீட்சையிலும் சித்தியைத் தீர்மானிக்கும் புள்ளி வெவ்வேறாக யாது;

(iii) 2019ஆம் ஆண்டு பரீட்சைக்கு ஏற்புடையதாக வெற்றிடங்களைக் கணிப்பிட அடிப்படையாகக் கொள்ளப்பட்ட திகதி யாது;

(iv) அதற்கு ஏற்புடைய வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை;

(v) 2019ஆம் ஆண்டு அரசாங்க முகாமைத்துவ சேவை (மட்டுப்படுத்தப்பட்ட) பரீட்சைக்கு ஏற்புடைய ஆட்சேர்ப்புக்கான குறைந்தபட்சப் புள்ளி யாது;

(vi) மேற்படி பரீட்சையில் 100இலும் கூடிய புள்ளிகளைப் பெற்றுள்ள விண்ணப்பதாரிகள் தற்போது ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளனரா;

(vii) அவர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட தடவைகளின் எண்ணிக்கை யாது;

(viii) முதலாவது தடவையின் பின்னர் எஞ்சிய விண்ணப்பதாரர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட முறை யாது;

என்பதை அவர் அறிவிப்பாரா?

(ஆ) (i) 2024ஆம் ஆண்டின் அரசாங்க முகாமைத்துவ சேவை (மட்டுப்படுத்தப்பட்ட) பரீட்சைக்கு ஏற்புடையதாக சித்தியைத் தீர்மானிக்கும் புள்ளி யாது;

(ii) அந்தப் பரீட்சையில் சித்தியெய்திய விண்ணப்பதாரர்களின் எண்ணிக்கை யாது;

(iii) சித்தியெய்திய விண்ணப்பதாரர்களில் இது வரையில் ஆட்சேர்ப்புச் செய்யப்பட்டவர்களின் எண்ணிக்கை எத்தனை;

(iv) 2019ஆம் ஆண்டில் 100இலும் கூடிய புள்ளிகளைப் பெற்றுக்கொண்ட விண்ணப்பதாரர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளதால், 2024ஆம் ஆண்டுப் பரீட்சையில் 100இலும் கூடிய புள்ளிகளைப் பெற்றுள்ள விண்ணப்பதாரர்கள் ஆட்சேர்ப்புச் செய்யப்படுவார்களா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he state -

(i) whether he is aware that the examinations of the Government Management Service were held in 2019 and 2024;

(ii) the cut-off marks of each of those examinations, separately;

(iii) the base date for taking the count on the number of vacancies for the examination held in 2019;

(iv) the associated number of vacancies;

(v) the cut-off mark of the Government Management Service (Limited) Examination held in 2019;

(vi) whether the applicants who have obtained more than 100 marks at that examination have been recruited by now;

(vii) the number of rounds in which they were recruited; and

**[ගරු එම්. ඒ. සී. එස්. චතුරි ගංගානි මහත්මිය]**

(viii) the manner in which the applicants remaining after the first round were recruited?

(b) Will he also state -

(i) the cut-off mark of the Government Management Service (Limited) Examination held in 2024;

(ii) the number of applicants who have passed the examination concerned;

(iii) out of the applicants who have passed the examination concerned, the number of those who have been recruited by now; and

(iv) whether the applicants who have obtained more than 100 marks at 2024 examination will also be recruited, given that the applicants who obtained more than 100 marks at the 2019 examination have been recruited?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2185 හා 2020.07.17 දිනැති කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019හි, -එය පැවැත්වුණේ 2021දී- විභාග නිවේදනය අනුව 2021.03.27 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2382 හා 2024.04.26 දිනැති කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2024හි විභාග නිවේදනය අනුව 2024.08.18 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ඇත.

(ii) සේවා ව්‍යවස්ථානුකූලව කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019 -පැවැත් වුණේ 2021දී- සහ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2024හි සමත් කිරීමේ ලකුණු ප්‍රමාණය 100 වේ.

(විභාග නිවේදනයේ 13.0හි සඳහන් විභාග පටිපාටිය අනුව විභාගය සමත්වීම සඳහා විභාගයේ එක් විෂයක් සඳහා සමත් ලකුණු ප්‍රමාණය 40ක් ද, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් ලබා ගත යුතු වේ.)

(iii) 2019.12.31 දිනට සහ 2023.01.17 දිනට.

(iv) 2019.12.31 දිනට පැවති මුළු පුරප්පාඩු 2,300න් සියයට 30ක පුරප්පාඩු ප්‍රමාණය වන පුරප්පාඩු 690, 2019.12.31 දිනට දුම්රිය දෙපාර්තමේන්තුව තුළ පැවති පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 30ක පුරප්පාඩු ප්‍රමාණය වන පුරප්පාඩු 260 සහ 2023.01.17 දිනට පැවති පුරප්පාඩුවලින් සියයට 30ක පුරප්පාඩු ප්‍රමාණය වන 486.

(v) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019හි බඳවා ගැනීමේ අවම ලකුණු 100 වේ.

(vi) ඔව්.

(vii) වාර තුනයි.

(viii) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019හි පළමු අදියර යටතේ නිලධාරින් 660ක් ද, දෙවන අදියර යටතේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා නිලධාරින් 277ක් ද, තෙවන අදියර යටතේ රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචන සම්බන්ධයෙන් පත් කරන ලද අනුකමිටුවේ නිර්දේශ මත ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හා අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් අනුමැතීන් ප්‍රකාරව නිලධාරින් 449ක් ද වශයෙන් මුළු නිලධාරින් 1,386ක් මෙම තරග විභාගය මඟින් බඳවා ගන්නා ලදී.

(ආ) (i) ලකුණු 100 වේ. (විභාග නිවේදනයේ 13.0හි සඳහන් විභාග පටිපාටිය අනුව විභාගය සමත් වීම සඳහා විභාගයේ එක් විෂයක් සඳහා සමත් ලකුණු ප්‍රමාණය 40ක් ද, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් ලබා ගත යුතු වේ.

(ii) එම තොරතුරු මෙම අමාත්‍යාංශය සතුව නොමැත.

(iii) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2024හි ප්‍රතිඵල සහ වෙන් වූ පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් නිලධාරින් 669දෙනෙකු කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන ඇත.

(iv) අංක 1840/34 හා 2013.12.11 දිනැති කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථාවේ 07වන ඡේදයේ පවතින ප්‍රතිපාදන අනුව සීමිත පදනම යටතේ බඳවා ගත හැකි නිලධාරින් සංඛ්‍යාව මේ වනවිට බඳවා ගෙන අවසන් කර ඇත. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමා කර ඇති අවස්ථාවක ආයතනවල කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධික පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම තුළ සීමිත පදනමින් බඳවා ගැනීම් සිදු කළ නමුත් දිගින් දිගටම එසේ සිදු කිරීම තුළින් 2028 වර්ෂය වනවිට ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ වයස අවුරුදු 30ට අඩු කිසිදු නිලධාරියකු නොමැති වන මට්ටමේ විකෘති තත්ත්වයකට පත්වීමේ අවදානමකට සේවය ලක්වීමේ හැකියාව පැවතුණි. සේවා ව්‍යවස්ථා විධිවිධාන උල්ලංඝනය කරමින් දිගින් දිගටම සීමිත පදනමින් බඳවා ගැනීමට ප්‍රතිපාදන නොමැති අතර, එසේ බඳවා ගැනීම මත සේවා අවශ්‍යතාව ද විධිමත්ව සපුරා ගැනීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ. එය මේ සම්බන්ධයෙන් ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව රැඳී සිටින ස්ථාවරයට ද පටහැනි වේ.

මේ වනවිට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සේවයට විවෘත පදනමින් බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර, සේවා ව්‍යවස්ථානුකූලව කළමනාකරණ සේවා නිලධාරි

සේවයේ විවෘත/සීමිත අනුපාතය සියයට 70 සහ සියයට 30 යන්න සැලකිල්ලට ගෙන විධිමත් ආකාරයෙන් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලියට එළඹියහොත් පමණක් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ ගුණාත්මකභාවය ප්‍රශස්ත තලයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇත. නියමිත ක්‍රමවේදය අනුව තරුණ නිලධාරීන් රාජ්‍ය සේවයට ප්‍රවේශ වීමේ අවස්ථාව තුළ එම සේවයට පැමිණෙන තාක්ෂණයේ නව්‍යතා පිළිබඳ දැනුම ඇති පිරිස් හේතුවෙන් රජයේ ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැඟීමේ වැඩ පිළිවෙළ ද යථාර්ථයක් කර ගැනීමට එය හේතු වනු ඇත. කෙසේ වෙතත්, 2024.08.18 දින පවත්වන ලද සීමිත තරග විභාගය සමත් නිලධාරීන් තවදුරටත් බඳවා ගන්නා ලෙස දිගින් දිගටම ලැබෙන ඉල්ලීම් සැලකිල්ලට ගෙන විවෘත/සීමිත අනුපාතයට හානියක් නොවන පරිදි යම් පිරිසක් පැවති සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට මේ වනවිට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර, එය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවට යොමු කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2024දී පැවති තරග විභාගයෙන් ලකුණු 116ක් ලබා ගත් පිරිස මේ වෙනකොට බඳවාගෙන අවසන් බව අපේ ගරු ඇමතිතුමා කිව්වා. ඒ වාගේම, 2019දී පැවති විභාගයේ පූර්වාදර්ශය පදනම් කරගෙන දිගින් දිගටම ලකුණු 100-115 අතර ප්‍රමාණයක් ලබාගෙන විභාගය සමත්ව ඉන්න පිරිස සම්බන්ධයෙන් තිබෙන ඉදිරි සැලසුම මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

සැලසුම කියැවුණා. අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කොපමණ ප්‍රමාණයක් බඳවා ගන්න බලාපොරොත්තු වෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ ආකාරයට 100-115 අතර ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 1,800ක් පමණ ඉන්නවා. මේ වන විට නියමිත කෝටාව අවසන් වෙලා තිබෙන්නේ. නමුත් ඉල්ලීම අනුව තමයි කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තවත් යම් පිරිසකට අවස්ථාව ලබා දෙන්න එකඟ වුණේ. එතැනදී විභාගය සමත් වූ පමණින්ම ඒ සියලුදෙනාට අවස්ථාව හිමි වෙනවාය කියලා කියන්න පුළුවන්කමක් නැහැ. සමත් වූ පිරිස අතරින් වැඩිම ලකුණු ලබා ගත් අය පමණයි තෝරා ගැනෙන්නේ. නමුත් ලකුණු 116ට අඩු, 100 සහ 115 පරාසයේ සිටින 300කට ආසන්න පිරිසක් අලුතෙන් බඳවා ගැනීම සඳහා මේ වන විට එකඟතාව ලැබී තිබෙනවා.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඒ 300කට ආසන්න පිරිස බඳවා ගැනීමේදී එය තීරණය වන අවසන් කඩඉම් ලකුණ සහ ඔවුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය වාගේම කොයි කාලය තුළද බඳවා ගන්නේ කියලා, - ඒ නිශ්චිත කාලය මොකක්ද කියලා, ඒ සම්බන්ධයෙන් - අදහසක් දැන ගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, මීට අදාළ කැබිනට් තීරණය සහිතව මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව සඳහා යොමු කරලා තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලද වහාම මේ කණ්ඩායම බඳවා ගන්න පුළුවන්. නිශ්චිත තොරතුරු නැහැ, ලකුණු සංඛ්‍යාව කීයද කියලා. නමුත් ලකුණු 115, 114, 113 යනාදී වශයෙන් අවරෝහණ ක්‍රමයට, පුරප්පාඩු සංඛ්‍යාව පිරවෙන තුරු බඳවා ගැනීමේ කටයුතු සිද්ධ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1102/2025- (1), ගරු සුරංග රත්නායක මහතා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## 2015 සිට තේ නිෂ්පාදනය සහ අපනයනය: ආදායම
2015 முதல் தேயிலை உற்பத்தி மற்றும் ஏற்றுமதி: வருமானம்
PRODUCTION AND EXPORT OF TEA FROM 2015: INCOME

16/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය සහ තේ අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) තේ අපනයනය සැලකීමේදී ඉහත කාලසීමාව තුළ ජාත්‍යන්තර වෙළඳපොළේ ශ්‍රී ලංකාව අත්පත් කරගෙන සිටි ස්ථානය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை இலங்கையில் தேயிலை உற்பத்தி மற்றும் தேயிலை ஏற்றுமதிமூலம் ஈட்டப்பட்டுள்ள வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) தேயிலை ஏற்றுமதியைக் கருத்திற்கொள்கையில், மேற்படி காலப்பகுதியில் சர்வதேச சந்தையில் இலங்கை வகித்த இடம் ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) இலங்கையின் தேயிலை உற்பத்தியை அதிகரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -

(i) volume of tea produced in Sri Lanka and the income earned by Sri Lanka from tea exports in each of the years from 2015 up to now, separately;

(ii) position Sri Lanka commanded in each year during the aforementioned period in the international tea market in terms of tea exports, separately; and

(iii) measures that will be taken to increase tea production in Sri Lanka?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | නිෂ්පාදන ප්‍රමාණය (කිලෝග්‍රෑම් මිලියන) | අපනයන ආදායම (රුපියල් මිලියන) | අපනයන ආදායම (ඇ.ඩො.මි.) |
|---|---|---|---|
| 2015 | 329 | 182,046 | 1,340 |
| 2016 | 293 | 184,778 | 1,269 |
| 2017 | 308 | 233,338 | 1,530 |
| 2018 | 304 | 231,750 | 1,428 |
| 2019 | 300 | 240,637 | 1,346 |
| 2020 | 279 | 230,170 | 1,241 |
| 2021 | 299 | 263,353 | 1,324 |
| 2022 | 252 | 411,055 | 1,259 |
| 2023 | 256 | 428,292 | 1,310 |
| 2024 | 263 | 433,473 | 1,436 |

(ii)

| වර්ෂය | ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ ශ්‍රී ලංකිය තේ අපනයනයට හිමි ස්ථානය |
|---|---|
| 2015 | 3 |
| 2016 | 3 |
| 2017 | 3 |
| 2018 | 3 |
| 2019 | 3 |
| 2020 | 3 |
| 2021 | 3 |
| 2022 | 3 |
| 2023 | 3 |
| 2024 | 4 |

(iii)

* ශ්‍රී ලංකාවේ ජාතික වැවිලි ප්‍රතිපත්තිය සකස් කිරීම.

ශ්‍රී ලංකාවේ ජාතික වැවිලි ප්‍රතිපත්තිය කෙටුම්පත් කර මේ වන විට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ අනුව ප්‍රධාන වශයෙන් නවීන කෘෂිකාර්මික පිළිවෙත්, පර්යේෂණ, සංවර්ධනය සහ තාක්ෂණික දියුණුව තුළින් ඵලදායිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කර, එමඟින් තේ ක්ෂේත්‍රයේ නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රතිපත්තිය මඟින් දළ දේශීය නිෂ්පාදිතයට වැඩි දායකත්වයක් ලබා දීම සහ වැවිලි ක්ෂේත්‍රයේ තිරසර, වගකිව යුතු කළමනාකරණය තුළින් පරිසරය සහ ඒ හා සම්බන්ධ ප්‍රජාවන් ආරක්ෂා කරමින් ජාතික ආර්ථික වර්ධනයක් සහතික කරන අතර, ශ්‍රී ලංකාවේ ජාතික වැවිලි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සකසන ලද උපායමාර්ගික තේමාවන් 08ක් යටතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

ඒවා පහත පරිදි වේ.

01. භෝග නිෂ්පාදනය සහ සම්පත් කළමනාකරණය.
02. පර්යේෂණ සහ සංවර්ධනය.
03. අගයදාම සංවර්ධනය සහ අගය එකතු කිරීම.
04. අළෙවිකරණය, වෙළෙඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය.
05. දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ අවදානම් අවම කිරීම.
06. පාර්ශ්වකරුවන් සවිබලගැන්වීම.
07. වෘත්තීයමය සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය.
08. ප්‍රතිපත්ති සහ පාලනය.

* 2025-2029 උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම.

තවද මේ වන විට සකස් කර ඇති 2025-2029 උපායමාර්ගික සැලැස්ම අනුව 2029 වර්ෂය වන විට තේ නිෂ්පාදනය කිලෝ මිලියන 400ක් දක්වා වැඩි කිරීම හා ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක ආදායමක් උපයා ගැනීම සඳහා සැලසුම් කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය හා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් තේ කර්මාන්තයේ තිරසර පැවැත්ම සහ නිෂ්පාදනය ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන් පහත පරිදි වේ.

01. තේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආදර්ශ ගම්මාන 500 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

02. තේ නිෂ්පාදන විවිධාංගීකරණය හා නව වෙළෙඳ පොළ අවස්ථා ගවේෂණය කර තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.

03. උසස් තේ වර්ග නිෂ්පාදනය හා ජාත්‍යන්තර ඉල්ලුම් ඇති තේ වර්ග නිෂ්පාදනය සඳහා සිදු කරනු ලබන පර්යේෂණ ලෙස එම තේ වර්ග සඳහා සුදුසු තේ ප්‍රභේද නිපදවීම, නිෂ්පාදනය කිරීමේදී නිසි හා ආරක්ෂිත ක්‍රමවේද හඳුන්වා දීම, එවැනි නිෂ්පාදනවල ක්ෂුද්‍රජීවී ගහනය අවම කර ගැනීමට පර්යේෂණ සිදු කිරීම හා ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.

04. තේ පර්යේෂණ ආයතනයේ ව්‍යාප්ති සේවය මඟින් දැනුම පුහුණුව ලබා දීම, වගාකරුවන්ගේ ක්ෂේත්‍ර ගැටලු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම, විශ්ලේෂණ සේවාවන් සහන ලෙස ලබා දීම සහ නව ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය ලබා දීම.

05. සෘජු තේ වගා සහනාධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

06. යාන්ත්‍රීකරණය අරමුණු කර ගනිමින් තේ නැවත වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

07. ගුණාත්මයෙන් යුතු පැළ නිෂ්පාදනය කිරීම සඳහා පැළ තවාන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

08. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

09. දේශගුණික විපර්යාස හේතුවෙන් තේ වගාවට සිදු වන හානිය වළක්වා ගැනීම සඳහා මිටි සෙවණ සහ උස් සෙවණ ස්ථාපිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. තේ වතු හිමියන් සඳහා පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

11. සුහුරු දලු නෙළන කණ්ඩායම් සහ කුලියට උපකරණ ලබා දීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.

12. දලු ප්‍රවාහනය සඳහා කර්මාන්තශාලා හා අමු තේ දලු වෙළෙඳුන් සඳහා ප්ලාස්ටික් කුඩ හා නයිලෝන් බෑග් මිලදී ගැනීම සඳහා සහනාධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

13. තේ කර්මාන්තශාලාවල නවීන යන්ත්‍ර සූත්‍ර සවිකර තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩි කරලීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය සඳහා ලබා දෙනු ලබන පහසුකම් සහ දිරි ගැන්වීම.

14. ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

15. තේ අගයදාම කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

16. කුඩා තේ ගොවි සංවිධාන ප්‍රතිසංවිධානය හා ඒවා වාණිජකරණය කිරීම.

17. තේ පර්යේෂණ ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් නිමි තේවල ගුණාත්වය අධීක්ෂණය කිරීම.

18. දලු ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සහනාධාර ලබා දීම සිදු කිරීම.

19. තේ නව වගා, නැවත වගා සහ පාළු සිටුවීම, සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ක්ෂේත්‍රයේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය ප්‍රවර්ධනය කිරීම.

20. නිෂ්පාදනයේ ගුණාත්මය වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම. (උදා - තත්ත්ව සහතික ලබා ගැනීම.)

21. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා විකල්ප බලශක්ති පද්ධතීන් ස්ථාපනය කිරීම.

22. කම්හල් තුළ යහපත් නිෂ්පාදන ක්‍රමවේද සහ ඇගැයීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම. (GMP)

23. නව තාක්ෂණයන් හඳුන්වා දීම.

24. අගය එකතු කරන ලද තේ සහ විශේෂිත තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

25. දත්ත මත පදනම්ව තීරණ ගැනීම උදෙසා තේ අගයදාමය ආවරණය වන පරිදි දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -116/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු M-class එන්ජින්: විස්තර

இலங்கை புகையிரத திணைக்களத்துக்குச் சொந்தமான M-class எஞ்சின்கள்: விபரம்

M-CLASS LOCOMOTIVES OF SRI LANKA RAILWAYS: DETAILS

218/2024

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු M-class වර්ගයේ දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින්වල මුළු වටිනාකම කොපමණද;

(iii) එම එන්ජින් අතරින් මේ වනවිට ධාවනයට එක්කර ඇති එන්ජින් සංඛ්‍යාව හා ධාවනයෙන් ඉවත් කර ඇති එන්ජින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති M-class දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා කඩිනමින් අලුත්වැඩියා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரத திணைக்களத்துக்குச் சொந்தமான M-class வகையைச் சேர்ந்த புகையிரத எஞ்சின்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த எஞ்சின்களின் மொத்தப் பெறுமதி யாது என்பதையும்;

(iii) அந்த எஞ்சின்களில், இன்றளவில் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ள மற்றும் சேவையிலிருந்து அகற்றப்பட்டுள்ள எஞ்சின்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) பழுதுபார்ப்பு நடவடிக்கைகளுக்காக அனுப்பப் பட்டுள்ள M-class வகை புகையிரத எஞ்சின் களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) அவற்றை விரைவில் பழுதுபார்க்க மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House the -

(i) number of M-class locomotives owned by the Sri Lanka Railways;

(ii) total value of the locomotives concerned;

(iii) number of locomotives that have been deployed in running operations and the number of those that have been removed from service, out of the ones referred to above, separately;

(iv) number of M-class locomotives that have been sent for repairs; and

(v) measures that will be taken to repair them expeditiously?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) M-class වර්ගයේ දුම්රිය එන්ජින් 103ක් සතුව ඇත.

(ii) රුපියල් මිලියන 13,853.073යි.

(iii) ධාවනයට සුදුසු (Maintainable) එන්ජින් සංඛ්‍යාව - 98

[2025.08.13 දින ධාවනයට එක්කර ඇති එන්ජින් සංඛ්‍යාව - 50]

නඩත්තු හා අලුත්වැඩියා සඳහා තාවකාලිකව නතර කර ඇති එන්ජින් සංඛ්‍යාව - 48

ධාවනයෙන් ඉවත් කර ඇති එන්ජින් සංඛ්‍යාව - 05

(iv) 48යි

- ලුහු අලුත්වැඩියාවන් (Light repairs) සඳහා ධාවනාගාරයේ නවතා ඇති එන්ජින් සංඛ්‍යාව - 21
- බැර සහ ලුහු අලුත්වැඩියාවන් (Heavy & light repairs) සඳහා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කර්මාන්තශාලාවල නවතා ඇති එන්ජින් සංඛ්‍යාව - 15
- කාලීන අලුත්වැඩියාවන් (Schedule repairs) සඳහා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කර්මාන්ත ශාලාවල නවතා ඇති එන්ජින් සංඛ්‍යාව - 10

(v) ඔව්.

කඩිනම් අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය සේවක හිඟයක් පවතින අතර, එයට පිළියම් ලෙස නව බඳවා ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.

එමෙන්ම, අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අමතර උපාංග මිලදී ගැනීමට කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1083/2025 - (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna**)**

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු රවි කරුණානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### තෙලිප්පලෙයි මූලික රෝහලේ සිදුව ඇතැයි සඳහන් මූල්‍ය වංචාව
### தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் இடம்பெற்றதாகக் கூறப்படும் நிதி மோசடி
### ALLEGED FINANCIAL IRREGULARITIES IN TELLIPPALLAI BASE HOSPITAL

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Good morning to the Hon. Speaker and all the Hon. Members in this august Chamber! Sir, I will read my Question in Tamil.

பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, வடக்கு மாகாணத்தில் புற்றுநோயால் பாதிக்கப்பட்டுள்ள நோயாளர்களுக்கான ஒரே யொரு வைத்தியசாலையாக தெல்லிப்பளை வைத்தியசாலை காணப்படுகின்றது. அந்த வைத்தியசாலையின் ஒரு பகுதி யாகவே புற்றுநோய் பிரிவு இயங்கி வருகின்றது. இவ்வைத்தியசாலை மாகாண அமைச்சின் கீழ்வரும் 'B' பிரிவு ஆதார வைத்தியசாலையாகும். இந்த வைத்தியசாலையில் பொருளாளர் ஒருவர் கடமையாற்றுவதில்லை. இந்த வைத்தியசாலையானது, நேரடியாக பிராந்திய சுகாதார சேவைகள் பணிப்பாளர் வைத்தியர் கேதீஸ்வரன் அவர்களின் கீழும் மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் சமன் பத்திரண அவர்களின் கீழும் நிருவகிக்கப்படுகின்றது. இந்த வைத்தியசாலையின் புற்றுநோய் பிரிவுக்குப் பொறுப்பான வைத்தியராகக் கடமைபுரியும் வைத்தியர் கிருசாந்தி அவர்கள் புற்றுநோய் பிரிவுக்கான தனிப்பட்ட பணக் கொடுக்கல் வாங்கல்களைச் செய்துகொண்ட வங்கிக் கணக்கு இலக்கங்கள் மற்றும் வைப்புப் புத்தகங்கள் இரண்டு கண்டுபிடிக்கப்பட்டு இருக்கின்றன. அதை என்னால் இன்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியும்.

அதுதவிர, வைத்தியர் கேதீஸ்வரன் அவர்கள் புற்றுநோய் பிரிவுக்கான மாகாணப் பொதுச் செயலாளர் அவர்களின் அனுமதியின்றி 30 மில்லியன் ரூபாய் பெறுமதியான கட்டட ஒப்பந்தமொன்றை முறையற்ற விதத்தில் மேற்கொண்டிருப்பது ஆரம்பக்கட்ட விசாரணைகளிலிருந்து தெரியவந்து இருக்கிறது. எனினும், சுகாதார அமைச்சால் அது சம்பந்தமாக எந்த நடவடிக்கையும் மேற்கொள்ளப்படவில்லை. நான் இவ்விடயம் தொடர்பில் 2025.06.03ஆம் திகதி இலஞ்ச ஊழல் ஆணைக்குழுவில் முறையிட்டு, வழக்கு தாக்கல் செய்யப்பட்டு, இன்று கிட்டத்தட்ட ஒன்றரை மாதங்களாகியும் எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இலஞ் ச ஊழல் ஆணைக்குழுவைப் பயன்படுத்தி தெற்கில் அரசியல் ரீதியான பழிவாங்கல்களை இந்த அரசாங்கம் மேற்கொள்கின்றது என்பதற்கு இதனைச் சிறந்த உதாரணமாக பொதுமக்கள் எடுத்துக்கொள்ளக்கூடும். எனவே, பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரிடம் பின்வரும் வினாக்களைக் கேட்க விரும்புகின்றேன்.

1. இந்த விடயம் தொடர்பாக 2025.06.03ஆம் திகதி இலஞ்ச ஊழல் ஆணைக்குழுவில் முறையாக முறைப் பாடு செய்யப்பட்டிருந்தும், இன்றுவரை சம்பந்தப்பட்ட இரு வைத்தியர்களும் கைதுசெய்யப்படாமல் இருப் பதற்கான காரணம் என்ன?

2. 2015ஆம் ஆண்டிலிருந்து இன்றுவரை சம்பந்தப்பட்ட புற்றுநோய் பிரிவுக்கு பொதுமக்களால் நன்கொடை யாக வழங்கப்பட்ட, அரசாங்கத்தின் கணக்கில் வைப்பில் இடப்படாத பணம் எவ்வளவு? இந்த நிதி மோசடி தொடர்பாக இலஞ்ச ஊழல் ஆணைக்குழு வுக்கு ஆராய்வதற்கு அதிகாரம் உண்டா?

3. RDHS கேதீஸ்வரன் அவர்களின் அனுசரணையுடன் புற்றுநோய் வைத்தியர் consultant கிருசாந்தி அவர்கள் பொதுமக்களிடமிருந்து பணம் பெற்றுக்கொண்டது தங்களுக்குத் தெரியுமா? அப்பணம் தனிப்பட்ட வங்கிக் கணக்குகளில் இடப்பட்டதென்பதும், வைத்தியசாலையிலிருந்து களவாடப்பட்டதென்பதும் தங்களுக்குத் தெரியுமா? தெரிந்திருந்தும் ஏன் இன்றுவரை நடவடிக்கை எதுவும் எடுக்கவில்லை?

4. வைத்தியசாலையின் consultant ஒருவர் பொது மக்களிடமிருந்து கிடைக்கப்பெறும் நன்கொடையை வைத்தியசாலை நிருவாகத்துக்குத் தெரியாமலும், PDHSக்குத் தெரியாமலும் அதற்குப் பொறுப்பாக இருக்கின்ற RDHS கேதீஸ்வரனின் அனுசரணையுடன் பெற்றுக்கொண்டு நிதி நடவடிக்கையில் ஈடுபட முடியுமா?

5. அந்த வைத்தியசாலையில் மாகாண சுகாதார அமைச்சின் செயலாளர் மற்றும் ஒப்பந்தக்காரர் இடையேயன்றி தனிப்பட்ட ரீதியில் முப்பது மில்லியன் ரூபாய் பெறுமதியான கட்டட ஒப்பந்த மொன்றை RDHS வைத்தியர் கேதீஸ்வரன் செய்திருப்பது தங்களுக்குத் தெரியுமா? அந்த ஒப்பந்தம் தொடர்பில் என்னால் இலஞ்ச ஊழல் ஆணைக் குழுவுக்கு முறைப்பாடு வழங்கப்பட்டும் ஏன், இதுவரை எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படவில்லை?

6. இந்த விடயங்கள் தொடர்பாக மாவட்ட ஒருங்கிணைப் புக் குழுக் கூட்டங்களிலும் பாராளுமன்றத்திலும் அதற்கு மேலதிகமாக இலஞ்ச ஊழல் ஆணைக்குழு விலும் முறைப்பாடு செய்யப்பட்டும் இதுவரை சம்பந் தப்பட்ட வைத்தியர் இருவரும் கைது செய்யப்படாதது ஏன்?

7. தங்களுடைய அரசாங்கம் இவ்வாறான திட்டமிட்ட ஊழல்களுக்கு எதிராக எந்தவித நடவடிக்கை எடுக்காமலும், விசாரணைகளை மேற்கொள்ளாமலும் இருப்பதற்குரிய காரணம் என்ன?

8. இனிமேலாவது இது தொடர்பில் விசாரணைகளை மேற்கொண்டு, சம்பந்தப்பட்ட வங்கிக் கணக்கையும் கட்டட ஒப்பந்தத்தையும் ஆராய்ந்து, சம்பந்தப்பட்ட வர்களைக் கைதுசெய்து, நீதிமன்ற நடவடிக்கை களுக்கு உட்படுத்த முடியுமா?

இன்றேல் ஏன்?

நன்றி.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට මට දින දෙකක කාලයක් අවශ්‍යයි. විශේෂයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ කොටසට පිළිතුරු දෙන්න හැකියාව තිබෙනවා. නමුත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කොමිසමක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පොලීසියට හෝ CID එකට පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා නම්, ඒ පිළිබඳව විස්තරත් දූන්නොත් මට,- *[බාධා කිරීමක්]* අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කාරණා මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගැනෙන්නේ නැහැ. නමුත් අනෙක් කොටසට මම දින දෙකක් ඇතුළත පිළිතුරු සපයන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එයට පිළිතුරු ලබා දෙනවා නේ. ඊට පසුව ප්‍රශ්නයෙන් පැන නඟින -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ප්‍රශ්නයට අදාළ කාරණයක් තමයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා ප්‍රශ්නයට පිළිතුරු දෙන්න දින ඉල්ලුවා නේද? ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යතුමාගේ පිළිතුරෙන් පසුව අහන්න.

අමාත්‍යාංශ නිවේදන, ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා.

## ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම සඳහා පැවැති ජාතික තරුණ සමුළුව: ගරු තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சர்வதேச இளைஞர் தினத்தை முன்னிட்டு நடைபெற்ற தேசிய இளைஞர் மாநாடு: இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரினது கூற்று
## NATIONAL YOUTH CONFERENCE HELD IN CELEBRATION OF INTERNATIONAL YOUTH DAY: STATEMENT BY MINISTER OF YOUTH AFFAIRS AND SPORTS

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, අගෝස්තු 12වන දිනට යෙදුණු 25වන ජාත්‍යන්තර තරුණ දිනයට අදාළව රජයක් විධියට සහ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විධියට අපි ඉතාම සුවිශේෂී ආකාරයට ජාතික තරුණ සම්මේලනය ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණයේදී අතිඋත්කර්ෂවත් විධියට පැවැත්වූවා.

මෙවර ජාත්‍යන්තර තරුණ දිනයේ තේමාව වුණේ, "තිරසර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් දේශීය තරුණ දායකත්වය" - "Local Youth Actions for the Sustainable Development Goals and Beyond" - කියන එක. මේ තේමාව රජයක් විධියට අපට තරුණ පරම්පරාව පිළිබඳව ඇති දැක්ම සමඟ හොඳින් සමපාත වෙනවා. රජයක් විධියට අපි දැඩි ලෙස විශ්වාස කරනවා, අපේ රට පොහොසත් රටක් කරා ගෙන යන ගමනේ වර්තමාන නියෝජිතයෝ තරුණ පරම්පරාව විය යුතුයි කියලා. ඔවුන් එහි පෙරගමන්කරුවෝ පමණක් නොවෙයි, ප්‍රමුඛතම ප්‍රතිලාභීන් විය යුතු බවටද අපි විශ්වාස කරනවා.

එක්සත් ජාතීන් විසින් 2030 වර්ෂය ඉලක්ක කර ගනිමින් 2015දී හඳුන්වා දුන් තිරසාර සංවර්ධන ඉලක්ක 17හි අවසාන අරමුණ තමයි මානව වර්ගයාගේ ජීවිත වඩාත් යහපත් කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම. අපේ තරුණ ප්‍රඥප්තිය ගත්තාම, විශේෂයෙන් Y7 සංකල්පය ගත්තාම ඒකේ අරමුණත් උසස් ජීවන පැවැත්මක් සහිත, පරිසරය තමන්ගේ ජීවිතේ කොටසක් කරගත් වඩා දියුණු තරුණයෙක්, තරුණියක් ගොඩනැඟීමයි. වඩාත් පැහැදිලිව කියනවා නම්, අපේ අරමුණ තමයි තරුණ පරම්පරාවට අනාගතයක් ගොඩනඟනවා වාගේම අනාගතයට ගැළපෙන තරුණ පරම්පරාවක් නිර්මාණය කිරීම. ලෝකය වේගයෙන් ඉදිරියට යමින් තිබෙනවා. රටක තරුණ පරම්පරාව කියන්නේ ඒ රටේ අතීතයේ, වර්තමානයේ සහ අනාගතයේ කැඩපත. අපට දැන් අතීතය වෙනස් කරන්න බැහැ. නමුත්, අපේ තරුණ පරම්පරාවට එහි බොහෝ තැන් අහිමි කරලා තිබුණා. විශේෂයෙන් තරුණයන්ට රැකියා අවස්ථා, දේශපාලනයට එන්න තිබෙන අවස්ථා, නායකත්වයට ඇති අවස්ථා අහුරා තිබුණා. ඒ, විශේෂයෙන් පැරණි දේශපාලන සංස්කෘතිය විසින්. අපි දැන් ඒ හිස්තැන පුරවනවා. ඒ වාගේම, ඉදිරියේදී ලෝකය සමඟ එක්ව ඉදිරියට යන ඒ පරම්පරාව අනාගතය පුරෝකථනය කළ හැකි දැනුමෙන්, ආකල්පවලින් පිරුණු නව තරුණ පරම්පරාවක් හැටියට ගොඩනැඟීමේ අත්හළ නොහැකි වගකීම ඉටු කිරීමේ අභියෝගය ජය ගන්න අපි මේ වන විටත් ශක්තිමත් අඩිතාලමක් දමමින් ඉන්නවා.

පොහොසත් රටක ලස්සන ජීවිතය අයිති සහ එහි වර්තමාන නියමුවෝ වන්නේ විචිත්‍ර, විවිධාකාර, සීමා විරහිතව සිහින දකින තරුණ ඔබ. මේ ගොඩනැගෙන පොහොසත් රටේ ඊළඟ නායකත්වය කියන්නේ තරුණ ඔබ. අපි ඒ වෙනුවෙන් අවශ්‍ය පසුබිම නිර්මාණය කරමින් ඉන්නවා. මෙරට වාගේම විදෙස්ගතවත් ඉන්න අපේ නිර්මාණශීලී, ජව සම්පන්න, දැනුමින්, ආකල්පවලින් පොහොසත් තරුණ තරුණියන්ට අපි මේ අවස්ථාව ලබා දෙනවා. පොහොසත් රටක් වෙනුවෙන් ඔබේ තැන සලකුණු කරන්නට පෙරමුණ ගන්න අපි ඔබට විවෘතව ආරාධනාවක් කරනවා. ඔබට ජය!

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත
### தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகம் சட்டமூலம்
### NATIONAL BUILDING RESEARCH INSTITUTE BILL

"ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2025 සැප්තැම්බර් 09වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 செப்ரெம்பர் 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 09th September, 2025*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## PENAL CODE (AMENDMENT) BILL

"(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2025 සැප්තැම්බර් 09වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 செப்ரெம்பர் 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 09th September, 2025*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අද දින මගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණා. නමුත්, මට උසාවියේ ලේඛන දෙකකට අත්සන් කරලා එන්න තිබුණා. සභාවේ ප්‍රධාන වැඩ කටයුතු පටන් ගන්න ඉස්සෙල්ලා මට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන්ද? අඩු ගණනේ ඒ ප්‍රශ්නය table කරලා හෝ ගරු ඇමතිතුමාගෙන් උත්තරයක් ලබා ගන්න පුළුවන් නම් ඒක ලොකු දෙයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රධාන වැඩ කටයුතු පටන් ගත් නිසා,- *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තවම පටන් ගත්තේ නැහැ නේ, ගරු කථානායකතුමනි. වෙලාව පැයකුත් ඉතිරි වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාවේ වැඩ කටයුතු ආපස්සට ගියොත් ඒක ගැටලු සහගත තත්ත්වයක් වෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම හිතන විදියට ඒ ප්‍රශ්නයට අද දිනයේ උත්තරයක් ලැබෙන එකක් නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඒ ප්‍රශ්නය table කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය ප්‍රශ්නය ඊළඟ දිනයේදී ඉදිරිපත් කරන්න.

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම, ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

## සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
## பணச்சூதாட்டத்தை ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம்
## GAMBLING REGULATORY AUTHORITY BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.31]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 දරන යෝජනා - රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග සහ විදේශ විනිමය පනත යටතේ නියමය - ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අද දින විවාදයට බඳුන් කරන මේ කාරණා තුන අතරින් පළමුවන කාරණය, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවන වර කියවීමයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ, සූදු ක්‍රීඩා නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමයි. සූදු ක්‍රීඩා සම්බන්ධයෙන් විසිරුණු යම් නීති රීති ප්‍රමාණයක් ලංකාවේ තිබුණත්, ඒවා නියාමනය කිරීමට මේ දක්වා නීතියක් තිබුණේ නැහැ. 2023දී ආරම්භ කළා, මෙම සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පතට අදාළ කටයුතු. නමුත්, එය අවසන් වුණේ නැහැ. දැන් අපි එය ඉදිරිපත් කර තිබෙනවා, විශේෂයෙන්ම ප්‍රධාන අරමුණු කිහිපයක් මුල් කරගෙන.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

එහි ප්‍රධාන අරමුණ බවට පත් වන්නේ, සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම. මොකද, දැනට තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥා පනත, ඒ වාගේම සූදු ආඥා පනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත පවතිනවා. තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥා පනත යටතේත්, ඒ වාගේම සූදු ආඥා පනත යටතේත් හුදෙක්ම සිද්ධ වන්නේ මෙවැනි ක්‍රියාකාරකම් මගින් බදු ආදායම් එකතු කර ගැනීම සඳහා වූ සීමාසහිත ක්‍රියාකාරකම් ටිකක්. ඒ වාගේම, ඒවාට ගැට ගැහිලා තිබෙන අනෙකුත් ආනුෂංගික ක්‍රියාකාරම් නියාමනයට පත් වන්නේ නැහැ.

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ ප්‍රධාන අරමුණ බවට පත් වුණේ, කැසිනෝ ව්‍යාපාර සම්බන්ධයෙන් බලපත්‍ර ලබා දීම සහ ඒ ව්‍යාපාර ක්‍රියාත්මක කරන්න ඕනෑ බල ප්‍රදේශය මොකක්ද කියලා තීරණය කිරීමයි. කෙසේ වෙතත්, එයට අදාළ රෙගුලාසි නිකුත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා මේ වනකල්ම ලංකාව ඇතුළේ ඔට්ටු, සූදු සහ කැසිනෝ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණු දේවල් නිසි නියාමනයකට යටත් කරලා නැහැ. ඒ අඩුපාඩුවත් මඟ හරවා ගනිමින් ඒවා නියාමනය කිරීමට යටත් කිරීමක් ද සිදු වෙනවා. මෙවැනි ක්‍රියාකාරකම් ආර්ථිකයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා; සංචාරක කර්මාන්තයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා; සමහර ඒවා සමාජයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා. ඒවා විවිධ පරාස ගණනාවක විහිදී තිබෙනවා. ඒ නිසා මෙය නියාමනය කිරීමෙන් අපි බලාපොරොත්තු වෙනවා, යම් රාජ්‍ය ආදායමකුත් එකතු කර ගැනීමට.

විශේෂයෙන් සූදු ක්‍රීඩා පවත්වාගෙන යෑමේදී විනිවිදභාවය ඉතාම වැදගත් වෙනවා. එහි පාරදෘශ්‍යභාවය, වගවීම වාගේම යහපාලනය ස්ථාපිත කර ගැනීමත් මේ පනත තුළින් අපි බලාපොරොත්තු වෙනවා. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම හරහා එහි විෂය පථය තීන්දු කරන්න; ඒ තුළ මොන මොන දේවල්ද අනුමත කළ යුතු වන්නේ, licence ලබා දෙනවා නම් මොනවාටද ලබා දෙන්නේ, තහනම් කරනවා නම් මොනවාද තහනම් කරන්නේ, සීමා කිරීම් කරනවා නම් මොනවාද සීමා කරන්නේ කියන සියලු කාරණාවලදී මේ අධිකාරියට බලය පැවරෙනවා.

ඒ වාගේම තමයි මේවා පවත්වාගෙන යෑමේදී පවත්වා ගත යුතු අවම ප්‍රමිති තත්ත්වයනුත් තීරණය කිරීමට අපි මේ පනත තුළින් බලාපොරොත්තු වෙනවා. සූදු වැනි ක්‍රියාකාරකම්වලදී ගැට ගැහිලා තිබෙන නීති විරෝධී ක්‍රියාකාරකම් පවා නියාමනය කරන්න අපි මේ තුළින් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වාගේම ත්‍රස්තවාදය සඳහා මුදල් සම්පාදනය වීම ආදි ක්‍රියා සම්බන්ධයෙන් ද නීති රීති, නියාමනය අඩු රටක එවැනි දේවල් වැඩිපුර සිද්ධ වෙන්න පුළුවන්. Anti-money laundering සම්බන්ධයෙන් තිබෙන වර්ගීකරණය යටතේ ලංකාව දැනට ඉන්නේ grey ලැයිස්තුවේ, අවදානම් කලාපයක. ඒ කියන්නේ ලංකාව ඇතුළේ මුදල් විශුද්ධිකරණය වීම, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට මුදල් සම්පාදනය කිරීම වැනි ක්‍රියාවලට තවමත් ඉඩ කඩ තිබෙනවා. ඒ නිසා අපි ඒ තත්ත්වය වෙනස් කර ගැනීමට විශේෂයෙන්ම anti-money laundering සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මූල්‍යනයට එරෙහිව කටයුතු කිරීම සම්බන්ධයෙන් වන Task Force එකට අදාළ කටයුතු සිදු කරමින් යනවා. ඒ අනුව අපේ අරමුණක් තිබෙනවා, 2026 මාර්තුවලදී සිදු කිරීමට නියමිත mutual evaluation එකේදී අපේ රට ඉහත කී grey list එකෙන් ඉවත් වුණු, විශුද්ධිකරණයට ඉඩක් නැති, විනිවිදභාවයෙන් වැඩ කටයුතු කරන්න පුළුවන් රටක් කියන කාරණය ඉදිරිපත් කරන්න. ඒ නිසා සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත මඟින් anti-money laundering ක්‍රියාකාරකම්වලට අප එකතු වීම තුළින් යම් විශේෂ වාසියකුත් සැලසෙනවා.

සූදු ක්‍රීඩා ආදියෙන් සමාජයට විය හැකි හානි අවම කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම අපි දන්නවා, සූදු ක්‍රීඩා ආදිය සම්බන්ධයෙන් සීමා කිරීම් ද කර ගන්නට සිදු වන බව. ළමුන් සූදු ක්‍රීඩාවෙන් ඈත් කර ගැනීම වැනි කාරණා සිදු කරන්නත් මේ අධිකාරියට බලය පැවරෙනවා.

එම අධිකාරිය ඉතා විධිමත්ව පවත්වා ගෙන යන්න සාමාජිකයන් හත්දෙනෙකුගෙන් යුත් සංයුතියක් තීරණය කර තිබෙනවා. එම සාමාජිකයන් හත්දෙනා අතරට අනිවාර්යයෙන් පත් වෙන්නට ඕනෑ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙක්. පොලිස්පතිතුමා හෝ ඔහුගේ නියෝජිතයෙක්. භාණ්ඩාගාර ලේකම්තුමා හෝ ඔහුගේ නියෝජිතයෙක්. ඒ වාගේම මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියා හෝ ඔහුගේ නියෝජිතයෙක්. ඊට අමතරව මුදල් ඇමතිවරයා වෙනුවෙන් පත් කරනු ලබන නියෝජිතයන් තුන්දෙනෙක්. ඒ අනුව සාමාජිකයන් හත්දෙනායි. එහි සමස්ත විෂය පථයට ඇතුළත් වනවා සාමාජිකයන් පත් කිරීම, අපරාධ වළක්වා ගැනීම, නීති විරෝධී සූදු ක්‍රීඩා වළක්වා ගැනීම වාගේම බලපත්‍ර ලබා දීම. එවැනි කාරණා ගණනාවක් මෙම කටයුත්ත ඇතුළේ සිද්ධ කිරීමට බලාපොරොත්තු වනවා.

ඊළඟට, දැනට පවතින ආඥා පනත් තුනක් මේ සමඟ අහෝසි වනවා. ඒවා තමයි, (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥා පනත, (46 වන අධිකාරය වූ) සූදු ආඥා පනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ බලය දීලා තිබුණේ බලපත්‍ර ලබා දීමටත්, ප්‍රදේශය තීරණය කිරීමටත්. හැබැයි, 2022 අගෝස්තු 31වන දා වන කල් එම ක්‍රියාකාරකම්, -ඒ කියන්නේ ලයිසන් ලබා දීම- සිදු වෙලා තිබුණේ නැහැ. අපි දන්නා විධියට, බලපත්‍ර නොදුන්නත් ඊට කලින් ඉඳලාම කැසිනෝ ව්‍යාපාර, සූදු සහ ඔට්ටු වැනි ක්‍රීඩා දිගින් දිගටම ක්‍රියාත්මක වුණා. නමුත්, 2022 අගෝස්තු 31වන දා ක්‍රියාත්මක වනවා රෙගුලාසියක්. ඒ අනුව ඒ වන කල් පවත්වාගෙන ආපු කැසිනෝ සඳහා බලපත්‍ර හතරක් ලබා දීලා තිබෙනවා, 2022 අගෝස්තු 31වන දා ඉදිරිපත් කරන ලද රෙගුලාසි මත. ඒ වාගේම එතැනදී කාල සීමාවක් ලබා දෙනවා තවදුරටත් එම ක්‍රියාකාරකම්වල නියැළෙන සමාගම් හෝ තැනැත්තන්ට බලපත්‍ර ලබා ගන්න. එහි ප්‍රතිඵලයක් විධියට 2022 වසර අවසාන වනකොට තවත් අලුත් බලපත්‍ර දෙකක් සහිතව බලපත්‍ර හයක් දැනට ක්‍රියාත්මක වනවා.

සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත යටතේ මේ නියාමනය සිදු වන ගමන්ම, තව අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, සූදු ක්‍රීඩා තෝරා බේරා ගැනීම. සමහර වෙලාවට සාම්ප්‍රදායිකව තිබුණු සූදු ක්‍රීඩාවකට වඩා එහා ගිය තාක්ෂණය එක්ක ගැට ගැසුණු ක්‍රීඩා තිබෙනවා. ඒ වාගේම සමාජ සූදු ක්‍රීඩා විවිධ ආකාරයෙන් පැතිරීම විශාලයි. ඒවා තෝරා බේරා ගැනීමේ බලයත්, නීති රෙගුලාසි නියාමනය කිරීමේ බලයත් මෙම අධිකාරියට පැවරෙනවා. සමාජ සූදු ක්‍රීඩා මොනවාද කියන එකත් නිර්වචනය කර ගන්න සිද්ධ වනවා, මෙම පනත් කෙටුම්පත යටතේ. එහිදී ඇත්තටම ඒ ක්‍රීඩාවට සම්බන්ධ වන තුන්වන පාර්ශ්වයට ඔට්ටු ඇල්ලීම හෝ වෙනත් ආකාරයකින් මුදල් හෝ ප්‍රතිලාභ ලබා ගන්න බැරි, ඒත් නිවසේ හෝ සමාජයීය වශයෙන් ගැට ගැසී තිබෙන සමාජ ක්‍රීඩා කිරීමට ඉඩකඩ

ලැබෙනවා. නමුත්, එය තීරණය කරන්නේ මෙම අධිකාරිය විසින්. ඒ වාගේම මෙයට ආවරණය වෙන්නේ නැති සුදුමය ස්වරූපයෙන් ක්‍රියාත්මක වන ආයතන දෙකක් තිබෙනවා. ඒ තමයි, ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය. එම ලොතරැයි මණ්ඩල දෙකේ ක්‍රියාකාරකම් මෙම අධිකාරියට යටත් වෙන්නේ නැහැ. එයට හේතුව තමයි, එම ආයතන දෙක දැනටමත් ක්‍රියාත්මක වෙන්නේ පාර්ලිමේන්තුවෙන් අනුමත වෙච්ච පනත් යටතේ වීම. එම නිසා ඒ ආයතන දෙක COPE සහ COPA කියන කමිටුවල අධීක්ෂණයට යටත් වනවා; විගණනයට යටත් වනවා. ඒ කියන්නේ, දැනටමත් නියාමනය වාගේම වාර්තාකරණය සිදු වන නිසා ඒ ආයතන දෙක මෙම අධිකාරියේ ආවරණයෙන් ඉවත් කර තිබෙනවා. මෙම අධිකාරිය පිහිටුවීමෙන් සිදු කරන්නේ, විසිරිලා තිබෙන සූදු ක්‍රීඩා වැනි දේවල් එක අධිකාරියක් යටතේ නියාමනය කිරීම. ඒ අනුව අපි ඇත්තටම බලාපොරොත්තු වනවා, ඒවා responsible gaming බවට පත් කරන්න. සූදු ක්‍රීඩා වගවීමට යටත් කරන, වගකීමට යටත් කරන, responsible gaming industry එකක් වෙනුවෙන් මෙම නීති සම්පාදනය කර ගැනීමට.

ඊළඟට අද ඉදිරිපත් කරනවා, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත දැනටත් ක්‍රියාත්මකයි.

රාජ්‍ය ණය කළමනාකරණ පනත සාමාන්‍යයෙන් ඕනෑම රජයකට වැදගත් වෙනවා, ණය කළමනාකරණය කිරීමට. විශේෂයෙන් මේ මොහොතේදීත් එය අපට ගොඩක් වැදගත් වෙනවා. මොකද, අපි ආණ්ඩු බලය ලබා ගත්තේ ආර්ථිකය බිඳවැටිලා, විසිරුණු තැනක සිට. ඒ නිසා අපි ස්ථාවරභාවය අරගෙන ඉදිරියට යනකොට ආණ්ඩුවේ ණය කළමනාකරණය කර ගැනීම වැදගත් වුණා. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ IV වන කොටස යටතේ වූ විශේෂ ක්ෂේත්‍ර 4කට අදාළව තමයි මේ නියෝග ඉදිරිපත් කරන්නේ. මෙයට පාදක වෙනවා, 2022දී සිදු කරන ලදැයි කියන අපේ development partnersලා ඇතුළුව කරන ලද අධ්‍යයනයක්. රාජ්‍ය ණය කළමනාකරණයේ කාර්ය සාධනය ඇගයීම පිළිබඳව ඉදිරිපත් කරන ලද ඒ වාර්තාවකට අනුව සොයා ගන්නවා, රාජ්‍ය ණය කළමනාකරණයේදී විශේෂයෙන්ම ගැටලු පැන නැඟුණු තැන් කිහිපයක්. එකක් තමයි, ඒ ඒ ආයතනවල වගකීම පැහැර හැරීමේ කාරණය. අපේ රාජ්‍ය ණය විසිරිලා තිබෙනවා. ඒ වාගේම, නොගැළපෙන නීති රාමු යටතේ ණය අරගෙන තිබෙනවා, ණය සඳහා ඇපකර නිකුත් කර තිබෙනවා. ඒ වාගේම විනිවිදභාවය, උපණය - on-lending - ලබා දීම කියන කාරණා පිළිබඳ ගැටලු තිබෙනවා. ඔබ දකින්න ඇති, අතීතයේදී බොහෝ දුරට විවේචන ආවා, විගණන වාර්තාවලදී පවා හෙළිදරව් වුණා, ආණ්ඩුව ලබාගත් ණය නිසි පරිදි වාර්තා වෙලා නැහැ, ඒ ණය ප්‍රමාණය අපි කවුරුත් දන්නේ නැහැ කියලා. මධ්‍යම රජය ලබාගන්නා ණයවලට අමතරව වෙනත් රාජ්‍ය ආයතන, විශේෂයෙන් රාජ්‍ය ව්‍යවසායයන් ලබාගත් ණය වගකීම් තිබෙන ගමන්ම, ඒවා ගිණුම්ගත වීමේ යම් යම් දුර්වලතා තිබුණු බව මේ වාර්තාවලිනුත් හෙළිදරව් කරගෙන තිබෙනවා. ඒවා නිසි පරිදි නියාමනය කිරීම සඳහා, කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනෙනවා. මේ රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්බන්ධ වෙනවා, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතටත්.

මේ නියෝග ඉදිරිපත් කරන්නේ ප්‍රධාන ක්ෂේත්‍ර 4කට අදාළව. එකක්, ඇපකර - guarantees - ලබා දීම. ඒවා ලබාදෙනකොට මොන විධියේ ක්‍රියාමාර්ගයක්ද අපි අනුගමනය කරන්නට ඕනෑ කියන කාරණා මෙහි සඳහන් කර තිබෙනවා. ඒ එක්කම අපි උපණය - on-lending - ලබා දීමේදී අනුගමනය කරන්න ඕනෑ ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ වාගේම, ණය දෙනු ලබන පාර්ශ්ව සමඟ -ලෝක බැංකුව, JICA, වෙනත් ආයතන වෙන්න පුළුවන්- මහා භාණ්ඩාගාරය කොහොමද ගිවිසුම්ගත වෙන්නේ සහ එහි සීමා සඳහන් කර තිබෙනවා. ඒ එක්කම තවත් එක් මූල්‍යන ක්‍රමයක් තිබෙනවා, රාජ්‍ය ආයතනවලට මූල්‍යනය කිරීමේදී මූල්‍ය කල්බදු - finance leasing - යටතේ. ඒ සඳහාත් මෙයින් ආවරණය ලබා දී තිබෙනවා. මෙහිදී විශේෂත්වය වන්නේ මෙන්න මේ උපණය - on -lending - සහ ඇපකර ලබා දීමේදී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයත්, රාජ්‍ය ණය කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවත් මේ කරුණු නිසි ඇගයීමකට ලක් කරලා, ඒ ආයතන බිඳ වැටෙන්නේ නැති විධියටත්, ඒ ආයතන පවත්වාගෙන යන්න අවශ්‍ය වන විධියටත්, ඒ සියලු දේවල් විමර්ශනය කරමින් කටයුතු කිරීමයි. ඒ අනුව තමයි මේ ඇප දීම හෝ උපණය ලබා දීම සිද්ධ වෙන්නේ. එහිදී විශේෂයෙන් පරීක්ෂාවට ලක් කරනවා, ඔවුන්ගේ ගිණුම් වාර්තා සහ විගණන වාර්තා. ඒ වාගේම මේ ණය ලබා දීම් සහ ඇප ලබා දීම් ඉලක්ක කර ගන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ එන ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සඳහා; ආර්ථිකය තවදුරටත් ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය කරන ව්‍යාපෘති වෙනුවෙන්.

ඒ අනුව තමයි රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ මෙම විධිවිධාන සලසා තිබෙන්නේ. අපේ ඉලක්කයක් තිබෙනවා, 2032 වෙනකොට රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 95ක ඉලක්කයට කළමනාකරණය කරන්න. එම ඉලක්කයට යෑමේදීත් මේ ඉදිරිපත් කර තිබෙන කාරණා අපට වැදගත් වෙනවා. දැනට තිබෙන දත්ත සහ සංඛ්‍යාලේඛන බැලුවාම, මේ තිබෙන නිර්ණායක ඇතුළේ නිසි පරිදි ණය කළමනාකරණය කරමින්, ස්ථාවර වෙමින් අපි ඉදිරියට යමින් තිබෙන බව පෙන්නුම් කරනවා.

ඊළඟට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ පනවන ලද නියමයකුත් අප ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රාග්ධන ගිණුමෙන් - Capital Account එකෙන් - විදේශ ආයෝජනවලට මුදල් නිදහස් කිරීමේදී සමාගම්වලට යම් යම් සීමා පැනවී තිබුණා. ඒ සීමා නිදහස් කරන්නට ඕනෑ නිසා විශේෂයෙන්ම අර්බුද තත්ත්වය සමහන් වෙනකොට, 2020 ඉඳලා කලින් කලට ඒ සීමා නිදහස් කිරීමට තමයි මෙම නියමය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව 2020 අප්‍රේල් 02වැනි දා ඉඳලා පළමුකොට මාස 3කට සීමා පැනෙව්වා, ප්‍රාග්ධන ගිණුමෙන් කොච්චර ප්‍රමාණයක් සමාගම්වලට එළියට අරගෙන යන්න පුළුවන්ද කියලා බලන්න. ඉන් පසුව මාස 6න් 6ට මේ සීමා පැනෙව්වා.

අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුවත් මේ සීමාව අපි නිශ්චය කළා, 2024.12.20 සිට 2025.06.19 දක්වා වූ මාස 6ක කාල පරිච්ඡේදයට. එම කාල පරිච්ඡේදයේදී අපි මේ සීමාව වැඩි කළේ නැහැ. එතෙක් පැවති සීමාවම පවත්වාගෙන ආවා. ඒකට ප්‍රධාන හේතුවක් තිබුණා. අපට තිබුණු පළමු වැනි අභියෝගය තමයි, මේ ආර්ථිකය ස්ථාවර කරගන්නා එක. ඒක අපි නිරන්තරයෙන් කිව්වා. අද අපි සන්තෝෂයෙන් කියන්නට කැමැතියි, එම ස්ථාවර කිරීම සෑම ක්ෂේත්‍රයකම සිදුවෙමින් පවතින බව. රාජ්‍ය ආදායම කළමනාකරණය කිරීමේදීත් අපි ඒ ස්ථාවර කිරීම කර තිබෙනවා. ඒ වාගේම මූල්‍ය වෙළෙඳ පොළ කළමනාකරණය කිරීම, වෙළෙඳ පොළේ මිල ගණන් ස්ථාවර කිරීම, විදේශ සංචිත ස්ථාවර කර ගැනීම කියන හැම පැත්තකින්ම අපි මේ ස්ථාවරත්වය පෙන්නුම් කර තිබෙනවා. රටේ නිෂ්පාදනය පැත්තෙන් ගත්තත් මේ ස්ථාවරත්වය සෑම ආර්ථික දත්තයකින්ම පෙන්නුම් කර තිබෙනවා. එදා අපි එම සීමා වෙනස් කරන්න ඉඩ දුන්නේ නැහැ. නමුත් දැන් ආර්ථිකය ක්‍රමයෙන් ප්‍රසාරණය වෙලා ඉදිරියට එන නිසා, අපි මේ අවස්ථාවේදී එය වෙනස් කරන්න යෝජනා කරනවා. ඒ අනුව වර්ග දෙකක සමාගම්වලට මුදල් නිදහස් කිරීමේ සීමාවේ යම් වැඩි කිරීමක් සිද්ධ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මගේ අදහස් දැක්වීම අවසන් කරන්න කලින් තව පුංචි කරුණක් සඳහන් කරන්න ඕනෑ. මේ මොහොත වෙනකොට අපි ඉතා අපහසුවෙන් මේ ස්ථාවර කිරීම කරන ගමන් -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට තව විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට අමතර විනාඩි 5ක කාලයක් ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි.

මේ ස්ථාවර කිරීම අපට ඉතා වැදගත් වෙනවා. අපට මේ ස්ථාවර කිරීම වැදගත් වෙන්නේ ඇයි?

මේ මොහොත වෙනකොට අපි ඉතා අමාරුවෙන්, දුෂ්කරව මේ කාර්යයට මුහුණ දෙමින් සිටිනවා. ඒ සඳහා එකට එකතු වෙලා, රට මේ අර්බුදයෙන් ගොඩ ගන්න උදවු කරන්න කියලා මහජනතාවට යෝජනා කරමින් සිටිනවා. අපි එකවර ප්‍රශ්න දෙකකට මුහුණ දෙනවා. මේ හිර වෙලා තිබෙන ආර්ථිකය ගොඩ ගන්නා ගමන්, අපේ ආර්ථිකය ප්‍රසාරණය කරන්න ප්‍රමාණවත් ආයෝජන කැඳවන්නට ඕනෑ. ඉතා වැදගත් වන කාරණය තමයි, ආයෝජන කැඳවීම සඳහා ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කර ගැනීම. අපි ඒක රට ඇතුළතත්, රටින් පිටතත් ක්‍රමයෙන් ස්ථාපිත කරමින් යන අවස්ථාවකදී, රට ඇතුළේ යම් කණ්ඩායම්, සමහර විට විපක්ෂය, යම් දේශපාලන හේතු මත හිතාමතා හෝ වෙනත් හේතු නිසා ඒ ස්ථාවරත්වයට බාධා වෙන ගොඩක් දේවල් සිද්ධ කරමින් තිබෙනවා. ඒ අතර ප්‍රධාන කාරණයක් ඔබ පසුගිය සතිය ඇතුළත දකින්න ඇති. ඒ තමයි විශාල මුදල් ප්‍රමාණයක් අච්චු ගහලා, රට ආයෙත් අර්බුදයකට ගෙන යන්න හදනවා කියලා සමාජයේ භයක් නිර්මාණය කළ එක. ඒ අය එක්කෝ මේවා හිතාමතා කරනවා, එහෙම නැත්නම් නොදැනුවත්භාවය නිසා කරනවා.

පළමුවෙන්ම යම් සංවිධානයක් කරුණු ඉදිරිපත් කළා, අපේ ආණ්ඩුව යටතේ රුපියල් ට්‍රිලියන 1.2ක - රුපියල් මිලියන 1,200ක - ප්‍රමාණයක් මුදල් අච්චු ගහලා තිබෙනවා කියලා. මම කියන්න කැමැතියි, දැන් මේ ක්‍රියාත්මක වෙන වපසරිය ඇතුළේ ආණ්ඩුවට මුදල් මුද්‍රණය කරන්න - අච්චු ගහන්න - හැකියාවක් නැහැ කියන එක. ඒ නිසා අපි එහෙම කරලා නැහැ, ඒ වාගේම නීතිමය වශයෙන් ඒකට ඉඩක් නැහැ. හැබැයි, මුදල් අච්චු ගහනවා කියන එක සමාජය වැරැදි විධියට තේරුම් ගන්නවා. මුදල් අච්චු ගහනවා කියන්නේ මොකක්ද? අලුතින් මුදල් නෝට්ටුවක් එළියට එන එකද, එහෙම නැත්නම් ආර්ථිකයට, වෙළෙඳ පොළට මුදල් ප්‍රසාරණය වෙන එකද? ඇත්තටම සමාජය මුදල් අච්චු ගහනවා කියලා කියන්නේ, මුදල් ප්‍රසාරණය වෙන එකට. ඒ මුදල් ප්‍රසාරණය වෙන්නේ කොහොමද? ඇත්තටම මුදල් ප්‍රසාරණය වෙන්න, මුදල් සංචිත - reserved money - ප්‍රමාණය බලපානවා. ඒක තමයි මහ බැංකුව පාලනය කරන්නේ. මහ බැංකුව පාලනය කරන ලද reserves ප්‍රමාණය මත, ලංකාව ඇතුළේ පුළුල් මුදල් සැපයුම - Broad Money Supply - කියලා එකක් තිබෙනවා' ඒකට, "M2b" කියලා කියනවා. ඒ කටයුතු මේ වෙනකොට පාලනය කරන්නේ, නියාමනය කරන්නේ මහ බැංකුව යටතේ. ඒ නිසා ආණ්ඩුව කිසිම ආකාරයකට ඒ මුදල් සැපයුම වැඩි කරලා නැහැ. ඒ වැරැදි තොරතුරු සමාජගත කරන අයට අපි කියනවා, ඔබට මේ තොරතුරු මහ බැංකුවේ website එකෙන් බලා ගන්න පුළුවන් කියලා. ඒ තොරතුරු සතිපතා එළියට එනවා, reserved money ප්‍රමාණය කොච්චරද, Broad Money ප්‍රමාණය කොච්චරද කියලා.

රටේ ආර්ථිකය ප්‍රසාරණය වෙනකොට, මහ බැංකුවට විදේශ විනිමය ලැබෙන කොට මහ බැංකුවේ ක්‍රියාකාරකම් ගණනාවක් තිබෙනවා. ඒවා තමයි, විවට වෙළෙඳ පොළ කටයුතු - open market operations -, සංචිත හැසිරවීම. මෙවැනි කාරණා මත, මුදල් සැපයීමේ කාරණයේදී මහ බැංකුවේ ක්‍රියාකාරකම් මත යම් ප්‍රමාණයක් එකතුවීම් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව මුදල් අච්චු ගහලා නැහැ. ඒක සම්පූර්ණයෙන්ම සමාජය නොමග යවන්න සිදු කරන ප්‍රකාශයක් කියන එක මම කියනවා. ඒ සම්බන්ධයෙන් සංඛ්‍යා දත්ත ගත්තාම, ලංකාවේ reserved money තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 1.6ක වාගේ ප්‍රමාණයක්. පුළුල් මුදල් සැපයුම රුපියල් ට්‍රිලියන 15කට කිට්ටු වෙලා තිබෙනවා.

එතකොට පසුගිය අවුරුද්දට සාපේක්ෂව පුළුල් මුදල් සැපයුමේ යම් වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මූල්‍ය වෙළෙඳ පොළේ ක්‍රියාකාරකමක් මිසක්, මහ බැංකුවේ මැදිහත්වීමක් මිසක් ආණ්ඩුව මුදල් අච්චු ගහලා නැහැ. සම්පූර්ණ වැරැදි මතයක් තමයි සමාජගත කරන්නේ. ඒත් එක්කම තවත් විවිධ වූ මත සමාජයට ඉදිරිපත් කරනවා. එවැනි තත්ත්වයක් පසුගිය සතියට කලින් සතියේ පාර්ලිමේන්තුවේදීත් අපි දැක්කා. අපි විශේෂ වෙහෙස මහන්සියක් දරමින් මේ ස්ථාවරත්වය රකිනකොට අපට දේශීය අභියෝගවලට අමතරව විදේශීය අභියෝගත් එනවා, බාහිර සාධකත් බලපානවා. එසේ පැන නැඟුණු කාරණයක් තමයි ඇමෙරිකා එක්සත් ජනපදයේ reciprocal tariff එක. එතැනදී ඔබ දකින්න ඇති, මහජනතාව දකින්න ඇති, ඒ කාරණයට අපි රජය විධියට මැදිහත් වෙලා, ආණ්ඩුවේ නියෝජිත කණ්ඩායම් මැදිහත් වෙලා අප්‍රේල් 2වැනි දා ඉඳලා ඉතා වෙහෙස මහන්සියක් දරමින් කරන ලද සියලු වැඩ කටයුතු කකුලෙන් ඇදීම සඳහා ම ව්‍යාජ්‍ඍති දියත් වුණු බව. "මේක හරියට කරන්නේ නැහැ, මෙතැන නොවෙයි සාකච්ඡා කරන්න ඕනෑ, වෙන අයත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ, මේ සාකච්ඡා කරන විධිය වැරැදියි, මේ අය කොහේද ගියේ, එහේ මෙහේ ගියා" කියලා අපි ගත්ත ක්‍රියමාර්ග උසුළු විසුළුවලට ලක් කළා. හැබැයි, අපි නොසැලී ගත්ත ක්‍රියාමාර්ගවල අවසාන ප්‍රතිඵලය විධියට අතරමැද තත්ත්වයකට එන්න අපට පුළුවන් වුණා. ඒ කියන්නේ අපට පනවපු reciprocal tariff එක සියයට 44 සිට සියයට 20 දක්වා අඩු කරගන්න අවස්ථාව ලැබුණා. අපි ඒක ජයග්‍රහණයක් විධියට දකිනවා. හැබැයි, ඒ මොහොතේදී අපේ මේ මැදිහත්වීම විවේචනය කරපු කණ්ඩායම් සංසන්දනාත්මකව වෙනත් රටවල් -ඉන්දියාව ඇතුළු වෙනත් රටවල්- උදාහරණයට ගත්තා.

ඒගොල්ලන් තවමත් සාකච්ඡා කරනවා තවමත් ඇමෙරිකාවේ ඉන්නේ කියලා, විවිධ විධියට කිව්වා. නමුත් අපි කළේ අපේ කාර්යය. අපි කිසිම කෙනෙකු උසුළු විසුළුවලට ලක් කළේ නැහැ. අපි කිසි කෙනෙකුගේ ක්‍රියාකාරකම් හැල්ලුවට ලක් කළේත් නැහැ. මොකද, අපේ ආණ්ඩුව වෙනත් රාජ්‍යයකට පරිබාහිරව මුහුණ දෙන්න වෙන අකරතැබ්බයක්, ගැටලුවක් ජයග්‍රහණයක් විධියට සලකන්නේ නැහැ. අපට පුළුවන් නම් තවත් උදවු කරලා ඒ අර්බුදයෙන් එර් අය බේරා ගන්නයි උත්සාහ කරන්නේ. හැබැයි,

විපක්ෂයේ සහ වෙනත් කණ්ඩායම් විසින් සමාජගත කළා, "අපේ උත්සාහය වැරදියි, අනෙක් රටවල් තමයි හරි" කියලා. ඒ නිසා ඔවුන්ට මුහුණ දෙන්න බැරි වුණා. ඒ නිසාම ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කරන ලද කථාවකුත් විකෘති කළා, අපි ඉන්දියාව දෙස වපර ඇසින් බැලුවා, උසුළු විසුළු කළා කියලා. කිසිසේත්ම නැහැ. අපි ඉන්දියාව, චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, අනෙකුත් සෑම රටක් එක්කම නිසි පරිදි රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වා ගෙන යනවා. ඒ අනුව වැඩ කටයුතු සිද්ධ කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙවැනි තත්ත්වයකට අපට මුහුණ දෙන්නට පුළුවන් කියා මම කියන්න කරන්න කැමතියි. නමුත් මෙවැනි වැරදි ප්‍රකාශ සමාජගත කරන්න එපා. අපි කිසිසේත්ම වෙනත් රටවල්වලට හිනා වෙන්නේ නැහැ. මොකද, ඇමෙරිකා එක්සත් ජනපදයේ reciprocal tariff එක ගැන අපට යමක් කියන්න බැහැ. අපි අද සන්තෝෂ වෙනවා, සෑහීමකට පත් වෙනවා, සියයට 44 සිට සියයට 20 දක්වා ඒ rate එක අඩු කර ගැනීම නිසා.

ඒ සඳහා ගොඩක් කණ්ඩායම්වල සහභාගිත්වය ලැබුණා. හැබැයි, මේක බාහිර සාධකයක්. අපට පාලනය කරන්න බැරි කාරණා නිසා -ඇමෙරිකානු එක්සත් ජනපදයේ වෙළෙඳ ප්‍රතිපත්ති අනුව ඒගොල්ලන් කටයුතු කිරීමේදී- හෙට වෙනස් තත්ත්වයන් නිර්මාණය වෙන්න පුළුවන්. ඔබ දකින්න ඇති, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඒ ඒ රටවල් අතර පවතින තත්ත්වයේ අනුපාත වෙනස් වෙච්ච හැටි. සමහර රටවලට reciprocal tariff එක එකවරම වැඩි කරනවා. එහෙම නැත්නම් අඩු කරනවා. එක වරක් බ්‍රසීලයට සියයට 50ක් කළා. ආයෙත් සියයට 10ක් කළා. සමහර රටවල - චීනයට - සියයට 145යි; ආයෙත් සියයට 30යි. ඒ විධියට වෙනස් තත්ත්ව නිර්මාණය වෙනවා. ඉහළ පහළ යෑම් සිද්ධ වෙනවා. ඉන්දියාවේත් එහෙම තමයි. හැබැයි ලංකාවේ අපට පුළුවන් වුණා, මේ සාකච්ඡා ස්ථාවරව, ක්‍රමිකව පවත්වා ගෙන යමින් සියයට 44 අනුපාතය සියයට 20 දක්වා අඩුකර ගන්න. අපි කියන්න දන්නේ නැහැ, ඉදිරියේදී -අපට පාලනය කරන්න බැරි තත්ත්වයකදී- ඒක වැඩි කරයිද, නැද්ද කියලා. එහෙම නම්, රටේ වගකිව යුතු පුරවැසියන් විධියට, විපක්ෂයක් විධියට, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවට සම්බන්ධ මහජන නියෝජිතයන් විධියට අපේ වගකීම වන්නේ එවැනි අර්බුදයකදී එය සමනය කර ගැනීමට මුහුණ දීමයි. ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න, ඒ කරුණු මහජනතාවට ඉදිරිපත් කරන්න අපි සූදානම්. ගරු කථානායකතුමනි, ඒ නිසා අපේ ස්ථාවරත්වය ගොඩ නැඟීම එතැනින් බිඳ වට්ටන්නේ නැතුව - මොකද, මේගොල්ලන් හොඳින්ම දන්නවා මේ ස්ථාවරත්වය බිඳ වට්ටන්න එක ප්‍රධාන විචල්‍යයක් බලපානවා කියලා. ඒ වෙන මොකක්වත් නොවෙයි, මේ රටේ තිබෙන පොලී අනුපාතය සහ මූල්‍ය වෙළෙඳ පොළේ ස්ථාවරත්වය. මූල්‍ය වෙළෙඳ පොළේ ස්ථාවරත්වය බිඳ වැටුණොත් මේගොල්ලන්ගේ අභියෝගය ජයග්‍රහණය කරනවා.

රටක් විධියට ගත්තොත්, මේ මොහොතේ රටේ සමස්ත ජනතාව දුක් විඳිමින් සිටිනවා. මෙය ඔවුන් ගොඩ ගැනීමේ ව්‍යාපාරයට කරන වැරදි ක්‍රියාකාරකමක්. ඒ නිසාම වෙන්න ඇති මුදල් අච්චු ගහනවා කියලා වැරදි මතයක් සමාජගත කරන්න උත්සාහ කළේ. මොකද, මුදල් කියන්නේ, එක පැත්තකින් ආර්ථිකය සංවර්ධනය කරන්න, දියුණු කරන්න, අමුද්‍රව්‍ය මිලදී ගන්න, ප්‍රාග්ධනය කැඳවන්න ක්‍රියාත්මක කරන විචල්‍යයක් වාගේම, ආදායම් උපයන්න, ලාභ උපයන්න පුළුවන් විචල්‍යයක්. ඒ නිසා මුදල් අච්චු ගසනවා හෝ ආර්ථිකය ප්‍රසාරණය වීමේ ගැටලුවක් තිබෙනවා කියලා යම් සැකයක්, අවිශ්වාසයක් සමාජය ඇතුළේ නිර්මාණය කළොත්, එක මොහොතකින් මේ ආර්ථිකයට යම් බලපෑමක් කරන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මම පැහැදිලි කරන්න ඕනෑ මෙන්න මේ තත්ත්වය වෙනස් කරන්න ඒ ස්ථාවර වූ ආර්ථිකය හරහා, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කරන කථාව අනුව සාමාන්‍යයෙන්, සුපුරුදු පරිදි මේක තමයි දිගටම ගෙනියපු ක්‍රමවේදය. ඉතින්, මේ අවස්ථාවේදී ඉදිරිපත් කරලා තිබෙන්නේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
නැහැ, ඒක නොවෙයි. සංසරණයට ආපු එක නොවෙයි. මේක වැරදි මතයක්, ගරු මන්ත්‍රීතුමනි. මුදල් සංසරණයට ඒමේ බලය, මුදල් ප්‍රසාරණය කිරීමේ බලය, - ඒ කියන්නේ, reserved money සහ broad money අතර පරතරය - වෙන්න පුළුවන් ආකාර දෙකයි තිබෙන්නේ. එකක් තමයි, ආණ්ඩුව විසින් මුදල් අච්චු ගැසීම; monetary financing. ඒක තමයි නරක වැඬේ. පසුගිය ආණ්ඩුවලින් මේ විධියට මුදල් අවභාවිත කරලා, මුදල් වියදම් කරලා, විවිධ ව්‍යාපෘති කරලා රට තුළ උද්ධමනයක් නිර්මාණය කර තිබෙනවා. එහෙම ඉතිහාසයක් තිබෙනවා. ඒක, එක ආකාරයක්. දෙවැනි ආකාරය තමයි මහ බැංකුව විසින් තමන්ගේ මුදල් පරිපාලනය කරමින් විවට වෙළෙඳපොළ කටයුතු - open market operations - හරහා reserves, foreign reserves ලබා ගැනීම. එහෙම නැත්නම් මුදල් සැපයුම එකම තැනක තිබෙන්නේ නැහැ. මම කියන්නේ, මෙන්න මේ කාරණා වැරදි ආකාරයට සමාජගත කිරීමයි වැරදියි කියන එකයි. මහජනතාව මේ තාක්ෂණික කාරණා තේරුම් ගන්නේ නැහැ. මුදල් අච්චු ගහනවා කිව්වාම ඒගොල්ලන් දකින්නේ, ගරු මන්ත්‍රීතුමා කියපු මේ කාරණය නොවෙයි. ඒගොල්ලන් දකින්නේ, ආණ්ඩුව මුදල් අච්චු ගහලා වියදම් කරනවා, නාස්ති කරනවා කියන එකයි. අපි කිසිම ආකාරයකට මුදල් අච්චු ගහලා අනවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපි ඉතාම විනිවිදභාවයෙන් මුදල් විනය - financial discipline - පවත්වා ගෙන යනවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, රාජ්‍ය ණය කළමනාකරණ පනත තුළ අපි ඒ කිසි ඉලක්කයක්, නිර්ණායකයක් කඩලා නැහැ. ඒ කටයුතු නිසියාකාරයෙන් ගෙන යනවා. ඒ අනුව තමයි අද ඉදිරිපත් කරපු මේ රාජ්‍ය ණය කළමනාකරණ පනතත් අපට ඉතාම වැදගත් වෙන්නේ. මේ කටයුතු සීරුවෙන් අපි ඉදිරියට අරගෙන යන්න ඕනෑ. මේ මොහොත වෙනකොට අතීතයේ සිට පවත්වා ගෙන ආපු රාජ්‍ය ව්‍යවසාය විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ, රාජ්‍ය ව්‍යවසාය රාජ්‍යයට වැය බරක් වෙලා තිබෙනවා. ඒවාත් අපි හදන්න ඕනෑ. අකාර්යක්ෂමතාව මුල් බැස තිබෙනවා.

මෙවැනි ප්‍රශ්න ගණනාවක් එකට තිබියදී මේ රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වූ නියෝගවල සඳහන් ඇපකර සහ උපණය කියන ක්‍රියාකාරකම් හරහාත් අපි ඉදිරියේදී පෙන්වනවා,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

අපි කොහොමද අපේ ආණ්ඩුව යටතේ රාජ්‍ය මූල්‍ය විනය නිසි ආකාරයකට පවත්වාගෙන යන්නේ කියලා. ඒ නිසා අපි විශේෂයෙන්ම ගරු සභාවෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටින්නේත් ඒ සඳහා අපට සහයෝගය ලබා දෙන්න කියලායි. මෙතැන අඩුපාඩු, ගැටලු තිබෙනවා නම් ඒ පිළිබඳව අපට සාකච්ඡා කරන්න පුළුවන්. මේ මොහොතේදී ඉතාම වැදගත් වන්නේ මේ ස්ථාවරත්වය මත රටට, ආණ්ඩුවට ආයෝජන කැන්දාගෙන එන ක්‍රමයයි. ඒ සඳහා අවශ්‍ය වටපිටාව සකස් කිරීම, සම බිමක් - a level playing field - නිර්මාණය කිරීම, නීති සකස් කිරීම කළ යුතුයි. අපි දැනටමත් මේ සඳහා යම් යම් නීති ප්‍රමාණයක් සකස් කරලා තිබෙනවා. ඉදිරියේදීත් මේ ආයෝජකයන්ගේ ආරක්ෂාව සඳහා investor protection laws අපි ඉදිරිපත් කරනවා. අපේ ආණ්ඩුව මේ සෑම දෙයක් සම්බන්ධවම විනිවිදභාවයෙන්, පාරදෘශ්‍යභාවයෙන් වැඩ කරන ආණ්ඩුවක් කියන කාරණයත් සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ point of Order එක කියන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ කථාවට ලබා දුන් කාලය අවසන් වන නිසා මට එතුමාගෙන් අහන්න කාරණා දෙකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමා පාර්ලිමේන්තුවට කියන්නේ සුපුරුදු පරිදි මෙතෙක් කල් වෙලා තිබෙන දේ. මාස හයකට විතරයි එක ආණ්ඩුවක් මේ print කරන එක පටන් ගත්තේ. නැත්නම් assetsවලට print කරන්න ම තිබෙනවා. මේ සම්බන්ධයෙන් තිබෙන වැරදි මතයක් ආයෙත් නිවැරදි කරන්න ඕනෑ නැහැ. මොකද, ඒක තමයි ගෙන යන ක්‍රමවේදය. තවත් එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එය මේ සභාවේ විවාදාත්මක දෙයක් වන්නේ නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට පැහැදිලි කරන්න දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් වෙන්නේ, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද වෙලාව පැයකුත් ඉතුරු වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මතක තබාගන්න, point of Order එකක් ගෙනෙන්නේ සභාව, - *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීවරුනි, මේ විවාදයක් නේ.

මීළඟට, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, තේරුම් ගන්න, point of Order එකක් කියන්නේ සභාව පවත්වාගෙන යෑමේ conduct එකේ ප්‍රශ්නයක් උඩ ගේන්න පුළුවන් දෙයක්. දැන් තිබෙන්නේ විවාදයක්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා ඉඳගන්න.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Member on his feet, please.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Speaker, you have to reset my time. I have not even started.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, give me just 15 seconds, please.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, not more than that.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, it is at the right time that you came to the Chair. All I want to know is - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you can clarify your issue. Take just 15 seconds.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Hon. Deputy Speaker. I wish you a long stay in that Chair, Sir.

Sir, what I want to raise with the Deputy Minister of Economic Development is this. Printing of money goes on every day and whether it is asset-backed printing is all that is asked. When you say there is no printing of money by the Government, then, there is something wrong, there is a contraction.

Sir, the next one is, the Hon. Deputy Minister mentioned that the Central Bank Chief or his envoy would be represented in this Gambling Regulatory Authority. Remember, this House had made the Central Bank an independent institution. He goes for textile negotiations; he goes to Singapore for investment promotion. How can that independent institution suddenly become non-independent? You cannot basically get him to be in a position when he is completely independent. He is the only one who can buy cars when the rest of the country cannot buy cars. What is this? This Parliament becomes a joke on that basis.

Sir, what I am trying to drive at is something which is good for the country. This is not the Opposition taking on the Government. Let us act together as a country and ensure that we correct the anomalies that are there.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. I think the Deputy Minister has got your point. Hon. Ravi Karunanayake, I see that you have not got a slot in today's Debate.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

No, today, the Hon. Gayantha Karunathilleka has given time - But, Sir, we have saved one hour for you today and that is the reason why we also graduated you to the Chair.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I think you could still take a little time from the Opposition's allocation and join this Debate because you have a long submission to make, I feel

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, with your magnanimity, if you could get the Deputy Minister to answer my question because the entire Public Financial Management Act basically stems - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Shall we move on to next Hon. Member from the Opposition due to speak?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

The Hon. Deputy Minister can anwer.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That is left to the Hon. Deputy Minister.

The next Speaker is Hon. Kabir Hashim. You could air the views of the Hon. Ravi Karunanayake.

[11.03 a.m.]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

Thank you, Hon. Deputy Speaker.

මලයාසියාවේ සමාජ ක්‍රියාකාරිකයෙකු වන අන්වර් ෆසාල් මහතා මනුෂ්‍යත්වයට එරෙහිව පාපයන් 11ක් ගැන කථා කළා. ගාන්ධිතුමා හඳුන්වා දුන් මනුෂ්‍යත්වය සතු විය යුතු ගුණාංග 7කට එතුමා තවත් සාධක 4ක් එකතු කළා. ගාන්ධිතුමා සහ අන්වර් ෆසාල් මහතා සඳහන් කරපු ප්‍රථම පාපය තමයි, ප්‍රතිපත්තියක් නැති දේශපාලනය. වර්තමානයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මේ පාපය හරහා ජනතාවට දුක්ඛිත ජීවිතයක් ඇති කරමින් සිටිනවා. ඒක කලිනුත් සිදු කළා. මේක තමයි යථාර්ථය. 1977 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ රටට විවෘත ආර්ථික මොඩලය හඳුන්වා දුන්නා. එය ආසියාවට පළමුවෙන්ම හඳුන්වා දුන්නේ එතුමායි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට සහ මාගේ මව් පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට එදා බොහෝදෙනෙක් කුහකකමින් නින්දා අපහාස කළා. ගොඩක් ශාප කරපු අයට මට කියන්න දෙයක් තිබෙනවා. හැටේ දශකයේදී අපි වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අපනයන - merchandise exports - විධියට බහුතරයක්ම, සියයට 95ක්ම , අපනයනය කළේ තේ, රබර් සහ පොල්. 1977න් පසුව ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ගෙනාපු සුසමාදර්ශී ආර්ථික විප්ලවයෙන් පසුව, අපනයනය මත පදනම් වූ ආර්ථිකයක් හැදුවාට පසුව EPZ කියන, FTZ කියන නිදහස් වෙළෙඳ කලාප සංකල්පයෙන් කාර්මික නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කරලා අසූව දශකයේදී වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අපනයනයෙන් - merchandise exportsවලින් - සියයට 75ක්ම කාර්මික නිෂ්පාදන මත පරිවර්තනය වුණා.

සියයට 95ක් තේ, රබර් සහ පොල් පිට රට යැවූ රට, සියයට 75ක් කාර්මික නිෂ්පාදන යවන රටක් බවට පරිවර්තනය කරන්න හැකියාව තිබුණා. ඒක තමයි සැබෑ system change එක; ඒක තමයි ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා ගෙනාපු system

[ගරු කබීර් හෂීම් මහතා]

change එක. ටොයෝටා, හොන්ඩා, මැස්ඩා කියන සමාගම් තුනම මෙහේ ආයෝජනය කරන්න, කර්මාන්තශාලා ඉදි කරන්න එනකොට ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන වාමාංශික දේශපාලන පක්ෂ වෘත්තීය සමිති දාලා, මහ පාරට බැහැලා, ඔවුන්ව පලවා හරින්නට කටයුතු කළා; ඒවා අහිමි කරලා දැම්මා. මේ රට ආර්ථික සොහොනක් බිමක් බවට පත් කරන්නට කටයුතු කළ JVP එක ඇතුළු එම වාමාංශික පක්ෂත් අවුරුදු 74ක ශාපයේ ප්‍රධාන වගඋත්තරකරුවෝ බවට පත් වෙනවා. දෛවය විසින් ඔබටම අද සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත මේ සභාවට ගේන්න වෙලා තිබෙනවා. ඒක තමයි දෛවය. වමේ දේශපාලන සංකේතයක් ලෙස හඳුන්වන ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය අද සභාවේ නැහැ. චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා නම් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය සතියේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී ඒ අය අත් දෙකම ඔසවලා සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත අනුමත කළා. මගේ පැත්තෙන් මම හිතනවා, ඒක දිට්ඨධම්ම වේදනීය කර්මයක් කියලා. ඔබතුමන්ලාටම සිද්ධ වුණා, ඒක සම්මත කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත - Gambling Regulatory Authority Bill එක - ගෙනෙන එක ඉතා වැදගත්. මොකද, මේ රටේ කැසිනෝ ක්‍රීඩාව තිබෙනවා. ඒ නිසා ඒක නියාමනය කළ යුතුයි. නමුත්, ඒක ප්‍රමාදයි. හැබැයි, මේ පනත් කෙටුම්පත ගේන්නේ අඩුපාඩු රැසක් එක්ක. ඒ අඩුපාඩු නිවැරදි කරනවා නම් හොඳයි. ගරු අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා, ආයෝජකයන්ගේ විශ්වාසය අපි ඇති කරන්න ඕනෑ කියලා. මේ පනත් කෙටුම්පතෙන් ඒ විශ්වාසය ඇති වෙන්නේ නැහැ. ඒක තමයි ප්‍රශ්නය. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත තුළින් ඉලක්ක කළ යුත්තේ මොකක්ද? ඒකෙන් ඉලක්ක කරන්න ඕනෑ, නීත්‍යනුකූල රාමුවක් - framework එකක් - හදනවා කියන එක. ඒ කියන්නේ, හොඳින් නියාමනය කරන සූදු ව්‍යාපාරයක් අපේ රටේ හැදෙනවා කියන එක සහ සැඟවුණු ආර්ථිකයේ, එහෙම නැත්නම් කළු ආර්ථිකය තුළ බහුලව සිදු වන මේ හානිය අවම කරනවා කියන එක මේකෙන් ඉලක්ක කරන්න ඕනෑ. රජයට උපරිම ආදායම ගන්න පුළුවන් බදු එකතු කිරීමේ ක්‍රමවේදයක් සකස් වෙන්න ඕනෑ, මේ අධිකාරිය තුළින්. ඒ වාගේම ප්‍රේක්ෂකයන්ව රැක ගන්න ඕනෑ. එමෙන්ම මුදල් විශුද්ධි කිරීමේ ක්‍රියාව අවම කරන්න ඕනෑ. මේ පනතෙන් ඒක ඒ විධියටම සිද්ධ වෙනවාද, නැද්ද කියන ප්‍රශ්නයත් අපේ විපක්ෂයට තිබෙනවා.

අග්නිදිග ආසියාවේ රටවලින් ශ්‍රී ලංකාවට එක අවස්ථාවක් තිබෙනවා. මේක ආර්ථික අවස්ථාවක් හැටියට හරවා ගන්න පුළුවන්. හැබැයි, අපි මේක අනුමත කරන්නේ නැහැ. මගේ ආගමට අනුව සූදු ක්‍රීඩාව තහනම් කරපු එකක්. හැබැයි, දැන් මේ රටේ තිබෙන දෙයක් නියාමනය කරන්න යනවා නම් ඒක කොහොමද කරන්නේ? ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගන්න ඕනෑ. එහෙම නම් ඒකට ස්වාධීන, විනිවිදභාවයෙන් යුක්ත, ශක්තිමත්, නිර්දේශපාලනීකරණය කිරීමක් එක්ක තිබෙන අධිකාරියක් ඇති කරන්න ඕනෑ. නියාමන රාමුව ශක්තිමත්, විනිවිදභාවයෙන් යුතු එකක් විය යුතුයි. නැත්නම් ඒක වැඩක් නැහැ. ඒ නිසා අද ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් ගෙනෙන මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පතෙන් ඇත්තටම එක පැත්තකින් ආර්ථිකයට ධනාත්මක දෙයක් සිදු වෙන්න පුළුවන්; මේක කාලානුරූප පියවරක් කියලා හිතන්න පුළුවන්. හැබැයි, මේකේ අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා.

අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල මාෆියා තිබෙනවා අපි දැකලා තිබෙනවා; ලොකු මාෆියා තිබෙනවා. සහල් මාෆියාවක් තිබෙනවා. හැබැයි, ඒ මාෆියාව මේ ආණ්ඩුවට කඩන්න බැරි වුණා; අසාර්ථක වුණා. රේගු මාෆියාවක් තිබෙනවා. ඔබතුමන්ලා කිව්වා, system change කියලා; ඒ මාෆියාව කැඩුවේ නැහැ. විදුලිබල මාෆියාවක් තිබෙනවා. මීට සති දෙකකට කලින් පනතක් ගෙනැල්ලා ඒ මාෆියාව තවත් ශක්තිමත් කළා; අසාර්ථකයි. ජාවාරම් මාෆියාව, ව්‍යාපාර මාෆියාව තවම කඩලා නැහැ. ලුණු මාෆියාව වාගේ මාෆියා ගොඩක් තිබෙනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත හරහා සූදු මාෆියාව තවත් වර්ධනය වෙයිද? ඒක තමයි ප්‍රශ්නය. ඒ නිසා තමයි ශක්තිමත් නියාමන රාමුවක් අවශ්‍ය වෙන්නේ. ලංකාවේ කැසිනෝ කිහිපයයි තිබෙන්නේ. ඒ නිසා කැසිනෝ ඒකාධිකාරියක් තිබෙනවා. ඒ බලපත්‍ර දීම තුළ ප්‍රශ්න තිබෙනවා. මේ අධිකාරියෙන් ඒක සුද්ද වෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. System change එකක් නම් මේ මාෆියා ටික කැඩිය යුතුයි නේද? ඒක මේ පනත් කෙටුම්පත තුළින් සිදු වෙනවාද, නැද්ද කියන එක හොඳට හිතලා බලන්න.

මේ පනත් කෙටුම්පතේ ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මම ඒ ගැන කියන්නම්. මුදල් ඇමතිතුමාට පූර්ණ බලය තිබෙනවා, නියාමන මණ්ඩලයේ සාමාජිකයෝ පත් කරන්න.

මුදල් ඇමතිවරයා තමයි මේකට සාමාජිකයෝ පත් කරන්නේ. එතකොට ඒක දේශපාලනීකරණයක් නොවෙයිද? මුදල් ඇමතිතුමාට ඕනෑ විධියට, එතුමාට ඕනෑ අය දමාගෙන සූදු ව්‍යාපාරයම එතුමා අතේ තබා ගන්න පුළුවන්. ඊළඟට, අධ්‍යක්ෂ ජනරාල් පත් කරන්නේත් මුදල් ඇමතිවරයා. අපි කියන්නේ, මේ දෙකම සිදු වෙන්න ඕනෑකම තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් කියන එකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යොමු කරලා ස්වාධීනව හා මධ්‍යස්ථව එම තනතුරු පත් කළ යුතුයි. එක්කෝ, ඒ නියාමන මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරන්න ඕනෑ නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කළ යුතුයි කියලා අපි යෝජනා කරනවා. මේ සංශෝධනය ගෙනා යුතුයි.

ඒ වාගේම නීති රීති හා රෙගුලාසි හැදීමේ බලය තිබෙන්නේත් මුදල් ඇමතිවරයාට. එතුමා තමයි gamblingවල ඉහළින්ම ඉන්න කෙනා. එතකොට එතුමා තමයි ලොකුම සූදුකාරයා වෙන්නේ. එහෙම වෙන්න බැහැ නේ. මේ අධිකාරියට ඒ බලය දිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය නීති රීති සහ රෙගුලාසි හදන්න කියලා අපි යෝජනා කරනවා.

ඒ වාගේම මේ පනත් කෙටුම්පත සකස් කරනකොට සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ කිරීම හරියාකාරව සිදුවෙලා නැහැ කියලා අපි විශ්වාස කරනවා. සංචාරක ක්ෂේත්‍රයේ නියෝජිතයෙක් මේ අධිකාරිය තුළ සිටිය යුතුයි කියලා අපි යෝජනා කරනවා. ගරු ඇමතිතුමනි, ලොතරැයි මණ්ඩලය හරියාකාරව මේ අධිකාරියේ නියාමනය යටතට එන්නේ නැහැ. ලොතරැයි මණ්ඩලය මේක යටතට එන්න ඕනෑ. මොකද, ඒකත් සූදු ක්‍රීඩාවක්. මේක නොවෙන්න, ඒ තුළ අඩුපාඩු රැසක් තිබෙනවා.

ඊළඟට, online gambling ගත්තොත්, අද ජාත්‍යන්තර ප්‍රජාවත් ඒ තුළ ගනුදෙනු කරනවා. ඒක මුදල් විශුද්ධිකරණ ක්‍රමවේදයක් හැටියට පාවිච්චි කරන්න පුළුවන්. අපේ රටට ලැබිය යුතු ආදායම් ගොඩක් අපට අහිමි වෙනවා. එම නිසා online gambling, නැත්නම් මාර්ගගත සූදු ක්‍රීඩාවට අවශ්‍ය නියාමන බලය මෙම අධිකාරියට වැඩිපුර ලබා දිය යුතුයි කියලා අපි යෝජනා කරනවා. එතකොට තමයි මේක අංග සම්පූර්ණ වෙන්නේ. එහෙම නැත්නම් මේක නිකම් නාමික පනතක් හැටියට ආවොත් මෙම අධිකාරිය දේශපාලනීකරණයට සහ දූෂණයට ඉඩ දෙන අධිකාරියක් බවට පත් වෙනවා. එතකොට බදු එකතු කිරීම, දඩ ගැසීම, ඒ වාගේම කැසිනෝවල ආදායම ඇස්තමේන්තුගත කිරීම, ඒවායින් රජයට

උපරිම ආදායම ලබා ගැනීම සඳහා එම අධිකාරියට ලබා දී තිබෙන බලය ප්‍රමාණවත් නැහැ. එම බලය වැඩි කළ යුතුයි කියලා අපි යෝජනා කරනවා. එමෙන්ම මේ වාගේ පනතක් සම්මත කරනවා නම්, මේක නීතිගත කරනවා නම් රටට එන ආදායම උපරිම කර ගන්නට මේ අධිකාරිය පිහිටුවන්න ඕනෑ කියලා අපි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ගරු අනිල් ජයන්ත ඇමතිතුමා අද රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන සංශෝධන කිහිපයක් ගැන කථා කළා. මම ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනෙන්නේ 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත වෙනුවට. ඒ කියන්නේ, අපි ඒ කාලයේ Fiscal Management (Responsibility) Act එක ක්‍රියාත්මක කළා. හැබැයි, ඒක ක්‍රියාත්මක කළාම කිසිම කෙනෙක් ඒ අනුව වැඩ කළේ නැහැ; මූල්‍ය රෙගුලාසිවලට යටත් වුණේ නැහැ. ඒකට පටහැනිවයි වැඩ කළේ. ඒ නිසාම තමයි අපි මේ රටේ ණය අර්බුදයට මුහුණ දෙන්නේ. අපි ප්‍රතිපත්තිවලට අනුව වැඩ කරපු නැති නිසා තමයි මේ රට බංකොලොත් වන තැනට තල්ලු වුණේ. ප්‍රමාණවත් නොවන පරිදි අපි ණය ගන්න පටන් ගත්තා. ඒ අනුව ණය හරියට කළමනාකරණය කරන්න තමයි 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනාවේ. මම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔබ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට දන්නවා, අතිගරු ජනාධිපතිතුමා මීට සතියකට විතර කලින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථාවක් කළ බව. එතුමා කිව්වා, මධ්‍යම අධිවේගී මාර්ගය හදන්න චීන එක්සිම් බැංකුවෙන් ඩොලර් මිලියන 500ක ණයක් ලබා ගන්නවා කියලා; එම අධිවේගී මාර්ගය හදන්න ඕනෑ, ඒ වෙනුවෙන් එක්සිම් බැංකුවෙන් ඩොලර් මිලියන 500ක ණයක් ගන්නවා කිව්වා. ඒ වාගේම තවත් ඩොලර් මිලියන 493ක් භාණ්ඩාගාරයෙන් ලබා ගන්නවා කිව්වා. එතකොට, මේ සඳහා යොදවන total එක US Dollars 993 million වෙනවා. මම අහනවා, රාජ්‍ය ණය කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරලා ද මේ ණය මුදල ගන්නේ කියලා. මෙම ණය මුදල ලබා ගැනීමට නම් Public Debt Management Act එක අනුව එම කමිටුවෙන් අනුමත කර ගන්න ඕනෑ. මේ සඳහා අනුමැතිය ලබාගෙන තිබෙනවාද? ඒ සඳහා ඉදිරිපත් කළ වාර්තාව නිර්දේශ කරලා තිබෙනවාද? එසේ ගනු ලබන ණය අපේ සමස්ත විදේශ ණය සංචිතයට එකතු වන බව ඔබතුමා පිළිගන්නවා ඇති. අපට ඒ ණය ආපසු ගෙවන්න, එය service කරන්න, ණය සහ පොලිය ගෙවන්න ප්‍රමාණවත් ඩොලර් ආදායමක් මේ මඟින් උපයා ගන්න පුළුවන් වෙයිද කියන ප්‍රශ්න ටික රාජ්‍ය ණය කළමනාකරණ කමිටුවට යොමු කර තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

මොකද, මේ වසරේ පළමුවැනි භාගයේ -first half එකේ- IMF එකෙන් අපට ලැබිලා තිබෙන්නේ ඩොලර් මිලියන 335යි. හැබැයි බහුපාර්ශ්වික ආයතනවලින් -World Bank එකෙන්, ආසියානු සංවර්ධන බැංකුවෙන්- අපිට ලැබිලා තිබෙන ඩොලර්වලින් මුදල් අඩු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඩොලර් මිලියන 300ක්, 400ක්, 500ක් ඒවායෙන් ලැබෙනවා. හැබැයි මේ වෙනකොට ලැබිලා තිබෙන්නේ ඩොලර් මිලියන 95යි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා, මේ අනුව බලනකොට ශ්‍රී ලංකාවේ විදේශ සංචිතය 2024 ඔක්තෝබර්, නොවැම්බර් තිබුණාට වඩා මේ වෙනකොට අඩු වෙලා තිබෙනවා කියලා. Our foreign reserves are not growing. It is a problem and you have to acknowledge that. ජනාධිපතිතුමා සමහර වෙලාවට කියනවා නේ, බය කරන්න අපි මේවා කියනවා කියලා. මේ, ඇත්ත තත්ත්වය.

මහ බැංකුව විසින් දේශීය මූල්‍ය වෙළෙඳ පොළේ dollar swap ගනුදෙනුව මාස කිහිපයක වැඩි කරලා තිබෙනවා; බැංකුවලින් කරන Ddllar swap ගනුදෙනු වැඩි වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ දළ විදේශ සංචිතය - gross reserves - ගත්තාම, 2025 මාර්තු මාසයේ අපිට තිබුණා, ඩොලර් මිලියන 6,531ක්. හැබැයි 2025 ජූලි මාසය වෙනකොට -මාස 4ක් යනකොට- අපේ ඒ සංචිතය - gross reserves - ඩොලර් මිලියන 6,044කට අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, අපේ ශුද්ධ විදේශ සංචිතය - net reserves - විධියට 2025 මාර්තු මාසයේ තිබුණු ඩොලර් මිලියන 2,799ක ප්‍රමාණය 2025 ජූනි මාසය වෙනකොට ඩොලර් මිලියන 2,210කට අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කියනවා, tourism වැඩි වුණා, අපනයනය වැඩි වුණා, විදේශ ප්‍රේෂණ වැඩි වුණා, අපට විදේශ සංචිත වැඩි වුණා කියලා. නැහැ. විදේශ සංචිත මේ වාගේ වෙලාවකත් අඩු වෙනවා. අපිට ගෙවීම් ගොඩක් තිබෙනවා, කරන්න. ඔබතුමන්ලා දන්නවා, ඒක. කොටින්ම කියනවා නම්, 2024 දෙසැම්බර් සිට 2025 ජූනි දක්වා දළ විදේශ සංචිතය ඩොලර් මිලියන 6,122 සිට ඩොලර් මිලියන 6,080 දක්වා අඩු වෙලා තිබෙනවා. මේක ලේසි නැහැ. මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් - Net Foreign Assets - පවා ජූනි මාසය වෙනකොට අඩු වෙලා තිබෙනවා. These are facts, Hon. (Dr.) Anil Jayantha. මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ මේක රතු එළියක් නොවෙයිද කියලායි. අපිට ඉස්සරහට තිබෙන ගෙවීම් එක්ක අපට මේවා කරගන්න පුළුවන්ද?

මම ඇත්තටම අගය කරනවා, මහ බැංකුව කරන රාජකාරිය. අනිල් ජයන්ත ඇමතිතුමා කියපු එක හරි. Anti-inflationary and deflationary policies ක්‍රියාත්මක කළ නිසා, මුදල් පාලනයක් ඇති කරපු නිසා, monetary policy එක හරියට ක්‍රියාත්මක කරන නිසා තමයි දැන්වත් අපට මේක පාලනය කරගන්න ලැබුණේ. හැබැයි රජය පැත්තෙන් අපි දකින්නේ නැහැ, ප්‍රගතියක්. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ගිහිල්ලා හිර වෙනකොටත් අපි මේක මේ සභාවේ මේ විධියටම කිව්වා; ඔබතුමන්ලා හිරවෙනවා කියලා කිව්වා. ඒ නිසා තමයි අපි කිව්වේ ලබන දෙසැම්බර් වෙනකොට ඔබතුමන්ලාට මේක අර්බුදයක් බවට පරිවර්තනය වෙනවා කියලා. මේ සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගත යුතුයි කියලා මේ අවස්ථාවේදී මතක් කරමින්, මම අහපු ප්‍රශ්නවලට උත්තර දෙන ලෙසත් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chathuranga Abeysinghe. You have an allocation of 17 minutes.

[පූ.භා. 11.18]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අණපනත් පිළිබඳව කථා කරන්න කලින් මේ වෙලාවේ කියන්න ඕනෑ විශේෂ කාරණයක් තිබෙනවා. දවසකට එක්කෙනෙක් ඇවිල්ලා රතු එළියක් පත්තු කරනවා. ඊළඟට තව එක්කෙනෙක් ඇවිල්ලා බොරු බෙගල් ටිකක් කියලා, රතු එළියක් පත්තු කරනවා. අපේ ආර්ථිකය ශක්තිමත්ව, positively ඉස්සරහට යනවා කියලා දේශීය දත්තවලින්, ජාත්‍යන්තර දත්තවලින්, ජාත්‍යන්තර ආයතනවලින් සහ IMF එකෙනුත් අපිට තොරතුරු ඇවිල්ලා තියෙද්දී දැන් රතු එළි පත්තු කරමින් යනවා කට්ටියක්. එක්කෙනෙක් හොඳටම නාගත්තාට පස්සේ අද තව එක්කෙනෙක් ඇවිල්ලා රතු එළියක් පත්තු කරනවා. අපේ රටේ ආර්ථිකය ගැන කථා කරන ජාති තුනක්

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක කට්ටියක් න්‍යාය විතරයි දන්නේ. ප්‍රායෝගිකව මෙලෝ දෙයක් බැහැ. ආසනයක්වත් දිනාගන්න බැරි කට්ටිය. ඊළඟට ඉන්නවා, ආර්ථිකයේ තාක්ෂණික වචන ටිකක් හොයාගෙන උදේට මෙතැනට ඇවිල්ලා අපිට උපදෙස් දෙන කට්ටියක්. ඒ ගොල්ලන් බිස්නස්කාරයෝ. කළුකඩකාරයෝ, ඩීල්කාරයෝ දේශපාලනයට ඇවිල්ලා දැන් ආර්ථිකය ගැන කථා කරනවා. මේ, පොඩ්ඩක් ඉංග්‍රීසියෙන් කථා කරන්න පුළුවන් කට්ටියක්. තව ඉන්නවා, ඒගොල්ලන්ගේ YouTubeවල ආදායම වැඩි කරගන්න ආර්ථිකය ගැන දන්නවා කියලා සාකච්ඡා කරන පිරිසක්.

ඒගොල්ලන් ආර්ථික විද්‍යාව කොහෙන්වත් ඉගෙනගෙනත් නැහැ. හැබැයි, ආර්ථික කරුණු අරන් mike පළනවා. මෙන්න මේ තුන්ගොල්ලෝ තමයි අපේ රටේ ආර්ථිකය ගැන මෙච්චර කාලයක් කථා කළේ. අපිත් ආර්ථිකය ගැන ගොඩක් දන්නේ නැහැ. නමුත්, යම්කිසි සංවිධිත ආකාරයෙන් ආර්ථිකය ගැන ඉගෙනගෙන, සාමූහික ක්‍රියාවලියක් ඇතුළේ ශක්තිමත් තීරණ අරගෙන වැඩ කටයුතු කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙන්න මේ කාරණයත් ගරු සභාවට කියන්න කැමැතියි. 2016දී මේ ඔස්තාර්ලා සියලු දෙනාම හිටපු ආණ්ඩුවේ අය වැය මේ සභාවට ඉදිරිපත් කළා. මේ උදවිය දැන් අපිට කියනවා, "බොරු කියනවා, බොරු කියලා බලයට ආවා, කියපු දේවල් කිසිම දෙයක් කළේ නැහැ" කියලා. 2016දී ඒ අය වැය ඉදිරිපත් කරනකොට, දැන් ඉන්දියාවට පවා උපදෙස් දෙන, ඉන්දියාවේ newsවලට ලංකාවේ තොරතුරු සාවද්‍ය විධියට ඉදිරිපත් කරන ඔස්තාරුත් ඒ ආණ්ඩුවේ හිටියා. ඒ වාගේම, නව ලිබරල් න්‍යායාචාර්යවරයා විධියට හිටපු රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාත් හිටියා. ඒ වාගේම, අර මම කියපු බිස්නස් කරලා දේශපාලනයට ආපු උදවියත් ඒ ආණ්ඩුවේ හිටියා. ඊළඟට, ආර්ථිකය ගැන උපදෙස් දෙන advisory board එකක් හිටියා; ලංකාවේ සමස්ත ආර්ථිකය තමන්ගේ යහළුවන්ට හසුරුවන කණ්ඩායමක්. ඔය උදවිය 2016දී අය වැයක් ඉදිරිපත් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ ගැන කියන්නේ, "බොරු කියනවා, බොරු කියනවා, බොරු කියලා බලයට ආවා, ආණ්ඩුව මුකුත් කරන්නේ නැහැ" කියලා කියන කට්ටියගේ නොහැකියාව පෙන්වන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම අය වැයේ යෝජනා 500ක් තිබෙනවා ආර්ථිකය දියුණු කරන්න. ඒකට වෙන් කළා රුපියල් බිලියන 229ක්. මම දැන් ඒවායින් 25ක් කියන්නම්; බොරු 25ක්. ඒ බොරු 25 මේගොල්ලන්ට කරගන්න බැරි වෙච්ච දේවල්. ඒ යෝජනා 500න්, 25යි මම දැන් කියන්නේ. ඒ 25 මේගොල්ලන්ට කර ගන්න බැරි වෙලා ඒ ටික අපි කරනකොට අද ඒ අයට වේදනාවක් දැනෙනවා ඇති. ඒක තමයි දෛවයේ සරදම කියලා කියන්නේ.

2016දී ඉදිරිපත් කරපු අය වැයේ තිබෙනවා, industrial policy එකක් ලංකාවට ගේනවා කියලා. නමුත්, අද වෙනතුරු එ්ක ගෙනැවිත් නැහැ. අපි ඒක ගේනවා මේ අවුරුද්දේ. ඊළඟට, simplified tax system එකක් ගේනවා කියලා එම අය වැය යෝජනාවල තිබෙනවා. අදටත් ලෝකයේ සංකීර්ණම බදු පද්ධතිය තිබෙන්නේ ලංකාවේ. ඊළඟට, tax collection එකට තාක්ෂණය එකතු කරනවා කියලා එම අය වැය යෝජනාවල තිබෙනවා. අද වෙනතුරුත් බදු ටික එකතු කර ගන්න අවශ්‍ය කරන POS systems ටික ගෙනැල්ලා නැහැ. අපි තමයි මෙවර අය වැය යෝජනාවෙන් ඒක ගේන්නේ.

ඊළඟට, අද අපි මේ ගෙනෙන රෙගුලාසි එක්ක රාජ්‍ය ණය කළමනාකරණ පනත ගැන කථා කළාට, එය establish කරනවා කියලා 2016දී කථා කළා. 2019 වනතුරු මේගොල්ලන්ට ඒක කර ගන්න බැරි වුණා. ඒ වාගේම, 2016 අය වැය යෝජනාවේ කියනවා, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කරලා ලාභ ලබන තත්ත්වයට පත් කරනවා කියලා. අපට 2024 වසරේදී මේවා ලැබෙනකොට ඔක්කෝම බංකොලොත් කරලා තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊළඟට මේ උදවිය 2016දී කිව්වා, agriculture productivity එක වැඩි කරලා 2018 වෙනකොට ලංකාව කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත කරනවා කියලා. 2016දී ඉදිරිපත් කරපු අය වැයෙන් තමයි මේ දේවල් කියා තිබෙන්නේ. ඊළඟට, gem and jewellery hub එකක් ලංකාවේ හදනවා කියලා 2016දී යෝජනා කළා. ඒක දැන් කරන්න වෙලා තිබෙන්නේ අපිට; අපි ඒක කරගෙන යනවා.

ඊළඟට, national digital ID system එක යෝජනා කරන්නේත් 2016දී. දූෂිතයෝ, වංචනිකයෝ හිටපු හින්දා ඒක කරගන්න බැරි වුණා. ඒ වාගේම මේ උදවියගේ තිබුණු නොහැකියාව නිසා ඒක කර කරන්න බැරි වුණා. Exim Bank එක හදනවා කියලා 2016 අය වැය යෝජනාවේ තිබෙනවා. ඒ, ආනයන අපනයන බැංකුව. ඒක හදාගන්නත් මේ අයට බැරි වුණා. ඊට පස්සේ 2016දී යෝජනාවක් කළා, National Payment Platform -NPP- එකක් හදනවා කියලා. ඒක හැදුවේ ජාතික ජන බලවේගය රජය යටතේ 2025 වසරේ. මාස 6ක් ඇතුළතදී GovPay එක හදලා දැන් ක්‍රියාත්මක වෙනවා. ඊළඟට, ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත -Anti-Dumping and Countervailing Duties Act- ගේනවා කියලා මේ ඔස්තාර්ලා 2016දී අය වැය යෝජනාවේ දැම්මා. ඒක ගෙනාවේ අපි, ගිය සතියේ.

ඊළඟට මේ අය 2016දී කිව්වා, land bank එකක් හදනවා කියලා. ඒක හදා ගන්න බැරි වුණා; තමන්ගේ යහළුවන්ට තමයි lands ටික ඔක්කෝම පැවරුවේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. land bank එක හදන්නේ අපි. මේ අවුරුද්දේ අග වෙනකොට අපි ඒක හදනවා. ඊළඟට, tourism branding කරනවා කියලා සල්ලි තොගයක් වෙන් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක කරලා නැහැ. ඒක නිසා තමයි ලංකාවේ tourism අද මේ තත්ත්වයේ තිබෙන්නේ. ඒ branding එක පටන් ගන්නේත් මේ අවුරුද්දේ. MICE tourismවලින් ඩොලර් බිලියන 3ක් ගෙනෙනවා කියලා 2016දී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒත් ඒක කරගන්න මේ උදවියට බැරි වුණා. ඒකත් දැන් වර්තමාන ආණ්ඩුව කරන්නේ. ඒ වාගේම, Colombo International Financial Centre එකක් කරනවා කියලා 2016දී යෝජනාවක් තිබිලා තිබෙනවා. ඒ මෙලෝ දෙයක් කරගන්න තිබුණු නොහැකියාව ගැනයි මම මේ කියන්නේ. න්‍යාය දන්නවා. ප්‍රතිපත්තිවලට ඉදිරිපත් කරනවා. නමුත්, මෙලෝ දෙයක් කර ගන්න බැරි ආර්ථික ඔස්තාර්ලා ටිකක් තමයි 2016 ඉඳලා හිටියේ.

ඊළඟට, Lanka Enterprise Development Bank කියලා development bank එකක් යෝජනා කර තිබෙනවා, 2016 අය වැයෙන්. එය අද වනතුරු හදලා නැහැ. මේ වන විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බංකොලොත් වෙන්න ප්‍රධානම හේතුව ඒක. ඊළඟට, Bills of Exchange Ordinance එක වෙනස් කරනවා කියලා 2016 අය වැය යෝජනාවල කියලා තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක කළේ අපි; ගිය මාසයේ. ඊළඟට, labour laws වෙනස් කරනවා කියලා 2016 අය වැය යෝජනාවක් තිබුණා, කාන්තාවන්ට BPO ක්ෂේත්‍රයේ වැඩ කරන්න හැකි වෙන්න. ඒකත් කළේ අපි. වර්තමාන ආණ්ඩුව බලයට ඇවිල්ලා මාස හයක් යන්න ඉස්සෙල්ලා ඒක කළා. ඊළඟට, කුඩා දරුවන්ගේ අධ්‍යාපනයට, පෙර පාසල්වලට රුපියල් බිලියන 7ක් වෙන් කරනවා කිව්වා. ඒ පෙර පාසල් එකක්වත් මේ දක්වා හැදිලා නැහැ. කොහේ ගියාද දන්නේ නැහැ, ඒ සල්ලි ටික. ඊට පස්සේ SOEsවලට holding company එකක් හදනවා කියලා යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ 2016 අය වැයේදී.

මෙගොල්ලන්ට එය කර ගන්න බැරි වීම හේතුවෙන් මෙගොල්ලන් දැන් වේදනාවෙන් දුක් වින්දාට අපි ඒක ලබන අවුරුද්ද වෙනකොට කරනවා.

ඊළඟට, SOEsවලට KPIs දමනවා කියලා 2016 අය වැය යෝජනාවක් තිබෙනවා. ඒකත් මෙගොල්ලන්ට කර ගන්න බැරි වුණා. අපි කර්මාන්ත අමාත්‍යාංශය වශයෙන් KPIs දීලා management agreements sign කළා, ගිය සතියේ. ඊළඟට, Commercial High Court එක ශක්තිමත් කරලා මාස හයක් ඇතුළත commercial ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙනවා කියන යෝජනාව තිබෙන්නේත්, 2016 අය වැයේ. ඒකත් මෙගොල්ලන්ට කර ගන්න බැරි වුණා. නොහැකියාව! නොහැකියාව! ඒ නිසා තමයි මේ අඬන්නේ. වෙන මොකක් නිසාද? ඊළඟට, 24; mini-industrial parks හදනවා කියලා යෝජනාවක් තිබෙනවා. ඒ සල්ලි කොහේ ගියාද කියලා නම් මම දන්නේ නැහැ. යෝජනා 500න් 25යි මම මේ කියවන්නේ. තවත් එකක් තිබෙනවා, venture capital fund එකක් හදනවා කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ණය ගන්න. මම කියන්නේ මේකයි. මේකේ ඇත්තම කථාව, මේ තමයි මේ ගොල්ලන්ගේ නොහැකියාව. මෙතැනට ඇවිල්ලා උදේට අපට උපදෙස් දෙන කට්ටියට, අපට බණ කියන කට්ටියට, මේ ආණ්ඩුව අසාර්ථකයි කියන කට්ටියට මේ ආණ්ඩුව මාස නවයක් ඇතුළත කරපු ඒවායින් කිසිම දෙයක් 2016 ඉඳලා 2018 දක්වාත්, අවුරුදු හතරක් ගිහිල්ලාත් කර ගන්න බැරි වුණා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ දවස්වල මමයි කර්මාන්ත ඇමතිවරයායි යනවා, අපේ SOEs බලන්න. ගිහිල්ලා මේ රටේ උළු කර්මාන්තය විනාශ කරලා තිබෙන දූෂිත පාලකයා ගැන අපි සටහනක් දැම්මාම අර ඉන්න යූටියුබ් ඔස්තාර්ලා කියනවා, කොහේද උළු හදන්න පුළුවන්, ලංකාවේ කොහේද උළු හදන්න පුළුවන්කම තිබෙන්නේ, උළුවලට මාර්කට් එකක් නැහැ කියලා. මේ ඔස්තාර්ලාගේ 2016 අය වැය යෝජනාවලියේ 606 වැනි යෝජනාවේ තිබෙනවා, 2018 වෙනකොට ලංකාව ඇස්බැස්ටස්වලින් තොර කරලා, උළු කර්මාන්තය නඟාසිටුවනවා කියලා. දැන් ඒකට කවුරුවත් pick on කරන්නේ නැහැ. ඊළඟට, 607 වැනි යෝජනාවේ තිබෙනවා, දේශීය ඇඟලුම් කර්මාන්තයයි, සම් භාණ්ඩ කර්මාන්තයයි ආරක්ෂා කරන්න ආරක්ෂණවාදී ප්‍රතිපත්ති නිර්මාණය කරනවා කියලා. ඔස්තාර්ලා ඒවා කියන කොට විවේචන නැහැ. ඔස්තාර්ලා ඒවා කියන කොට විවේචන එන්නේ නැහැ. නමුත්, අපි එය කරන්න යන කොට තමයි විවේචන.

තවත් විහිළු කථා ටිකක් කියන්නම්, මේ ඔස්තාර්ලාගේ වැඩ ගැන. මේ ඔස්තාර්ලා 2016 අය වැයෙන් පොරොන්දු වෙලා තිබෙනවා, 2016 අග වෙනකොට අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 10ක් කරනවා කියලා. හරිද? එය, අමූලික බොරුවක්. ඒකත් නොහැකියාව! ඊළඟට මේ ගොල්ලන් කියලා තිබෙනවා, 2018 වනකොට බදු එකතු කිරීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17කට නංවනවා කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සියයට 12.4යි, මෙගොල්ලන් පැනලා යනකොට, 2018දී. ඊළඟට, agricultureවලින් ස්වයංපෝෂිත වෙනවා කියලා තිබෙනවා. Gem and jewellery sector එකේ අපනයනය 2018 වනකොට ඩොලර් බිලියන 2ක් දක්වා ගෙන එනවා කියලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද එම ප්‍රමාණය මිලියන 330යි. අපි දැන් ඒක මුල ඉඳලා හදන්න ඕනෑ. ඊළඟට, IT-BPO sector එක, එහෙම නැත්නම් ඩිජිටල් ආර්ථිකය ඩොලර් බිලියන 5ක ආර්ථිකයක් බවට පත් කරනවා කිව්වා, ඔස්තාර්ලා. නමුත් ඒ ඔස්තාර්ලාට ඒ මොකවත් කර ගන්න බැරි වුණා. මේ ඔස්තාර්ලාට කර ගන්න බැරි වෙච්ච සියලුම දේ, මේ ගරු සභාවේ හිටගෙන කියපු අමූලික බොරු- *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, හිටගෙනද, ඉඳගෙනද කිව්වේ කියලා. අය වැය දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා, අපට උපදෙස් දෙන එක්කෙනා. ඒ අයට ඒ කිසිම දෙයක් කර ගන්න බැරි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම දැන් මෙතුමන්ලාට ඉලක්කම්වලින් කියා දෙන්නම්. 2016 අය වැය මඟින් මෙතුමන්ලා GDP එකෙන් සියයට 16.6ක revenue එකක් බලාපොරොත්තු වෙලා තිබෙනවා. හැබැයි, 2016 වර්ෂයේ achieve කර ගත්තේ සියයට 12.7යි. නමුත්, අපේ ආණ්ඩුවේ ගරු ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා අය වැය ඉදිරිපත් කළාට පස්සේ මේ වනකොට අපි බදු එකතු කිරීමේ වාර්තා අභිභවමින් එක මාසයකට විතරක් රේගුවෙන් රුපියල් බිලියන 230ක් එකතු කර ගන්න සමත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, මෙතුමන්ලාගේ ආණ්ඩුව 2016 අය වැයෙන් පොරොන්දු වුණා, පොලී අනුපාතය සියයට 4.4ක් කරනවා කියලා. මෙතුමන්ලා 2018දී ආණ්ඩුව දාලා යනකොට පොලිය සියයට 5.9යි. මේ රට බංකොලොත් කරලා, සියයට 4.2ට තිබුණු ආර්ථික වර්ධන වේගය 2018 වනකොට සියයට 2.3ට වට්ටලා ගියා. ඒ වාගේම අපව ISBsවල හිර කරලා රට බංකොලොත් කරන්න මූලික පදනම දැම්මේ මේ කියන ආර්ථික ඔස්තාර්ලා කිහිපදෙනා තමයි.

අප අද ගෙනැවිත් තිබෙන Gambling Regulatory Authority Bill එක ගැන කථා කළොත්, ඔව්, එ්ක ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ඒ කාලයේ මේ අය online හරහා කරන සූදු, ලංකාවේ කරන සූදු සහ betting ආදි කිසිම දෙයක් නියාමනය නොකර, තමන්ගේ යාළුවන්ට, ගජ මිතුරන්ට අධිලාභ ලබන්න, තමන්ගේ යාළුවන්ට, ගජ මිතුරන්ට බදු නොගෙවා ඉන්න, තමන්ගේ යාළුවන්ට, ගජ මිතුන්ට අනීතික ව්‍යාපාර කරන්න ඉඩ සැලැස්සුවා. එහෙම ඉඩ සලස්වපු ඒ පාලකයන්ට අද කටඋත්තර නැහැ. මොකද, අපි තමයි Gambling Regulatory Authority Bill එක ගෙනෙන්නේ. මෙතුමන්ලාට අවුරුදු ගණනක් තිස්සේ මේක ගේන්න බැරි වුණා. අදාළ රෙගුලාසි හදන්න තමයි අපි මේ නියාමන අධිකාරිය හදන්නේ. එහෙම නම්, අප ඔක්කෝටම එකතු වෙලා රටට වඩාත් සුදුසු විධියට රෙගුලාසි හදාගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙතුමන්ලා දැන් කියනවා, විදේශ සංචිත ගැන ප්‍රශ්නයක් තිබෙනවා, රතු එළියක් පෙන්වනවා කියලා. මේවා අමූලික බොරු, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමන්ලා -රනිල් වික්‍රමසිංහ- ගිය අවුරුද්දේ විදේශ සංචිත බේරා ගත්තේ ආනයන තහනම් කරලා. අද අපි මේ Foreign Exchange Act එකෙන් ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගම්වලට මිලියන 750ක් දක්වා ලංකාවෙන් පිට ආයෝජන අවසරයක් දීලා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ නැති සමාගම්වලට මිලියන 200ක් දක්වා විදේශ ආයෝජන අවස්ථා ලබා දී තිබෙනවා. අපි වෙළෙඳ පොළ විවෘත කරලා තමයි සංචිත බේරාගෙන තිබෙන්නේ. එහෙම නැතුව මෙගොල්ලෝ වාගේ ආර්ථිකය වහගෙන සංචිත බේරාගෙන නැහැ. මේ අනුව, ආර්ථිකය ඉතාම ශක්තිමත්ව ඉස්සරහට යනවා කියන එක අපට පැහැදිලිවම කියන්න පුළුවන්.

ඒ වාගේම Public Debt Management Act එකට රෙගුලාසි ගෙනැල්ලා අපිම ස්වයං පාලනයක් දමාගෙන, අපිම මේ රට විනිවිදභාවයෙන් ඉතාම හොඳ ණය කළමනාකරණයකින් යුතුව ඉදිරියට ගෙන යනවා. මෙතුමන්ලා තමයි මෙච්චර කාලයක් ණය අවභාවිත කළේ. පසුගිය ආණ්ඩු ණය අරගෙන කැමැති, කැමැති projects වෙනුවෙන් ඒ ණය අවභාවිත කළා. එළියේ සිටින analystsලාට මම කියනවා පුළුවන් නම් 2016 ඉඳලා 2018 වනකල් අය වැය යෝජනා ටික අරගෙන පරීක්ෂා කර බලන්න කියලා. 2016 අය වැය යෝජනා 500ක් තිබෙනවා. ඒ කාලයේ

[ගරු චතුරංග අබේසිංහ මහතා]

රුපියල් බිලියන 253ක් නාස්ති කරලා තිබෙනවා; කාබාසිනියා කරලා තිබෙනවා. Projects එකක්වත් කරලා නැහැ. ඊළඟ අවුරුද්දේ එකේත් යෝජනා 500ක් තිබෙනවා. මා හිතන විධියට, ඒ අය වැය ඉදිරිපත් කරපු මුදල් ඇමතිතුමා 500ට බොහොම කැමැතියි වාගේ. අවුරුදු දෙකේම යෝජනා 500 ගණනේ දාලා බිලියන ගණනක මුදල් වෙන් කරගෙන තිබෙනවා. නමුත්, මේ රටට වෙච්ච සෙතක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අර ඔස්තාර්ලා තුන්දෙනා ගැන ආයෙත් මතක් කරන්නම්. එක්කෙනෙක් theory විතරයි දන්නේ, practicals මොකුත් බැහැ. ඒක නිසා හම්බ වෙන ඕනෑම topic එකකට ගිහිල්ලා හෙණ "ටෝක්" එකක් දෙනවා; අන්තිමට අකුළාගෙන පැත්තකට වෙනවා. විශේෂයෙන්ම ඇමෙරිකාවේ tariff එක ගැන ලෝකයේ වැඩිපුරම දන්නේ එතුමා වාගේ තමයි කථා කළේ. එහෙම කථා කරලා, අන්තිමේදී වරදින කොට කථාව මාරු කරනවා. ඒක තමයි ප්‍රතිපත්තිය.

අපට උපදෙස් දෙන්නේ ලංකාවේ සතොස බංකොලොත් කරපු හිටපු මුදල් ඇමතිවරු. ලංකාවේ සතොස විකුණපු, රාජ්‍ය ආයතන කොල්ල කාපු අය තමයි උදේට ඇවිල්ලා අපට මෙතැන "පොර ටෝක්" දෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවාට හිනා වෙන්න තමයි තිබෙන්නේ. අද අපේ ආර්ථිකය හොඳින් ශක්තිමත්ව ඉදිරියට යනවා. ඒකට අපට හොඳ ඇමති මණ්ඩලයක්, ජනාධිපතිවරයෙක්, උපදේශක මණ්ඩලයක් ඉන්නවා, සාමූහික තීරණ ගන්නා ක්‍රියාවලියක් තිබෙනවා. ඒ නිසා අපේ රටේ ආයෝජකයන්ට, අපේ රටේ ජනතාවට අප කියන්නේ, නිර්ණායක දිහා බලාගෙන ඉන්න, රට වෙනස් වෙනවා කියන එකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, your time is up.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
අපේ රට ආර්ථික වශයෙනුත්, සමාජයීය වශයෙනුත්, නෛතික වශයෙනුත් වෙනස් වෙනවා. ඒක බලාගෙන ඉන්න බැරි වේදනාවෙන් විවිධ කථා කියලා අපේ රට අපකීර්තියට පත් කරන්න එපා කියන ඉල්ලීම විපක්ෂයෙන් කරමින් මගේ කථාව නිමා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 16 minutes.

[පූ.භා. 11.34]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන කොට මම ඉතා ඕනෑකමින් බලාගෙන හිටියා, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු අමාත්‍යවරයා හෝ ඊට පසුව කථා කරපු කථිකයන් මෙහි සඳහන් දේවල් පිළිබඳව මොනවා හරි කාරණයක් මතු කරයිද කියලා. අපේ විපක්ෂයේ ඉන්න, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට වාගේ ප්‍රහාර එල්ල කිරීම වාගේ දේවලට තමයි ආණ්ඩුවේ කථිකයන්ගේ කාලය වැඩිපුර වැය වුණේ. හැබැයි, මේකේ ප්‍රධාන කාරණය මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.04.21වන දින අමාත්‍ය මණ්ඩල තීරණයෙන් උපුටා ගත් කොටසක් මම කියවන්නම්. ඒකේ සඳහන්ව තිබෙනවා, "නෞකාවන්හි හා කොළඹ වරාය නගරයේ අක්වෙරළ සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ මාර්ගගත සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළුව ශ්‍රී ලංකාවේ සූදු ක්‍රීඩා කර්මාන්ත මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් පුළුල් හා පූර්ණ විෂය පථයක් සහිත ස්වාධීන තනි නියාමකවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීමට යෝජනා වී ඇත." කියලා.

මම මේකේ ප්‍රධාන කාරණය ලෙස මතු කළේ "නෞකාවන්හි හා කොළඹ වරාය නගරයේ" කියන කොටස. ඒක තමයි මෙම කැබිනට් මණ්ඩල තීරණයෙන් මම උපුටා ගත් ප්‍රධානම කොටස. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ පිටු අංක 54හි 79වන වගන්තියේ "අර්ථ නිරූපණය" යටතේ සඳහන්ව තිබෙනවා, "පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ..." කියලා. "කැසිනෝ ක්‍රීඩාව" පිළිබඳව සහ "ඩිජිටල් සූදු ක්‍රීඩාව" ආදිය පිළිබඳව මේකේ විග්‍රහයක් කරලා තිබෙනවා. මෙහි පිටු අංක 55 මුල් කොටසේ සඳහන්ව තිබෙනවා, " 'සූදු ක්‍රීඩාව' යන්නෙන්, ඔට්ටු ඇල්ලීම, සූදු, මාර්ගගත සූදු, කැසිනෝ, සංචාරක නෞකා කැසිනෝ, විනෝද සවාරි සූදු ක්‍රීඩා මෙහෙයුම් අදහස් වන අතර,..." කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙච්චර කල් ලංකාව තුළ - ගොඩබිමේ- කැසිනෝ තිබුණා. පසුගිය කාලයන්හි කැසිනෝ හොඳ නැහැ කියලා කැසිනෝවලට විරුද්ධව කථා කරපු පක්ෂයක් දැන් ආණ්ඩුව කරන්නේ. හැබැයි, දෛවයේ සරදමක් තමයි කැසිනෝවලට විරුද්ධව කථා කළ එතුමන්ලාටම ජෝන් කීල්ස් එකේ කැසිනෝ එකක් විවෘත කරන්න සිදු වීම. හැබැයි, මේක ඉතා භයානක කාරණයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අද බලාගෙන හිටියේ ඇමතිවරයා හෝ වෙනත් කථිකයෙක් ඒ කැල්ල පිළිබඳව වචනයක් හරි කියයි කියලා. නමුත්, ඒ ගැන වචනයක්වත් කියවුණේ නැහැ. හැබැයි, රටේ සමස්ත ජනතාවට පෙන්වන්න යන්නේ "මේක සූදු නියාමනය කිරීම සඳහා අපි ගන්නා ක්‍රමවේදයක්" කියලා. "අපි සූදු හරහා ලංකාවේ බදු ආර්ථිකය වැඩි කරන්න යනවා. අපි කැසිනෝ ටික මෙල්ල කරන්න යනවා" වාගේ කථාවක් කිව්වාට මේක ඇතුළෙන් කොළය වහලා, හැමෝටම හංගලා කටයුතු කරනවා. අද දවසේ සිට, නැත්නම් මේ පනත් කෙටුම්පත රට තුළ පනතක් බවට පත් වන දවසේ සිට මෙතෙක් ඉතිහාසයේ තිබුණේ නැති, නෞකාවන්හි සූදු ක්‍රීඩාවට අනුමැතිය ලබා දීමක් මේ හරහා සිදු වෙනවා. මම දන්නේ නැහැ, මේ තරම් වැදගත් කැල්ලක් ගැන කිව්වේ නැත්තේ ඇයි කියලා. මට ඒක හිතා ගන්න බැහැ. මෙතෙක් ඉතිහාසය තුළ සිදු වුණේ නැති ආකාරයේ දෙයක් සිදු වෙන්නයි යන්නේ. ඒකේ තවත් භයානක දෙයක් තමයි, ලංකාවේ flag එකක් නැති පිට රට vessel එකකට පවා permit එකක් අරගෙන ලංකාවේ මුහුදු තීරයේ සූදු ක්‍රීඩාවේ නියැළෙන්න මේ පනත් කෙටුම්පත හරහා මේ ආණ්ඩුව ඒ permission එක, එහෙම නැත්නම් ඒ බලය පිට රට නෞකාවලට පවා ලබා දීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසුව ලංකාව තුළ වරායක් තිබෙන ඕනෑම ප්‍රදේශයක -ගාල්ල වරාය වෙන්න පුළුවන්, හම්බන්තොට වරාය වෙන්න පුළුවන්, ත්‍රිකුණාමලය වරාය වෙන්න පුළුවන්, ඔලුවිල් වරාය වෙන්න පුළුවන්, යාපනය කන්කසන්තුරේ වරාය වෙන්න

පුළුවන්, ඉදිරි අනාගතයේ මන්නාරමේ හැදුණොත් මන්නාරමේ වරාය වෙන්න පුළුවන්- විදෙස් කොඩියත් සමඟ නෞකාවකට ඇවිල්ලා ලංකාවේ බලපත්‍රයක් අරගෙන ඕනෑම කාලයක් ඒ මුහුදු තීරයේ ඉඳලා සූදු ව්‍යාපාරයක් කරගෙන යන්න පුළුවන්.

මේක ඉතාම භයානක තත්ත්වයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම මේ රට තුළ Chinese, නැත්නම් විදෙස් influences ගැන මම දිගටම ගොඩක් කරුණු කථා කරලා තිබෙනවා. මම ළඟ තිබෙනවා, article එකක්; "Global Times" කියන Chinese website එකේ article එකක්. 2025 ජුලි 23 වෙනි දා ඒ website එකේ තිබෙනවා, "China's Ministry of State Security warns against foreign espionage agencies targeting country's maritime data" කියන title එකෙන් දාපු news එක. දැන් චීනය කියනවා, වෙනත් රටවල් චීනයේ maritime data හොරකම් කරන්න නෞකා භාවිත කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ පනත සම්මතවීම තුළින් මොකද වෙන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ අසල්වැසි රට වන ඉන්දියාවට ආරක්ෂාව පිළිබඳ විශාල ගැටලු අපේ Indian Ocean එකේ තිබෙන බව. ඒක මගේ පැහැදිලි කිරීමක්. නමුත් "මේක එහෙම නොවෙයි, අපි එහෙම එකක් කරන්නේ නැහැ, එහෙම කිසිම ගැටලුවක් නැහැ" කියලා ආණ්ඩුවෙන් කියනවා නම්, ගැටලුවක් නැහැ. හැබැයි, මෙහි තිබෙන භයානකකම අනුව, geopolitically, අද ලංකාව තුළ තිබෙන අනුව ජාතික ආරක්ෂාවට විශාල ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. මොකද, ඕනෑ නම්, Chinese කොඩියක් සමඟ vessel එකක් ඇවිල්ලා ත්‍රිකුණාමලය වරායේ නවත්වලා permit එකක් අරගෙන ඔවුන්ට අවශ්‍ය කාලයක් ඒ ප්‍රදේශයේ ඉඳන් මේ බිස්නස් එක කරගෙන යන්න පුළුවන්, මේ පනත හරහා.

ඒ වාගේම මීට අමතරව, මෙහි තව කාරණයක් තිබෙනවා. බදු අය කර ගැනීම සම්බන්ධයෙන්, මේ රටේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සම්බන්ධයෙන් මේ නියාමන අධිකාරිය උපයෝගී වෙනවා කියලා කියනවා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට 2015දී හඳුන්වා දෙනවා, කැසිනෝ එකකට ඇතුළු වෙන පුද්ගලයෙකුගෙන් යම් මුදලක් අය කරන්න ඕනෑ ක්‍රමයක්. 2015 අවුරුද්දේ ඒ මුදල ඩොලර් 100ක්. ඒක entrance fee එකක් වෙන්න පුළුවන්. නැත්නම් ඒක ඇතුළේ minimum bet gambling කළත් ඩොලර් 100ක ප්‍රමාණයක් charge කරලා ඒක ආණ්ඩුවට ගෙවන්න ඕනෑ, ඒ කැසිනෝ එකෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015-2023 දක්වා මෙම payment එක කැසිනෝ එකක්වත් ලංකා රජයට ගෙවලා නැහැ. අපි බලාපොරොත්තු වුණේ මේ ආණ්ඩුව ආවාට පස්සේ මේවා නියාමනය කරලා, මේ අධිකාරිය හදන්න කලින් මේ මුදල් අය කර ගනීවි කියලා. මම හිතන විදියට, රට තුළ කැසිනෝ 4ක් නැත්නම් 5ක් තමයි ඇත්තේ. ඉතින් මේ 5දෙනා 2015 සිට 2023 වෙනතුරු ගෙවන්න ඕනෑ ඩොලර් 100 ලබා නොගත්තේ ඇයි? අපි දන්නේ නැහැ ඒ සංඛ්‍යාව. නමුත් ඇයි මේ හිඟමුදල් ටික, අවුරුදු 8ක හිඟ මුදල් ටික තවම ලබා ගත්තේ නැත්තේ? නමුත් සාමාන්‍ය ජනතාවට, පොඩි ජනතාවට බදු ගහනවා. IT ක්ෂේත්‍රයේ ඉන්න අයට බදු ගහනවා. IT industry එකට බදු ගහනවා. ඉතින් 2015 සිට 2023 දක්වා කාලයට ගෙවන්න තිබෙන මේ ඩොලර් 100 ප්‍රමාණයත් අය කර ගන්න තිබුණා. අදටත් අය කර ගන්න පුළුවන්. හැබැයි, ඒක අය කර ගන්න කිසිම උත්සාහයක් ගන්නේ නැතුව, ව්‍යාපාරිකයන්ට උදවු කරන ගමන් සාමාන්‍ය ජනතාව මත බදු පටවනවා විතරක් නොවෙයි, ඒකට විරුද්ධව කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මඩ ගහන එකත් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් හැටියට තිබෙනවා. 2023න් පස්සේ මේ අය කරන ගාස්තුව Sri Lankan පුරවැසියන්ට විතරක් ඩොලර් 50ට අඩු කරලා තිබෙනවා. නමුත් 2015-2023 දක්වා දේශීය විදේශීය දෙගොල්ලන්ටම ඩොලර් 100යි. 2023දී ඒ ආණ්ඩුව, ඒ අවස්ථාවේ ඒක ඩොලර් 50ට අඩු කළා. ඒ ප්‍රමාණය දේශීය පුද්ගලයන්ට පමණක් කියලා සීමා කළා. එහෙම සීමා කළාට පසුවත් ඒකෙන් කොච්චර ප්‍රමාණයක් අය කරගෙන තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙනවා. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා දෙකම ඉතාම බැරෑරුම් කාරණා දෙකක්.

ඒ වාගේම තමයි මේ පිළිබඳ තව සමාජීය ගැටලුවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, ඕනෑම පුද්ගලයෙක්ගෙන් යම් රටක් සඳහන් කරලා ඇහුවොත් -නිකම් අපි උදාහරණයක් විදියට තායිලන්තයේ පටායා ගත්තොත්- ඒ රට ගැන මොකක්ද ඔළුවට එන්නේ කියලා සියලුදෙනාම දන්නවා. ඒ රට මොකටද සුප්‍රකට කියලා පොඩි මතයක් හැදිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව මේ නෞකාවල සූදු ව්‍යාපාරයට දෙන අනුමැතියෙන් පසුව, එහෙම නැත්නම් නෞකා හා සංචාරක නෞකාවලට රට වටේට ගිහිල්ලා සූදු ව්‍යාපාරයේ යෙදෙන්නට දෙන අනුමැතියෙන් පසුව, දකුණු ආසියාවේ සූදු පොළක් බවට තමයි ඉදිරි අනාගතයේදී ශ්‍රී ලංකාව ලෝක සිතියමට එකතු වෙන්නේ. චීනයේ මැකාවු වාගේ ප්‍රදේශ ගත්තාම, මැකාවුවලට අද මොනවාද වෙලා තිබෙන්නේ? ඒ ගොල්ලන්ගේ heritage එක, history එක ඇතුළු ඒ සියලු දේම අද නැති වෙලා තිබෙනවා. අද මැකාවු කිව්වොත්, කැසිනෝ. ඒකෙන් රාජ්‍ය ආදායමක් එන්න පුළුවන්. හැබැයි, ඒ ප්‍රදේශයේ සමාජයීය ගැටලු, ඒ ප්‍රදේශයේ traditional history එක සම්බන්ධ ගැටලු ආදී වශයෙන් ගැටලු විශාල ප්‍රමාණයක් අද මැකාවුවල තිබෙනවා. ඕනෑම කෙනෙක් මැකාවු කියලා සොයා බලන්න, කැසිනෝ ආවාට පසුව ඒ කලාපයට ඇති වෙලා තිබෙන ගැටලු මොනවාද කියලා එතකොට බලා ගන්න පුළුවන්. අන්න ඒ තත්ත්වයට මේ රට පත් වෙයිද කියන සැකය මේ පනත් කෙටුම්පත සම්මතවීම හරහා තිබෙනවා. මට අදහා ගන්න බැහැ, මේ "නෞකා" කියන කැල්ල කොළේ වහලා තිබෙන්නේ ඇයි කියලා. මේක කාගේ හරි වුවමනාවකට කරනවාද, නැත්නම් වෙනත් රාජ්‍යයක වුවමනාවට කරනවාද, Colombo Port City එකේ වුවමනාවට කරනවාද? මේ වාගේ විශාල ගැටලු ප්‍රමාණයක් අපට ඇති වෙනවා. ඉතින් මම බලාපොරොත්තු වෙනවා, මේ ගැටලුවලට කවුරු හරි පිළිතුරක් ලබා දෙයි කියලා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය සතියේ තිබුණු හර්තාල් ව්‍යාපාරය පිළිබඳවත් මම අදහස් කිහිපයක් කියන්න ඕනෑ.

ඒ හර්තාල් ව්‍යාපාරය පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ඉන්න කණ්ඩායම්, ඒ හර්තාල් ව්‍යාපාරයට සහයෝගය ලබා දුන්නේ නැති යම් දේශපාලන පක්ෂ සහ විපක්ෂයේ ඉන්න කණ්ඩායම් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. Illankai Tamil Arasu Kachchi පක්ෂය, මේ හර්තාල් ව්‍යාපාරයට සහයෝගය දුන් Ceylon Workers' Congress එකට, Sri Lanka Muslim Congress එකට, ඒ වාගේම ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා, මනෝ ගනේසන් හිටපු ඇමතිතුමාගේ தமிழ் முற்போக்குக் கூட்டணி - Tamil Progressive Alliance, TPA - එකට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තමයි උතුර සහ නැඟෙනහිර තිබෙන හර්තාල් ව්‍යාපාරය සාර්ථක කර ගන්න සහයෝගය දුන් Illankai Tamil Arasu Kachchi පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි, ඒ දිස්ත්‍රික්කවල තිබෙන වෙළෙඳ සංගම්, ඒ දිස්ත්‍රික්කවල තිබෙන අනෙකුත් සංගම්, ප්‍රාදේශීය සභා සභාපතිවරුන් ඇතුළු සියලුදෙනාට මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හර්තාල් ව්‍යාපාරය ආරම්භ කරන්න ප්‍රධාන වශයෙන්ම අපි තීරණය කළේ මුලතිව් දිස්ත්‍රික්කයේ තරුණයෙකු ඝාතනයට පත් වීමත් සමඟ. ආරක්ෂක

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. සමාජ මාධ්‍ය මේ කාරණය විකෘති කරමින් යනවා. හැබැයි, අපි ස්තුතිවන්ත වෙනවා, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමාට. මොකද, පසුගිය ඉරිදා පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමාත්, හමුදා මාධ්‍ය ප්‍රකාශකතුමාත්, එතුමාත් සහභාගි වෙලා හදිසියේ මාධ්‍ය සාකච්ඡාවක් කැඳවලා, රටේ ජනතාවට ඒ සිදුවීම පිළිබඳ පැහැදිලි කිරීම ගැන. එතුමා ඒ පැහැදිලි කිරීම කරපු නිසා තමයි සඳුදා දවස ම හර්තාල් ව්‍යාපාරය කරනවා කියලා කිව්වත්, දවල් 12 වනකල් පමණක් කියලා අපේ පක්ෂයෙන් ඒ තීරණය වෙනස් කළේ. මොකද, මීට පෙර කවදාවත් සිදු නොවුණු ආකාරයට ආණ්ඩුව මැදිහත් වෙලා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා වෙච්ච දේ. ඒ මාධ්‍ය සාකච්ඡාව හොඳට බැලුවොත්, පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා, මේ පහර දීමට ලක් වෙලා මැරුණු පුද්ගලයාට හමුදාවේ යම් පිරිස් එක්ක යම් සම්බන්ධතා තිබිලා තිබෙනවා කියලා. හමුදාවේ පිරිස් එක්ක යම් සම්බන්ධතා තිබුණු නිසා ඒ දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා කියලා පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා කිව්වා. සමාජයේ මතයක් ගොඩ නඟන්න හදනවා, රෑ 11.30ට හතරපස් දෙනෙක් camp එක ඇතුළට බලහත්කාරයෙන් ඇතුළු වුණාම, එතැන පහර දීමක් සිදු වුණා කියලා. හැබැයි, හමුදා මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා, පහර දීමක් සිදු වුණේ නැහැ, ජනතාව කියපු නිසා එක පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්තා කියලා. ඉතින්, මේවා පරස්පර විරෝධියි. හැබැයි, ඒක ගැන මම වැඩිය කියන්නේ නැහැ. මොකද, අඩුම තරමින් ආණ්ඩුවෙන් මේ කාරණය පිළිබඳව press briefing එකක් හරි call කරපු නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන් පැන නැඟුණු විශාලම කාරණාව මේකයි. හමුදා මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා, camp එකට ආපු එක තරුණයෙක් පවුලේ කට්ටියට භාර දුන්නා කියලා. සමාජ මාධ්‍ය කියන විධියට camp එකට බලෙන් රෑ 11.30ට ඇතුළු වුණු පුද්ගලයා එක්කෝ පොලීසියට භාර දෙන්න ඕනෑ, එහෙම නැත්නම්, හමුදාවෙන් අත්අඩංගුවට ගන්න ක්‍රමයක් නීතිමය රාමුව තුළ කෙරෙන්න ඕනෑ. ඒ පුද්ගලයා ගෙදරට ගිහිල්ලා භාර දෙනවා කියන්නේ, මොකක්ද එතැන වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි? පැහැදිලි ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. පහර දීමට ලක් වනවා, ඒ පහර දීමට ලක් වනකොට, ඔව්, අපට පහර දුන්නා, අපි පැනලා ආවා කියලා අනෙක් තරුණයෝ කිව්වා. ඒ එක තරුණයෙකුගේ මළ සිරුර තමයි වැවකින් හමු වුණේ. මේ පිළිබඳ සමාජයීය ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා.

ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නවා, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපි හැම අවස්ථාවේ ම කියලා තිබෙන්නේ පිට්ටනියක් තිබෙනවා නම් camp එක ඇතුළේ, පාසලක් තිබෙනවා නම් camp එක ඇතුළේ, ජනතා අවශ්‍යතාවලට තිබෙන රජයේ ගොඩනැඟිල්ලක් camp එක ඇතුළේ තිබෙනවා නම් ඒ වාගේ buildings නිදහස් කරන්න කියලායි. අපි එහෙම ඉල්ලීම් කරලා තිබෙනවා. එහෙම නැතිව, එක camp එකක්වත් තියන්න එපා, ඔක්කොම අයින් කරන්න කියලා අපි කිසිම අවස්ථාවක කියලා නැහැ. නමුත්, සමාජ මාධ්‍ය තුළ අපට විරුද්ධ මතයක් ගොඩ නඟන්න හදනවා, මේ රාසමාණික්කම්ලා වාගේ අය ජාතිවාදීන් කියලා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හර්තාල් ව්‍යාපාරය අසාර්ථකයි කියලා කවුරු හෝ කියනවා නම් මතක තබා ගන්න ඕනෑ, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය තමයි මෙම හර්තාල් ව්‍යාපාරයට ආරාධනා කළේ කියලා. මමත් පිළිගන්නවා, උතුර සහ නැඟෙනහිර පළාත්වල තිබෙන දිස්ත්‍රික්ක අටේම සියයට සියයක් කඩ වැහුවේ නැහැ කියලා. සියයට 60ක්, 70ක් පමණ කඩ දවල් 12 වනකල් වහලා තිබුණා. මොකද, මේ ව්‍යාපාරය කඩාකප්පල් කරන්න ඕනෑය කියන යම් කණ්ඩායම් හිටියා. ජාතික ජන බලවේගයේ මඩකලපුව මහ නගර සභාවේ මන්ත්‍රීවරු ගිහිල්ලා වහලා තිබෙන කඩ විවෘත කරන්න කියලා එතැන ඉන්න අයට තර්ජනය කරලා, අපේ නගරාධිපතිතුමා එතැනින් යනකොට එයා නවත්තලා එයාට චෝදනා කරලා, ඒ වාගේ විශාල දේවල් වුණා. ඒ වාගේ දේවල් සාමාන්‍යයෙන් දේශපාලනයේ වෙනවා නේ. ආණ්ඩු පක්ෂය වුණාම, ආණ්ඩු පක්ෂයෙන් මේවා නවත්වන්න, කඩාකප්පල් කරන්න උත්සාහයක් ගන්නවා. ඒ ගැන අපි කියන්නේ නැහැ. හැබැයි, මතක තබා ගන්න ඕනෑ, මේක ඉතා සාර්ථක හර්තාල් ව්‍යාපාරයක් වුණේ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලනය කරන පක්ෂයක් නිසායි. අපට ගිහිල්ලා කාගේවත් කඩවල් බලෙන් වහන්න පුළුවන් තත්ත්වයක් නැහැ. හැබැයි, මේ හර්තාල් ව්‍යාපාරය අසාර්ථකයි කියලා ආණ්ඩු පක්ෂයේ කවුරු හරි කියනවා නම්, එහෙම නැත්නම්, දකුණේ ඉන්න මන්ත්‍රීවරයෙක් කියනවා නම්, මම අභියෝග කරනවා ඔයගොල්ලන්ගේ තනි පක්ෂයකට පුළුවන් නම් ලංකාවේ ඕනෑම දිස්ත්‍රික්කයක් අරගෙන ඒ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 10ක් වහලා පෙන්වන්න කියලා.

ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය තනි පක්ෂයක් වශයෙන් කළ ඉල්ලීම පරිදි උතුර සහ නැඟෙනහිර තිබෙන දිස්ත්‍රික්ක අටේම සියයට 60කට වැඩි ප්‍රදේශයක කඩ වහලා තිබුණා. යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය Town එකේ bazaar එක ඇරලා තිබුණා. අපි ඒක පිළිගන්නවා. යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු 6දෙනෙක් ඉන්නවා. ඒ 6දෙනාගෙන් එක්කෙනෙකුවත් හර්තාල් එකට support කරන්න කිව්වේ නැහැ. මේ හර්තාල් ව්‍යාපාරය අසාර්ථකයි කියලා කියන පුද්ගලයෙක් ඉන්නවා නම්, ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉල්ලීමට ජනතාවගේ සහයෝගය අරගෙන උතුර සහ නැඟෙනහිරින් පිට තිබෙන ඕනෑම දිස්ත්‍රික්කයක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් පුළුවන් නම් වහලා පෙන්වන්න. ඒ වාගේම තමයි උතුර සහ නැඟෙනහිර නියෝජනය කරන සමහර දෙමළ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ දෙමළ මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ හර්තාල් ව්‍යාපාරය අසාර්ථකයි කියලා කියනවා නම්, පුළුවන් නම් උතුර සහ නැඟෙනහිර තිබෙන එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හරි වහලා පෙන්වන්න කියලා. මේ හර්තාල් ව්‍යාපාරය තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ ආණ්ඩුව අස්ථාවර කරන්නවත්, ආණ්ඩුව ගෙදර යවන්නවත්, ආණ්ඩුව පෙරළන්නවත් නොවෙයි. අපේ සාධාරණ ඉල්ලීම්වලට මේ ආණ්ඩුව ඇහුම්කන් දෙන්න ඕනෑ කියන එක තමයි අපේ බලාපොරොත්තුව වුණේ. අපේ සාධාරණ ඉල්ලීම් මොනවාද කියලා බැලුවොත්, උතුර සහ නැඟෙනහිර සාමාන්‍ය ජන ජීවිතය ගත්තාම මම හිතන විධියට දකුණේ සිටින ඇමතිවරයෙකුගේ සාමාන්‍ය ජීවිතය පිළිබඳ අර්ථ කථනයයි, උතුරේ සිටින පුරවැසියෙකුගේ සාමාන්‍ය ජීවිතය පිළිබඳ අර්ථ කථනයයි වෙනස්. ඒ නිසා සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට ගෙන එන්න පුළුවන් විධියේ වාතාවරණයක් හදන්න. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ පරීක්ෂණ පටන් ගන්න. ජනතාවට අවශ්‍ය ඉඩම්වල තිබෙන හමුදා කඳවුරු ඉවත් කර ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, your time is up now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I am winding up now.

උතුර සහ නැඟෙනහිර තිබෙන ඉඩම් ගැටලු නිරාකරණය කරලා දෙන්න. පළාත් සභා මැතිවරණය පවත්වන්න. එහෙම

නැත්නම් සියලු ජනතාවගේ දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂා වෙන ආකාරයේ අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න. ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. මේවා අපි දුන් පොරොන්දු නොවෙයි. මේ, ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණු දේවල්. මම දැක්කා, සමහර මාධ්‍ය - එක් රජයේ මාධ්‍යයක් - එක දිස්ත්‍රික්කයක, එක ගමක කැල්ලක් අල්ලා ගෙන උතුරේ හර්තාල් අසාර්ථකයි කියලා උදේ නවය වෙද්දි news එකක් ප්‍රචාරය කළා. හැම තැනම ගිහිල්ලා බලන්න තිබුණා. යම් ප්‍රදේශවල මුස්ලිම් ව්‍යාපාරිකයෝත් ඒකට සහයෝගය දුන්නා, විශේෂයෙන් වාලච්චේන වාගේ ප්‍රදේශවල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පක්ෂයක් වශයෙන් සෑම අවස්ථාවකම මීට පෙර සිටි රජයන්ගෙනුත් මේ ඉල්ලීම් කළා. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙන්න කලින් අපේ පක්ෂයේ හිටපු නායකවරුනුත් එහෙමයි; හැම අවස්ථාවකදීම අපේ උත්සාහය වුණේ ආණ්ඩුවත් සමඟ වැඩ කරලා අපේ ගැටලු නිරාකරණය කර ගැනීම.

අපේ ගැටලු නිරාකරණය කරගත නොහැකි අවස්ථාවලදී තමයි මේ වාගේ විරෝධතා පාන්න අපට අවස්ථාවක් ඇති වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Anil Jayantha?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සූදු ක්‍රීඩාවේ අර්ථ කථනය පිළිබඳ පුංචි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

ඒ අර්ථ කථනය ඇතුළේ නෞකාවල කෙරෙන කැසිනෝවලට අනුමැතිය දුන්නේ ඇයි කියන කාරණාව ගත්තොත්, මෙතැන නෞකාව පමණක් නොවෙයි,- මොකද, අද සූදු ඔට්ටු යටතේ තාක්ෂණය ක්‍රියාත්මක වෙනකොට විශාල පරිචයක මේක ක්‍රියාත්මක වෙනවා. ඔබ සඳහන් කළ දේට අදාළ සූදු ක්‍රීඩා මොනවාද කියලා විශාල ප්‍රමාණයක් මේ list එකේ තිබෙනවා. ඔබතුමා ඒ ටිකත් කියවන්න. මෙයින් අදහස් කරන්නේ තෝරාගෙන කාටවත් ලයිසන් දෙනවා කියන එක නොවෙයි. සූදු ක්‍රීඩාව විශාල පරිචයක තිබෙනවා. දැනුත් එය නීතියට යටත් නැහැ. දැනට මේ නීතියෙන් ක්‍රියාත්මක වෙන්නේ දෙක තුනකට බදු එකතු කරගන්න එක විතරයි. මෙය නියාමනය කිරීම සඳහා අපි කරන්නේ ඇල්ලීමක් කළොත් මේ අධිකාරිය විසින් සොයා බලා ඒක උචිත නම් පමණයි. ආර්ථිකයට, සමාජයට, සංචාරක කර්මාන්තයට යන මේ සියල්ලට උචිත නම් පමණයි අවසර දෙන්නේ. එහෙම අවසර දුන්නාට පස්සේ අනිවාර්යයෙන් අපි නියාමනය සිදු කරනවා. එහෙම නැතිව මේ මඟින් ලයිසන් දීගෙන ඕනෑම දෙයක් කරන්න යනවා කියන එක කිසිම තැනක කියලා නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති, මේ වෙනකොට ලෝකයේ ඇති එක එක කොටස් වෙළෙඳ පොළවල්වල තිබෙන කොටස් ඉලක්ක කරගෙන ප්‍රධාන ස්ථානයක් වන ලෝක වෙළෙඳ පොළ හරහා සිද්ධ වෙන මේ වාගේ නීතියට අසු වෙන්නේ නැති shadow share markets ලංකාවේ තිබෙන බව. ඉතින්, අපි ඒවාටත් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නවා. මේ තුළින් පෙන්නුම් කරන කාරණය තමයි අපි නීතිය මඟින් නියාමනය කිරීමක් මිසක් නීති විරෝධී, සමාජ විරෝධී කටයුතුවලට අවසර දීම හෝ ලයිසන් දීම කිසි විධියකට සිද්ධ කරන්නේ නැහැ කියන එක.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, මම කිසි අවස්ථාවක ඔබතුමන්ලා සිදු කරන මේ නියාමනය පිළිබඳව ගැටලුවක් මතු කළේ නැහැ. මට වචන දෙකකින් උත්තරයක් දෙන්නකෝ.

මෙච්චර කල් නෞකාවල කෙරුණු කැසිනෝවලට ලංකාවේ ලයිසන් දීලා නැහැ. නෞකාවල කෙරෙන කැසිනෝවලට ලයිසන් දීලා නැහැ නේ. ගොඩබිමේ කෙරෙන කැසිනෝවලට දීලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත සම්මත වුණායින් පසුව නෞකාවල කෙරෙන කැසිනෝ එකකට අවශ්‍ය නම් පිට රට කොඩියකුත් එක්ක ඇවිල්ලා permit එකක් ගන්න පුළුවන්ද, බැරිද? ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමා දීර්ඝ විග්‍රහයක් කළොත් මට නැවත ප්‍රශ්නයක් අහන්න වනවා. එතකොට මෙය විවාදයක් බවට පත් වනවා. මෙපමණ කල් නෞකාවලට එහෙම දීලා නැහැ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
නෞකාවල විතරක් නොවෙයි, රට ඇතුළෙත් ලයිසන් නැතුව කැසිනෝ සූදුව කෙරෙනවා. ලයිසන් නැතුව ඕනෑ තරම් කැසිනෝ ව්‍යාප්ත වනවා. මෙම පනත් කෙටුම්පත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති නෞකා හිමියන්ට ඉඩකඩක් තිබෙනවා, ඉල්ලුම් කිරීම සඳහා. දෙනවාද, නැද්ද කියන එක අධිකාරිය තීරණය කරන්නේ මම කිව්ව කාරණා මත.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 10 minutes.

[පූ.භා. 11.53]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන සූදු ක්‍රීඩා නියමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ දී මම මුලින්ම කථා කරන්න කැමැතියි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරයකු කළ ප්‍රකාශයක් පිළිබඳව. එතුමා කිව්වා, එතුමාගේ ආගමෙන් තහනම් වුවත් සූදු ක්‍රීඩා නියාමනය කළ යුතුයි කියලා. ඒකට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපට අත ඔසවන්න සිදු වීම දිට්ඨධම්ම වේදනීය කර්මය පල දීමක් කියලා එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලාගේ ආණ්ඩු තිබුණා. හැබැයි, මේවා නියාමනය කර ගන්න එතුමන්ලාට බැරි වුණා. ඒකට පළමු පියවර අද අප තබනවා. කවදාවත් බලයට පත් වෙයි කියලා නොසිතපු NPP ආණ්ඩුවක් බලයට පත් වෙලා මේවා නියාමනය කරන්න හදනකොට ඒකට විරුද්ධව පාර්ලිමේන්තුවේ කථා කරන්න එතුමන්ලාට සිද්ධ වීම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිට්ඨ ධම්මවේදනීය කර්මය පල දීම කියන්නේ.

[ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය]

එතුමා නෞකාවල කෙරෙන කැසිනෝ සම්බන්ධයෙන් කියපු නිසා මම එයටත් උත්තරයක් දීලාම මගේ කථාව පටන් ගන්නම්. ගරු මන්ත්‍රීතුමා නොදන්නවා වුණාට ලංකාව වටේම තිබෙන නෞකාවල කැසිනෝ ක්‍රීඩාව කෙරෙනවා. ඒ වාගේම ලංකාව තුළත් කැසිනෝ ක්‍රීඩාව කෙරෙනවා. හැබැයි කෙරෙන්නේ, regulation එකක් නැතුව. එහෙම නැතුව මෙම පනත නිසා අලුතින් නෞකා එන්නේ නැහැ. දැනටත් නෞකා එනවා. Regulate කරන එක තමයි අපි කරන්නේ; නියාමනය කිරීම තමයි අපි මෙම පනතෙන් හඳුන්වා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන මම ටිකක් පැහැදිලි කරන්න හිතුවා. මොකද, මෙම පනත් කෙටුම්පත සහ එහි ඉතිහාසය සම්බන්ධයෙන් ටිකක් අඩු අවධානයක් තමයි යොමු වුණේ. ජනතාවගේ දැන ගැනීම පිණිස ටිකක් විස්තර කිරීම අවශ්‍යයි කියලා මම හිතුවා. විශේෂයෙන් සූදු ක්‍රීඩාව විවිධාකාරයෙන් ක්‍රියාත්මක වුණු රටක් තමයි ලංකාව. සූදු ක්‍රීඩාව යටත් විජිත යුගයේත් තිබුණා. 1844දී ලොතරැයි ආඥා පනත ගෙනාවා. 1845දී එංගලන්තයෙන් ආපු සූදු පනත තිබුණා; 1889දී ඒක ක්‍රියාත්මක වුණා. 1935 සීට්ටු ආඥා පනත, තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥා පනත හා 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත වාගේ පනත් විශාල ප්‍රමාණයක් තිබීමෙන්ම පෙනී යන්නේ යටත් විජිත යුගයේ සහ ඉන් අනතුරුවත් ලංකාවේ සූදු ක්‍රීඩාව විවිධාකාරයෙන් ක්‍රියාත්මක වුණු බවයි. කැසිනෝ කියන්නේ, සූදු ක්‍රීඩාවල එක් විශේෂයක් පමණයි. කැසිනෝ වැඩිපුරම ලංකාවේ promote වුණා නම්, promote වුණේ ඇත්තටම 1977දී ගෙනා විවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් පසුවයි. විවෘත ආර්ථිකය කියන්නේ, ලංකාව දියුණුවේ හිණි පෙත්තටම ඔසවා තැබූ එකක් කියලා උත්කර්ෂයට නඟපු එක් මන්ත්‍රීතුමෙකුට මම උත්තර දෙන්න කැමැතියි. ඇත්තටම විවෘත ආර්ථික ප්‍රතිපත්තිය කියන්නේ, නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් විතරක් නොවෙයි. විවෘත ආර්ථික ක්‍රමය විසින් ලංකාවේ සමාජ, දේශපාලන සහ සංස්කෘතික දේහය බිඳ වට්ටලා, ලංකාවේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වට්ටලා, දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ ව්‍යවසායකයන් බිඳ වට්ටලා, මිනිසුන්ගේ අයිතිවාසිකම් වාගේම ජීවිත බිඳ වට්ටලා, විශේෂයෙන් කාන්තාවන් සහ අයිතිවාසිකම් අහිමි කොටස් තවදුරටත් අයිතිවාසිකම් අහිමි වුවන් බවට පත් කරලා, රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවීම බිඳ වට්ටලා, 2022දී ලංකාව බංකොලොත්භාවයට පත් කරලා තිබුණා. එවැනි අවස්ථාවක රට පවතිද්දී තමයි 2024දී අපි ආණ්ඩුව භාර ගන්නේ.

මගේ දැනුමේ හැටියට ලංකාවේ මේ වනකොට ප්‍රධාන කැසිනෝ ව්‍යාපාර හයක් වාගේ ප්‍රමාණයක් ක්‍රියාත්මක වනවා. එම ව්‍යාපාර මේ තාක් කල් ලංකාවට ගෙවන්න ඕනෑ බදු ටික ගෙවලා නැහැ. ඒ වාගේම ලංකාව ඇතුළේ මුදල් ලංකාවෙන් පිටතට අරගෙන යනවා. විශාල ප්‍රමාණයක් online casinos ක්‍රියාත්මක වනවා. මේවා අලුතෙන් අපි ලංකාවට හඳුන්වා දෙන දේවල් නොවෙයි. දැනටත් ලංකාවේ විශාල වශයෙන් කැසිනෝ ක්‍රියාත්මක වනවා. හැබැයි, ලංකාවේ ඒවා ක්‍රියාත්මක වීමේ නිසි ක්‍රමවේදයක් නොමැතිකම නිසා ආණ්ඩුවට ආදායම් අහිමි කරවන යන්ත්‍රණ බවට පත් වෙලා තිබෙනවා. එම නිසා තමයි යන්ත්‍රණයක් ගෙනැල්ලා මේවා නියාමනය කරන්න අවශ්‍ය වන්නේ. 2010, 2011 වසරවල තමයි විශේෂයෙන්ම සූදු ක්‍රීඩා නියාමනය සම්බන්ධව discussions පටන් ගන්නේ.

මොකද, යුද්ධය අවසන් වූ 2009 වසරෙන් පසු ගොඩක් වෙලාවට අලුතින් කැසිනෝශාලා විවෘත කරන්න බලපත්‍ර දීම සහ අලුත් කැසිනෝ ව්‍යාපාර සම්බන්ධ සාකච්ඡා වැඩි වුණා. මට මතක විධියට 2013දීත් මේ සඳහා කෙටුම්පතක් - draft Bill එකක් - ඉදිරිපත් වුණා. හැබැයි, විවිධ කාරණා නිසා ඒ කෙටුම්පත සම්මත කරගන්න එවක පැවති ආණ්ඩුවට බැරි වුණා. ඊට පස්සේ 2022දීත් නැවත වතාවක් මෙවැන්නක් ඉදිරිපත් වුණා.

මෙහිදී, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ යටතේ පිටු අංක 03හි සඳහන්ව ඇති කොටසක් මම කියවන්න කැමැතියි. එහි සඳහන් වනවා, "මුදල් කාරක සභාව 2022 නොවැම්බර් 24 දින නිශ්චිත සූදු නියාමන අධිකාරියක් පිහිටුවන ලෙස මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත නියෝග කළා" යනුවෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි කියා තිබෙන්නේ සූදු නියාමන අධිකාරියක් පිහිටුවන ලෙසයි. ඒ වාගේම "ප්‍රමාණවත් නොවන යෝජනා ප්‍රතික්ෂේප කරමින්, කෙටි කාලීන කාල රාමු නිර්දේශ ඉල්ලා සිටිමින් සහ අන්තර්ජාතික හොඳම භාවිතයන් සමඟ විශේෂයෙන්ම සූදු නියාමන අධිකාරිය සඳහා සිංගප්පූරු ආකෘතියට සමාන ආකෘතියක අවශ්‍යතාව අවධාරණය කරමින් මෙම ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නැවත නැවත මැදිහත් වුණි." යනුවෙනුත් එහි සඳහන් වනවා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා මුදල් කාරක සභාවේදී ඔය යෝජනා, එතුමාගේ තිබෙන concerns ටික ගෙනාවා නම් මම කැමැතියි. මොකද, එතුමා ඒකට සහභාගි වුණේවත් නැහැ, අද පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළාට. මුදල් කාරක සභාවේදී මේ අදහස් දැක්වීම් ඉදිරිපත් වුණේ නැහැ. නමුත් මම කියන්න ඕනෑ, මුදල් කාරක සභාවේදී දීර්ඝ වශයෙන් මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩුලුහුඬුකම් සහ එහි තිබෙන ප්‍රගතිශීලී - progressive - තැන් ඉස්මතු වුණු බව. මොකද, මුදල් කාරක සභාව දිගින් දිගටම හිටියේ සහ තවදුරටත් ඉන්නේ කැසිනෝ ඇතුළු මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වන සූදු සහ ක්‍රීඩා නියාමනය කළ යුතුයි කියන මතයේ. ඒ නිසා මේක ඊයේ පෙරේදා ආපු සංවාදයක් නොවෙයි. මේක බොහෝ කාලයක් තිස්සේ දැඩි සමාජයීය අවශ්‍යතාවක් ලෙස පැන නැඟුණු දෙයක්. මේකෙන් යම් ආකාරයකට ආදායමක් උපයනවා තමයි. නමුත්, මහ බැංකුවේ 2022 වර්ෂයට අදාළ වාර්තා අනුව ලොතරැයි ආදායම ඇතුළුව රුපියල් බිලියන 12.88ක් විතරයි ආදායම විධියට ලැබුණේ. හැබැයි අපි ඇත්තටම දන්නවා, ලංකාවේ ක්‍රියාත්මක වන කැසිනෝශාලා ප්‍රමාණය ගත්තොත්, මීට වඩා විශාල ආදායමක් ලැබෙන්න ඕනෑ බව. විශේෂයෙන් බලපත්‍ර ලබා දීමේ ක්‍රමයේ තිබෙන අඩුපාඩු සහ එහි ආදායම මනින්න ක්‍රමයක් නැති වීම නිසා මේ ආදායම අපට අහිමි වනවා. 2024 ජනවාරි 14 "The Sunday Times" පුවත් පත වාර්තා කරනවා, දිවයිනේ තිබෙන කැසිනෝශාලාවලින් රජයට ගෙවිය යුතුව ඩොලර් මිලියන 7.4ක හිඟ මුදලක් පවතිනවා කියලා මුදල් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවක් තිබෙනවා කියලා. ඇත්තටම "The Sunday Times" පුවත් පත දක්වන්නේ නැහැ, එහි මූලාශ්‍රය. නමුත්, ඒ පුවත් පත් වාර්තාවේ එහෙම තිබෙනවා.

මේ නියාමනය සිදු කරන දකුණු ආසියානු රටවලින් එකක් තමයි, ලංකාව. නේපාලයේත් මේ සම්බන්ධව යම් නියාමනයක් තිබෙනවා. අර කිව්වා වාගේ සිංගප්පූරුවේ තිබෙන නියාමන ක්‍රමවේදය ඇසුරින් තමයි ලංකාවේ මේ නියාමන පනත් කෙටුම්පත නිර්මාණය වෙන්නේ. දුර්වල නියාමනයක් නිසා ඇත්තටම ලංකාවට අහිමි වන බදු ප්‍රමාණය විශාලයි. විශේෂයෙන් මේ පනත් කෙටුම්පතේ 3වන වගන්තියේ දක්වන "පනතේ අරමුණු" මම නැවතත් අවධාරණය කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද සමාජයේ මතයක් හදන්න උත්සාහ කරනවා, අපි දැන් මේ පනත් කෙටුම්පතින් කැසිනෝ promote කරන්න යනවා කියලා. හැබැයි, ඇත්තටම වෙන්නේ

මොකක්ද? මෙහි අරමුණු රාශියක් තිබෙනවා. ඒවායින් කිහිපයක් මම තෝරාගත්තා, මේ ගරු පාර්ලිමේන්තුවේ කියවන්න.

ඒවා මෙසේයි, "3.(අ) සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම; (ආ) සූදු ක්‍රීඩාවලට අදාළ ආදායම් එකතු කිරීම සහතික කිරීම; (ඇ) සූදු ක්‍රීඩා පවත්වාගෙන යාමේ දී ඒවායෙහි විනිවිදභාවය සහ යහපාලනය පිළිබඳව සහතික කිරීම; (එ) සූදු ක්‍රීඩාවෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා වගකීම් සහගත සූදු ක්‍රීඩා අභිවර්ධනය කිරීම; (ඒ) සූදු ක්‍රීඩාවලට අදාළ නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම; (ඔ) සූදු ක්‍රීඩාව හා සම්බන්ධ සමාජ හානිය අවම කිරීම; (ක) සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් හෝ සූදු ක්‍රීඩාව හා සම්බන්ධ ක්‍රියාකාරකම්, අපරාධ මඟින් උපයාගත් මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම;"

ඒ අනුව අපට පැහැදිලියි, මේ අධිකාරියේ අවශ්‍යතාව. මෙතැන තිබෙන්නේ ඇත්තටම සූදු ක්‍රීඩාවට, ඒ කියන්නේ කැසිනෝවලට යන්න මිනිස්සුන්ව promote කරන එක නොවෙයි, දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින නියාමනය නොවූ, තමන්ට කැමැති කැමැති විධියට හිතුමතේට ක්‍රියාත්මක වන, දේශපාලන බලය, ශක්තිය සහ මුදල් හයිය මත ක්‍රියාත්මක වන කිසියම් ආකාරයක වෙළෙඳ පොළක් නියාමනය කර ඒකෙන් ලැබිය යුතු ආදායම අරගන්න එකයි.

ඇත්තටම කිව්වොත්, මේ අධිකාරිය පිහිටුවන්නේ ඉදිරි රෙගුලාසි හදන්නයි. මෙතැනදී කලින් කථා කළ මන්ත්‍රීවරුන් මතයක් ඉදිරිපත් කළා, මේ අධිකාරියට අමාත්‍යවරයාගේ පත් කිරීමක් තිබෙන නිසා මේක ස්වාධීන වෙන්නේ නැහැ කියලා. නමුත් අධිකාරියක් කියන එකට ලංකාවේ තිබෙන නීතිමය අර්ථ නිරූපණයට අනුව අධිකාරියක සිටින කළමනාකරණ මණ්ඩලයට නියෝජිතයන් පත් කිරීමේ හැකියාව අමාත්‍යවරයා සතුව පවතිනවා. මේවාට රජයේ මැදිහත්වීමක් තිබිය යුතුයි කියන ප්‍රතිපත්තිය තුළ අපේ රජය දිගටම ඉන්නවා. මොකද අපි දන්නවා, සමහර පෞද්ගලික ආයතන, විශේෂයෙන්ම කැසිනෝ ව්‍යාපාරික ආයතන කැමැති නැහැ, රජයේ මැදිහත්වීමක් වෙනවාට. මොකද, මේ පනතින් අපි පැහැදිලිව කියනවා, ලබා ගන්නා ආදායම්, එහෙම නැත්නම් දිනන ඔට්ටු මුදල් සියල්ල වාර්තා කළ යුතුයි කියලා. නමුත් අපි දන්නේ නැහැ, මේකට විරුද්ධ වන සමහර අය කැසිනෝ ව්‍යාපාරවල බලපෑම නිසා වෙනත් දේවල් කියනවාද කියලා. නමුත්, මේ සඳහා රජයේ මැදිහත්වීමක් ඕනෑ. කලින් කථා කළ මන්ත්‍රීතුමා කියපු විධියට දැනට නෞකාවලත් කැසිනෝ තිබෙනවා. සමහර ඒවායේ permanent casinos තිබෙනවා. සමහර ඒවායේ Casino Nights කියලා *ad hoc* casinos තිබෙනවා. ඒවා කොහේවත් නියාමනය වෙන්නේ නැහැ. ඒවායෙන් ලැබිය යුතු ආදායම්, බදු මුදල් නිසි ලෙස ලැබෙන්නේත් නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඒවා නියාමනයේදී රාජ්‍යයේ මැදිහත්වීම තිබීම හොඳ දෙයක් විධියට.

ඒ වාගේම මාර්ගගත සූදු ක්‍රීඩා ගැන සඳහන් කිරීමේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද වෙනකොට එය menace එකක් බවට පත් වෙලා තිබෙන බව. අද හැම තැනකම වාගේ online සූදු ක්‍රීඩා කෙරෙනවා. මේකේ ප්‍රායෝගික ගැටලු තිබෙන්න පුළුවන්. අපි දන්නවා, සමහර online සූදු ක්‍රීඩා නියාමනය කරන්න ගියාම ප්‍රායෝගිකව ප්‍රශ්න මතු වන බව. නමුත් මෙම පනතේ 76 වගන්තිය තුළ ඒ සඳහා වන රෙගුලාසි සෑදීමේ බලයක් මේ අධිකාරියට ලබා දීලා තිබෙනවා. ඒ කියන්නේ මේක අවසාන රෙගුලාසිය හෝ එක රෙගුලාසියක් පමණක් නොවෙයි. මොකද, ක්‍රීඩා කියන කාරණයේදී එක එක විධියේ අලුත් ක්‍රීඩා එනවා. මේ online gaming කියන එකේදී එක එක විධියේ ඒවා එනවා. එතකොට, එක එක විධියට එන ක්‍රීඩාවලට ප්‍රතිචාර දක්වමින් අවශ්‍ය රෙගුලාසි හැදීමේ පුළුල් බලයක් 76වන වගන්තියෙන් මෙම අධිකාරියට ලබා දීලා තිබෙන නිසා, නව වැරදි අර්ථ නිරූපණය කරන්නත්, ඒ වාගේම මේකට අදාළ වෙනත් විවිධ නීති සහ රෙගුලාසි සංශෝධනය කරන්නත් හැකියාව තිබෙනවා.

ඊළඟට, මම මේ පනතේ 29වන වගන්තියට අවධානය යොමු කරනවා. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, දේශීය ආදායම් පනත සහ විදේශ විනිමය පනත කියන පනත් ටික සඳහන් කරමින් එම වගන්තියේ කියා තිබෙනවා, ඒ පනත් යටතේ පවතින නීති උල්ලංඝනය කරමින් වරදක් කරන යම් ආයතනයක බලපත්‍රය අත්හිටුවීමේ බලය මේ අධිකාරියට තිබෙන බව. එතකොට මේක තනි පනතක් නොවෙයි. මේක අනෙකුත් පනත් සමඟ ක්‍රියාත්මක වෙන එකක්. සමහර විට අපට අවශ්‍ය වෙන්න පුළුවන්, යම් යම් පනත් අතර ගැටුම් මතු වුණොත් ඒවා සංශෝධනය කිරීමේ රෙගුලාසි. එම රෙගුලාසි පැනවීමේ බලයත් මේ අධිකාරියට තිබෙනවා. ඒ නිසා නියාමනය නොවී පවතින කළු සල්ලි සුදු කිරීමට - මුදල් විශුද්ධිකරණයට - පාවිච්චි කරන කිසියම් වෙළෙඳ අධිකාරියක් නියාමනය යටතට පත් කර එහි නිසි ආදායම් ගැනීම සහ එය අධීක්ෂණය කිරීම - monitor කිරීම - සඳහාත් මෙම අධිකාරියට නිශ්චිත බලයක් ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kaushalya Ariyarathne, your time is up.

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
Hon. Deputy Speaker, I will wind up.

මම පැහැදිලිව කියන්න කැමැතියි, නව රෙගුලාසි සෑදීමේදී ඉස්සරහට ගොඩක් දේවල් කරන්න තිබෙන බව. ඒ කියන්නේ විශේෂයෙන්ම junket operations වාගේ දේවල් පිළිබඳව.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, මෙය සමාජය සහ විපක්ෂයේ දැනට ඉන්න -එවකට ආණ්ඩු කරපු- අය පවා දිගින් දිගටම ඉල්ලා සිටි, නමුත් කරගන්න බැරි වුණු අත්‍යවශ්‍ය නීති සම්පාදනයක් බව. ඒ නිසා මේකට සහාය දක්වන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. S.M. Marikkar. You have 12 minutes.

[අ.භා. 12.07]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජය මේ ආණ්ඩුව භාර ගන්න කලින් කිව්වේ, අපේ රටට ගෙවන්න බැරි සමස්ත ණය ප්‍රමාණය ඩොලර් බිලියන 41යි, ඒක සොච්චමක් කියලායි. ඩොලර් බිලියන 41ක් කියන්නේ සොච්චමක් කියලා තමයි කිව්වේ. අපි දන්නේ නැහැ, ආණ්ඩුව භාර ගත්තාට පස්සේ ඒ ණය ගෙවා තිබෙනවාද කියලා. නමුත් මාර්තු මාසයේ 31වැනි දා වන විට අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය ඩොලර් බිලියන

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

106කට ආසන්න ප්‍රමාණයකට වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය ණය ප්‍රමාණය ඩොලර් මිලියන 102,671කුත්, රාජ්‍ය ව්‍යාපාරවලින් - SOEsවලින් - අරගෙන තිබෙන ප්‍රමාණය ඩොලර් මිලියන 4,831කුත් වශයෙන් ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

එතකොට "සොච්චම ගෙවන එක ප්‍රශ්නයක් නැහැ" කියපු රජයක් ආවාට පස්සේ මේ තරම් ණය ගන්නේ මොකද කියන එක තමයි අපට පැහැදිලි නැත්තේ. මොකද, ණය අරගෙන කරන මහා පරිමාණයේ සංවර්ධන වැඩසටහන් තවම අපට දකින්නට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම රාජ්‍ය ආයතන ලාභ ලබන ආකාරයක් අපට ලොකුවට පෙනෙන්නත් නැහැ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, වර්තමාන රජය මේ පාඩු ලබන රාජ්‍ය ආයතන පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න ඕනෑ බව. විශේෂයෙන්ම පසුගිය දශක තුනක කාලය තුළ පාඩු ලබන රාජ්‍ය ආයතන ඩොලර් මිලියන 4,831ක් ණය අරගෙන තිබෙනවා. ඒ, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඩොලර් මිලියන 1,025ක්, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ඩොලර් මිලියන 800ක්, ශ්‍රීලන්කන් ගුවන් සේවය ඩොලර් මිලියන 502ක්, ලංකා විදුලිබල මණ්ඩලය ඩොලර් මිලියන 409ක්, Airport and Aviation Services (Sri Lanka) (Private) Limited ඩොලර් මිලියන 221ක්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඩොලර් මිලියන 30ක් ආදී වශයෙන්. මේ ආකාරයට ලබා ගත්ත ණය එක්ක අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන ගැටලුව අපට තිබෙනවා. ඒ නිසා වර්තමාන රජයේ ප්‍රතිපත්තිය කුමක්ද? මේ පාඩු ලබන රාජ්‍ය ආයතන තවදුරටත් පාඩු ලබමින් පවත්වා ගෙන යනවාද, එහෙම නැත්නම් ඒවා පෞද්ගලීකරණය කරනවාද, එහෙමත් නැත්නම් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයට ගෙනැල්ලා ඒ පාඩුව අවම කරලා ඒ බර රජය නොගන්නවාද?

විශේෂයෙන්ම ජනාධිපතිතුමා කිව්වා, රාජ්‍ය සේවකයෝ තව 60,000ක් බඳවා ගන්න යනවා කියලා. සමහර අත්‍යවශ්‍ය ආයතනවලට බඳවා ගන්න ඕනෑ අය ඇති. නමුත්, සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගත්තාම වසමකට ග්‍රාම නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, සමෘද්ධි නිලධාරි වාගේම කෘෂිකර්ම නිලධාරි ඉන්නවා. ඔවුන් කරන කාර්යභාරය පිළිබඳව වාගේම, ඔවුන්ට දවසකට, සතියකට, මාසයකට කරන්න තිබෙන වැඩ ප්‍රමාණය පිළිබඳව අපි නිවැරදි වාර්තාවක් ලබා ගන්න ඕනෑ. එහෙම නිවැරදි වාර්තාවක් අරගෙන වර්තමාන රාජ්‍ය සේවයේ ඉන්න උදවිය අත්‍යවශ්‍ය තැන්වලට ආදේශ කිරීමේ හැකියාව තිබෙනවා නම් අපට තවදුරටත් රජය විසින් පඩි ගෙවමින් නඩත්තු කරන ප්‍රමාණය වැඩි කිරීමේ අවශ්‍යතාවක් මතු වෙන්නේ නැහැ.

අපි පැහැදිලිව කියන්න ඕනෑ, පසුගිය දශක තුනක කාලය තුළ මේ පාඩු ලබන රාජ්‍ය ආයතන නඩත්තු කරන්න අරගෙන තිබෙන ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන අටක් කියන එක. මේ රාජ්‍ය ආයතන අරගෙන තිබෙන රුපියල් ට්‍රිලියන අටක ණය ප්‍රමාණය, අපේ රට 2022දී බංකොලොත් වෙන්න ඔන්න මෙන්න කියා තිබෙන මොහොත දක්වා ගත්ත සමස්ත විදේශ ණය ප්‍රමාණයට හරියටම සමාන වෙනවා. ඒ නිසා මේ පිළිබඳව තීරණාත්මකව කල්පනා කරලා බලන්න රජයට සිද්ධ වෙනවා. මොකද, මේ විධියට ගියොත් තව ණය බර වැඩි වෙනවා. එතකොට ආණ්ඩුව කියන විධියට 2027දී ණය ගෙවන්න පටන් ගන්නා විට ශක්තිමත් ආර්ථිකයක් හදන්න පුළුවන්ද කියන ප්‍රශ්නය එනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් ශ්‍රී ලංකාව පිළිබඳව නව වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ තිබෙනවා, සමස්ත ආදායමින් සියයට 60ක් ණය පොලී ගෙවීමට වෙන් කිරීමට සිදුවීමත්, සියයට 20ක ට්‍රම්ප් පැනවූ බද්ද පෙර පැනවූ සියයට 44ට සාපේක්ෂව අඩු වුවත්, ඇඟලුම් කර්මාන්තයට සැලකිය යුතු බලපෑමක් සිදුවීමත්, එය අපේක්ෂිත ආර්ථික වර්ධනයට බාධාවක් බව. කුහකකමින් ඔබ්බට ගිහිල්ලා අපි සතුටු වෙනවා, සියයට 44ක බද්ද සියයට 20 දක්වා අඩු කර ගැනීම ගැන. ඒ ගැන ගැටලුවක් නැහැ. නමුත්, තරගකාරී වෙළෙඳ පොළක් තුළ අපට දැනට තිබෙන ආදායම එම ආකාරයෙන්ම ලබා ගන්න පුළුවන්ද, බැරිද කියන එක ගැන රජය පුරෝකථනයක් කරලා, මේ පාර්ලිමේන්තුවට හා රටට දැනුම් දෙන්න ඕනෑ. මට හිතෙන විධියට ඉන්දියාව හැර කලාපයේ අනෙක් රටවල් එක්ක බැලුවාම අපට ලොකු තරගයක් දීලා ආදායම වැඩි කර ගන්න පුළුවන්කමක් තිබෙනවාය කියන එක හිතා ගන්න අමාරුයි.

අනෙක් කාරණය මේකයි. මේ ණය ගෙවන කාලය වෙනකොට ණය ගෙවීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා ආර්ථිකය ශක්තිමත් කරලා, ආදායම් මාර්ග වැඩි කරන එක ගැන රජය හරියට කියන්න ඕනෑ. නමුත්, ඒ එකක්වත් කියන්නේ නැහැ. මේ දක්වා ආපු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය කොච්චරද, ඒවායින් පටන් ගත්ත ව්‍යාපෘති මොනවාද, රැකියා අවස්ථා කොච්චර බිහි වෙලා තිබෙනවාද, ඒ හරහා නිෂ්පාදනය කොච්චර වැඩි වෙනවාද, ඒකෙන් ප්‍රතිඅපනයනය කොච්චර වැඩි වෙනවාද කියන කරුණු පාර්ලිමේන්තුවට තවම හෙළිදරව් කරලා නැහැ. සන්දර්ශනවලින් අපට යන්න පුළුවන්. නමුත් ඇත්තටම ණය ගෙවන වේලාව ආවාම, ඒ ණය ගෙවා ගන්න බැරි වුණොත් තමයි ප්‍රශ්නයක් ඇති වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, ඊයේ හෝ පෙරේදා සංචාරකයෝ මෙච්චර ප්‍රමාණයක් ආවා කියලා SMS alert එකක් එනවා. හැබැයි, ඒ විධියට ආපු එක සංචාරකයෙක් වියදම් කරන ගණන කොච්චරද කියලා බලන්න. අපි දැක්කා, බැසිල් රාජපක්ෂ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ ඇමති විධියට හිටපු කාලයේදීත් ඔය වාගේ SMS alerts දවස්පතා එවනවා, ඉතිහාසයේ වැඩිම ගණන ආවා, මේ දක්වා වැඩිම ගණන ආවා කියලා. හැබැයි, ඒ සංචාරකයන්ගේ මුදල් වියදම් කරවීම සඳහා රජය අරගෙන තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

අඩුම ගානේ කොළඹට එන සංචාරකයන් හරියට දෙහිවල සත්තු වත්ත බලන්නවත් යන්නේ නැහැ. සිංගප්පූරුව ගත්තොත්, සිංගප්පූරුවේ Night Safari එකක් බලන්න හතරදෙනෙක් ගියොත් රුපියල් 60,000ක් ගෙවන්න ඕනෑ. අපි අය කරන ගණන කීයද? අපට ආදායම් වැඩි කරන්න බැරි ඇයි? ඒ පහසුකම් සලසා නැතිකම සහ ඒ පිළිබඳව වැඩ පිළිවෙළක් හදලා නැතිකම නිසා. කොළඹ හෝටල් කීයක brochures තියලා තිබෙනවාද? ටැක්සි පදවන කී දෙනෙකුට දැනුවත්වීමක් තිබෙනවාද, සංචාරකයන් කොළඹ guide කරන්න ඕනෑ තැන් මොනවාද කියන කාරණය ගැන. ඒ නිසා අපි මේ අවස්ථාවේදී රජයෙන් ඉල්ලීමක් කරනවා. සංචාරකයන් අපේ රටට එන ප්‍රමාණය වැඩි කරන එක හොඳයි. ඒ එක්කම ලංකාවට එන සංචාරකයන් ලවා තව වැඩිපුර මුදල් වියදම් කරවීමට අවශ්‍ය කටයුතු හදන්න කියන එක අපි පැහැදිලිව කියන්න කැමතියි.

ඒ වාගේම දැන් ලාභ ලබන රාජ්‍ය ආයතන ගණනාවකුත් තිබෙනවා. මේ අවස්ථාවේදී අපේ සභානායකතුමා මෙතැන ඉන්න නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් මිලියන 40ක් ලාභ ලැබුවාම ඒගොල්ලන්ට බොහොම සතුටුයි. රුපියල් මිලියන 40ක් ලාභ ලැබුවාම බොහොම සතුටුයි. ඇත්තටම වරාය අධිකාරියේ තිබෙන වත්කම් ප්‍රමාණයයි, ඉන්න සේවක සංඛ්‍යාවයි, සිදු වන මෙහෙයුම් ප්‍රමාණයයි එක්ක බැලුවාම මේක feasibleද?

අනෙක් කාරණය මේකයි. වරාය අධිකාරිය රුපියල් මිලියන 40ක් ලාභයි කියලා පෙන්වන්නේ කොළඹ වරායෙන් ලබන

ලාභයයි, ත්‍රිකුණාමලය වරායෙන් ලබන ඉතා කුඩා ලාභයයි එක්ක. හැබැයි, ගාලු වරාය පාඩු ලබනවා. පාඩු ලබන ගාලු වරාය break even කරන්නවත් තවම සැලැස්මක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට නැහැ. කන්කසන්තුරේ වරාය දියුණු කිරීම සඳහා ඉන්දියාව offer කරලා තිබෙන grant එක ගැන රජය ගන්නා පියවර මොකක්ද? ඒ හරහා දකුණු ඉන්දියානු වෙළෙඳ පොළ අල්ලා ගැනීම සඳහා තිබෙන opportunity එක පාවිච්චි කරනවාද, නැද්ද කියන එක පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරන්න. මම දන්නා තරමින් පසුගිය ආණ්ඩුව නම් ඒ grant එක ගන්න කැබිනට් අනුමැතියක් අරගෙන තිබුණා. ලබන මාසයේ 21වැනි දාට ජනාධිපතිතුමා පත් වෙලා අවුරුද්දක් වෙනවා. එතකොට මේ ගෙවුණු අවුරුද්දක කාලය තුළ ඒ සඳහා ගත්ත ප්‍රතිපත්තිමය තීරණය මොකක්ද කියන එක අපි පැහැදිලිව විමසන්න කැමැතියි. මොකද, කවුරු කොහොම කිව්වත්, ඔබතුමන්ලා ආණ්ඩු කළත්, අපි ආණ්ඩු කළත් - කවුරු ආණ්ඩු කළත් - පාඩු ලබන රාජ්‍ය ආයතනවල පාඩුව අවම කිරීමත්, ලාභ ලබන රාජ්‍ය ආයතනවල ලාභය වැඩි කිරීමත්, අලුත් ආදායම් මාර්ග උත්පාදනය කිරීමත් මේ රටට අත්‍යවශ්‍ය වෙනවා. ඒ විධියට වැඩකටයුතු සිදු වුණොත්, එහෙම ආදායම් වැඩි වුණොත් තමයි, අපට අනිවාර්යයෙන් ණය ගෙවීමේ හැකියාව වර්ධනය කරගෙන බංකොලොත්භාවයකට පත් නොවී ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා අපි මේ කාරණය පැහැදිලිව කියන්න කැමතියි. මෙතැනට ඇවිල්ලා දේශපාලනය කරන්න, දේශපාලන කථා කියන්න, යූටියුබ් එකේ දමන්න, සන්දර්ශන දමන්න, media shows දමන්න. නමුත්, යථාර්ථය අවබෝධ කරගෙන ඇත්තටම ආර්ථිකය වර්ධනය කරලා, ආදායම් මාර්ග වැඩි කිරීම සඳහා ගන්නා වූ පියවර අඩුම ගානේ මේ පාර්ලිමේන්තුවට ලබා දෙන්න කියලා අපි ඉල්ලන්න කැමතියි.

මේ ගෙවුණු මාස 11ක කාලය තුළ ජනාධිපතිතුමා රටවල් හයකට හෝ හතකට යනවා අපි දැක්කා. එහෙම ගිහිල්ලා ආවාට පස්සේ මොනවාද ගෙනාවේ, මොනවාද ලැබුණේ, මොනවාද එන්න නියමිත කියන එකක්වත් මේ සභාවේදී කියන්නේ නැහැ. "ඒවා එහෙම කියන්න බැහැ" කියලා තමයි කියන්නේ. ඒක හරියට අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා ජාතික ආරක්ෂාව ගැන ටියුෂන් දෙන්න බංකු ගේන්න කිව්වා වාගේ වැඩක්. ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ කාරණයත් කියන්න කැමතියි. ජනාධිපතිතුමා සංචාරයක් සඳහා පිට රට ගියා, ආවා කියන ප්‍රවෘත්තිය පළ වෙන්නේ කොහොමද? "ජනාධිපතිතුමා සාර්ථක සංචාරයක් ආරම්භ කළා" කියනවා. ඊට පස්සේ ප්‍රවෘත්තියක් පළ වෙනවා, "ජනාධිපතිතුමා සාර්ථක සංචාරයක් ඉවර කළා" කියලා. අපි හැම දාම ඒ ට්‍රිප් දකින්නේ එහෙමයි. හැබැයි, අත්සන් කරපු ගිවිසුම් මොනවාද, ව්‍යාපෘති මොනවාද, කොච්චර මුදල් ප්‍රමාණයක් එනවාද, කොච්චර ව්‍යාපෘති ගණනක් ආරම්භ කරනවාද, කොච්චර රැකියා බිහි වෙනවාද, ආර්ථිකය වර්ධනය වෙන්නේ කොහොමද කියන ඒවා කියන්නේ නැහැ.

ඒත් එක්කම මම දැක්කා, ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබෙන දෙයක්. මම එතුමාට ගරු කරනවා. එතුමා වැඩ කරන නියෝජ්‍ය ඇමති කෙනෙක්. මම හිතන විධියට එතුමා ආණ්ඩුවක වගකීම තේරුම් ගත්ත නියෝජ්‍ය ඇමතිවරයෙක්. නමුත් එතුමා කියනවා, සල්ලි අච්චු ගහන එකෙන් උද්ධමනය වැඩි වෙන්නේ නැහැ කියලා. ඔය වාගේ කථා කියන්න තිබුණා, 2022ට කලින්. අද වනකොට හන්දියේ ත්‍රී වීලර් පාර්ක් එකේ ඉන්න කෙනාත්, ගෙදර කුස්සියේ උයන අම්මාත් දන්නවා, උද්ධමනය කියන්නේ මොකක්ද කියලා. අයින් කරන මුදල් වෙනුවෙන් මුදල් අච්චු ගහනවා නම් උද්ධමනයක් ඇති වෙන්නේ නැහැ. ඒක අපට තේරෙනවා. ඔබතුමන්ලාට බලයට එන්න සමාජ මාධ්‍ය තේ ලොකු ශක්තියක් වුණේ. අද සමාජ මාධ්‍ය තුළින් ප්‍රශ්න කරනවා, රුපියල් බිලියන 1,200 ගානක් අච්චු ගැහුවා කියලා. මේක ඇත්තද, බොරුද කියන්න. මොකද, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, මහ භාණ්ඩාගාරය සතුව රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා කියලා. එතකොට මේ රුපියල් ට්‍රිලියනය අච්චු ගහලා ගත්ත ඒවාද, බදු ආදායමින් ගත්ත ඒවාද? අච්චු ගැහුවේ නැත්නම් "නැහැ" කියන්න. අච්චු ගැහුවා නම්, අලුතින්ම අච්චු ගැහුවාද නැත්නම් අයින් කරන මුදල් වෙනුවෙන් අච්චු ගැහුවාද කියන එකත් කියන්න.

මේ අවස්ථාවේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. ඔබතුමා ජන සමාජයෙන් එල්ල වෙන මේ චෝදනාවලට මේ පාර්ලිමේන්තුව හරහා උත්තරයක් ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි කියපු මේ කාරණා පිළිබඳව, අපි සාධාරණ විවේචනයක් එල්ල කළාම එහෙම නැත්නම් සාධාරණ ප්‍රශ්න කිරීමක් කළාම ඒවා අහගෙන ඉඳලා නිකම් ඉන්නේ නැතුව උත්තරයක් ලබා දෙයි කියලාත් අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Anil Jayantha?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට පිළිතුරක් දෙන්න අවශ්‍යයි. මගේ ආරම්භක කථාවේදීත් පැහැදිලි කළා, මේ මුදල් අච්චු ගැසීම කියන කාරණය පිළිබඳව. ඒ පිළිබඳව වැරදි අදහසක් තමයි සමාජගත කරන්නේ. මහ බැංකුවට මුදල් මුද්‍රණය කිරීමත් අච්චු ගැසීමක්. නමුත් මුදල් අච්චු ගහනවා කියලා සමාජයේ මතය හදන්නේ, ආණ්ඩුවේ monetary financing, ඒ කියන්නේ මහ බැංකුවට බැඳුම්කරයක්, එහෙමත් නැත්නම් බිල්පතක් නිකුත් කරලා මහා භාණ්ඩාගාරයෙන් සල්ලි ගන්න එක ගැන. ඒක කරලා නැහැ. ඒක තමයි මම පැහැදිලිව කිව්වේ. හැබැයි, ජන සමාජයේ එහෙම මතයක් තිබෙනවා කිව්වාට, ජන සමාජය එහෙම එකක් මතු කරන්නේ නැහැ. කවුරු හෝ මේ කරුණු විකෘති කරගෙන තිබෙනවා. මහා භාණ්ඩාගාරයේ අතිරික්තය කියන්නේ වෙන කථාවක්. මහා භාණ්ඩාගාරයේ අතිරික්තය කියන්නේ, මේ වෙනකොට මහා භාණ්ඩාගාරයේ තිබෙන සල්ලි, Treasury operations. ඒ කියන්නේ, අපේ බදු ආදායමින් එකතු කරගෙන භාණ්ඩාගාරයට එන ඒවා සහ ඒ තිබෙන මුදල්. රාජ්‍යයකට නෛසර්ගික වගකීමක් තිබෙනවා, නිරන්තරයෙන් ණය ගන්න. ණය ගෙවන්න ණය ගන්නවා; ව්‍යාපෘතිවලට ණය ගන්නවා. මේ කියන්නේ මේ වෙනකොට මහා භාණ්ඩාගාරය ඉතාම විචක්ෂණශීලිව පැරණි ණය ගෙවා දැමීමට ණය ගැනීම සහ බදු ආදායම්වලින් ට්‍රිලියනයක සංචිතයක් තිබෙනවා කියලායි. ඒක මුදල් අච්චු ගැසීම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් කථා කළ මන්ත්‍රීතුමා මාත් සම්බන්ධ කරමින් කථා කරපු නිසා මේ කාරණය කියන්න ඕනෑ. මම හිතුවා එතුමාගේ කථාවට බාධා නොකර පසුව උත්තර දෙන එක හොඳයි කියලා. එතුමා වරාය ගැන කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්ව කර්මයෝ නොවෙයි. විශාල විනාශ කරපු, හොරකම් කරපු, නාස්ති කරපු ආයතන ගොඩ නඟන්න තමයි අපි මේ උත්සාහ කරන්නේ. රොකට් එකක වේගයෙන් ඒවා ගොඩ නඟන්න බැහැ. නමුත් එසේ තිබියදී ඒවායේ වැඩ කරන සේවකයන් -අපිත් යම්කිසි මැදිහත්වීමක් කරලා- යම්කිසි ජයග්‍රහණයක් ගත්තාම, ඒක අගය කරන්න තරම් නිහතමානිකමක් අපි බලාපොරොත්තු වෙනවා. මම දැක්කා, ශ්‍රීලන්කන් ගුවන් සේවයේ plane එක සම්බන්ධයෙනුත් "කෝචොක්" කරනවා.

තව කාරණයක් කියන්න තිබෙනවා. මම තත්පර 10කින් කියන්නම්. මේ, අපි කියපුවා නොවෙයි. "Maritime Gateway" කියන website එකේ "The Sri Lanka Ports Authority has posted a substantial 66 per cent rise in profits during the first six months of 2025, with earnings climbing from Rs. 14,691 million in the first half of 2024 to Rs. 24,418 million this year,..." කියා සඳහන් වෙනවා. මිලියන 10,000කින් වැඩි වුණා කියන එක තමයි මෙකේ සඳහන්ව තිබෙන්නේ. ඒ කියන්නේ, සියයට 66ක වැඩිවීමක්. මම දන්නවා, වරායේ මීටත් වඩා ලාභ වැඩි කරන්න පුළුවන්. ඒවාට මිනිස්සු පුරවලා, නාස්ති කරලා තිබෙනවා. සමහරුන්ගේ යාළුවෝ තමයි ඒවායේ තවමත් කොන්ත්‍රාත් කරන්නේ. කොයි පක්ෂයෙන් පිරෙව්වත් අපේ රටේ මිනිස්සුනේ වරායේ වැඩ කරන්නේ. ඒ නිසා අපහාස නොකර ඉන්නවා නම් හොඳයි. අපි යම් සැලකිය යුතු ලාභයක් පෙන්වා තිබෙනවා. ලබන අවුරුද්දේ අපි මීට වඩා ලාභ ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Rajapaksha. You have 10 minutes.

[අ.භා. 12.22]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රාජ්‍ය ණය ගැන සුවිශේෂීව කථා කරනවා. ලෝකයේ හා ලංකාවේ සමාජ හා භෞතික සංසිද්ධි ගත්තාම, ඒවා එක්කත් මේ ණය සංකල්පය පටලවා කාටුන් ඇඳපු අවස්ථා තිබුණා. උදාහරණයක් විධියට ගත්තොත්, කොළඹ, මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටුණා. හැබැයි කාටුන් අඳින්නේ, ලංකාව ණය කන්දකට යට වුණා කියලායි. ලෝකයේ කොහේ හරි ගිනි කන්දක් පිපිරුණොත් ලංකාවේ ණය කන්ද පුපුරලා කියලා කාටුන් අඳිනවා.

ඒ, මේ ලංකාවේ සමාජය, ලංකාවේ රාජ්‍ය ණය දකින විධිය, දැකපු විධිය. ඒ අය හිතනවා, මේ ණය ජනතාවට බරක්, රජයට බරක් කියලා. ඒ නිසා තමයි ඒ ණය එවැනි විධියට අර්ථකථනය කරන්නේ.

මම අද අන්තර්ජාලයෙන් බැලුවා, ලෝකයේ වැඩිම රාජ්‍ය ණය තිබෙන රටවල් 10 මොනවාද කියලා. එතැන තිබෙනවා, ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, ජපානය, කැනඩාව, එක්සත් රාජධානිය, ස්පාඤ්ඤය, ජර්මනිය සහ චීනය. ඒ රටවල් තමන්ගේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට සියයකටත් වඩා ණය අරගෙන තිබෙනවා. හැබැයි, අපි අහලා නැහැ, ඒ එක රටක්වත් ලෝකයේ දූප්පත් රටවල් විධියට, ණය ගෙවා ගන්න බැරි බංකොලොත් රටවල් විධියට ලේබල් ගහලා තිබෙනවා කියා. ඒ රටවල් ණය අරගෙන තිබෙනවා. ඒ ණය රටේ සංවර්ධනයට යොදවා තිබෙනවා. ඒ තුළ, ඒ ගත්ත ණයවලට වටිනා, ප්‍රමාණවත්, ගැළපෙන වත්කම් ඒ රටවල ගොඩනැඟිලා තිබෙනවා. පසුගිය දශක දෙක තුන ගත්තොත්, ලංකාව ණය ගැනීම සඳහා හොඳ උනන්දුවක්, වැඩ පිළිවෙළක්, හොඳ ආසාවක්, කැමැත්තක් දක්වා තිබුණා. ඇතැම් වෙලාවට ඒ ණය ගන්නකොට අරමුණ හැටියට මොනවා හරි ව්‍යාපෘතියක් පෙන්නුවා. ඒ ව්‍යාපෘතිය යට තිබුණේ, තමන්ගේ සාක්කුවට ලැබෙන කොමිස් එක, අත යටින් ලැබෙන ගනු දෙනුව. ඒ නිසා සමහර ණය ගැනීම් යටතේ හිටපු ව්‍යාපෘතිකරුවන්ට "Mr. Ten Percent" ආදී විවිධ නම් පටබැඳුණා. නම් වශයෙන් කියන එක හොඳ නැහැ නේ. හැබැයි, " Mr. Ten Percent" කිව්වාම ලංකාවේ ඕනෑම කෙනෙක් දන්නවා.

ණය ගැනීම නොවෙයි, වඩා වැදගත් වෙන්නේ අරමුණක් ඇතිව ණය අරගෙන, අදාළ අරමුණට යොමු කරලා, කළමනාකරණය කරලා රටේ සංවර්ධනය සඳහා යොදවා ගන්න එකයි. ඒ නිසා ඕනෑම රටකට දිගුකාලීන සාර්ථක මූල්‍ය කළමනාකරණයක් සඳහා, මූල්‍යකරණය සඳහා ණය කළමනාකරණය කියන විෂයය අත්‍යවශ්‍යයි. අපේ රටේත් ණය කළමනාකරණයේ අරමුණ වෙන්න ඕනෑ, අපේ දේශීය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම වාගේම රජයේ මූල්‍ය අවශ්‍යතා කාලෝචිත පරිදි හඳුනාගෙන අවම පිරිවැයකින්, විචක්ෂණශීලිව, අවදානම් මට්ටමකට අනුකූලව සපුරා ගන්න එක තහවුරු කර ගැනීමයි. ඒ සඳහා 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා. ඒ තුළින් රජයට රාජ්‍ය ණය ගැනීම, රාජ්‍ය ණය නිකුත් කිරීම, ණය සේවාකරණය, ඇපකර නිකුත් කිරීම හා උපණය දීම වාගේම ණය සැපයුම්කරුගේ ණය ගිවිසුම් හා මූල්‍ය කල්බදු ගිවිසුම් ඇති කර ගැනීම ආදී රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ සියලුම බලය අපි මේ පනතට ලබා දෙනවා. ඒ වාගේම මේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලය රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවමින් ලබා දෙනවා. ඒ වාගේම ඒ හා සම්බන්ධ අනෙකුත් විධිවිධාන සහ රාජ්‍ය ණය කළමනාකරණය පුළුල් රාමුවක් තුළ සිදු කරනවා.

ඒ වාගේම, එමඟින් ණය ගැනීම විනිවිදභාවයකින් යුතුව කළ හැකි වෙනවා. ණය ගත්තේ මොකටද, ඉදිරියේදී ඒ ණය ගෙවන්නේ කොහොමද, ඒ ණය ගැනීම නිසා උපදින වත්කම් සහ ආදායම් මොනවාද, ඒ තුළින් ණය ගෙවීමේ හැකියාව තහවුරු වෙන්නේ මොන විධියටද ආදි වශයෙන් ණය භාවිතය සම්බන්ධ විනිවිදභාවය තහවුරු කරන්නත් අපට එමඟින් අවස්ථාව ලැබෙනවා.

මේ පනත අදාළ වන ආයතන ලෙස ගැනෙන්නේ, ආණ්ඩුවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක, පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව රජයේ මුදල් වෙන්කර ඇති ව්‍යවස්ථාපිත අරමුදල් සහ භාර, රාජ්‍ය ව්‍යවසායන්, පළාත් සභා, පළාත් සභා යටතට ගැනෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන සහ පළාත් පාලන ආයතනයි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට මේ කටයුතු යටත් කිරීමෙන් අපි බලාපොරොත්තු වෙනවා රාජ්‍ය ණය කළමනාකරණය ශක්තිමත් කිරීමට සහ ඒ කටයුතු මධ්‍යගත කිරීමට.

අපි දන්නවා, අපේ රටේ රාජ්‍ය ආයතන සහ රජයේ අනුබද්ධිත ආයතන, එහෙම නැත්නම් රජයට අයත් ව්‍යාපාර ණය නිසියාකාරව සටහන් කරලා නැහැ, එම නිසා ලේඛනවලින් දැක්වෙන ණය මීට වඩා උඩ මට්ටමක තිබෙන්න ඕනෑ කියලා පසු ගිය කාලයේ විගණන වාර්තාවලින් කියැවුණු බව. ඒ කියන්නේ, ඒ කාලයේ රජයේ සංඛ්‍යාලේඛන පිළිබඳවවත් විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සක්‍රිය වුණාට පසු ඒ කටයුතු එක තැනකින් සිදු වන නිසා ඒ ගැටලුව මඟ හරවා ගන්න අපට පුළුවන්. ඒ වාගේම රාජ්‍ය ණය සම්බන්ධ තොරතුරු බෙදා හැරීමේ සහ ඒ තොරතුරු බෙදා හැරීම තුළින් ණය සම්බන්ධ වගකීම සහ ණය පිළිබඳ විනිවිදභාවය තහවුරු කිරීමේ හැකියාවත් මේ කාර්යාලයට ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ඒ එක්කම, රාජ්‍ය ණය තිරසර බව ඇති කරන්නත්, දිගු කාලීන, යහපත් මූල්‍යකරණයට අවශ්‍ය කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු ණය ගැනීමේ පිළිවෙත ක්‍රියාත්මක කිරීම සහතික කරන්නත් අපට අවස්ථාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා අපේ ආණ්ඩුව ණය ගත්තේ මොකටද, ඒ ගත්තු ණය ගෙවන්න කටයුතු කරන්නේ කොහොමද යනාදි දේවල් අපි පැහැදිලි කරන්නේ නැහැ කියලා. ණය කළමනාකරණ කාර්යාලය ක්‍රියාත්මක වනකොට, ඔය පාඩු ලබන රාජ්‍ය ආයතන, ව්‍යවසාය වෙනුවෙන් ණය ගත්තොත් ඒ ණය ගන්නේ කුමටද, ඒවා යොදවන්නේ, ආයෝජනය කරන්නේ කුමක් සඳහා ද, කොයි තරම් කාලයකින් ඒවා ගෙවනවාද ආදි සියලු කාරණා විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශ කිරීම ඒ කාර්යාලය හරහා සිදු වෙනවා. එම නිසා දැනට ඔබතුමන්ලාගේ හිතේ තිබෙන හුඟක් ප්‍රශ්නවලට මේ පනත යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක වුණාට පසු උත්තර ලැබෙන බව පවසමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Faiszer Musthapha. You have 12 minutes.

[1.00 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Deputy Speaker, I am thankful for the opportunity to speak on the proposed Gambling Regulatory Authority Bill.

Sir, various quarters in this House has accorded sentiments, but one has to realize that casino and gambling have already been legitimized and that what needs to be debated before this House is whether the present Gambling Regulatory Authority Bill has oversight, accountability and focuses on responsible governance.

Sir, the global casino market was valued to be US Dollars 287 billion in 2022 and is predicted to reach US Dollars 477 billion by 2031. Gambling and casinos are considered a necessary evil, but unless we are geared, we will lose out in international tourism. My faith is, gambling should be prohibited, but, unfortunately, it is a necessary evil today, if we want to entice tourism in this country. So, we are looking at not promoting gambling among us, but with regard to enticing foreign nationals to come here and bring us valuable foreign exchange, which we need.

Sir, if we speak about gambling, in pre-colonial times also there were various forms of gambling like "*cheetu*", cock-fighting et cetera. I would not delve in to that; I think the Hon. (Dr.) (Ms.) Kaushalya dealt with it quiet extensively. The first regulatory framework was brought during colonial times, the Gaming Ordinance, No. 17 of 1889. That criminalized unlawful gambling and common place gambling. Further, horse racing is also a form of gambling, which was regulated under Betting on Horse-Racing Ordinance.

During post-Independence era, Sri Lanka took a different stand. Gambling was not encouraged; it was somewhat prohibited. However, the State, through various lotteries like the Hospital Lottery in the 1950s and the National Lotteries Board, encouraged gambling. A sweep is a form of gambling. So, on the one hand, the State said, "Do not gamble" and on the other, it realized that it is necessary and used the revenue from gambling for development. The open economy in 1977 saw the emergence of the casino industry. It was an illegal industry, but the governments turned a blind eye to that. Then, they brought in the Betting and Gaming Levy Act, No. 40 of 1988. On the one side, the Government said gaming and casino are illegal, but it was used as a revenue-generating exercise. So, the Government, while saying it was an illegal act, taxed gaming, thereby giving it tacit acceptance. The Government did not have the courage to say that it is legitimate and said it was illegal, maybe, because of politics or other social norms, but thought fit to collect revenue through taxes.

For the first time, casinos and gaming were legitimized by the Casino Businesses (Regulation) Act, No. 17 of 2010, thereby introducing a licensing mechanism for casinos in this country. So, legitimacy was brought in only in 2010. In 2013/2014, Australian billionaire James Packer wanted to invest in a casino in Sri Lanka. There was a massive social outcry. His investment was US Dollars 350-400 million. Other than the social factors, there was an economic factor, which was detrimental to the nation because his profits were not to be taxed for ten years. Therefore, according to some estimation, for the period of ten years, there would have

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

been a revenue loss of approximately US Dollars 1 billion for the country. In 2015, the then Government cancelled all the permits and all the concessions given and with that, Mr. Packer left. And, that was the end of their project.

At present, casino operators are not given any form of concession in terms of taxes and levies. In addition to the local operators, there is a foreign operator who has invested US Dollars 125 million and that, too, is subjected to the same taxation and levies. So, there is a level playing field and through taxation, the State is able to obtain the much needed revenue. However, when we look at the 2010 Act, there were various issues and grievances. They said that there is no proper mechanism to monitor money laundering, and gaming was somewhat unregulated because of the loopholes in the law.

Sir, I would say that the Gambling Regulatory Authority Act is a step in the right direction, but there are certain shortcomings and loopholes which, I believe, this Government needs to address. The 2010 Act gave the Minister of Finance absolute discretion to grant or refuse a licence. Therefore, in terms of the 2010 Act, without political patronage, you cannot get a licence. The present Bill creates a Gambling Regulatory Authority and if there is refusal by the Authority, you could appeal to the Secretary and from the Secretary, you could appeal to the Court of Appeal. So, there is a transparent mechanism, if a licence is refused or suspended.

The present Bill replaces certain old enactments that were in existence. In addition to the land-based casino industry, there is a global online casino industry, which is valued at US Dollars 110 billion. Anybody who has a smartphone can access online gaming. So, I appeal to the Government to bring in more stringent laws and regulations. Casinos do not attract the common man; it affects the common man less. However, online gaming could be an addiction. Therefore, I appeal to this Government to look at bringing in very stringent laws and regulations to monitor online gaming. Further, the physical casino industry creates jobs and entice tourism, but if we have online gaming, its revenue will go out of the country and there would be no net benefit to the country.

Sir, talking about autonomy, I would like to bring your attention to Clause 77(1) of the Bill. Whilst the Authority has certain autonomy in terms of the Bill, Clause 77(1) gives the Minister the authority to give directions, which the Authority is obliged to follow. That could be considered as an infringement on the autonomy of the Authority. So, therefore, I would like the Government to address this Clause because unlike a statutory authority, when you have a regulatory authority, the Minister giving dictates could affect its independence. However, I would like to reiterate that the present Bill is more progressive than the 2010 Act because it has more transparency.

In addition, Sri Lanka encourages casinos in this country only for the purpose of enticing foreigners to come and gamble here. Therefore, I would urge the Government to consider having a representative from the tourism sector represented in the Authority, thereby issues in relation to tourism could be further addressed.

Also, Sir, I believe there is ambiguity in this Bill with regard to certain provisions. Clause 22 refers to a main cash desk. Today, we are in a digital age. A main cash desk should not be interpreted as a physical main cash desk, but should include other generally accepted forms of payment like electronic transactions, which would connect to one centralized system. So, the definition of "main cash desk" should mean one centralized system.

The term "currency" in Clause 22, I believe, should be read with Clause 59 to include electronic fund transfers because if you give a very restrictive meaning, especially in this day and age where everything is in a digital form and everything is electronic, it would create issues. So, allowing other forms of payment would be better for attracting overseas travellers and would also remain auditable.

There are some other defined terms such as "digital gambling", "gambling software", "prohibited gambling machine", "junket", "junket operator" and "casino game", which, I believe, need clarity. Unless there is clarity by way of regulations, there would be a lot of ambiguity in the Act. Unfortunately, the Minister is not here at this point of time, but I would urge the Hon. Deputy Minister to take into consideration the various issues I have raised. I have raised them after studying the Bill. I see this Bill as very progressive, but if you look at the international norms and practices, for operators to operate in Sri Lanka, there need to be clear definitions. And, when there is ambiguity, the Minister is empowered to bring in regulations and through those regulations, you could get over the ambiguity created.

Today, I see a lot of debate on casinos. I would like to reiterate that in 2010, casinos came into operation in Sri Lanka. So, if one speaks about social norms now saying, "You said no" and "You said yes", I would say that the bus had already left. Unfortunately, some in this House as well have already missed the bus. What is there to be debated in this House is whether the Authority created has transparency and accountability. Therefore, I would like to appeal to the Government to take the views expressed by us into consideration - nobody in this House is an expert - to get over the ambiguities in the Bill as this Authority intends to encourage other major operators to come to Sri Lanka. It is a known fact that Singapore first discouraged gambling.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Just give me half a minute, Sir.

So, Singapore first opposed gambling. However, they did a deep study and later, brought in casinos. Through casinos, their GDP has increased by 1 to 2 per cent and their tourist arrivals increased by 50 per cent after setting up casinos. Therefore, I humbly request this House to look at this progressively while addressing the shortcomings. Here, nobody looks at it from a religious angle and in 2010, this House had already voted that casinos should be given licences. Social factors are a different issue, but what we are debating here is whether there is a conducive legal environment for a regulatory authority to perform being fair to the gambler, the gaming operator and the public at large.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mahinda Jayasinghe. You have 12 minutes.

[1.14 p.m.]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Hon. Deputy Speaker, thank you very much for the opportunity given.

First of all, I would like to comment on the views expressed by the Opposition Members. Hon. Faiszer Musthapha, we will consider your constructive ideas.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ සාකච්ඡාවට ගැනෙන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳවත්, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳවත්, විදේශ විනිමය පනත යටතේ ගෙනෙන නියමය පිළිබඳවත් අදහස් දක්වද්දී, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් විසින් මේ සම්බන්ධයෙන් මේ සභාව තුළ විවිධ සැක සංකා පළ කරමින් සමාජය තුළ යම් බියක් හදන්න උත්සාහ කරනවා අපි දැක්කා. අපි සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනැල්ලා Authority එකක් හදන්න හදනකොට මේ තරම් බයට පත්වෙන්නේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. පසුගිය දශක ගණනක් තිස්සේ සූදු ක්‍රීඩාව පැත්තෙන් විතරක් නොවෙයි, හැම පැත්තකින්ම මේ මුළු රටම අයාලේ ගිහිල්ලා තිබුණේ, අයාලේ යවලා තිබුණේ කියලා අපි දන්නවා. ඒ අයාලේ ගිය රට තමයි වර්තමාන අපේ ආණ්ඩුව ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් නිසිමඟට ගෙනැල්ලා, නිවැරදි පීල්ලට හරවන්න කටයුතු කරමින් තිබෙන්නේ. මේ සූදු ක්‍රීඩාවත් ඒ වාගේම තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩාවට නියාමනයක් අවශ්‍ය නැද්ද කියලා අපි ඔබතුමාගෙන් අහනවා. මේකට නියාමනයක් අවශ්‍යයි. අද මේකට විතරක් නොවෙයි, හැම දේකටම නියාමනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. එහෙම නැත්නම් විවිධ විධියට මේ හැම එකක්ම අයාලේ යන තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ. ඒ නිසා අපි අද මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙන එන්නේ ඒවා නිවැරදි කර ගැනීමේ අරමුණ සහිතවයි. එහෙම නැතුව සමහරු කිව්වා වාගේ මේ රට තුළ නැව්වල සූදු ගහයි, එන එන නැව්වල සූදු ගහයි වාගේ දේවල් කරන්න නොවෙයි. මේ ක්‍රීඩාව අනිවාර්යය ලෙසම නියාමනය කළ යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි අද අපි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. සමහරු කියන විධියට මේ සියල්ල අයාලේ යන්න ඉඩ දීලා ආණ්ඩුවක් ලෙස ඔහේ බලාගෙන ඉන්න ඕනෑද? මේක ඇතුළෙත් සූදු ගහන අය ඉන්නවාද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසාම මේකට බිය වෙලා තිබෙනවාද කියලා අපි දන්නේත් නැහැ. ඒ කොහොම වුණත්, යහපත් අරමුණින් තමයි අපි මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි, රටේ ණය සම්බන්ධයෙනුත් දැන් ලොකු ඝෝෂාවක් නඟමින් තිබෙනවා. ආණ්ඩුව මහා ලොකු ණයක් අරගෙන තිබෙනවා ලු, කිව්වේ ණය ගන්නේ නැහැ කියලා ලු. මේ ආදී වශයෙන් ණය සම්බන්ධයෙන් මේ සභාව ඇතුළේත්, එළියේත් විවිධ වැරදි මත පළ කරමින් තිබෙනවා. මේ ආණ්ඩුව අරගෙන තිබෙන ණය ඉලක්කම් එක්ක මේ දවස්වල social media ඇතුළේත් වැඩිපුර ප්‍රකාශ කරමින් තිබෙනවා අපි දැක්කා. ආණ්ඩුවක් ලෙස ණය ගන්නේ නැහැ කියලා අපි කිව්වේ කොහේද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ණය ගන්නවාය කියන එක අපි බලයට එන්න කලින් ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා. හැබැයි අපට එදාත්, අදත් මේ ණය ගැනීම සම්බන්ධ විවේචනයක් තිබුණා. ඒ මොකක්ද? ඒ ගත්ත ණය රටේ ඵලදායී ලෙස යොදවාගෙන නැහැ, ඒ ණයවලින් ඵලදායී ලෙස වත්කම් උපයාගෙන නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ යම් විගණන වාර්තා එළි දැක්වුණු බව ඔබතුමාට මතක ඇති. අරගෙන තිබෙන සමස්ත ණයවලින් සියයට 22ක වාගේ ප්‍රමාණයක වත්කම් තමයි උපදවලා තිබෙන්නේ කියලා සමහර විගණකාධිපතිවරු ඒ දවස්වල ප්‍රකාශ කළා අපට මතකයි. ඒ උපයපු වත්කම් වුණත් ඵලදායී නැහැ, උපයෝගිතාවක් නැහැ, ඌන උපයෝගිතාවක් තිබෙන්නේ කියලා පසුගිය කාලය පුරාම විවිධ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා තොරතුරු හෙළිදරව් වූ ආකාරය ඔබතුමා දකින්න ඇති. අපට තිබුණේ ඒ විවේචනය. එහෙම නැතුව ණය ගන්නේ නැහැ කියලා විවේචනයක් නොවෙයි අපට තිබුණේ. අපි ණය ගන්නවා, ඵලදායී ව්‍යාපෘතිවල යොදවනවා, මේ මහත්වරු වාගේ ණය අරගෙන වෙන වෙන සූදු ක්‍රීඩා කරන්නේ නැහැ කියලා අපි ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා. මේ සම්බන්ධයෙනුත් අපට ඒක කියන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම රට පුරා වත්කම් උපද්දවපු හැටි අපි දැක්කා. රට පුරා නොවෙයි, ලෝකය පුරාම වත්කම් උපද්දවා තිබෙන හැටි අපි දැකලා තිබෙනවා. ලෝකය පුරාම, රට පුරාම විවිධ දේවල් මිලදී ගනිමින්, රටේ කොහේ හරි තැනක සාරවත් ඉඩමක් තිබුණා නම් ඒ ඉඩම් ටික ඔක්කෝම රාජපක්ෂවරුන්ගේ නම්වලට ලියාගෙන තිබෙනවා. එහෙමයි ඒගොල්ලෝ ණයවලින් වත්කම් ඉපැද්දෙව්වේ. රටට වත්කම් ඉපැද්දෙව්වේ නැහැ. රට කාබාසිනියා කරලා දානකොට, රටට වත්කම් උපද්දවන්නේ නැති වෙනකොට, රටට වැඩක් නැති, වැදගැම්මකට නැති සමහර ව්‍යාපෘති සඳහා රුපියල් කෝටි ප්‍රකෝටි ගණන්, බිලියන ගණන් මුදල් වෙන් කරනකොට, ඒගොල්ලන් නම් වත්කම් උපද්දවාගෙන තිබෙනවා අපි දැක්කා.

අදටත් ඒවා පේනවා නේ. මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේත් තවමත් තිබෙනවා, අයිතිකාරයෝ නැති ගෙවල්, අයිතිකාරයෝ නැති ඉඩම්. ඔබතුමන්ලා ඒවා දන්නේ නැත්නම් දවසක එන්න, අපි පෙන්වන්නම්. මල්වාන පැත්තේ වෙලාවක එන්න පෙන්වන්නම්. රඹුටන් ගෙඩියකුත් කටේ ඔබලා ම එවන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ණය අරගෙන කරපු වැඩ නිසා තමයි අද අපි මේ කටයුතු විධිමත් කළ යුතුව තිබෙන්නේ. We need transparency, we need proper reporting regarding debt. So, that is our Government's policy. ඒ නිසා ඉතාම පැහැදිලිව අපි කියන්න ඕනෑ, ඉතිහාසයේ

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ණය ගත් විධියට අපි ණය ගන්න සූදානම් නැහැ කියන එක. අපේ ආණ්ඩුව ණය ගන්නේ තිරසර රාමුවක් තුළයි. ඒක අපි බලයට එන්න කලින් මැතිවරණ වේදිකාවේත් කිව්වා. අද ආණ්ඩුවක් ලෙසත් අපි ඒක ඉතාම පැහැදිලිව නිරවුල්ව කියනවා. අපි ණය අරගෙන ඔබතුමන්ලා කළා වාගේ ප්‍රයෝජනයක් නැති වැඩ කරන්නේ නැහැ.

අපි දැන් ණය ගන්නේ කොහොමද? අදාළ නීති-රීති, අදාළ පනත්, ඒ වාගේම IMF රාමුව ඇතුළත තමයි අපි මේ හැම දෙයක්ම කරන්නේ. ඒක තමයි මූල්‍ය විනය කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි වර්තමාන ජාතික ජන බලවේග ආණ්ඩුවේ මූල්‍ය විනය. මූල්‍ය විනයක් නැති මිනිස්සුන්ට, මූල්‍ය විනයක් නොවෙයි, මොනම විනයක්වත් නැති අයට මේක විහිළුවක් වාගේ වෙනවා. *[බාධා කිරීමක්]* අනේ මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්නකෝ, චූන් වෙන්නේ නැතිව. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ, චූන් වෙන්නේ නැතිව. *[බාධා කිරීමක්]* මේ, යාපනයේ අපේ ආදරණීය දමිළ ජනතාව කරපු ඓතිහාසික වැරැද්දක්. ඒකට ඉතින් අපි මොනවා කරන්න ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මම මූල්‍ය විනය ගැන වෙනම කියන්නම්. ඒ මූල්‍ය විනය අනුව අපි ණය ගන්නවා. ඒ ණය ඉතාම විධිමත් ලෙස අදාළ ව්‍යාපෘතිවලට යොදවනවා. ගන්නා හැම රුපියලකටම අපි වග කියනවා. ඒ ණයවලින් ආදායම් උපදවන්නත්, මේ රටේ ජනතාවට ප්‍රයෝජනවත් ලෙස ඒ ණය යොදවන්නත් අපි කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී අවධාරණය කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දැක්කා, ඊයේ උතුරේත්, නැගෙනහිරත් හර්තාලය ගැන මේ සභාව ඇතුළේ බොහෝ වගාඩම්බර කියනවා. ඒ හර්තාලය පුස් වෙඩිල්ලක් කියන එක අපි ඉතාම පැහැදිලිව දැක්කා. විශේෂයෙන්ම උතුරේත්, නැගෙනහිරත් ආදරණීය දමිළ සහ මුස්ලිම් ජනතාවට අපි අපේ ගෞරවය, ප්‍රණාමය, ආචාරය පුද කරනවා. ඇයි ඒ? පසුගිය සැප්තැම්බර් මාසයේ 21වැනි දාත්, නොවැම්බර් මාසයේ 14වැනි දාත් මේ රටේ ජනතාව ජාතිවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කළා. මේ මහත්වරු උතුරේ ජාතිවාදය පාවිච්චි කළා, දකුණේ ජාතිවාදය ගොඩනැඟීම සඳහා. දකුණේ ජාතිවාදය පාවිච්චි කළා, උතුරේ ජාතිවාදය ගොඩනැඟීම සඳහා. ඒ වරනැංවීම සඳහා ඔවුන් ඒවා පාවිච්චි කළා. පසුගිය මැතිවරණ දෙකේදීම මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව මොකද කළේ? *[බාධා කිරීමක්]* අනේ, මේ මන්ත්‍රීතුමා නිහඬ කරන්නකෝ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමා හරිම කරදරයක් නේ. යමක් කිව්වාට කමක් නැහැ. නමුත්, දිගින් දිගටම මේ විධියට බාධා කරනකොට ඒක හරිම කරදරයක් නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member from the Opposition, please let the Hon. Deputy Minister speak.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඒ නිසා ඉතාම පැහැදිලිව ඊයේ උතුරේත්, නැගෙනහිරත් දමිළ, මුස්ලිම් ජනතාව ජාතිවාදී දේශපාලනයට තවදුරටත් මේ රටේ ඉඩක් නැහැ කියන එක තහවුරු කළා. ඊයේ හර්තාලය පුස් වෙඩිල්ලක් වුණා. අපි කනගාටු වෙනවා, සුමන්තිරන් හිටපු මන්ත්‍රීතුමා ගැන. මොකද, අපි එතුමා විශ්වාස කළේ, පසුගිය කාලයේ දැක්කේ, සමහර දේශපාලකයෝ ජාතිවාදී වෙනකොට මධ්‍යස්ථ තැනක හිඳිමින් ක්‍රියා කරන කෙනෙකු විධියට. හැබැයි, අද එතුමාටත් මේ ජාතිවාදී මඩ ගොහොරුවේ එරෙන්න සිද්ධ වෙලා තිබෙනවා ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙන්. අපි දැක්කා, මේ සභාවේ විපක්ෂය පැත්තෙන් මරු අභියෝගයක් කරනවා. පුළුවන් නම් ග්‍රාම නිලධාරි වසම් 5ක, 6ක කඩ වහලා පෙන්වන්න ලු. ඒක තමයි මේ අභියෝගය. *[බාධා කිරීමක්]* ඔව්, ඒක දන්නවා නේද? ඒ කාලයේ දන්නවා නේ. ඒක මම කියා දෙන්න ඕනෑ නැහැ නේ. ඒක දන්නවා නේ. දන්නවා නම් සද්ද නැතිව ඉන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ කෙරුවාවත් මම දන්නවා. ඒක මගෙන් අහගන්න එපා. මම දවසකුත් ඒ ගැන කිව්වා. *[බාධා කිරීමක්]* ඒක තමයි. මොකද දන්නවා ද? *[බාධා කිරීමක්]* අනේ! ඔයගොල්ලන් ගැන කථා කරනවාට වඩා මේ ගරු සභාවේ වෙන වැඩ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have two more minutes, Hon. Deputy Minister.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි තුනක් දෙන්න, ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන්. *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අපි වෙලාව දෙන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමා කලබල වෙන්න එපා, අපි එතුමාට වෙලාව දෙනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is it, Hon. Member?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Hon. Deputy Speaker, constant interruptions are being made to Hon. Deputy Minister's speech. That has to be stopped.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let the Hon. Deputy Minister continue, please.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Thank you very much.

ඔය මහත්වරු ආර්ථික වශයෙන් විතරක් නොවෙයි, සමාජයීය වශයෙන්, සංස්කෘතික වශයෙන් ආදී හැම පැත්තකින්ම විනාශ කරලා කාබාසිනියා කරලා වට්ටපු රටක් තිබුණේ. අද සුදනෝ වාගේ කථා කළාට, අද සුදු ඇඳගෙන, කිරි දියෙන් නාලා ඇවිල්ලා

වාගේ කථා කළාට, ඔය මහත්වරු වට්ටලා තිබුණු රට ගෙවුණු මාස දහයකට ආසන්න කාලයක් තිස්සේ අපි ගොඩනහලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉන් කිහිපයක් කියන්නම්.

එකක් තමයි, පසුගිය මාස හයේ අපි ආදායම ලෙස උපයාගෙන තිබෙනවා, රුපියල් බිලියන 2,325ක්. ගිය අවුරුද්දේ ඒ ප්‍රමාණය රුපියල් බිලියන 1,865යි. අපි අපේක්ෂිත ආදායමට වඩා රුපියල් බිලියන 460ක් -සියයට 25ක්- වැඩිපුර වත්කම් උපයා ගන්න සමත් වෙලා තිබෙනවා. එක පැත්තකින් ආදායම් වැඩි වෙනකොට අනෙක් පැත්තෙන් අපි වියදම් අඩු කරන්න සමත් වෙලා තිබෙනවා. ආදායම් සියයට 25කින් වැඩි වෙනකොට වියදම් සියයට 11කින් අඩු කර ගන්න ආණ්ඩුවක් ලෙස අපි සමත් වෙලා තිබෙනවා. ඒක IMF එක අපේක්ෂා කළාටත් වඩා වැඩි ආදායමක්. IMF එක අපේක්ෂා කළේ මේ වසර අවසන් වෙනකොට, රුපියල් බිලියන 4,439ක්. නමුත්, මේ පුරෝකථනය අනුව අපේ ආදායම රුපියල් බිලියන 4,650 ඉක්මවා යන්න පුළුවන් කියලා අපට විශ්වාසයක් තිබෙනවා. රුපියල් බිලියන 4,650ක් නොවෙයි, මේ වසර අවසන් වෙනකොට රුපියල් බිලියන 5,000ක ආදායමකට යන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, සාමාන්‍යයෙන් දෙවන කාර්තුවේදී තමයි ආදායම වැඩි වෙන්නේ කියලා. ඒ නිසා රුපියල් බිලියන 5,000ක සීමාවකට යන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ සමහර මහත්වරු රේගුවෙන් බඩු පන්නන්න උල්පන්දම් දීපු විධිය, උඩගෙඩි දීපු විධිය, කටයුතු කරපු විධිය අදටත් රහසක් නොවෙයි, මේ රටේ ජනතාවට. රේගු ඉතිහාසයේ පළමු වතාවට මාසයක ආදායම විධියට පසුගිය ජූලි මාසයේදී රේගුව රුපියල් බිලියන 235ක ආදායමක් ලබනවා. අන්න, අපි රට ගෙනිහිල්ලා තිබෙන තැන. ඒ විතරක් නොවෙයි. පළමු මාස හය ඇතුළත වරාය රුපියල් මිලියන 24,418ක, ආදායමක්, මෙහෙයුම් ලාභයක් ලබන්න සමත් වෙලා තිබෙනවා. ඒ, පසුගිය වසරට සාපේක්ෂව සියයට 66ක වර්ධනයක්. ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ මෙහෙයුම් ලාභය වැඩි කර ගන්නත් අපි සමත් වෙලා තිබෙනවා. අපට මතකයි නේ, ඒ ගුවන් සමාගම පසුගිය කාලයේ කටයුතු කරපු විධිය. බාප්පොච්චිලා රවුම් ගහපු විධිය, මේ මහත්වරු අප්පොච්චිලා එක්ක දෙසීය තුන්සීය දමාගෙන ලෝකය වටා රවුම් ගහපු විධිය, තොරන් බලන්න ගිය විධිය, බල්ලෝ අරගෙන ගිය විධිය මතකයි නේද? අද ඒ ගුවන් සමාගමේ මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 29ක් දක්වා ඉහළ නංවන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ලෝකෙ වටේ ගියා, කෝ, මොනවාද ගෙනාවේ කියලා අපෙන් අහනවා. අපි Foreign Direct Investments - FDIs - ගෙනැල්ලා තිබෙනවා, ඩොලර් මිලියන 507ක. ඒ අනුව ඩොලර් මිලියන 507කින් අපේ සෘජු විදෙස් ආයෝජන වැඩි කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. පසුගිය වසරට සාපේක්ෂව ඒක සියයට 101ක වර්ධනයක්. පසුගිය වසරේ තිබුණේ, ඩොලර් මිලියන 252යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක ඩොලර් මිලියන 507 දක්වා වර්ධනය කරන්න අපි පසුගිය කාල සීමාව තුළ සමත් වෙලා තිබෙනවා. වට්ටපු රට එහෙමයි පසුගිය කාල සීමාව තුළ ගොඩනැඟුවේ.

ඒ විතරක් නොවෙයි. දේශීය ආයෝජන මිලියන 252 සිට 285 දක්වා සියයට 13කින් වර්ධනය කර ගන්න අපි පසුගිය කාලය තුළ සමත් වෙලා තිබෙනවා. ඒ නිසා හරි පැහැදිලිව, අපි ක්‍රමක්‍රමයෙන් මේ රට ඉහළට ඔසවමින්, ගොඩනහමින් තිබෙනවා. ගුවන් යානා ඉන්ධන අළෙවිය ලීටර මිලියන 21කින් ඉහළ නංවා ගන්නත් අපි සමත් වෙලා තිබෙනවා, පසුගිය අවුරුද්දේ පළමු මාස හයට සාපේක්ෂව.

ඒ විතරක් නොවෙයි, පසුගිය 15වැනි දා වනකොට කොළඹ කොටස් වෙළෙඳ පොළේ සියලු කොටස් මිල දර්ශකය - ASPI එක - 20,000 ඉක්මවා ඉහළ ගියා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන් ගමන් වාර සංඛ්‍යාව පළමු මාස 6 තුළ සියයට 16ක වර්ධනයක් අත්කර ගන්න සමත් වෙලා තිබෙනවා. (10th Start)

කල්පනා කරලා බලන්න, ඔයගොල්ලන් මේ රට වැට්ටුවා විතරක් නොවෙයි, රටේ ජනතාවට කැව්වේ වසවිස. ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතතාව සියයට 24 ඉඳලා සියයට 16 දක්වා පහළ හෙළන්නත් අද අපි සමත්වෙලා තිබෙනවා. අපේ ඉලක්කය, තව කාලයක් යනකොට සමස්තයක් ලෙස රටේ ආහාර අනාරක්ෂිතතාව අවසන් කිරීමයි. ඒ වෙනුවෙන් තමයි අපි පියවර නහමින් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට රට ක්‍රමක්‍රමයෙන් ඉහළට යනකොට කොහෙන් හරි මොකක් හෝ කොනක් අල්ලාගෙන මේ රට වට්ටන්න උත්සාහ කරනවා නම්, සොරි තමයි. ඒගොල්ලන්ට කියන්න තිබෙන්නේ, සොරි කියලා තමයි. අපි දැක්කා, සමහරු කඳමලු බැඳගෙන එක එක නාට්‍ය රඟපානවා. ඕවා නාට්‍යවලට විතරක් සීමා වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා කවුරු හරි හීන දකිනවා නම් හෙට ආපසු බලය අරගෙන මේ රට නැවත හොරුන්ගේ දේශයක් බවට පත් කරන්න, මේ රට නැවත දූෂිතයන්ගේ දේශයක් බවට පත් කරන්න, මේ රට නැවත කාබාසිනියා කරන්න, ඒකට ඉඩ දෙන්න අපි සූදානම් නැහැ කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට වේලාව ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Namal Rajapaksa, please. You have ten minutes.

[අ.භා. 1.30]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙතුමන්ලා දැන් කැසිනෝ ගැන කථා කරනවා. කැසිනෝ දාලා, ගංජා වවලා ආර්ථිකය හදන්න යනවා කියලා තමයි එදා මේ අය අපට චෝදනා කළේ, විහිළු කළේ. හැබැයි අපි සතුටු වෙනවා, එහෙම කියපු අය අද එතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිවලට කැසිනෝයි, ගංජායි දෙකම ඇතුළු කර තිබෙන එක ගැන. ඒ දෙකම ඇතුළත් කර තිබෙනවා විතරක් නොවෙයි, අපටත් වඩා හොඳට ඒවා සමාජගත කරන්නත් එතුමන්ලා මහන්සි වෙනවා.

දැන් රාජ්‍ය ආදායම ගැන කථා කළා. ඔව්, දැන් අසීමිතව බදු වැඩි කරනවා, ජනතාව පිට බදු පටවනවා. ජනතාවට බදු ගහලා ආණ්ඩුව කියනවා, අපි ආදායම වැඩි කර ගත්තා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩි කර ගත් ආදායමෙන් දැන් ජනතාවට ලැබෙන්නේ මොනවාද? ඒ කාලයේ කිව්වා, විදුලි බිල අඩු කරනවා කියලා. නමුත් අඩු කළේ නැහැ. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කිව්වා. නමුත් අඩු කළේ නැහැ. මේවා ඔබතුමන්ලා කියපු දේවල්. එහෙම නැතුව අපි කියපු දේවල් නොවෙයි. ඔබතුමන්ලා තවත් පැත්තකින් මොකක්ද කිව්වේ? පොහොර සහනාධාරය වෙලාවට ලැබෙන්නේ නැහැ කිව්වා. වී මිලදී ගැනීම ගැනත් කිව්වා. ආණ්ඩුව වී මිලදී ගන්නේ නැහැ

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

කිව්වා. එක පැන් පහරින් හාල් මාෆියාව අවසන් කරනවා කියලා තමයි බලයට ආවේ. හැබැයි, හැමදාම හාල් පිට රටින් ගේනවා. ඉස්සර කිව්වේ, ඇමතිවරයා කොමිස් ගහන්න හාල් පිට රටින් ගේනවා කියලා. දැන් ඒක කොහොමද කියන්න මම දන්නේ නැහැ. මොකද, අපි ඒ වාගේ දේවල් කියන්න යන්නේ නැහැ නේ. හැබැයි, ඉස්සර කිව්වේ එහෙමයි. *[බාධා කිරීමක්]* ඔව්, අපි එන්නම්. ඉන්න, ඉන්න. ඉස්සර හාල් කිලෝවක් රුපියල් 180යි. දැන් හරි, දැන් බලමුකෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙළෙඳ ඇමතිතුමා වාඩිවෙලා ඉන්නවා නේ මේ සභාවේ. නැවට පැටෙව්වාම හාල් කිලෝවක් කීයක් වෙයිද කියලා බලමුකෝ. මේ, ඉස්සර කියපු ඒවා. හැබැයි, දැන් ලස්සනට පිට රටින් හාල් ගේනවා. ඒ, ජනතාව වෙනුවෙන්ය කියනවා. හැබැයි, ගොවියා? නෙත වී කිලෝවක මිල උපරිම රුපියල් 93යි. වේළිච්ච වී කිලෝවක මිල උපරිම රුපියල් 105යි. ගොවියාගේ ආදායම සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටිලා. අද ගොවියා ගැන හොයන්න මේ ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැහැ.

පාරවල් හදනවාය කිව්වා. පාරවල් හදන එක කෙසේ වෙතත් වළවල් වහනවා නම් දැක්කා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම විදුලිය, ජලය දෙනවාය කිව්වා. නමුත්, ටැප් එකක් අරිනවා නම් දැක්කා. බස් එකක යනවාත් දැක්කා. හැබැයි, ඔබතුමන්ලා මේ වැඩි කර ගන්න රාජ්‍ය ආදායමින් මේ රටේ ජනතාවට ලැබෙන්නේ මොනවාද? රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම පිළිබඳව අපි ප්‍රශ්න කරන්නේ නැහැ. හැබැයි, බදු ගෙවන මේ රටේ ජනතාවට ඔබතුමන්ලා අනෙක් පැත්තෙන් ලබා දෙන්නේ මොකක්ද? එහෙම කිසිම දෙයක් ලබා දෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එදා නම් ඔය වාගේ දේවල්වලට එතුමන්ලා කිව්වේ හොරකම් කරනවා කියලා. නමුත්, අද අපි එහෙම අභූත චෝදනා නඟන්නේ නැහැ. හැබැයි, තැන් තැන්වල තිබෙන ඒවාත් ටික ටික එළියට එයි. ඒවාට ආණ්ඩුව මේ වෙනකොට සූදානම් වෙන බවකුත් අපට පෙනෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් අසීමිත විධියට බදු ගහලා රාජ්‍ය ආදායම වැඩි කරනවා. අනෙක් පැත්තෙන්, සමස්ත රාජ්‍ය සේවය සහ රාජ්‍ය යන්ත්‍රණය කඩා වට්ටන තැනට මේ ආණ්ඩුව කටයුතු කරනවා. සමස්ත රාජ්‍ය සේවයම, සමස්ත රාජ්‍ය යන්ත්‍රණයම කඩා වැටෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් යෞවන සමාජ ව්‍යාපාරය දේශපාලනීකරණය කරනවා. අනෙක් පැත්තෙන් ඒක රටේ අධිකරණ පද්ධතිය දක්වා දේශපාලනීකරණය කරන්න මේ ආණ්ඩුව උත්සාහ කරනවා. දැන් අලුත්ම න්‍යාය පත්‍රය තමයි, අධිකරණ පද්ධතිය දේශපාලනීකරණයට ලක් කිරීම. ජනාධිපති ලේකම්වරයා පත් කළේත් එහෙමයි. ඒක ජනාධිපතිතුමාගේ කැමැත්ත. තමන්ගේ දේශපාලන වේදිකාවෙන් ගෙනැල්ලා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කළා. තමන්ගේ දේශපාලන වේදිකාවෙන් ගෙනැල්ලා CID එකේ ප්‍රධානියා පත් කළා. හැබැයි, අද වනකොට අධිකරණ පද්ධතියටත් තමන්ගේ දේශපාලනීකරණය ගෙනෙන්න උත්සාහ කරනවා. අපි ආණ්ඩුවට කියන්නේ ඒක නවත්වන්න කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අධිකරණ පද්ධතිය ස්වාධීනව කටයුතු කළා. ඒ ස්වාධීන අධිකරණ පද්ධතිය දේශපාලනීකරණය කරන්න ලැහැස්ති වෙන්න එපා. *[බාධා කිරීමක්]* ඔය ඉස්සරහ පේළියේ වාඩිවෙලා ඉන්න අයගේ නඩු ළඟ තිබෙන ගරු විනිශ්චයකාරවරුන් මාරු කරලා තිබෙනවා. අපි ඒක දන්නවා. රටම දන්නවා, කාගේ නඩු ද තිබෙන්නේ කියලා. මොකද, අපේ ඉඩම් ගැන කථා කරනවා. අපට අනුරාධපුරයට ගියාම නාන්න විතරක් ගෙයක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Wash එකක් දමා ගන්න යන්න ගෙවල් තිබෙන අය තමයි අපට දැන් චෝදනා කරන්නේ. *[බාධා කිරීම්]* අපි ඒවාට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ.

හැබැයි, අපි ඔබතුමන්ලාට කියන්නේ මේ රටේ අධිකරණ පද්ධතියට ස්වාධීනව කටයුතු කරන්න ඉඩ දෙන්න කියායි. අධිකරණ පද්ධතියේ ගරු විනිශ්චයකාරවරු පත් කිරීමට, මාරු කිරීමට දේශපාලන මැදිහත්වීම ගෙනෙන්න එපා. පොලීසිය දේශපාලනීකරණය කළා. අනෙක් පැත්තෙන් හමුදාව දේශපාලනීකරණය කරන්න උත්සාහ කරනවා. අපි දකිනවා, හිටපු නාවික හමුදාපතිවරයා හඳුනා ගන්න එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ බුද්ධි අංශයෙන් ගෙනැල්ලා එතුමාව ඇතුළට දානවා. අනෙක් පැත්තෙන් වෙනත් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා, උතුරේ හර්තාල් එනකොට. දැන් ඒ පැත්තට ගිහිල්ලා අනෙක් පැත්තට කථා කරනවා. අපි දන්නවා, ඔය හර්තාල් පිටුපසත් ඉතින් විට් යවලා කඩ වහන්න පුරුදු කළේ ඔබතුමන්ලා බව. ඒ, වෙන කවුරුවත් නොවෙයි නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා නම් ඒවාට සම්බන්ධ නැති බව මම පෞද්ගලිකවත් දන්නවා. හැබැයි, මේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ අලුත් සංස්කෘතියක් හදන්න නේ ආවේ. ඔබතුමන්ලා කැසිනෝ වාගේ මේ හැම දෙයක්ම කරන්නේ ආයෝජකයන් ගෙනෙන්න නේ. ආයෝජකයන් ගෙනෙන්න යන ගමනේදී රටේ රාජ්‍ය සේවය කඩා වට්ටනවා නම්, රාජ්‍ය යන්ත්‍රණය දේශපාලනීකරණය වෙනවා නම්, අපි කථා කරන මේ මොහොතේදීත් කොහේ හෝ හන්දියක කවුරු හරි පුද්ගලයෙකුට වෙඩි තියලා ඝාතනය කරන්න උත්සාහ කරනවා නම්, ආයෝජකයෙක් ලංකාවට එයිද? අනෙක් පැත්තෙන්, අධිකරණ පද්ධතිය තමන්ගේ දේශපාලන ග්‍රහණයට ලක් කරන්න උත්සාහ කරනවා නම් ආයෝජකයෙක් එයිද? *[බාධා කිරීමක්]* අහගෙන ඉන්නකෝ. *[බාධා කිරීමක්]* එන්නම්, එන්නම්. අපි ඔබතුමන්ලාත් හම්බ වෙන්න එනවා, වෙලාව ආවාම. අධිකරණ පද්ධතියත් තමන්ගේ ග්‍රහණයට ලක් කරන්න උත්සාහ කරනවා නම් මොන පනත පාර්ලිමේන්තුවට ගෙනාවත් ඒ වාගේ රටකට ආයෝජකයෝ එයිද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

ඒ වාගේම තමයි, සංචාරක ව්‍යාපාරය. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඇහුම්කන් දෙන්න. ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ මිනිසුන්ගේ පැත්තේ නේ හිටියේ. සංචාරකයන්ට තමුන්නාන්සේලා driving licence එක දෙනවා, airport එකේදි. ඕනෑම සංචාරකයෙකුට international driving licence එකෙන් වාහනයක් පදවන්න පුළුවන්. Airport එකේදි driving licence එක නිකුත් කරන්න දෙයක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා කරන වැඩෙන් මොකක්ද වෙන්නේ? ගම්වල, නගරවල ඉන්න කුඩා හා මධ්‍ය පරිමාණයේ සංචාරක ව්‍යාපාරයේ නියැළෙන අයට තමයි මේකෙන් පහර වදින්නේ. එක පැත්තකින් චෝදනා කරනවා, විදේශිකයෝ මේ රටට ඇවිල්ලා අනවසරයෙන් සංචාරක ව්‍යාපාරයේ යෙදෙනවා, හෝටල් කරනවා, restaurants කරනවා කියලා. මේ පාර්ලිමේන්තුව තුළදී කිහිප වතාවක් ඒ ගැන කථා කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Driving licence එක අරගෙන, වාහනයක් rent එකටත් අරගෙන හයර් කරන එක විතරයි නැතුව තිබුණේ. දැන් ඒකත් හරි. මේ ආණ්ඩුවට පින්සිද්ධ වෙන්න හයර් එකක් යන්න හිටපු එකත් වෙන රටවලින් අය ඇවිල්ලා හයර් කරන තැනට පරිවර්තනය වෙනවා. ඉතින්, ඔබතුමන්ලා තීන්දු තීරණ ගැනීමේදී මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්ට ඇහුම්කන් දීලා ඒ කිහිපදෙනෙකුගේ අවශ්‍යතාව මත පමණක් තමන්ගේ දේශපාලන තීන්දු වාගේම ආර්ථික තීන්දු ගන්නවා නම් ඒවා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේදී ගරු ජනාධිපතිතුමා කියපු කථාවක් මම මේ කියන්නේ. ඒක හරිද, වැරදිද කියන්න මම දන්නේ නැහැ. මහ බැංකුවේ රුපියල් ට්‍රිලියනයක සංචිතයක් තිබෙනවා ලු.

රුපියල් ට්‍රිලියනයක සංචිතයක් තිබෙනවා නම්, වී ටික මිලදී ගන්න බැරි ඇයි? ගමේ ඉස්කෝලේ හදන්න බැරි ඇයි? සෙවනගල, පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල උක් ගොවීන්ගේ සල්ලි ටික දෙන්න බැරි ඇයි? අනික් පැත්තෙන් මේ රටේ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න බඩු මිල අඩු කරන්න ආණ්ඩුවට මැදිහත් වෙන්න බැරි ඇයි? ව්‍යාපාරිකයෝ කිහිපදෙනෙකුට විතරක් මේ රටේ ආර්ථිකය හසුරුවන්න ඉඩ දීලා ආණ්ඩුව බලාගෙන ඉන්නේ ඇයි? ඇහුවාම කියන්නේ රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා, ආර්ථිකය හැදෙනවා කියලා. හැබැයි, ජනතාවට එහි ප්‍රතිලාභ යන්නේ නැහැ. ජනතාවට එහි ප්‍රතිලාභ යන්නේ නැත්නම්, රටේ සංවර්ධනයක් වෙන්නේත් නැත්නම්, යටිතල පහසුකම් හදන්නේත් නැත්නම්, ණය ගෙවන්නේත් නැත්නම් මේ ආණ්ඩුව හම්බ කරනවා කියන මුදල්වලට මොකක්ද වෙන්නේ? ඒක මේ ගරු සභාවට කියන්න ඕනෑ. ණය ගෙවන්න තිබෙන්නේ 2028 අවුරුද්දේ ඉඳන් නේ. ණය ගෙවන්නේත් නැත්නම් මේ මුදල්වලට ආණ්ඩුව කරන දේ පිළිබඳව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව දැනුවත් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ රාජ්‍ය යන්ත්‍රණය කඩා වැට්ටවීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලා සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මොකද, එක පැත්තකින් රාජ්‍ය යන්ත්‍රණය දේශපාලනීකරණය කරනවා. අනික් පැත්තෙන් තමුන්නාන්සේලා පාර්ලිමේන්තුව ඇතුළේ බොරු කීම අයිතියක් බවට පත් කරලා තිබෙනවා. අපි හිතුවේ එළියේ විතරයි බොරු කියන්න අයිතියක් තිබෙන්නේ කියලා. ජනාධිපතිතුමා ඇවිල්ලා තහවුරු කළා, පාර්ලිමේන්තුවේම වාඩිවෙලා ඕනෑ බොරුවක් කියන්න, හැබැයි එළියේ කියනවා නම් පරිස්සම් වෙන්න කියලා. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙනුත් ඉල්ලන්නේ මෙයයි. මේ පනත් හොඳයි. මේ තිබෙන්නේ පනත්වල ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, මේ පනත් ක්‍රියාත්මක කරන්න පුළුවන් වන විධියට මේ system එක හදන්න. මේ පනත් අලුත් කරන්න.

ඩොලර් මිලියන 500ක ආයෝජන ඇවිල්ලා තිබෙනවාය කිව්වා. ඔබතුමන්ලා ඔය ආපු ඩොලර් මිලියන 500 පිළිබඳ විස්තර සභාගත කරන්නකෝ. මොන සමාගමෙන්ද ඩොලර් මිලියන 500 ආවේ, කවුද ආයෝජකයා, මොකටද ආයෝජනය කරන්නේ කියලා කියන්න. කර්මාන්තශාලා වැහිච්ච ඒවා ගැන අපි දන්නවා. පසුගිය කාලයේ එක දිගට ඇඟලුම් කර්මාන්තශාලා වැහුණා. ඒක අපි දන්නවා. ඇඟලුම් කර්මාන්තශාලා වැහෙන එක අපි දන්නවා. හැබැයි, රටේ ආයෝජනය කළේ කවුද කියන එක අපි කවුරුවත් දන්නේ නැහැ. ආණ්ඩුව ඒ ගැන දන්නේත් නැහැ. එක වේලාවක කියනවා, බිලියන 4ක ආයෝජන අපි සැලසුම් කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම දැන් කියනවා, ඩොලර් මිලියන 500ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා කියලා. ඩොලර් මිලියන 500 ආවේ මොන ව්‍යාපෘතියටද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමියට නම් උත්තර දෙන්න එපා කියන්න. නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. මොකද, මේ ඔක්කෝම එකතු වෙලා අගමැතිතුමියට බණිනවා. ඒ නිසා මේ ගැන වෙනත් විෂය භාර ඇමතිවරයෙක් ඇවිල්ලා උත්තර දුන්නොත් හොඳයි.

කෙසේ වෙතත්, අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ මේ රටේ රාජ්‍ය සේවය සහ අධිකරණ පද්ධතියට කරුණාකර ස්වාධීනව කටයුතු කරන්න ඉඩ දෙන්න කියලායි. පොලීසියට ස්වාධීනව කටයුතු කරන්න ඉඩ දෙන්න. තමුන්නාන්සේලා මේ සිද්ධ වෙන සංවිධානාත්මක අපරාධ හැම එකක්ම විපක්ෂය මත පටවලා, විපක්ෂයට ඇඟිල්ල දිගු කරලා ඇඟ බේරා ගන්න ලැහැස්ති වෙන්න එපා. මේ රටේ මිනිසුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. එතකොට මේ පනත් කෙටුම්පත් සම්මත කිරීමත් එක්ක ආයෝජකයෝ අපේ රටට ඒවි. එහෙම නැතුව මේ මොන ප්‍රතිපත්තිය අනුගමනය කරන්න මේ අය උත්සාහ කළත් වැඩක් නැහැ. මොකද, මේ අයගේ ප්‍රතිපත්ති නොවෙයි නේ, මේවා. මේ, IMF එකෙන් දෙන ප්‍රතිපත්ති නේ. දැන් මෙතුමන්ලා IMF එකේ යාළුවෝ වෙලා නේ. IMF එක දෙන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නත් මේ රටේ ජනතාවගේ - පුරවැසියාගේ - ආරක්ෂාව තහවුරු කළ යුතුයි කියා අපි කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Wasantha Samarasinghe. You have 20 minutes.

[අ.භා. 1.40]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග, විදේශ විනිමය පනත යටතේ වන නියමය සහ සූදු ක්‍රීඩා නියාමන අධිකාරියක් පිහිටුවීම පිළිබඳව අද දවසේ සිදු කරන සාකච්ඡාවට එකතු වෙන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ සාකච්ඡාවට එකතු වෙමින් විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දේවල් කිව්වා. එහෙම කියලා එතුමන්ලා සභාවෙන් යන්නේ නැතුව හිටියා නම් හොඳයි කියලා තමයි මට කියන්න තිබෙන්නේ. හැබැයි, ගියත් කරන්න දෙයක් නැහැ. *[බාධා කිරීමක්]* කොහොමත් online අහගෙන නේ ඉන්නේ. ඔබතුමන්ලාටත් සමහර විට ඇතුළේ ඉඳන් තමයි online අහගෙන ඉන්න වෙන්නේ. මොකද, ආයෝජන ගෙනාපු නිසා තමයි උසාවිවල නඩු ඇහෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඇයි යන්නේ? අහගෙන ඉන්න. ඉතුරු ටිකත් කියන්නයි හදන්නේ. online නොවෙයි, අහගෙන ඉන්න. පවුලේ ඔක්කෝටම නඩු. ඔන්න, රට හදපු හැදිල්ල. අපෙන් අහ ගන්න එපා, නඩු ගැන. හොඳද? නඩුවෙන් නඩුව කියනවා. හූ මිටි තියන්නත් එනවා, ළඟ ඉඳන් කට්ටිය. මම මේ නැඟිට්ටේ ඒ ගැන කියන්න. කෝට්ටේ, දුව පාරේ විතරක් තිබෙනවා, ඉඩම් 4ක්; පොඩි මල්ලි ගත්තේ; මොකද, rent එකට ගත්තා කියලා තමයි කිව්වේ. පැමිණිල්ල විභාග වෙනකොට බලා ගන්න. ගෙනාපු ආයෝජන නිසා උසාවිවල නඩු. මෙන්න, ආයෝජන ගෙනාපු හැටි. අපෙන් අහනවා, අපි ගෙනාපු ආයෝජන ගැන. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැරදිලා වුණත් කියැවෙනවා, රට හදන්නකෝ කියලා. ඉස්කෝල හදන්න කියනවා; පාරවල් හදන්න කියනවා; පාලම් හදන්න කියනවා. හත්වළාමේ, මෙච්චර කල් රුපියල් බිලියන 30,000ක් ණය අරගෙන මොකක්ද කළේ? ඒ ගත්ත ණය නාස්ති කරපු ආකාරය පිළිබඳව Auditor-General එක වේලාවක කරුණු කිව්වා. දැන් අපට කරුණු කියන්න විතරක් නොවෙයි තිබෙන්නේ. නැවත මේ රට හදන්නත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රට හදන්න අවශ්‍ය වන කරුණු ටිකක් කියන්න හදනකොට මොකක්ද මේ කියන්නේ?

අපෙන් අහනවා, වී මිල ගැන.

පොහොර වෙලාවට දෙන්නේ නැහැ කියනවා. මම හිතන විධියට ලංකාවේ නොවෙයි, onlineම තමයි ඉන්නවා ඇත්තේ, onlineම තමයි ඉන්නවා ඇත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ දැනගැනීම සඳහා මම මේ කාරණා

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කියනවා. ජනාධිපතිතුමා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ කමිටුවක් පත් කර තිබෙනවා, අමාත්‍යාංශ ලේකම්වරු 10දෙනෙකුගෙන් සමන්විතව. මගේත්, අපේ කෘෂිකර්ම ඇමතිතුමාගේත් සම සභාපතිත්වයෙන් යුතුව අපි සති දෙකකට වතාවක් මේ කමිටුව කැඳවනවා. රටේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව තීන්දු තීරණ ගන්නවා, එතැනින්.

පසුගිය මහ කන්නයට පොහොර සහනාධාරය බෙදන්න සල්ලි වෙන් කර තිබුණේ ටිකක් අඩුවෙන්. හැබැයි, අපි ඒකට සල්ලි හොයලා දුන්නා, රුපියල් බිලියන 4ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යල කන්නයේ පොහොර සහනාධාරය ගෙවලා ඉවරයි. හෙක්ටෙයාර 528,000කට පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 13,189ක් මේ වනකොට ගෙවලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි අපි කිව්වා, යල කන්නයේ කුඹුරුවල වගා කරන අතිරේක භෝගවලටත් ගෙවනවා කියලා. මේ වනකොට ඒ සඳහා හෙක්ටෙයාර 28,000කට රුපියල් මිලියන 149ක් අපි ගෙවලා තිබෙනවා. ඔක්කොම රුපියල් මිලියන 13,800කට ආසන්න මුදලක් පොහොර සහනාධාරය වෙනුවෙන් අපි ගෙවලා තිබෙනවා. ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා ඒ තොරතුරු මම **සභාගත*** කරනවා. මේ මුදල් ගෙවලා ඉවරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වී ගැන ඇහුවා. මේ වනකොට යල කන්නයේ අස්වැන්න කැපෙනවා. කෘෂි කර්මාන්තය තුළ ගොයම් කැපෙන ආකාරයක් තිබෙනවා. ඒ ආකාරය අනුව උතුරේ දිස්ත්‍රික්ක කිහිපයක සියයට 60ක්, 70ක්, 80ක් ගොයම් කැපිලා ඉවරයි. හැබැයි, පොඩි ප්‍රමාණයයි තිබෙන්නේ. ලංකාවේ වැඩිම වී අස්වැන්න තිබෙන්නේ අනුරාධපුරයේ. ඊට පස්සේ තිබෙන්නේ අම්පාරේ. ඊළඟට, තිබෙන්නේ පොළොන්නරුවේ. මේ කන්නයේ අපි වගා කර තිබෙනවා, හෙක්ටෙයාර 537,000ක්. ඒ විතරක් නොවෙයි, මේ වනකොට ඒකෙන් සියයට 45යි අපි අස්වැන්න නෙළලා තිබෙන්නේ. මෙට්‍රික්ටොන් මිලියන එකකට වැඩියෙන් අපි වී අස්වැන්න නෙළලා තිබෙනවා. ඒ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ගත්තොත්, හැම දාම රජය වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට මැදිහත් වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මැදිහත් වුණු කාල තිබුණා. වී අලෙවි මණ්ඩලයෙන් වී ටික මිලදී ගත්තා. ගබඩාවේ තිබෙන වී ටික සත්ත්ව ආහාර කියලා යාළුවන්ට කුණු කොල්ලයට දුන්නා. ඒගොල්ලන් මේක ගේම් එකක් කරගෙන හිටියේ. ඒ ගේම් එක අපි අවසන් කරලා තිබෙන්නේ. වී අලෙවි මණ්ඩලය විතරක් නොවෙයි, සතොස වහලා දැම්මා. රවී කරුණානායක මහත්මයා දන්නවා, සතොසවල් වහලා දැම්මා කියලා. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ලංකාවේ පරණම සංස්ථාව. පළමුවෙනි සංස්ථාව තමයි වහලා දැම්මේ. ගිය ඡන්දයට කලින් ඒකේ වාහන 100ක් තිබුණා. ඒවායින් 56ක් ලොරි. හොඳම ලොරි ටික, ලක්ෂ 130ක් වටිනා ලොරි ලක්ෂ 56 ගණනේ විකුණලා තිබෙනවා. ඒ ගැන පරීක්ෂණ කරන්න දැන් පැමිණිල්ල දාලා තිබෙන්නේ. අපි සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කළා. වී අලෙවි මණ්ඩලය සහ සතොස මහ කන්නයේ වී මිලදී ගැනීම පටන් ගත්තා. යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා මහ කන්නයේ වී ටික අපි සහල් කරන්න පටන් ගත්තා. ඊයේ සිට අපි "සතොස" නමින් සහල් වෙළෙඳ පොළට එවනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේවා කුණු කොල්ලයට විකුණන්නේ නැහැ. පාරිභෝගිකයාටයි දෙන්නේ, ඒ සහනය.

වී මිලදී ගැනීම පිළිබඳවත් අපි යාන්ත්‍රණයක් හදලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, වී මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට වාගේම මහා පරිමාණ මෝල් හිමියන්ටත් ඔඩපණ ණය පහසුකම ආණ්ඩුවෙන් ලබා දෙනවා. රාජ්‍ය බැංකුවලට වාගේම පෞද්ගලික බැංකුවලටත් මේ පහසුකම ලබා දෙනවා. ඔඩපණ ණය පහසුකම යටතේ අපි මේ වනකොට රුපියල් මිලියන 4,971ක් ලබා දී තිබෙනවා, කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට. ඊට අමතරව මහා පරිමාණ මෝල් හිමියන් ඇතුළු සියලුදෙනාට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙන්ම රුපියල් මිලියන 15,000ක් ලබා දී තිබෙනවා. වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 15,000ක්! ඊට අමතරව, සතොසට මිලියන 5,000ක්, වී අලෙවි මණ්ඩලයට මිලියන 10,000ක් වී මිලදී ගැනීම සඳහා ආණ්ඩුව මුදල් වෙන් කර තිබෙන බව මේ වෙලාවේ අපි කියන්න ඕනෑ. භය වෙන්න එපා, අපේ ආණ්ඩුව වී මිලදී ගැනීම කරනවා. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග පිළිබඳව තමයි දැන් මේ කියන්නේ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා කථාව කරලා එළියට ගියා. කථාව කරලා සභා ගර්භයෙන් එළියට යනවා නේ. මට ඉතුරු ටික කියන්න ඕනෑ එතුමා ඉන්නකොටයි. මම නම කිව්වේ එයි ද කියලා බලන්නයි. එතකොටවත් එයි ද දන්නේ නැහැ නේ. ඒගොල්ලන් කියලා මාරු වෙනවා. කියලා මාරු වෙන්න එපා. බංකොලොත් වෙච්ච, ණය ගෙවා ගන්න බැරි වෙච්ච, ලංකාවේ ලොකුම වත්කම් තිබෙන බැංකුවටවත් LC එකක් open කර ගන්න බැරි වෙච්ච රටක් අපි භාර ගත්තේ. ඒ රට අපි ක්‍රම ක්‍රමයෙන්, පියවරෙන් පියවර, පියවරෙන් පියවර පරිවර්තනීය යුගයක් කරා ගෙන යමින් ඉන්නේ. ඒ පරිවර්තනීය යුගය සඳහා වූ තීන්දු තීරණ අපි ගන්නවා. ඒ තීන්දු තීරණ අරගෙන අපි වැඩ කරනවා. එහෙම වැඩ කරනකොට දැන් කථා කරන්න එනවා, tap එකක් ඇරපු එක ගැන. නැහැ, tap එකක් ඇරීම එක විතරක් නොවෙයි, රුපියල් බිලියන 1,400ක ප්‍රාග්ධන වියදමක් මේ අවුරුද්දේ මාස 6ට අපි කරනවා. රුපියල් බිලියන 1,400ක් සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් කරනවා. ඒ තමයි ආණ්ඩුවේ වැඩ පිළිවෙළ. මැයි මාසයේ 6වැනි දා වනකල් ඡන්ද තිබුණා. මැයි මාසයේ 6වැනි දායින් පස්සේ තමයි සංවර්ධන ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කරන්න වුණේ.

අපි දන්නවා, නිරිතදිග මෝසම් වැසි පටන් ගන්නයි එන්නේ කියලා. ඊට කලින් වැව් අමුණු ටික, ඒ වාගේම පාරවල් ටික පිළිසකර කර ගන්න ඕනෑ. ඒ නිසා අපි වේගෙන් වැඩ කරනවා. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ මොකක්ද? තාක්ෂණික නිලධාරින් නැති නිසා වැඩ කර ගන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සමහර තැන්වලදී කට්ටිය කිව්වා, රාජ්‍ය සේවයට පුද්ගලයන් බඳවා ගන්නවා නම් ඉන්න අයගේ වැඩ සමාලෝචනය කරලා අවශ්‍යතාව අනුව තීරණය කරන්න ඕනෑ කියලා. ඔව්, එ්ක කරන්න ඕනෑ. හැබැයි, දැන් රාජ්‍ය සේවයේ ඉන්න අය අයින් කරන්නත් බැහැ. ඒ වාගේම අපි අවශ්‍ය තැන්වලට නිලධාරින් බඳවා ගන්න ඕනෑ. තාක්ෂණ නිලධාරින් ගන්න ඕනෑ. ඉහළ නිලධාරින් ගන්න ඕනෑ. මගේ අමාත්‍යාංශයේ ආයතන 16ක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ හැම ආයතනයකම පුරප්පාඩු. ඒ නිසා අවුරුදු 5කට පස්සේ රාජ්‍ය සේවයට 62,000ක් බඳවා ගන්නවා. උපාධිධාරින් බඳවා ගැනීමේ වයස වැඩි කරලා, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වයස වෙනස් කරලා ඒ අය රාජ්‍ය සේවයට බඳවා ගන්නවා. වසර ගණනාවක් රාජ්‍ය සේවකයාගේ වැටුප් හදලා තිබුණේ නැහැ. අපි වැටුප් හැදුවා. විශ්‍රාමිකයන්ගේ වැටුපේ බරපතළ විෂමතා තිබුණා. ඒ විෂමතා හැදුවා. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප රුපියල් 30,000 දක්වා වැඩි කළා. වතු සේවකයන්ට රුපියල් 1,700ක වැටුපක් ලබා දීම වෙනුවෙන් රජය මැදිහත්වෙමින් තිබෙනවා. අපි ඒ ආකාරයට සියලු ක්ෂේත්‍රවලට මැදිහත් වෙනවා. එහෙම මැදිහත්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙනකොට ආර්ථිකය අවිධිමත් කරපු සහ මෙච්චර කල් යාළුවෝ එක්ක ගේම් ගහමින් හිටපු අයට ටිකක් අමාරුයි. මොකද, මේවා අස්සේ තමයි සමහර ගනුදෙනු දිව්වේ, ආවේ, ගියේ. මේවා තමයි ගේම් හැටියට තිබුණේ. මේවා නියාමනය සඳහා ක්‍රියාමාර්ග ගන්නවා වෙනුවට, ඒ නියාමන කටයුතු නවත්වලා තිබුණාම ඒගොල්ලන්ට නියාමනය කරන්න ලේසියි. මොකද, රජය නියාමනයට මැදිහත් නොවුණාම ආණ්ඩුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු, ඔවුන්ගේ යාළුවෝ තමයි ඒ නියාමනය කරන්නේ. ඒගොල්ලෝ තමයි හිතවත් යාළුවන්ට කථා කරලා ඔවුන් ගෙනැල්ලා ගණන ඉල්ලා ගන්නේ. දැන් ඒක තමයි අපි නවත්වන්න යන්නේ.

ලෝකයේ රටවල් 190කින් 130කම මේ regulations තිබෙනවා, මේ නීති හදලා තිබෙනවා. සූදු නියාමනය පිළිබඳ regulations, authorities හදලා ඒ රටවල නීති ක්‍රියාත්මක කරනවා. ආසියාවේ වුණත් සමහර රටවල් තිබෙනවා, -මුස්ලිම් ජනතාව වැඩියෙන් ජීවත්වෙන රටවල්- ඒ රටවල මේ නීතිත් නැහැ. මේ සූදු ක්‍රියාත්මක කරන්න දෙන්නේත් නැහැ. ඒ ආගම, සංස්කෘතිය අනුව ඒ විධියට ගොඩ නැඟිච්ච තැන් තිබෙනවා. අපේ රටේ තත්ත්වය මොකක්ද? අපේ රටේ සූදු තිබෙනවා. විවිධ සූදු තිබෙනවා. කට්ටිය කාලයක් ජනතාවගේ මුදල් එක්කත් සූදු ගැහුවා. දැන් ඒක නැතිවෙලා තිබෙන්නේ. අපි ඒ සියලු සූදු නැති කරලා රට විධිමත්ව පියවරෙන් පියවර පිළිවෙළට ඉස්සරහට ගෙන යන්න කටයුතු කරනවා. මේ අධිකාරිය පිහිටුවීමට වුවමනා වෙන්නේ ඇයි? ඉස්සරහ දොරයි, පිටුපස දොරයි එකට තියාගෙන කැසිනෝ ගහන ඒවා ගැන අපි දන්නවා. ඒ නිසා අද අපි රටේ නීති හැදුවා. එක මන්ත්‍රීවරයෙක් අපෙන් ඇහුවා, පරණ බදු තිබුණා, ඒවාත් එකතු කරගන්න තිබුණා නේ කියලා. ඔව්. නමුත් මෙච්චර කල් ආණ්ඩු තිබුණා, මෙච්චර කල් ආණ්ඩු කළා, ආණ්ඩුත් එක්ක එකට හිටියා. එතකොට ඒවා කිව්වේ නැහැ නේ. අපි කියන්නේ ඒකයි.

මේ සූදු, ක්‍රීඩා හැටියටත් තිබෙනවා. මේ කුමක් තිබුණත් අපේ පැත්තෙන් අපි හිතනවා, මේ රට ඉස්සරහට ගෙන යන්න නම් රෙගුලාසි - regulations, නීති, ඒ අණපනත් හැදිය යුතු ඒවා අපි හදන්න ඕනෑ කියලා. අපි මේ නියාමන අධිකාරිය පිහිටුවීමේ ක්‍රියාවලිය පටන් ගන්නේ ඇයි? නියාමන අධිකාරියක් පිහිටුවන්න වුවමනා වෙන්නේ ඇයි අපට? මේගොල්ලන් දන්නවා, මෙවැනි නියාමන අධිකාරියක් පිහිටුවන්න වුවමනා වෙන්නේ නිකම් නොවෙයි කියලා. නියාමන අධිකාරියක් පිහිටුවන්න වුවමනා වෙන්නේ නියාමනයකින් තොරව සිද්ධ වෙන වැඩ ටික පිළිවෙළකට අරගෙන එන්නයි. මෙච්චර කල් බදු ගෙව්වේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රීඩාව ඇතුළේ කැසිනෝ තමයි වැඩිපුරම ප්‍රසිද්ධ වෙන්නේ. මේක ඇතුළේ විවිධ සෙල්ලම් තිබෙනවා. මේක ඇතුළේ දිනුම් ගන්නා අයට බදු ගෙවන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ කිසි කෙනෙක් සූදු ගහලා දිනපු බවක් පෙනෙන්නේ නැහැ. ඇයි? ඒ කවුරුත් බදු ගෙවලා නැහැ. ඒකෙන් කියන්නේ ඒකද? නැහැ. එහෙම නම් කවුරුත් ඔය සූදු පොළට එන්නේ නැහැ. කවුරුත් කැසිනෝ ගහන්න එන්නේ නැහැ. දිනන අය බදු ගෙවලා නැහැ. හැබැයි, ඒවා කොහෙන්ද regulate වෙන්නේ? ඒවා කොහෙන්ද monitor වෙන්නේ? කොහෙන්ද ඒවා අහු වෙන්නේ? ඒවා අහු වෙන්නේත් නැහැ, ඔහේ යනවා. දැන් අපි මොකක්ද කරන්න හදන්නේ? අන්න, අපි කරන්න හදන්නේ ඒවා නියාමනය කිරීම තමයි. අපි කරන්න හදන්නේ මේකයි. කෙනෙක් දිනුවොත්, සූදුවෙන් දිනුවත් ඔහු ඒ දිනපු මුදලට බද්දක් ගෙවන්න ඕනෑ. මොකද, ලොතරැයි මණ්ඩලයේ දිනුමක් ගත්තාම ඒ මුදලින් අදාළ බදු මුදල අඩු කරලා තමයි දිනුම ලබපු කෙනාට ඒ ඉතිරි මුදල දෙන්නේ. ජාතික ලොතරැයි මණ්ඩලයේ හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාවලිය ඇතුළේ ඒකට අදාළ නියාමන ක්‍රියාවලියක් තිබෙනවා. හැබැයි, සූදුවලට එහෙම ඒවා නැහැ. ඒ නිසා මේ නියාමන අධිකාරිය පිහිටුවන එක විතරක් නොවෙයි, මේක හරහා රටේ ආදායම වැඩි කරගන්නවා වාගේම මේ කටයුතු විධිමත් කරන්නත් ඕනෑ.

මම අහගෙන හිටියා එක මන්ත්‍රීතුමෙක් ඇහුවා, රට වටේට නැව් එනවා, නැව් ඇවිල්ලා බලපත්‍රයක් අරගෙන සූදු ගැහුවොත් මොකද කරන්නේ කියලා. හත් දෙයියනේ! දැනුත් නැව් එනවා. සූදු තිබෙන නැව් තිබෙනවා. Passengersලා එන නැව්වල සූදු තිබෙනවා. ඒ package එකත් එක්ක තමයි ඒ නැව ගමනේ යෙදෙන්නේ. ඒකට බලපත්‍රයක් ඉල්ලුවාට පස්සේ දෙනවාද නැද්ද කියලා, අපේ වෙරළට, අපේ වරායකට ඇවිල්ලා ඒ කටයුතු කරන්න ඉඩ දෙනවාද, නැද්ද කියලා තීරණය කරන්න තමයි දැන් මේ අධිකාරිය තිබෙන්නේ.

ඒගොල්ලන්ට ඒ ක්‍රියාවලියට, සූදු ක්‍රීඩාවලට බලපත්‍ර දෙනවාද නැද්ද කියලා තීරණය කරන්නයි එම අධිකාරිය තිබෙන්නේ. මීට කලින් මේවා තීරණය වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවට අයාලේ යෑමක් වුණේ. එදා දේශපාලනඥයන් ඉලක්කයක් නැතුව තමන්ගේ වුවමනාවටයි, තමන්ගේ හිතවතුන්ටයි ඒ කටයුතුවලට අවසර දුන්නේ. නමුත්, මෙම අධිකාරිය තුළින් ඒ කටයුතු regulate වෙනවා. මීට පසුව එවැනි බලපත්‍රයක් දෙනවා නම් අදාළ වග කිව යුතු නිලධාරීන් සියලුදෙනා මැදිහත් වෙලා තීන්දු තීරණ අරගෙන තමයි මේ අධිකාරිය හරහා ඒ නියාමනයට අදාළ බලපෑම් කරන්නේ; මැදිහත්වීම කරන්නේ. අලුතින් ලයිසන් එකක් දෙනවාද, තිබෙන ලයිසන් එක දීර්ඝ කරනවාද කියලා ඒ අධිකාරිය තමයි තීරණය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක නීති තිබුණොත් තමයි ඒ රට පිළිබඳව ලෝකයේ රටවල් සොයන්නේ බලන්නේ සහ කියවන්න ගන්නේ. එම නිසා අපේ රටේ නැති නීති ගොඩක් අප හැදිය යුතුව තිබෙනවා. අපි සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය හදන්නේත් ඒ සඳහායි. අපි ආයෝජන සඳහා ලෝකයේ රටවලට එන්න කියනවා; ආයෝජකයෝ අපේ රට දිහා බලනවා. එතකොට ඒගොල්ලෝ බලනවා අපේ රටේ තිබෙන නීති මොනවාද කියලා. අපි සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නයි කල්පනා කරන්නේ. අපි ඒ සඳහා ආයෝජකයන්ට ආරාධනා කර තිබෙනවා. සංචාරක ව්‍යාපාරයේ ආයෝජන සඳහා ආයෝජකයන් එනකොට විවිධ පැති බලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ව්‍යාපාරිකයෝ ඉන්නවා, තමන්ගේ හෝටලයේ කැසිනෝ තිබෙනවාට අකමැති. හැබැයි, සමහර ව්‍යාපාරිකයෝ ඉන්නවා කැසිනෝ තිබෙන රටවලට යන. ඒ ඇයි? සමහර අය විවිධ රටවලට යන්නේ සංචාරය සඳහාම නොවෙයි. ඒ අය leisure purposesවලටයි යන්නේ. ලෝකයේ සමහර රටවල හෝටල් තිබෙනවා night එකකට විශාල මුදලක් අය කරන. ලාස් වේගාස්වල තිබෙන සමහර හෝටල්වල night එකකට ඩොලර් ලක්ෂ එකහමාරක් අය කරනවා. කැසිනෝවලින්ම හැදිච්ච නගරයක් තමයි ලාස් වේගාස් කියන්නේ. එච් හෝටලයක night එකකට ඩොලර් ලක්ෂ එකහමාරක් අය කරනවා. හැබැයි, කැසිනෝ නැති රටවලුත් තිබෙනවා. උදාහරණයක් තමයි, ස්විට්සර්ලන්තය. ඒ රටේ night එකකට ඩොලර් 80,000ට 90,000ට කාමර තිබෙනවා. හැබැයි ස්විට්සර්ලන්තයේ boundary එකේ තමයි, ප්‍රංශය පැත්තේ තමයි කැසිනෝ තිබෙන්නේ. සංචාරකයෝ රටකට ප්‍රවිෂ්ට වීමේදී මේවා පිළිබඳවත් හිතනවා.

අපේ රට නම් තවම ඩොලර් 100ට කාමරයක් ලබා දෙමින් සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින රටක්. අපි ඩොලර් 40ට, 50ට සංචාරකයන්ට කාමර ලබා දෙන රටක්. හැබැයි, අපේ රට

[ගරු වසන්ත සමරසිංහ මහතා]

සංචාරකයන්ගේ තෝතැන්නක්. ලෝකයේ සංචාරක සිතියම්වල, සංචාරක ගමනාන්ත පිළිබඳ සාකච්ඡාවල, websitesවල, researchesවල කියනවා, ලංකාව ලෝකයේ සංචාරකයන්ට යන්න තිබෙන හොඳම රටක් කියලා. එක්කෝ ඒ පළමුවන තැන, දෙවැනි තැන. එහෙම නැත්නම් හොඳම රටවල් 10 අතර අපේ රට ඉන්නවා, දූපත් අතර සුන්දරම දූපත බවට පත් වෙලා. එම නිසා මේ අනුව අපි කියන්නේ, අපි අපේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන බවයි. අයාලේ ගිය සමහර නීති අපි ක්‍රමානුකූලව පිළිවෙළකට සකස් කරන්න හදන විට විපක්ෂයේ සමහර අය ඒකට බාධා කරනවා. හැබැයි, සමහර මන්ත්‍රීවරුන් නම් මේ කටයුත්ත positive ලෙස දැකලා ප්‍රගතිශීලී - progressive - ලෙස අදහස් දැක්වූවා.

අපේ ආණ්ඩුව මොන විදියේ එකක්ද කියන එකත් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අවබෝධ කර ගන්න ඕනෑ. සමහරු හිතාගෙන ඉන්නවා ඇති, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ, එදා කියපු ඔක්කොම අමතක කරලා කියලා. එහෙම නැහැ. මේ රටේ විධිමත්ව, පිළිවෙළට වැඩ කරන්න ඕනෑ කියන අදහස ඇතිවයි අපි මේ ආණ්ඩුව හැදුවේ. එම නිසා අපි දැනට නැති නීති හැදුවා, අවශ්‍ය නීති ගෙනාවා. ඒ අවශ්‍ය නීතිවලට අනුව රට ඉස්සරහට ගෙන යන්නයි අපි වැඩ කරමින් ඉන්නේ. අවුරුදු 76ක් තිස්සේ ආපස්සට ඇදගෙන ගිය රටක් මාස 8ක්, 9ක් යනකොට අනෙක් පැත්ත හරවන එක සරල නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලෝකයේ රටවල්, රාජ්‍ය නායකයෝ, ජාත්‍යන්තර සංවිධාන අපේ රට දිහා බලනවා. ඒගොල්ලෝ අපේ රටට එනවා. ඒගොල්ලෝ ඇවිල්ලා අපේ රටේ මොකද වෙන්නේ, මොනවාද කරන්නේ, අපේ ප්‍රතිපත්ති මොනවාද කියලා බලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවට ඇවිල්ලා ඔය නිකම් කෑ ගහන මන්ත්‍රීවරුන් කාට හරි පුළුවන් වුණාද, මේ මාස 10ට අපේ ඇමතිවරයෙකු සම්බන්ධයෙන් වංචා හෝ දූෂණ ගැන එක චෝදනාවක් හෝ ඉදිරිපත් කරන්න, එක පැමිණිල්ලක් හෝ දමන්න? බැරි වුණා. ඇයි? අපි මේ රට හදන්න පටන් ගත්තේ ජන වරමකින්; mandate එකකින්. එය වංචාව, දූෂණය හා නාස්තිය අවම කරන්න ලබා දුන් ජනවරමක්. එම ජනවරමට අදාළවම තමයි අපි මේ කටයුත්ත කරමින් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මම ගමනක් යනකොට පාරේ බුරන හැම බල්ලාටම ගල් ගහන්න යන්නේ නැහැ. මොකද, එහෙම කරන්න ගියොත් මගේ ගමන යන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට ගොඩනඟන්න මේ ආණ්ඩුව ගත්තු ප්‍රතිපත්තිමය තීරණ මත තමයි අපි ඒ කටයුතු විධිමත්ව කරන්නේ. මෙතුමන්ලා දැන් ගංජා ගැන කියන්න පටන් ගත්තා, කැසිනෝ ගැන කියන්න පටන් ගත්තා. ආර්ථිකය ඇතුළේ සමහර ක්‍රියාමාර්ග පිළිබඳව අපි තීරණ ගන්නවා. අපි ඒවා ගැන කියන්න බය වෙන්නේ නැහැ. ඒ තීරණ අරගෙන අපි වැඩ කරනවා. හැබැයි, අපි නොකියපු දේවල් තමන්ට ඕනෑ විදියට අර්ථකථනය කරගෙන, තමන්ට කැමැති විදියට කියවාගෙන, තමන්ට කැමැති විදියට විග්‍රහ කරගෙන මෙතැනට ඇවිල්ලා කියන්න එපා. අපි කියපු දේවලට අපි අදටත් වග කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි කියපු දේවලට අපි අදටත් වග කියනවා. එම නිසා ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ සිදු කරන ක්‍රියාවලිය තුළ ඒ කියපු දේවල් ඉටු කරන්න කටයුතු කරනවා.

මේ ව්‍යාපාර ගෙවිය යුතු බදු ගෙව්වේ නැහැ කියලා මෙතුමන්ලා දන්නවා. ඇයි? නීති හැදුවාට, Regulations ගෙනාවාට ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. එම නිසා නොගෙවපු බදු අය කරගන්න, බදු නොගෙවා සිටීමට බැරි වන විදියට නීති හදන්න අවශ්‍ය Regulations පනවන්න අපට අධිකාරියක් ඕනෑ.

අන්න, අපි ඒක හදනවා. ඒ වාගේම තමයි, ඕනෑම තැනක සුදු ක්‍රියාවලියක් සිදු වෙනවා නම්, වාණිජමය අර්ථයෙන් සුදු ක්‍රියාවලියක් සිදු කරනවා නම්, ඒවා හැංගිලා ඉඳලා අල්ලලා, එහෙම නැත්නම් පොලීසියෙන් ලවා අල්ලලා දඩ ගහන ක්‍රියාවලිය වෙනුවට බරපතළ දඬුවම් පමුණුවන්න තමයි, ඒවාට විරුද්ධව නීති හදන්න තමයි අපි මේ Regulations පනවන්නේ, මේ කියන අධිකාරිය පිහිටුවන්නේ. මේ අධිකාරිය හරහා අපට ඒ කටයුත්ත කරන්න පුළුවන්කම තිබෙනවා. (11th Start)

බදු අය නොකිරීම පිළිබඳව අපට තිබෙන්නේ විවේචනයක්. ජාතික ලොතරැයි මණ්ඩලයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් අළෙවි කරන ලොතරැයි ටිකට් එකකට දිනුම ඇදුණාම ඒකෙන් බද්ද අය කරන අපි, දෛනිකව කැසිනෝ ගහලා දිනන මිනිසුන්ගෙන් ඒ බද්ද ගන්නේ නැහැ. සාමාන්‍යයෙන් online lotteriesවලත් දිනන කට්ටියට අඩුම ගණනේ සියයට 50ක්වත් යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කැසිනෝවලත් තිබෙනවා ratio එකක්. ඒක නැත්නම් කැසිනෝ ශාලාවට පුද්ගලයන් එන්නේ නැහැ. ඕනෑම, gambling එකක - සුදු ක්‍රීඩාවක - ජයග්‍රාහකයා සඳහා portion එකක් වෙන් කරනවා. සමහර විට දවසේ කරන සූදුවලින් සියයට 30ක්, 35ක් ඒගොල්ලන් දිනන්න ඕනෑ. නැත්නම් ඒ අය පහුව දා එන්නේ නැහැ. හැබැයි, මේ කියන අය ලංකාවේ කවදාවත් බදු ගෙවලා නැහැ. අන්න ඒ අයගෙන් බදු අය කිරීමේ ක්‍රියාවලිය කාටද අපි පවරන්නේ? එය ආයතනයකටම පවරන්න ඕනෑ, ඒ ආයතනයම records තබාගන්න ඕනෑ, කවුද ආවේ, කී දෙනෙක් ආවාද, දවස තුළ සල්ලි කීයක් මාරු කළාද, කී දෙනෙක් දිනුවාද, දිනපු අයගේ බද්ද කීයද කියලා. ඒගොල්ලන් පරීක්ෂා කිරීමේ බලයත් අපි මේ අධිකාරිය යටතට ගෙනෙනවා. ඒ බලයත් මේ අධිකාරිය යටතට ගෙනැල්ලා ඒ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියත් අපි කරනවා.

මේක ජාත්‍යන්තර මට්ටමින් සාකච්ඡා වන, ලෝකයේ දියුණු රටවල් සාකච්ඡා වන මාතෘකාවක්. රටක් ඉස්සරහට යද්දී අපට අත්‍යවශ්‍ය වන මෙවැනි ආයතන පිහිටුවීම සහ Regulations පනවා ඒවා නීතියෙන් ශක්තිමත් කිරීම තමයි ආණ්ඩුවේ කටයුත්ත හැටියට අපි දකින්නේ. අන්න ඒ කටයුත්ත අපි අද කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒ කටයුත්ත කරගෙන යනකොට, පසුගිය ඉතිහාසය තුළ ඒ කටයුත්ත වෙනුවෙන් මැදිහත් නොවුණු අය මේ මාස 8 ගැන කියමින් අපෙන් ප්‍රශ්න කරනවා, "කෝ කළා ද?" කියලා. ඔව්, අපි කරනවා, බලාගෙන ඉන්න. අපේ රටේ ගොවි ජනතාව බලාගන්න එක, මේ රටේ වැඩ කරන ජනතාව බලාගන්න එක, මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව බලාගන්න එක, මේ රටේ ආර්ථිකය ස්ථාවර කරන එක අපි කරනවා. මේ රට තවදුරටත් ආපස්සට, අඳුරු යුගයකට ඇදගෙන යන්න දෙන්නේ නැතිව මේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් උරුම කර දෙන්න, ඒ පොරොන්දුව ඉටු කරන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ අපි වැඩ කරනවා. ඒ වැඩ කිරීම වෙනුවෙන් අපි මේ ගෙන යන ක්‍රියාමාර්ගවලට ඈත ඉඳන් ගල් ගහන්න බලාගෙන ඉන්න හැමෝටම අපි කියනවා, අත වේගයෙන් වීසි කරන්න උත්සාහ කරන්න, හැබැයි, මේ ගමන නවත්වන්න වෙන්නේ නැහැ, ජාතික ජන බලවේගය ජනතාවට වෙච්ච පොරොන්දු ඉටු කරමින් මේ රට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කරා ගෙන යන්න වැඩ කරනවාය කියන කාරණය.

ඒ කාරණය ප්‍රකාශ කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Amila Prasad. You have 12 minutes.

Order please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.00]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. ඇත්තටම අද දවසේ ඉදිරිපත් කරන මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත කාලීන අවශ්‍යතාවක් විධියට තමයි මා දකින්නේ. ඒකත් එක්කම, ඒ කථාව ඇතුළේ සාකච්ඡා කරපු, අවසානයේ ගරු ඇමතිතුමා ඉදිරිපත් කරපු අදහසක්, දෙකක් ගැනත් කියන්න තිබෙනවා. ඒවා ගැන කියමින්ම කථාව පටන් ගත්තා නම් හොඳයි කියලා මට හිතෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පළමු කාරණාව තමයි, එතුමා කියපු හාල් පිළිබඳ ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ ලංකාවට හාල් ආනයනය කරපු වෙලාවල එම හාල් විකුණුවේ සතොස හරහා පමණද, එහෙම නැත්නම් සත්ව ආහාරවලට හෝ වෙනත් අවශ්‍යතාවලට ඒ හාල් විකුණා තිබෙනවාද? ඒක චූටි උත්තරයක් දෙන්න පුළුවන් ප්‍රශ්නයක්. ආනයනය කරපු සහල් සතොස හරහා විකිණීම හැර තොග වශයෙන් වෙනත් අයටත් විකුණා තිබෙනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, හාල් ආනයනය නිදහස් කළා. එතකොට හාල් ආනයනය කළේ පෞද්ගලික ආයතන.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
සතොස විසින් ගත්තු ඒවා?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
සතොස ගත්තු ඒවා කවදාවත් සතුන්ට කන්න දීලා නැහැ. සතොස ගත්තු හාල් මිනිසුන්ට කන්න දුන්නා විතරයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මෙතැනදී හාල් ප්‍රශ්නයම ආපු නිසාත්, විෂය භාර ඇමතිතුමා වන ඔබතුමා දැන් මෙහි සිටින නිසාත් එතැනින්ම කථාව පටන් අරගෙන මගේ මාතෘකාවට එන්නම්. දැන් ආණ්ඩුව සාර්ථක ව්‍යාපෘතියක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ තමයි, ඊයේ දවසේ ඉඳලා රතු පාට කවරයක හාල් එනවා, "සතොස" නමින්. පසුගිය කාල සීමාවේදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ සමහර ව්‍යාපෘතිවලට "රාජපක්ෂ" නම දාගෙන යනකොට ඒකට විරුද්ධව කථා කරපු අය අද රතු පාට කවරයක හාල් ටික එවන එකේත් පොඩි ගතියක් තිබෙනවා. කොහොම වුණත් ඒක ලස්සනයි. *[බාධා කිරීමක්]* ලස්සනයි, ලස්සනයි! මම ඒක තමයි කිව්වේ. ඉතින්, කථාව මැදින් පනිනවා නේ. ඒක ලස්සන කවරයක්, රතු පාට කවරයක්. ගෙවල් හැම එකකටම ඒ රතු පාට කවරය යනවා. ඒක හොඳයි.

නමුත් ප්‍රශ්නය මේකයි. දැන් ඔබතුමාට පුළුවන් වෙන්න ඕනෑ, ඒ වී ටික අරගත්ත තැන ඉඳලා හාල් බවට පත් කර සතොසට එන තැන දක්වා වූ ඒ සම්පූර්ණ ක්‍රියාවලිය තුළ, "මෙන්න මේ තැන්වලටයි වියදම් ටික ගියේ" කියලා රටේ මිනිස්සුන්ට කියන්න. එතකොට අලුත් ව්‍යාපාරිකයන්ට පුළුවන්, සතොස කරගෙන ගිය විධියටම සහල් ව්‍යාපාරයට ඇතුළු වෙන්න. මම එහෙම කියන්න හේතුව මේකයි. රැකියාවට අදාළ වැටුප ගෙවන්නේ හාල් විකුණලා නොවෙයි නම්, ඒක ගෙවන්නේ රාජ්‍ය බදු මුදල්වලින් නම්, ඒ විධියට හාල් විකුණුවොත් අමතර මුදලක් අතනින් එකතු වෙනවා. මම කියන එක පැහැදිලි ඇති නේ. එහෙම නැත්නම් මේක මරු.

ඊළඟ ප්‍රශ්නය. සතොස හරහා විකුණන මේ හාල් මිටිය අනෙක් ව්‍යාපාරිකයන් විකුණන හාල්වලට වඩා මිලෙන් අඩුද? අඩු නම් මරු. එහෙම නැතුව තරගකාරී ලෙස මීට වඩා හාල් මිල වැඩි වුණොත්, - *[බාධා කිරීමක්]* මම මේ කියන එක අහගෙන ඉඳලා උත්තරයක් දෙන්න. එහෙම හාල් මිල වැඩි වුණොත් අර ව්‍යාපාරිකයන්ටත් chance එකක් හම්බ වෙනවා. මොකද, ඒ අයටත් ඒ ගණනට මිල වැඩි කරන්න පුළුවන්. ඒ නිසා වෙළෙඳ පොළේ තිබෙන අනෙක් හාල්වල මිලට වඩා මේ හාල්වල මිල අඩුද කියන කාරණය සහ අර සම්පූර්ණ chain එක ගැන ගරු ඇමතිතුමාට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද පස්සේ? *[බාධා කිරීමක්]* උත්තරයක් දෙන්න. *[බාධා කිරීමක්]* උත්තරයක් දෙන්න. උත්තරයක් දීලා ඉන්න. *[බාධා කිරීමක්]* නැහැ, උත්තරයක් දෙන්න. උත්තරයක් දෙන එක ලේසියි. *[බාධා කිරීමක්]*හොඳයි, බොහොම ස්තුතියි.

රතු බෑගයේ හාල් එන එක, ගති වැඩක්. මම එහෙම කියන්න හේතුව මේකයි. අපි රාජ්‍ය ව්‍යාපාර කරන්න ඕනෑ නැහැ කියලා විශ්වාස කරන අය. ඔබතුමන්ලා රාජ්‍ය ව්‍යාපාර කළ යුතුයි කියලා විශ්වාස කරන අය. හරි නේ. ඒකේ වරදක් නැහැ නේ. රටේ මහජනතාව කිව්වේ, රාජ්‍ය ව්‍යාපාර කළ යුතුයි කියන පාර්ශ්වයට බලය ලබා දෙන්න කියලායි. ඒ නිසා ඔබතුමන්ලා ඒ තීරණය ගැනීම මා අගය කරනවා. ඒකේ සාර්ථක අසාර්ථකභාවය කෙසේ වෙතත්, ඒක ඔබතුමන්ලා ගත් තීරණයක් සහ රාජ්‍ය බලය ලබා ගැනීම උදෙසා ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කළ අදහසක් ක්‍රියාත්මක කිරීමක්. ඒක මා අගය කරනවා. ඒක නරක වැඩක් නොවෙයි. එතකොට අපට ඒ දිහා බලාගෙන ඉන්න පුළුවන්. රටේ මිනිස්සුන්ටත් ඒ දිහා බලාගෙන ඉන්න පුළුවන්.

නැවත වතාවක් මම අවධානය යොමු කරනවා, අද දෙවැනි වර විවාදයට ඉදිරිපත් කළ පනත් කෙටුම්පතට. ඇත්තටම ප්‍රේමදාස ආණ්ඩුව පැවැති කාලයේ ගෙනා 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත හරහා තමයි ලංකාවේ මුලින්ම සූදු ක්‍රීඩා නියාමනය වීම ආරම්භ වුයේ. ඊට පසුව 2010 මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පැවැති කාලයේ අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය) කිරීමේ පනත ක්‍රියාත්මක වුණා. ඒ හරහා මේ ක්‍රීඩා තවදුරටත් නියාමනය වුණා. අන්න ඒ කාලයේ විපක්ෂයේ හිටියා, අනුර කුමාර දිසානායක කියලා මන්ත්‍රීවරයෙක්. හැන්සාඩ් වාර්තාවක තිබෙන ඒ මන්ත්‍රීවරයාගේ කථාවක් මම දැක්කා. "තෝන් ගන්නා මුදලාලිලා මේ රට පාලනය කරන තැනට ඇවිල්ලා තිබෙනවා." කියලා එහි සඳහන්ව තිබුණා. අවසානයේ 2025දී තෝන් මුදලාලි බවට අනුර කුමාර දිසානායක පත් වෙන ගමන්, සූදු පනත ක්‍රියාත්මක කරමින්, ඒ නියාමන අධිකාරිය

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ක්‍රියාත්මක කිරීම අපි අගය කරනවා. විශේෂයෙන්ම මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමට සහ මේ සූදු ක්‍රීඩාවලට අපි එකඟයි. පෞද්ගලිකව මම කොහොමත් එකඟයි. පක්ෂයක් ලෙසත් අපි මේ ක්‍රියාවලියට එකඟයි. මේ තුළ වඩා වැදගත් වෙන්නේ, කොහොමද අපි මේ බදු මුදල් ටික රජයට එකතු කර ගන්නේ කියන කාරණාව.

මේ නියමන අධිකාරියට අදාළව ඉදිරිපත් කළ මෙම පනත් කෙටුම්පත සම්මත වීම හරහා ඔබතුමන්ලා අවධානය යොමු කළ යුතු වැදගත්ම කාරණයක් තිබෙනවා. කැසිනෝ ක්‍රීඩාවේ යෙදීමට කැසිනෝ ශාලාවක දොරෙන් ඇතුළට යද්දී ඩොලර් 15ක මුදලක් අය කරනවා. ඒ මුදල අය කරන්නේ ඇතුළට යනකොටනේ. එහෙම ඇතුළට ගිය පිරිස කොහොමද detect වෙන්නේ? ඒ ගැන ඒ මොහොතේම කොහේ හරි තැනක -එක්කෝ මුදල් අමාත්‍යාංශයේ හෝ එහෙම නැත්නම් නියාමන අධිකාරියේ හෝ කොහේ හෝ තැනක- තිබෙන digital system එකකින් දැන ගන්න පුළුවන්ද? මම එහෙම කියන්න හේතුව මොකක්ද දන්නවාද? දවසක් ඇතුළත සියලු කැසිනෝ ශාලාවලට 1,000ක් ඇතුළු වුණත්, ඩොලර් 15 ගණනේ ඩොලර් 15,000ක් ඒ අයගෙන් අය වෙනවා. ඒ මුදල ඒක රාශි කරගන්න පුළුවන් නම් හොඳයි. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, දිනලා යන කෙනාගෙන් බදු ගන්න බලාපොරොත්තු වෙනවා කියලා. දිනලා යන කෙනාගෙන් බදු ගන්න බලාපොරොත්තු වෙනවා නම්, අනිවාර්යයෙන්ම කළ යුතු දේ තමයි, ඒ මූල්‍ය ගනුදෙනු බැංකු හරහා සිදු කිරීම. විශේෂයෙන්ම ලංකාවේ බැංකු හරහා සිදු කිරීම. මේ නියාමන අධිකාරිය හරහා ඔබගේ ආණ්ඩුව ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලාත් මා දැන ගන්න කැමැතියි. මොකද, මට ඒ ගැන තොරතුරු හරියාකාරව හොයා ගන්න බැරි වුණා, මේ පනත් කෙටුම්පත කියවපු වෙලාවේ.

ඊළඟ එක තමයි බලපත්‍ර ලබා දීමේ ක්‍රමය. 2023 දෙසැම්බර් මාසයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් ඩොලර් මිලියන 500කට මේ බලපත්‍ර ලබා දෙනවා කිව්වත්, පසුව එතුමාගේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයකු ලෙස කටයුතු කළ සාගල රත්නායක මුදල් අමාත්‍යාංශයේ නිලධාරි පිරිසක් එක්ක එකතු වෙලා ගැසට් පත්‍රයක් හරහා ඒක ප්‍රමාද කළා. මේ නියාමන අධිකාරිය ස්ථාපිත කිරීම හරහාත් ඇමතිවරුන්ට හෝ නිලධාරින්ට අත්තනෝමතික ලෙස එහෙම ගැසට් පත්‍ර නිකුත් කිරීම හරහා ආයෝජකයන් පැමිණීම අධෛර්යවත් කරන්න පුළුවන්ද? එහෙම system එකක් තිබෙනවාද? එහෙම තිබෙනවා නම්, ඒකෙන් අපි බලාපොරොත්තු වන අරමුණ ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත ක්‍රියාත්මක කිරීමේදී කැසිනෝ පමණක් නොවෙයි, නියාමනය විය යුත්තේ. මොකද, කැසිනෝ ක්‍රීඩාවට අමතරව ලංකාවේ ඕනෑ තරම් online සූදු ව්‍යාපාර තිබෙනවා, cricket matches ඇතුළු සියලු දේවල්වලට අදාළව. මේ online system එක තුළ ක්‍රියාත්මක වන සූදු ව්‍යාපාර මේ නියාමන අධිකාරිය හරහා ග්‍රහණය කරගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් ඔබගේ අවධානය යොමු වෙලා ඇති කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම තමයි, මේ sytem එකට පිටින් වැඩ කරන අයට මේ නියාමන අධිකාරිය හරහා ලබා දිය හැකි දඬුවම් සහ ඒවා කොහොමද කරන්නේ කියන එක පිළිබඳවත් ආණ්ඩුවේ අවධානය යොමු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි, මේ ආයතන දෙකක් අලුතින් ඇවිල්ලා තිබෙනවා. මම දැක්කා, ඒ එකක් විවෘත කරන්න ජනාධිපතිතුමාත් ගිහිල්ලා තිබෙනවා. ඒ, Cinnamon Life එකේ තිබෙන Melco Resorts and Entertainment කියන එක. ලංකාවේ ඉන්න සූදු ව්‍යාපාරිකයන්, එහෙම නැත්නම් ඒ ව්‍යාපාරිකයන් - ඒකට සූදු කියලා කියන්න දෙයක් නැහැ- ඒගොල්ලන්ගේ ව්‍යාපාරවල මුදල්, හෝටල් සහ ඊට අමතරව මේ ක්‍රියාවලියට දමන කොට, ගරු ඇමතිතුමා කියපු විධියට වෙනත් සංචාරකයන් මේ රටට එන්න පටන් ගන්නවා. ඒ නිසා මේ සූදු ව්‍යාපාරය ලංකාවේ මිනිස්සුන්ට විවෘත කරපු එකක්වත්, එහෙම නැත්නම් ලංකාවේ මිනිස්සුන්ගේ සල්ලි ටික ගන්නවත් කරපු දෙයක් නොවෙයි. ලංකාවේ මිනිස්සු මේවාට යන එක අවම කරගෙන, විශාල වශයෙන් මුදල් වියදම් කරන පිට රටවල අයට ව්‍යාපාරයක් විධියට මේක ඇතුළට ඇවිල්ලා, මේ ක්‍රීඩා කරලා, ඒකෙන් ලංකාවේ ආදායම ඉහළ නංවා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගයක් නිසා, අපි පක්ෂයක් ලෙසත් පෞද්ගලිකව මමත් මේ පනතට එකඟ වෙනවා.

ඒ වාගේම, කැසිනෝ ව්‍යාපාරය පිළිබඳව මේ ගනු ලබන ක්‍රියාමාර්ග ගැන ලංකාවේ රාජ්‍ය නිලධාරින් කවුද දන්නේ? තෝන් මුදලාලි දන්නේත් නැහැ, බවුන්සර්ලා 159දෙනා දන්නේත් නැහැ, රාජ්‍ය නිලධාරින් දන්නේත් නැහැ. එහෙම නම් අපි කොහොමද මේ ක්‍රියාවලිය විධිමත්ව කර ගන්නේ? එහෙම නම් අපට කරන්න පුළුවන් එකම දේ තමයි, ලෝකයේ මේ ව්‍යාපාරය හොඳට ක්‍රියාත්මක වෙන රටකින් විශේෂඥ සහාය ගන්න එක. ඒ විශේෂඥ සහාය ගන්නකොට ඒගොල්ලන්ට වැටුපක් ගෙවන්න වෙනවා. ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ, ඒගොල්ලන්ට ගෙවන්න. මොකද, මේක හරියට ක්‍රියාත්මක කර ගන්න නම්, ඒ පිළිබඳ විශේෂඥ සහාය වුවමනායි. ඒ නිසා ඒ රටවල අය අරගෙන හෝ මේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාට මේ කාරණය කියන්න ඕනෑ. ඩිජිටල්කරණය මේ ආණ්ඩුවේ ප්‍රධානම අරමුණක්. මේ තිබෙන්නේ මුලින්ම ඩිජිටල්කරණය කරන්න ඕනෑ තැනක්. ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය හරහා මේ මුදල් ටික බදු මුදල් වශයෙන් රාජ්‍යයට එකතු කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා මුලින්ම මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය හරහා කැසිනෝ ව්‍යාපාරිකයන්ගේ කැසිනෝ මධ්‍යස්ථාන සියල්ල ඩිජිටල්කරණයට ලක් කරන්න කියන ඉල්ලීමත් මම කරන්න කැමැතියි. කැසිනෝ ව්‍යාපාරිකයෝ කියලා කිව්වාට, ලංකාවේ කැසිනෝ ව්‍යාපාර කරන අය, කැසිනෝ ව්‍යාපාරයට සම්බන්ධ අය අතර මේ ආණ්ඩුවටත් උදවු කරමින් ඉන්න ව්‍යාපාරිකයන් ඉන්නවා. ඒ නිසා මේ ක්‍රියාවලිය බොහොම විධිමත්ව සහ විනිවිදභාවයකින් යුක්තව කරයි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

විපක්ෂයේ ඉන්න කාලයේ ඒ ව්‍යාපාරිකයන්ට බොහොම තදින් ප්‍රහාර එල්ල කරපු කෙනා අද ඒ ව්‍යාපාරිකයන් සමඟ කටයුතු කරමින් ඉන්න නිසා, පුළුවන් තරම් විනිවිදභාවයකින් යුක්තව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

පසුගිය දවසක ජනාධිපතිතුමා ඇවිල්ලා පාර්ලිමේන්තුවේදී කථාවක් කළා. ඒ කථාව මම සම්පූර්ණයෙන්ම ඇහුවා. මම ඒකෙදී දැක්කේ නැති දේවල් දෙක තුනක් තිබෙනවා. ඒ ගැන කවුරු හරි ඉන්න ඇමතිවරයෙකුට උත්තරයක් දෙන්න පුළුවන්. මේ අවුරුද්ද

තුළ රටක් විධියට අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක ඉලක්කයකට යන්න තිබෙනවා. ඒ ඩොලර් බිලියන 7ක ඉලක්කයට යන්න තිබෙන action plan එක මොකක්ද? 2028 ජනවාරි මාසය වෙනකොට ඩොලර් බිලියන 15ක ඉලක්කයකට අපිට යන්න තිබෙනවා. ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන action plan එක මොකක්ද කියලා කවුරු හරි කෙනෙකුට කථා කරලා කියන්න පුළුවන් නම් හොඳයි. හේතුව, මේවා ගැන අපි ප්‍රශ්න කරද්දී අප සහ අපේ කණ්ඩායමේ අය ද්‍රෝහීන් ලෙස හඳුන්වන්නේ නැතුව, මේ ක්‍රියාවලිය පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්න පුළුවන් නම් හොඳයි කියලාත් මා කියනවා.

තව එකක් තමයි, රාජ්‍ය ආදායම ඉහළ නැංවීම. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රේගුව හරහා රාජ්‍ය ආදායම ඉහළ නැංවීම පිළිබඳව බොහොම අතිශයෝක්තියෙන් යුක්තව කථා කළා. ඒක අගය කරනවා. රටක රාජ්‍ය ආදායම ඉහළ යෑම හොඳ දෙයක්. හැබැයි, රාජ්‍ය බදු මුදල් එකතු කර ගැනීමේදී දිගින් දිගටම එකම ජනතාවක් වෙත අවධානය යොමු කරමින්, ඒ අයගෙන් පමණක් බදු මුදල් එකතු කර ගැනීමේ අර්බුදයක් තමයි අපේ රටේ තිබෙන්නේ. 2022දී මේ රටට ආපු ආර්ථික අර්බුදය විසඳා ගැනීමට නිර්මාණය කරපු සෑම බද්දක්ම පාහේ තවමත් ක්‍රියාත්මකවීම නිසා, ප්‍රාග්ධනය ලෙස වියදම් කරන්න තිබෙන සල්ලි ප්‍රමාණය රාජ්‍යය ඇතුළට අරගෙන මුදල් හම්බ කරන්න බැරි ව්‍යාපෘතිවලට වෙන් කරනවා නම්, ඒකේ කිසි තේරුමක් නැහැ. ඒ නිසා එකම කණ්ඩායමක් ඉලක්ක කරලා බදු පැනවීමෙන් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම මෙන්ම රාජ්‍යය විධියට ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ අර්බුදයක් තිබෙනවා. මම දැක්කා, මේ ආණ්ඩුවට ආර්ථික උපදෙස් ලබා දෙන කණ්ඩායම් තුනක් ඉන්නවා කියලා නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා. මම මේ බල බලා හිටියේ එතුමා ඉන්නවාද කියලා. අර හිනා වෙන, අඩන නියෝජ්‍ය ඇමතිතුමා. එතුමා කිව්වා, කණ්ඩායම් තුනක් ඉන්නවා කියලා. මම ඒ තුනෙන් කොයි කොටසේද ඉන්නේ කියලා කල්පනා කළේ. ආර්ථික විද්‍යාව පිළිබඳ ලොකු ලොකු කථා ටිකක් කියලා එතුමා ගිහිල්ලා තිබෙනවා. එතුමා හිටියා නම් ඒ ගැන අහන්නත් තිබුණා.

ඒ වාගේම තමයි, ශ්‍රී ලංකා රේගුව පිළිබඳ අදහස. ශ්‍රී ලංකා රේගුවේ ආදායම 2022දී මිලියන 600යි; 2023දී මිලියන 975යි; 2024දී මිලියන 1,500යි; 2025දී මිලියන 2,300යි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තත්පර කිහිපයක් දෙන්න.

ගිය අවුරුද්දේ වැඩිවීම ඩොලර් මිලියන 600යි. මේ අවුරුද්දේ අපේක්ෂිත ගණන ඩොලර් මිලියන 800යි. ඇත්තටම ඒක වැඩිවීමක් තමයි. නමුත්, පසුගිය වසරේ වාහන ආනයනය කිරීම නවත්වලා තිබුණේ. එතකොට වාහන ආනයනය කිරීම හරහා විශාල බද්දක් එකතු කරන මොහොතක, මේ වැඩිවීම ප්‍රමාණවත්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නයත් යොමු කරමින්, ඒකටත් උත්තරයක් ලබා දෙන්න කියමින්, මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට විනාඩියක් දෙන්න. ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා ප්‍රශ්න කිහිපයක් ඇහුවා. එතුමා ආර්ථික විද්‍යාව උගන්වන ගුරුවරයෙක් නිසා එතුමාට මේ ගැන ටිකක් අවබෝධය තිබෙනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ සතොස වී ගත්තා. සතොස ගත්ත වී හාල් බවට පත් කරන්න අපට මෝලක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපට තිබුණු මෝල් දෙකම කැඩිලා තිබෙන්නේ. ඒවා හදන්න රුපියල් මිලියන 400ක් විතර යනවා. ඒ නිසා ඒවා අපට එකවර හදන්න බැහැ.

හැබැයි, අපි ගත්ත වී සහල් කරන්න ඕනෑ. ඒ සඳහා EoIs කැඳෙව්වා. අපේ වී ටික සහල් කරලා දෙන්න පුළුවන් සැපයුම්කරුවෙක්, මේ ක්‍රියාවලියට සම්බන්ධ වෙන්න පුළුවන් කෙනෙක් අපි ටෙන්ඩර් පටිපාටිය ඇතුළේ තෝරලා තමයි මේ ක්‍රියාවලිය කරන්නේ.

රජයෙන් පඩි ගෙවනවා, සහල් cost එකට විකුණවා කියලා ඔබතුමා කිව්වා. එහෙම නැහැ. අපි පාලන මිලක් දාලා තිබෙනවා. පාලන මිලට අපි සහල් විකුණන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම ඔබතුමාට කියන්න ඕනෑ, අපි වී සහතික මිලට ගන්නවා කියලා. රුපියල් 120ට ගන්නවා. ඔව්, ආණ්ඩුවෙන් ණය මුදල් අරගෙන, බැංකුවලින් සල්ලි අරගෙන රුපියල් 110ට, රුපියල් 115ට එළියේ වී මිලදී ගන්නවා. අපි මේ කාරණය ගොවීන්ට කියනවා. අපි මේ වෙනකොට වී අලෙවි මණ්ඩලයට රුපියල් බිලියන 10ක් දීලා තිබෙනවා. රුපියල් බිලියන 10කින් වී මෙට්‍රික්ටොන් 100,000ක් ගන්න පුළුවන්. මොකක් හරි රෝලක් ගහ ගත්තොත් තව මෙට්‍රික්ටොන් 25,000ක් ගන්න පුළුවන්. සතොසට රුපියල් බිලියන 5ක් දීලා තිබෙනවා. ඒකෙන් වී මෙට්‍රික්ටොන් 40,000ක් ගන්න පුළුවන්. ඒක ආපහු pledge කරන්න පුළුවන්. එහෙම pledge කළොත්, තව සියයට 80ක් ගන්න පුළුවන්. ඒ නිසා මේ කාලය තුළ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු වහලා තිබෙන ගබඩා ළඟට ගිහින් "ගබඩා වහලා නේ" කියලා කියනවා මම දැක්කා. කලබල වෙන්න එපා, අපි වී ගන්නවා. ඔබතුමා ප්‍රශ්නය ඇහුවා නිසා ඒක කියන්න ඕනෑ. කිසිදු පාඩුවක් ඇතිව නොවෙයි සතොස සහල් විකුණන්නේ කියන කාරණයත් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විනාඩියයි ගන්නේ. එතුමා ඇහුවා, කැසිනෝ entrance fee එක ගැන.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම ඇහුවේ රුපියල් 120ට වී අරගෙන 220 දක්වා වන සෙස් එක කියන්න පුළුවන්ද කියලායි. අන්න ඒක තමයි මට දැනගන්න ඕනෑ. වැරැදි අදහසකින් නොවෙයි ඒක ඇහුවේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි, මම කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, සහල් කිලෝවක් හදන්න වී කිලෝග්‍රෑම් 1.6ක් අවශ්‍ය වෙනවා. අපි සහල් දමන්න බෑග් එකක් හදලා තිබෙනවා. අපි හදලා තිබෙන්නේ කිලෝ පහේ බෑග්. ඒ බෑග් එකක් හදන්න cost එක විධියට රුපියල් 35ක් විතර යනවා. වී කොටලා, බෑග්වලට දාලා, ගබඩාවට ගෙනත් දෙන්න යන cost එක ඔහු අපට දීලා තිබෙනවා. ඒක conversion cost එක. Conversion cost එක අනුව අපි එයාට වී දෙනවා, එයා අපට සහල් දෙනවා. ඒ අනුව සහල් කිලෝවකට මිලක් කියනවා. අපි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඒවා සතොසට දෙනවා. සතොසත් transport කරලා තමන්ගේ ගබඩාවල ඉඳන් විකුණන්න ඕනෑ. රුපියල් 230ට තමයි නාඩු කිලෝ එක දීලා තිබෙන්නේ. Bulk එක ආවොත් මීට අඩු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කැසිනෝ entrance fee එක ගැන එතුමා ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, ඒකට ලංකාවේ ඩොලර් 50ක් ගන්නවා. ලංකාවේ entrance fee එක වශයෙන් ඩොලර් 50ක් ගන්නවා. ඒ වාගේම winning tax එකක් නැහැ; tax එක ගෙවන්න ඕනෑ. ඒ ආයතනනය තමයි දැන් ඒක monitor කරන්න ඕනෑ. දිනපු කෙනාට සල්ලි ගෙවනකොට, සල්ලි ගෙවන තැනදී එයා දැනගන්න ඕනෑ, එයාට සියයට 14ක tax එකක් ගෙවන්න තිබෙනවා කියලා. මේවා monitor වෙච්ච නැති නිසා තමයි transparency ඇතිව මේ අධිකාරියට නීති සහ අණපනත් හදන්න සිදුවෙලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒකත් කරනවා.

ඒ වාගේම ඔබතුමා ඇහුවා, බිලියන 7ක් සඳහා ආයෝජන reserve එක වැඩි කරන්නේ කොහොමද කියලා. මේ අවුරුද්දේ බිලියන 7ක් වැඩි කරගන්න අවශ්‍ය කරන සංචාරක ව්‍යාපාරයේ වර්ධනය, විදේශ ආයෝජනවල වර්ධනය ඇතුළු රටේ ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ බොහෝ ක්‍රියාකාරකම් තිබෙනවා. ඔබතුමාට මේ ගැන තව දැන ගන්න අවශ්‍ය නම් මම ආයෙත් වෙලාවක කියන්නම්. අපට බිලියන 7ට යන්න පුළුවන්.

ඒ වාගේම ඔබතුමා ඇහුවා, Government income එක වැඩි කරගන්නේ කොහොමද කියලා. මේවාත් ඒවා තමයි. රජයේ ආදායමට එකතු නොවන ඒවා තමයි අපි රජයේ ආදායමට එකතු කරන්න හදන්නේ. මේවා වෙන දා ගියේ කොහේටද? වෙන වෙන තැන්වලට යන්න ඇති. ඒවා දැන් ඒ තැන්වලට යන්නේ නැහැ. ඒවා එන්නේ රජයේ ආදායමට. මේ ක්‍රියාවලිය ඇතුළේ වහලා දාපු, අඩපණ කරලා දාපු රාජ්‍ය ආයතන, රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කරලා ගොඩ නඟන්න අපි කටයුතු කරනවා කියලා අපි ඉතාම පැහැදිලිව කියනවා. ඔබතුමා කිව්වා හරි. ඒක අපේ policy එක. ආණ්ඩුව මේ supply chain එකේ කොටසක් නියෝජනය කරන්නම ඕනෑ. එහෙම නැතිව භාණ්ඩ මිල පාලනය කරන්න බැහැ. Supply chain එක වැටෙන වැටෙන වෙලාවට අපි පිටකොටුව හරි, පොළොන්නරුවට හරි බැණ බැණ ඉඳලා හරියන්නේ නැහැ. අපි මේ වැඩේට බහින්න ඕනෑ. අපි ඒ වැඩේට බැස්සා. ඒ පැත්තෙන් ආණ්ඩුව ක්‍රියාවලිය පටන් අරගෙන තිබෙනවාය කියන කාරණය විතරක් මම ඔබතුමාට කියන්නම්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.16]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, එහෙම නැත්නම් Gambling Regulatory Authority Bill එක පිළිබඳව අද ඇති වෙලා තිබෙන සාකච්ඡාවේදී මේ ගැනත් ටිකක් කථා වුණා නම් හොඳයි කියලා මම හිතනවා. "එදා කැසිනෝ ව්‍යාපාරයට විරුද්ධ වුණා, දැන් කැසිනෝ ව්‍යාපාරය වෙනුවෙන් නීති සම්පාදනය කරනවා" වාගේ අදහසක් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඇති කරමින් යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම කැසිනෝ නීති සම්බන්ධයෙන් 2010 අංක 17 දරන Casino Business (Regulation) Act එක repeal කරමින්, එහෙම නැත්නම් අහෝසි කරමින් තමයි අද අපි මේ සූදු ක්‍රීඩා නියාමන අධිකරිය පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. ඇත්තටම 2010 පනත පිටු තුනක පනතක්. මේ පනතේ පිටු 3යි තිබෙන්නේ. අපි අද දින repeal කරන පනතට අනුව ඇමතිවරයාට තමයි casino licences නිකුත් කිරීමට සම්පූර්ණ බලතල තිබෙන්නේ.

ඒ වාගේම මේකේ නියාමනය සිද්ධ කරන්න තිබෙන්නේ ඒ පනත යටතේයි. ඒ පනතේ Sections හයයි තිබෙන්නේ. අද උදේ වරුවේ ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා, මේකෙන් ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙනවා, ආර්ථිකයට ප්‍රශ්නයක් වෙනවා කියලා. ඒ වාගේ ලොකු කථාවක් කළා. නමුත් මේ සියලු දේ නියාමනය කිරීම සඳහා අපේ රටේ නීතියේ තිබුණේ වගන්ති 6යි. එවැනි නීතියක් ඉවත් කරලා තමයි අපි අද මේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. 2010 පනත යටතේ ඇමතිවරයාට බලතල තිබුණා, මේ ව්‍යාපාරයේ Regulations හරහා නියාමනය සිදු කිරීමට. ඒ කියන්නේ, ගැසට් එකේ රීති - Regulations - publish කරලා මේ ව්‍යාපාරය නියාමනය කිරීමේ බලයක් ඇමතිවරයාට තිබුණා. නමුත්, 2010 පනත පාස් වුණාට Casino Business Licensing Regulations No. 1 - පළමුවෙනි Regulation එක - නිකුත් වෙන්නේ, 2022 අගෝස්තු මාසයේදීයි. අපට පෙනෙනවා මේ පනත මීට පෙර ඉදිරිපත් කරලා තිබුණාට කිසිදු නියාමන කටයුත්තක් ලංකාවේ සිද්ධ වෙලා නැති බව. එවැනි පරිසරයක් තුළ තමයි casino business එක ලංකාවේ ආරම්භ කරන්න 2010 ඉඳන් අද වෙනකම් හිටපු හැම රජයක්ම උත්සාහ කළේ. අපි යමක් කථා කරද්දී ඒකේ context එකත් එක්ක කථා කරන්න අවශ්‍යයි. එහෙම නැතුව "මාලිමාවෙන් එදා මේකට විරුද්ධ වුණා, ජනාධිපතිතුමා විරුද්ධ වුණා" කියලා නිකම් බොරුවට කිව්වාට වැඩක් නැහැ. ඒ කාලයේ තිබිච්ච නියාමන පරිසරයයි, අද තිබෙන නියාමන පරිසරයයි අතර විශාල වෙනසක් තිබෙනවා. එදා වෙනකොට එක Regulation එකක්වත් තිබුණේ නැහැ, casino business එක regulate කරන්න. අද අපි සූදු නියාමන අධිකාරිය - Gambling Regulatory Authority එක - ඇති කරනවා. ඒ හරහා licences නිකුත් කිරීම, cancel කිරීම විතරක් නොවෙයි, මේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නියාමනය කිරීමටත් ඒ අධිකාරියට බලය හිමිවෙනවා. 2022 අවුරුද්දේ ආපු Regulation එකට අනුව කටයුතු නොකළොත් කරන්න පුළුවන් එකම දේ licence එක cancel කිරීම විතරයි. ඊට වඩා දෙයක් කරන්න බැහැ. එතකොට යම් ආර්ථික හානියක් මේ ව්‍යාපාරයට සිද්ධ වුණාට, මේ ව්‍යාපාරය තුළ සිද්ධ වෙන අපරාධත් තිබෙන්නට පුළුවන්. මේ ව්‍යාපාරය තුළ ළමයින්ට හානි සිද්ධ වෙන්න පුළුවන්.

මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කථා කළා, මේකේ වැරදි - offences - හඳුනා ගෙන තිබෙනවාද කියන කාරණය. අද අපි ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත තුළ වැරදි විශේෂිතව හඳුනා ගෙන තිබෙනවා, PART VI - Offences - යටතේ. Clause 42 ඉඳන් Clause 58 වෙනකම් තිබෙන්නේ offences සම්බන්ධ කාරණා. ඒ යටතේ තිබෙනවා, දරුවන් යෙදවීම, නීතිවිරෝධී ලෙස gamblingවල යෙදීම කියන කාරණා. ඒ වාගේම prohibited age එකක් දාලා තිබෙනවා. මේවායේ වැඩ කරන අයට වයස් සීමා දාලා තිබෙනවා. අවුරුදු 21ට වඩා අඩු වයස් සීමාවල අයට මේවායේ වැඩ කරන්න බැහැ කියන එක තිබෙනවා. ඒ වාගේ පනත තුළම විශාල offences ප්‍රමාණයක් නිර්මාණය කර තිබෙනවා. ඊට අමතරව සූදු ක්‍රීඩා නියාමන අධිකාරියට -

Gambling Regulatory Authority එකට - බලය හිමි වෙනවා, මේ තුළ ඕනෑම නියාමනයක් සිද්ධ කිරීමට. ඊට අතිවිශාල බලතල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම කිව්වා, අපි කවුරුවත් සූදු ක්‍රීඩාව ගැන දන්නේ නැහැ කියලා. පෞද්ගලිකව, ඇත්තටම මම නම් සූදු ක්‍රීඩාව ගැන දන්නේ නැහැ, ඒක ඇත්ත. ගොඩක් දෙනා දන්නේ නැහැ. දැනගන්න අවශ්‍යතාවකුත් නැහැ. අවශ්‍ය වෙන්නේ සූදු ක්‍රීඩා නියාමනය කිරීම සඳහා හොඳ අධිකාරියක් පිහිටුවීමයි. මේක compare කරන්න ඕනෑ පවතින නීතිය සමඟ නේ. පවතින නීතිය යටතේ ඇමතිවරයාට තමයි සම්පූර්ණ බලය හිමි වන්නේ. නමුත්, මේ නීතිය යටතේ මේ අධිකාරියට තමයි licence එක නිකුත් කිරීමේ බලය හිමි වන්නේ. ඒ අනුව, ඇමතිවරයා පත් කරන පිරිස අතර ඉන්නවා, පත් කිරීමේ දී අනිවාර්යය කරලා තිබෙනවා, Clause 7(2)(b) states, I quote:

> "three members appointed by the Minister from among persons who have qualifications and experience in any of the fields of economics, accountancy, law, information and communication technology and have knowledge in the regulation of gambling ...."

මේ සම්බන්ධයෙන් අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් කථා කළා. එතකොට පැන නැඟුණු ප්‍රශ්න තමයි සූදු ක්‍රීඩා නියාමනය කරන්නේ කොහොමද, මේවා නියාමනය කරන්න දැනුම තිබෙන්නේ කාටද කියන කාරණා. ඇත්තටම, නියාමනය අධිකාරියට තමයි එය නියාමනය කිරීමේ දැනුම සහ හැකියාව පවතින්න ඕනෑ. එහෙම නැතුව ඇමතිවරයාවත්, පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනා හෝ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනා පමණක් මේ ගැන දැනගෙන ඉන්න අවශ්‍යතාවක් නැහැ. එහෙම නොවෙයි නියාමනය සිදු විය යුත්තේ.

නියාමනයක් ස්වාධීන වෙනවා කියන්නේ ඒකටයි. අපි මේ කරලා තිබෙන්නේ මොන තරම් හොඳ improvement එකක්ද, මේක නීතියේ කොයි තරම් හොඳ වර්ධනයක්ද කියන එක පිළිගන්නේ නැතිව බොරුවට මේ සභාවේ ඉඳගෙන කියනවා, මේ දේවල්වලට ඒ කාලයේ විරුද්ධ වෙලා අද ඒවා කරනවා කියලා. නැහැ, සරලවම කිව්වොත්, ඒ කාලයේ ඔයගොල්ලන් කළ දෙයක් නොවෙයි අපි දැන් කරන්නේ. ඒ කාලයේ මෙහෙම නීතියක් ගෙනාවේ නැහැ. ඒ කාලයේ casino businessවලට ලංකාවට එන්න කියලා investments call කළේ කිසිම නියාමන පරිසරයක් තුළ නොවෙයි. 2010 ඉඳන් 2024 වෙනකම් පැවති ආණ්ඩු casino business ගෙනාවා ලු, අපි එදා ඒවා ගේනකොට විරුද්ධ වුණා ලු. විරුද්ධ වෙන්න ඕනෑ තමයි. නියාමන පරිසරයක් නැතිව, කිසිදු නීතියක් නැතිව, regulation එකක් නැතිව casino business එකක් ලංකාවට ගේනවා නම් ඒකට විරුද්ධ වෙන්න ඕනෑ. මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? ඒකට විරුද්ධ වෙන්න ඕනෑ. මොකද, ඒක හරියට කරන්නයි ඕනෑ. නියාමනයක් කරලා, කාටවත් හානියක් නොවන ආකාරයට නිශ්චිත පරාමිතීන් යටතේ තමයි මේ ව්‍යාපාර කරන්න ඕනෑ. මෙගොල්ලන් හිතාගෙන ඉන්නවා, ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් කරන්න දෙන එක තමයි විදේශ ආයෝජන කැඳවීම කියලා. අවසානයේ රට බංකොලොත් බවට පත් වෙන්නේත් ඒක හින්දා නේ. නමුත් දැන් එහෙම විදේශ ආයෝජන ලංකාවට ඇවිල්ලා නැහැ නේ. මේ පනත හරහා නීතිය තුළ යම්කිසි වර්ධනයක් වෙලා තිබෙනවා. මේ අධිකාරිය පත් කළාට පස්සේ ඒකේ අඩුපාඩු මොනවා හරි තිබුණොත් අපට නීතිය වෙනස් කර ගන්න පුළුවන්, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් නීතියේ වර්ධනයක් වෙලා තිබෙනවාය කියන එක පිළිගන්න තරම්වත් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට හැදියාවක් නැහැ. මේ සභාවේ ඉඳගෙන නිකම් බොරුවට "ඇහින්දාස්" තර්ක ඉදිරිපත් කරනවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවේදී social mediaවල ආණ්ඩුවට විරුද්ධව තිබෙන ඔක්කෝම දේවල් කිව්වා. ඒවා ඔක්කෝම එකින් එක ඒ මන්ත්‍රීතුමාත් කියනවා. කිසිම තර්කයක් නැහැ, කිසිම අදහසක් නැහැ, ඔහේ කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ විවාද තුළින් අපි ජනතාවට පැහැදිලි කරන්න ඕනෑ මොනවාද? ඇයි මේ පනත් ගේන්නේ, මේවාට විරුද්ධ වෙනවා නම් ඇයි විරුද්ධ වෙන්නේ කියලා කියන්න. ජනාධිපතිතුමා ඒ කාලයේ මේවාට විරුද්ධ වුණා, අද පක්ෂයි වාගේ බොහොම ළදරු, සරල තර්ක ගේන්නේ නැතිව විපක්ෂයට වගකීමක් තිබෙනවා, ආණ්ඩුව බරපතළ ලෙස මොනවා හරි කරනවා නම් ඒවා හරියට විවේචනය කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්නම ඕනෑ. විපක්ෂයේ මේ විවේචනය බලන්න. මම පෞද්ගලිකව මේකට කියන්නේ කුහක විවේචනය කියලායි. හොඳක් දකින්න බැරි, කාගේවත් හොඳක් පේන්න බැරි, වැරදීම කියන කුහක විවේචනයක්, මේක. මාළුවා නහින්නේ කට හින්දා කියනවා නේ. ඒ වාගේ තමයි මුදල් කාරක සභාවේ සභාපතිතුමාත්. එය කනගාටුවට කාරණයක්. අපේ මුදල් කාරක සභාවේ සභාපතිතුමා, හර්ෂ ද සිල්වා මහත්මයා ඉන්දියාවට අපේ රජය හිනා වුණා කියලා ලොකු බොරුවක් social mediaවල දාලා, Twitterවල දාලා, ඒක Indian mediaවල report කරලා රට අපකීර්තියට පත් කරලා තිබෙනවා. මේක තමයි කුහකකමේ යන්න පුළුවන් limit එක. ඊට පස්සේ අද කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් කියනවා, රතු එළි දල්වනවා, reserves අඩු වෙලා, මුදල් අච්චු ගහනවා කියලා. අපේ කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනිල් ජයන්ත මැතිතුමා ඒක කොච්චර පැහැදිලි කළත් ආයෙ ආයෙත් කියනවා, මුදල් අච්චු ගහනවා කියලා. මම හිතන්නේ, මේ කියන හැටියට මුදල් අච්චු ගහනවා කියන්නේ මොකක්ද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් දන්නේ නැහැ. මුදල් අච්චු ගැසීම ඇයි කරන්න ඕනෑ නැත්තේ, මොන මුදල් අච්චු ගැසීමද කරන්න ඕනෑ නැත්තේ, සාමාන්‍යයෙන් වෙන්නේ මොකක්ද කියන ඒ කිසිම දෙයක් දන්නේ නැතිව මම ඉස්සෙල්ලා කිව්වා වාගේ සමාජ මාධ්‍යයේ මඩ pagesවල තිබෙන ඔක්කෝම උස්සාගෙන ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කියවනවා. ඉතින් ඇත්තටම මේ වාගේ විවාද කිරීම කාලය නාස්ති කිරීමක්, ඇත්තටම අපේත් කාලය නාස්ති කිරීමක්. ඒ නිසා මීට වඩා සාර්ථකව මේ විවාද කරන්න ඕනෑ, මේවා බරපතළ නීති, consider කරලා හදලා තිබෙන නීති. මේ නීති ගැන කථා කරන්න ඕනෑ. නීති ගැන කථා කරන්නේ නැතිව "ඇහින්දාස්" විවේචන කිරීම නවත්වන්න. මේ විපක්ෂය අපේ රටට කරන හානිය, මේ රටේ ආර්ථිකයට කරන හානිය, රටේ ස්ථාවරත්වයට කරන හානිය නතර කරන්න. මේ රටේ ආර්ථිකය ස්ථාවර වෙන එක, මේ රටේ ආර්ථිකය වර්ධනය වෙන එක ගැන විපක්ෂයට ලොකු ප්‍රශ්නයක් තිබෙන බව අපට දැන් ඇත්තටම පේනවා. ඒක නේ කිසිම හේතුවක් නැතිව රතු එළි දල්වන්න ලැස්ති වෙලා ඉන්නේ. මෙන්න මේ ක්‍රියාකලාපය නවත්වන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.26]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මට කලින් කථා කළ අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය හොඳ කථා ටිකක් කිව්වා. හැම දාම හොඳ කථා ටිකක් එතුමිය කියනවා. අදත් හොඳ කථා ටිකක් කිව්වා. විපක්ෂයට විවේචනය කරන්න එපා කිව්වා. කරුණාකරලා ගිහින් වර්තමාන ජනාධිපතිතුමාගෙන් අහන්න, එදා විපක්ෂයේ ඉන්නකොට ඇයි එතුමා ආණ්ඩුව විවේචනය කළේ කියලා. එහෙම නම් එතුමා කරලා තිබෙන්නේ බරපතළ වැරැද්දක්. එහෙම නම් ඉස්සෙල්ලාම ඒ වැරැද්ද හදලා පෙන්වන්න කියන්න. දැන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා එදා තිබුණු ආණ්ඩුවලින් සමාව ඉල්ලන්න කියන්න. මොකද, එදා එතුමා කරලා තිබෙන්නේ වැරැද්දක්. විපක්ෂයේ රාජකාරිය දන්නේ නැතිව මේ මන්ත්‍රීතුමිය විපක්ෂයට ඇඟිල්ල දික් කළේ ඉතාම උද්ධච්ච විධියට. හැම දාම බණිනවා. මෙතැන වැදගත්කමක් තිබෙන්න ඕනෑ. විපක්ෂයේ ඉන්න අපේ රාජකාරිය මොකක්ද? අනේ ආණ්ඩුව හොඳයි, අද හොඳට නාලා ඇවිල්ලා තිබෙනවා, අද සුවඳයි, හොඳ සූට් එකක් ඇඳලා ඇවිල්ලා, ලස්සනට කථා කරනවා වාගේ දේවල්ද අපි කියන්න ඕනෑ? *[බාධා කිරීමක්]* මන්ත්‍රීතුමිය ඒකත් අහගෙන ඉන්නේ නැතිව සභාවෙන් යනවා.

ඇත්තටම අපි මේ රටේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න ඕනෑ. හැබැයි ඒවාට ඇහුම්කන් දීම, ඒවා විඳ දරා ගැනීම, ඒවා ඉවසීම සහ ඒවායෙන් යම් දෙයක් ඉගෙන ගැනීම කරන්නේ නැහැ. අපි ඔක්කෝම දේවල් දන්නවා, අපි තමයි වැඩකාරයෝ, අපිට තමයි මේ ඔක්කෝම කරන්න පුළුවන් කියලා කයිවාරු ගහන එක නොවෙයි වැඩේ. යමක වැරැද්දක් තිබෙනවා නම් ඒක නිවැරදි කර ගන්න. ඒකට තමයි පාර්ලිමේන්තුවක් හදලා තිබෙන්නේ. 225දෙනෙක් අරගෙන ඇයි මේ අවස්ථාව දීලා තිබෙන්නේ, ඇයි මේ කාරක සභා ටික පත් කරලා තිබෙන්නේ, ඇයි මේ debate කරන්න අපට අවස්ථාව දීලා තිබෙන්නේ?

එහෙම නම් ආණ්ඩුවෙන් මේ පනත හදලා ඉවර වෙලා, සම්මත කරලා දමනවා නේ. මේක මේ සභාවට ගෙනෙන්නේ නැහැ නේ. ඇයි, මේක ගැන සාකච්ඡා කරන්නේ නැත්තේ? අපට තිබෙන්නේ මේ ගැන කථා කරන්න. අපි කථා කළාම හැම දාම වාගේ නිකම් කැත, පහත්, නිර්දය විධියට විවේචනය කරලා, ජනතාවට කියන්න හදන්න එපා, "අපි තමයි සුදනෝ. අපි තමයි හොඳම" කියලා. එහෙම කියන්න යන්න එපා. ඔබතුමන්ලා දැන් ඒක පිළිගන්න සූදානම් නැහැ. ඇයි, ඔබතුමන්ලා ඒක පිළිගන්න සූදානම් නැත්තේ? වර්තමාන ජනාධිපතිතුමා එදා මෙතැන ඉඳලා කැසිනෝ ගැන වාගේම ගංජා ගැන මොනවාද කිව්වේ? ඔබතුමන්ලාගේ අමාත්‍යවරු එදා ගංජා ගැන මොනවාද කිව්වේ? මේ රටේ තිබෙන ප්‍රශ්න ඔක්කෝම ටික එකින් එක ගත්තොත්, මුදල් අච්චු ගහන එක ගැන එදා මොනවාද කිව්වේ? ඔබතුමන්ලා එහෙම කිව්ව ඒවා ටික අරගෙන බලන්නකෝ. ඔබතුමන්ලාගේ කණ්ඩායම් රැස්වීම තිබෙනවා නේ. පොඩ්ඩක් එක වෙලාවක ඒ කණ්ඩායම් රැස්වීමේ වාඩි වෙලා පසුගිය පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමන්ලා - විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා - කියපු කාරණා ටික නැවත නැවතත් අරගෙන බලන්නකෝ.

දැන් ඔබතුමන්ලා තමයි අපට මාතෘකාවක් හදලා දීලා තිබෙන්නේ. ඔබතුමන්ලා එදා කරපු කථා ටික අරගෙන බලන්න. ඔබතුමන්ලා කැසිනෝ ගැන එදා මොනවාද කිව්වේ? ඔබතුමන්ලා අද කැසිනෝ සම්බන්ධයෙන් මෙපමණ කාලයක් තිබුණු ආණ්ඩු ඔක්කෝටම වඩා ඉස්සරහට ගිහිල්ලා. ඇත්තටම රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා මේ කැසිනෝවලට වෙනම chance එකක් දීලා තිබෙනවා. ගැසට් පත්‍ර 5ක් ගහලා යම් යම් කරුණු වෙනස් කරලා, අඩු කරලා අවස්ථාව ලබා දීලා තිබෙනවා, තව කැසිනෝ ව්‍යාපාර වැඩියෙන් දමන්න. හැබැයි, තමුන්නාන්සේලා හැම දාම ඒවාට ඇඟිල්ල දිගු කරපු නිසා අඩු ගණනේ ඒ තත්ත්වය වෙනස් කරන්න තිබුණා නේ. කැසිනෝ ගහන්නේ මෙහෙම නොවෙයි, කැසිනෝවලට බලපත්‍ර දෙනවා නම් අපි මෙන්න මේ නීති ටික දානවා කියලා නියාමන අධිකාරියක් - regulatory authority එකක් - වෙනම හදන්න තිබුණා. හැබැයි, පැහැදිලිවම තමුන්නාන්සේලා හදපු මේ නියාමනයේ තිබෙන වැරැද්ද තමයි, මේ විෂය භාර අමාත්‍යවරයා වන ජනාධිපතිවරයාට වැඩිපුර බලය ලබාගෙන තිබීම. ඒක වැරදි ක්‍රමයක්. ඇයි ඒ? විශේෂයෙන්ම මේ කරුණු පාර්ලිමේන්තුවට එවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ නියාමනයෙන් හදලා නැහැ. මේ නියාමනය සඳහා පත් කරන අය සම්බන්ධයෙන් පවා අමාත්‍යවරයාට තමයි විශේෂ බලයක් ලැබිලා තිබෙන්නේ. මේක වැරැද්දක්. මේක තමුන්නාන්සේලා කියන ප්‍රජාතන්ත්‍රවාදී විධියට රට පාලනය කරන ඒ වෙනස නොවෙයි. ඒ නිසා මේ පනතට අදාළ ගැසට් පත්‍රයේ විශාල අඩුපාඩුකම් තිබෙනවා. මේකට නිවැරදි නියාමනයක් දැම්මා නම් අපි එකඟයි. මේ පනත හොඳයි. මේ බදු ගහන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න ඕනෑ. හැබැයි, ඒ කටයුත්ත කරද්දී යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. තව පාරක් වෙනස් කරන්න හිතාගෙන අපි මේක හදන්නේ ඇයි? අපිට වාඩි වෙලා, සාකච්ඡා කරලා, එක විධියක වැඩ පිළිවෙළක් එක වතාවටම හදන්න තිබුණා නේ, සම්පූර්ණ වෙච්ච එකක් විධියට. හැබැයි, එහෙම සම්පූර්ණ වෙච්ච එකක් විධියට ඔබතුමන්ලාට මේක හදන්න බැරි වුණා. ඒ ගැන තමයි අපිට කථා කරන්න තිබෙන්නේ.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණා කිහිපයක්ම තිබෙනවා. දැන් ඔබතුමන්ලා කියනවා, මේ කටයුතු නියාමනය කරන්න හැදුවාට, අපි ඒ හැම එකටම අවස්ථාව දෙනවා කියන එක නොවෙයි ඒකෙන් කියන්නේ කියලා.

විශේෂයෙන්ම අපේ ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් කැසිනෝ විතරක් නොවෙයි, සූදු කෙළින ගොඩක් දේවල් මේ රටේ තිබෙනවා. දැන් ඒවා ගැන ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතට පොඩි පොඩි කථා ටිකක් දාලා තිබෙනවා. සූදු ක්‍රීඩාව ගැන හඳුන්වද්දී ඔබතුමන්ලා මෙන්න මේ වාගේ කථාවකුත් පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. පනත් කෙටුම්පතේ 79වැනි වගන්තියේ "සූදු ක්‍රීඩාව" යටතේ මෙසේ සඳහන් වනවා:

> ".....පුණ්‍ය හෝ පරාර්ථකාමී අරමුණු සඳහා වන සූදු ක්‍රීඩා හෝ අමාත්‍යවරයා විසින් කලින් කල 19 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රීඩාවන් ක්‍රීඩා කිරීම ද ඇතුළත් වේ;"

දැන් අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, පුණ්‍ය එහෙම නැත්නම් පරාර්ථකාමී අරමුණු කියන කොටස අනුව තමුන්නාන්සේලා විශේෂයෙන්ම පන්සල්වල, දේවස්ථානවල - සමහර ස්ථානවල තිබෙනවා, මල් වට්ටි වෙන්දේසි කරන එකක්- මල් වට්ටි වෙන්දේසි කරන එකටත් දැන් බද්දක් ගහන්නද, නියාමනයක් කරන්නද යන්නේ කියලා. *[බාධා කිරීමක්]* පන්සලේ මල් වට්ටියටත් බද්දක් ගහනවාද වෙන්දේසි කරද්දී? මේ වගන්තිය අනුවයි මම ඒක අහන්නේ. ඒක වැරදි නම් තේරුම් කරලා දෙන්න. විපක්ෂය හැටියට අපට තිබෙන්නේ, තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්න අහන එක නේ. අපට පෙනෙන විධියට පන්සලේ මල් වට්ටියට, විශේෂයෙන්ම දේවස්ථානවල තිබෙන දන්සැල්වලට, පාසැල්වලට ටිකට් ගහලා ආධාර හැටියට ගන්න දේවල් ඇතුළු සියල්ලටම තමුන්නාන්සේලා බදු ගහන නියාමනයක්ද මේ පනත යටතේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක අපට කියන්න. එහෙම නැත්නම්, නැහැ කියන්න. මේ පනත් කෙටුම්පතේ තිබෙන විධියට අපි විශ්වාස කරනවා, තමුන්නාන්සේලා පන්සලේ මල් වට්ටියටත් ඔන්න බදු ගහනවා කියලා. ඒ කියන්නේ, ගහන්න තිබෙන හැම එකටම බදු ගහනවා. *[බාධා කිරීමක්]* මේ පනත් කෙටුම්පතේ තිබෙන කාරණාවක් තමයි මම කිව්වේ.

ඒ වාගේ තව කාරණාවක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ, "සමාජ සුදු ක්‍රීඩාව" යන්නෙන් හඳුන්වන්නේ මොනවාද කියායි. පනත් කෙටුම්පතේ 79වන වගන්තියෙහි "සමාජ සුදු ක්‍රීඩාව" යටතේ මෙසේ සඳහන් වෙනවා:

" "සමාජ සුදු ක්‍රීඩාව" යන්නෙන්-

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ නිවෙස හෝ වෙනත් යම් තැනැත්තකුගේ නිවෙස වන පරිශ්‍රයක දී සිදු කරනු ලබන;

(ආ) එකම පවුලේ සාමාජිකයන් වන හෝ එකිනෙකා පෞද්ගලිකව ම හඳුනන තැනැත්තන් පමණක් සහභාගීවන්නන් ලෙස සිටින;

(ඇ) එය නිතිපතා, සිරිත් පරිදි හෝ ඊට සම්බන්ධ තැනැත්තන් අතර වන එකඟතාවක් මාර්ගයෙන් සිදු කරනු ලැබිය හැකි වුව ද, සැලකිය යුතු ලෙස ස්වයං සිද්ධ වන;"

ඒ කියන්නේ, මළ ගෙදර බූරු ගහන එකත් තමුන්නාන්සේලා නීත්‍යානුකූල කරලා ඒකත් tax කරන්නද යන්නේ? අපි අහන්නේ ඒකයි. ඔබතුමන්ලා මේවා නිවැරදි කර දෙන්න. මේ පනත් කෙටුම්පතේ සඳහන අනුව, මළ ගෙදර බූරු ගහන එකටත් tax ගහන්න තමයි තිබෙන්නේ. ඒක තමයි මේ කියලා තිබෙන්නේ. ගරු ඇමතිතුමා මීට පෙර කියනවා මම අහගෙන හිටියා, අපි හැම එකම දැම්මාට, හැම එකටම අපි නීතියෙන් අවස්ථාව, බලපත්‍ර දෙන්නේ නැහැ කියලා. හැබැයි, මේ පනත් කෙටුම්පතේ දාලා තිබෙන රාමුව තුළ අපි දකින්නේ තමුන්නාන්සේලා බූරු පොළත් නීත්‍යානුකූල කරලා, ඒකටත් බදු ගහන්න යනවා කියන එකයි. ඒක එහෙමද කියන එකයි අපි අහන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මළ ගෙදරක බූරු ගහන එක නීත්‍යානුකූල ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
නීත්‍යානුකූල නැහැ. අපි අහන්නේ ඔබතුමන්ලා ඒක නීත්‍යානුකූල කරන්න යනවා ද කියලායි. මම ඇහුවේ ඔබතුමන්ලා ඒක නීත්‍යානුකූල කරන්න යනවාද කියලායි. මේ වාගේ වගන්තියක් දාපුවාම ඒ අනුව අවසරය දෙන්න පුළුවන් නේ. *[බාධා කිරීමක්]* අන්න ඒක තමයි. ඊළඟට, මළ ගෙදරත් ලියාපදිංචි කරගෙන, බූරු පොළත් ලියාපදිංචි කරගනියි ද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ඒ බදු ගහන්නේ තෝන් ගන්න එක්කෙනාගෙන් ද, ගෙදර හිමියාගෙන් ද කියන එකයි. ඒකත් අපි අහන්න ඕනෑ. මේක සිද්ධ වෙන්නේ කොහොමද කියලා අපි අහන්න ඕනෑ.

ඊළඟට, තව ප්‍රශ්නයක් තිබෙනවා. බූරු ගහලා දිනපු එක්කෙනාගෙනුත් බදු ගන්නවා ද කියලා අපට දැනගන්න ඕනෑ. බූරු ගහලා කවුරු හරි මුදලාලි කෙනෙක් දිනලා යනවා නේ. ඒ මුදලාලිගෙනුත් බද්දක් ගන්නවා ද කියලා විස්තර කර දෙන්න කියලා අපි කියනවා. මේ කථා සියල්ල අවසානයේදී ගරු ඇමතිතුමාට මේ දේවල් විස්තර කර දෙන්න පුළුවන්. එතුමා මේ කරුණු හරියට විස්තර කරයි කියලා අපි හිතනවා.

එක පැත්තකින් මේ රටේ නීතිය මොන ආකාරයෙන් තිබුණත්, ඇත්තටම ඔබතුමන්ලා මේ රටේ ගංජා වවන්න අවසරය දුන්නා නේ. මීරිගම පැත්තේ දැන් ගංජා වවන්න අවසර දුන්නා නේ. පසුගිය කාලයේ ගංජා ගැන කථා කරද්දී මට මතකයි, එක debate එකකදී වත්මන් අපේ විදේශ කටයුතු ඇමතිතුමා එදා හිටපු ඩයනා ගමගේ රාජ්‍ය ඇමතිතුමියට කිව්වා, "මේක නිකම් ගංජා සමූළුවක් වුණා නේ, පිස්සු ද, අද ගංජා විකුණලා ඊළඟට බල්ලොත් විකුණයි" කියලා. එදා එහෙමයි මේ අය කිව්වේ. එදා මේ අය කිව්වා, ඉදිරියේදී කුඩුත් විකුණලා මෙහෙම කරයි කියලා. හැබැයි, අද තමුන්නාන්සේලා ගංජා වවන්න අවසර දීලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ වැඩේ හය නැතුව කරලා තිබෙනවා. හැබැයි, මතක තියා ගන්න, තමුන්නාන්සේලා ඔහොම කරන ගමන්ම අගමැතිතුමියට හොඳ ෂොට් එකක් දුන්නු බව. මොකක්ද දන්නවාද? අගමැතිතුමිය දැන් JVP එක සහ මාලිමාව කියන දෙපැත්තටම සම්බන්ධයි නේ. ඒ නිසා හෙමිහිට රාජපක්ෂලාගේ බෝඩ් එක අගමැතිතුමියට අලවලා සද්ද නැතුව හිටියා. එහෙම කරලා ඔබතුමන්ලා ඒක දන්නේ නැහැ වාගේ හිටියා. ප්‍රශ්නයක් නැහැ. ඒක හරි. ඔබතුමන්ලා තීක්ෂණ බුද්ධියෙන් ෂොට් එක ගහලා දැම්මා. ඒක දැන් ඉවරයි; ඒ ගමන ඉවරයි; ඒක නතර කරලා දැම්මා. මොකද, ඔබතුමන්ලාගේ එළියේ ඉන්න cadre එක ඒකට වැය කරන්නේ නැහැ. තේරුණාද? *[බාධා කිරීමක්]* වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා පෞද්ගලිකව ඒක කරනවා කියන එක නොවෙයි මම කියන්නේ. ඒක යම් විධියක project එකක් විධියට කළා, ගැහුවා. ඒක හරි. ඒ වාගේම මේ කාරණයත් තමුන්නාන්සේලා මතක තියා ගන්න. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 159දෙනෙක් මේ පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා හැම තැනකදීම පවත්වන සාකච්ඡාවලදී කියනවා, ඒ අය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට පත් වුණේ ඔවුන්ගේ සල්ලි වියදම් කරලාවත්, ඔවුන්ගේ හැකියාවකින්වත් නොවෙයි, ජනාධිපතිතුමා ප්‍රමුඛ ඒ පක්ෂයේ වැඩ පිළිවෙළ අනුවයි කියලා. ඒ නිසා ඔබතුමන්ලා ඒ මන්ත්‍රීවරුන්ට ෂොට් එක දීලා, ඒ පළිය ගත්තේ කොහොමද දන්නවාද? ඒ මන්ත්‍රීවරුන්ට කිව්වා, මීට පස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පෙන්ෂන් එක නැහැ කියලා. ඒ මන්ත්‍රීවරුන්ට වැඩේ දුන්නේ එහෙමයි. ඊළඟට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ insurance එක රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා අඩු කළා. කාගේද අඩු කළේ? මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ. මන්ත්‍රීවරුන්ගේ ඒ insurance එක අඩු කළේ ඇයි? මේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ අනෙක් අය වාගේ දුක් විඳලා නොවෙයි. හැමදාම දුක් විඳපු නිසා, දුක් විඳලා මෙතැනට ආපු නිසා ඔබතුමන්ලා ඇමතිකම් හරි ගත්තා. ඒ වරප්‍රසාදය හරි. හැබැයි, අර මන්ත්‍රීවරු ටික පව්. මම කියන්නේ ඒකයි. ඇතුළේ ඉඳලාම ෂොට් එක දීලා සම්පූර්ණයෙන්ම ඉවර කරලා දානවා. ඒක ඔබතුමන්ලා හරි විධියට කරනවා. ඒ විතරක් නොවෙයි.

මේ සුදු නියාමන අධිකාරිය මීට වඩා විධිමත් කරලා, මෙහි නිරත වන හැම කෙනෙකුගෙන්ම tax අය කර ගන්න පුළුවන් වන විධියට සකස් කරලා, ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සාකච්ඡා කරලා, අපි එක වැඩ පිළිවෙළක් හදමු. අපි මේ ක්‍රමයට විරුද්ධයි. එම නිසා ඒක නිවැරදි කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ මන්ත්‍රීවරු සඳහන් කරපු කරුණු කාරණා සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ඇත්තටම මෙතැන තිබෙන්නේ විධිවිධාන සහ අර්ථකථන පටලවා ගැනීමක්. මේ සුදු ක්‍රීඩාව කියන්නේ මොකක්ද කියන එක අර්ථකථනයේදී, ඔට්ටු ඇල්ලීම ඇතුළු ඕනෑම දෙයක් සුදු ක්‍රීඩාවට ඇතුළත් වෙන්න පුළුවන්.

ඒ නිසා තමයි මේක ඇතුළත් කරලා තිබෙන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, ඔබතුමන්ලා කිව්වා නේ, ලබන දෙසැම්බර් වෙනකොට ජනාධිපති අපේ එක්කෙනා කියලා. ඒවාටත් ඔට්ටු අල්ලන්න පුළුවන්. ඒවාත් මේක යටතට වැටෙනවාද, නැද්ද කියලා ඉදිරියේදී නියාමනය කරන්න පුළුවන්. එහෙම නැතුව හැම එකකටම licence දෙනවා කියන එක නොවෙයි මේකෙන් කියන්නේ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒත් එක්ක මෙතුමන්ලා මතු කරපු තවත් කරුණු දෙක, තුනකට උත්තර දෙන්න මට විනාඩියක කාලයක් දෙන්න.

එක කාරණයක් හැටියට විපක්ෂය මතු කළා, අපේ ආණ්ඩුව යටතේ බැංකු පද්ධතියේ net foreign assets අඩුවෙලා කියලා. ඇත්තටම ඒක සාවද්‍ය තොරතුරක්. ඒ කරුණු අර්ධ සත්‍යයයි. ඒ කියන්නේ, තොරතුරු වැරදි විධියට අර්ථකථනය කරලා තිබෙනවා. ඇත්තටම මැයි මාසයට සාපේක්ෂව ජූනි මාසයේ සමස්ත බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පොඩි ප්‍රමාණයකින් අඩුවෙලා තිබෙනවා. හැබැයි, අපි ආණ්ඩුව ගත්ත දවසේ ඉඳලා licensed commercial banksවල සහ මහ බැංකුවේ අඛණ්ඩව විදේශීය සංචිත වැඩිවෙලා තිබෙනවා. ඒ මන්ත්‍රීතුමාට මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ පැවති දත්ත මම ලබා ගත්තා. මම ඒ දත්ත ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම 2015 සිට 2018 තෙක් අඛණ්ඩව එකදු මාසයක්වත් ඒක ධන විධියට තිබිලා නැහැ. ඒ සියල්ල සෘණ. මහ බැංකුවේත් තිබිලා තිබෙන්නේ විදේශීය වගකීම්. වත්කම් සතයක්වත් තිබිලා නැහැ, වත්කම් සෘණ. ඒ වාගේම රටේ අර්බුදයක් නොතිබුණු කාලයේත් බැංකු පද්ධතිය සෘණ. අන්න, ආර්ථිකය කළමනාකරණය කරලා ගෙනැවිත් තිබුණු තැන! නමුත් වැරදි තොරතුරු සමාජගත කරපු නිසා තමයි මම මේ තොරතුරු සභාගත කළේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඊට අමතරව සංචිත සම්බන්ධ ප්‍රශ්නයකුත් මතු කළා. සමහර ආර්ථික දත්ත තිබෙනවා. මේ තිබෙන්නේ අපි ආර්ථිකය ස්ථාවර කරගෙන යන වැඩ පිළිවෙළක් අස්සේ තත්ත්ව කළමනාකරණය කිරීමයි. සංචිත ඉහළ යන්න පුළුවන්, පහළ යන්න පුළුවන්. හැබැයි, අපි මේ ආර්ථිකය ස්ථාවරව ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා, හෙල්ලෙන්නේ නැහැ. අපි වාහන ආනයනය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක් වෙන් කරපු තත්ත්වයක් යටතේදීත් ඩොලරයේ අගය එහෙම ම තබා ගන්න පුළුවන් වුණා. මෙතුමන්ලා දැන් මතු කළා, ඩොලර් බිලියන 6.1ක සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 7ට යන්නේ කොහොමද කියලා. ඔව්, අපි අපනයන ආදායම වැඩි කිරීම සඳහා වන සැලැස්මක් සකස් කරලා තිබෙනවා. අපි විදේශීය සංචිත, ප්‍රේෂණ සහ සෘජු විදේශීය ආයෝජන කැඳවලා තිබෙනවා. ඒවා තමයි තිරසාර පිළිතුරු. එහෙම බැරි වුණොත් අපි ඊළඟට විදේශීය වෙළෙඳ පොළටත් උපක්‍රමශීලීව මැදිහත් වෙනවා.

ඒ වාගේම මුදල් අච්චු ගැසීම සම්බන්ධයෙනුත් එතුමන්ලා නිරන්තරයෙන් වැරදි අදහස් මතු කළා. ඒක නැවත අධ්‍යයනය කරලා බලන්න. මුදල් සැපයුම ගත්තොත්, රට ඇතුළේ ප්‍රධානම කොටස් කිහිපයක් තිබෙනවා. ඒ කියන්නේ, සමස්ත බැංකු පද්ධතිය තුළින් ආණ්ඩුවට ලබා දුන් ණය, පෞද්ගලික අංශයට ලබා දුන් ණය, රාජ්‍ය ආයතනවලට ලබා දුන් ණය සහ ශුද්ධ විදේශීය වත්කම්වල එකතුව. රටේ බැංකුවල මූල්‍ය පද්ධතියේ වැඩ කටයුත්තක් නිසා තමයි ඒ එකතුව ප්‍රසාරණය වෙලා තිබෙන්නේ. එහෙම නැතුව ආණ්ඩුව කිසිදු ආකාරයකින් මුදල් අච්චු ගහලා නැහැ. කලින් සභාගත කරපු වාර්තාවත් සමඟ මම තවත් වාර්තාවක් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.41]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்று நாங்கள் 2024ஆம் ஆண்டின் 33ஆம் இலக்க பொதுத் தனிசு முகாமைத்துவச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடந்த காலங்களில் எமது நாட்டிலுள்ள அரச நிறுவனங்கள் பல்வேறுபட்ட கடன்களைப் பெற்றுள்ளன. எந்த ஒழுங்கு முறையும் இல்லாமல் ஊழல், மோசடி செய்யும் நோக்கத் திலேயே அந்தக் கடன்கள் பெறப்பட்டுள்ளன. சர்வதேச நிறுவனங்களின் உதவியோடும் யோசனையின் பேரிலும் 2024ஆம் ஆண்டு பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம் நிறைவேற்றப்பட்டது. இந்தச் சட்டத்தின்மூலம் மிக முக்கியமான இரண்டு நிறுவன அமைப்புகள் உருவாக் கப்படும். ஒன்று, Public Debt Management Office எனப்படும் பகிரங்க தனிசு முகாமைத்துவ காரியாலயம். அடுத்தது, Public Debt Coordinating Committee. இந்த Committee ஊடாக சில criteria மூலம் கடன் சார்ந்த கொடுக்கல் வாங்கல்கள் ஒழுங்குபடுத்தப்படுகின்றன. நாங்கள் ஒரு வங்கியில் கடன் பெறுவதற்குச் சென்றால், அந்த வங்கியானது சேவைநாடி கடனை எவ்வாறு மீளச் செலுத்துவார் அல்லது கடன் பெறுவதன்மூலம் எதிர்பார்க்கப்படும் இலக்கு அடையப்படுமா என்பதை நிச்சயமாகப் பார்க்கும்.

கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் பல்வேறு வேலைத்திட்டங்களுக்காக கடன் பெற்றுள்ளன. அந்தக் கடன் தொகையை முறையாகப் பயன்படுத்தி, சிறந்த முறையில் முதலீடு செய்து, நாட்டின் வருமானத்தை அதிகரிக்கக்கூடிய அல்லது மக்களுக்குச் சேவையைப் பெற்றுக்கொடுக்கக்கூடிய வகையிலான வேலைத்திட்டங்களாக அவை அமையவில்லை என்பதையே எங்களால் காணக்கூடியதாக உள்ளது. இதற்குச் சிறந்த உதாரணங்களாக, Sooriyawewa International Cricket Stadium, Hambantota International Conference Hall என்பவற்றைக் குறிப்பிடலாம். இவ்வாறான எந்த வருமானத் தையும் பெற்றுத்தராத வேலைத்திட்டங்கள் இந்த நாட்டில் முன்னைய காலங்களில் நடைபெற்றதை நாங்கள் காணக் கூடியதாக இருந்தது. எனவேதான் பொறுப்புள்ள அரசாங்கம் என்ற வகையில், எங்களுடைய அரசாங்கமானது ஒவ்வொரு விடயத்தையும் ஒழுங்குபடுத்த வேண்டுமென்ற நோக்கில் புதிய விதிமுறைகளை நடைமுறைப்படுத்துவதற்கு குறித்த சட்டங்களுக்குக்கீழ் ஒழுங்குவிதிகளை உருவாக்குகின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த நாட்டு மக்களுக்கு வழங்கிய வாக்குறுதிகளை நிறைவேற்றுகின்ற ஒரு சந்தர்ப்ப மாகக்கூட நாங்கள் இதனைப் பார்க்கலாம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்றைய தினம் இடம்பெற்ற ஹர்த்தால் பற்றி நான் இங்கு ஒருசில வார்த்தைகளைக் குறிப்பிட வேண்டும். எமது அன்புக்குரிய தமிழ்ச் சமூகம் இந்த ஹர்த்தாலை அழகான முறையில் தோல்வியடையச் செய்துள்ளது. இதற்கு நல்லதோர் உதாரணத்தைச் சொல்கின்றேன். அதாவது, இந்த ஹர்த்தாலை

யாழில் மேற்கொள்வதற்குச் சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள் அதில் தோல்வியுற்று வவுனியாவுக்குச் சென்றார். வவுனியாவில் என்ன நடந்தது? அங்கு அவர் மூக்குடைபட்டு வந்தார். இந்த ஹர்த்தாலை இலங்கை தமிழரசுக் கட்சியே ஒழுங்குசெய்து இருந்தது. எனினும், அதன் பாராளுமன்ற உறுப்பினரான சிறீதரன் அவர்கள் மு.ப. 10.00 மணியுடன் ஹர்த்தாலை முடித்துக்கொண்டார்.

நான் இந்தச் சபையில் முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, ஹர்த்தாலின்போது யாழ். மாநகர சபை முதல்வரும் மட்டக்களப்பு மாநகர சபை முதல்வரும் கேவலமான முறையில் நடந்துகொண்டதை நாம் காணக்கூடியதாக இருந்தது. இவர்கள் தமது அதிகாரத்தைத் துஷ்பிரயோகம் செய்த ஒரு சூழலையே காண முடிந்தது. இது தொடர்பில் மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ கந்தசாமி பிரபு அவர்கள் புகார் செய்திருப்பதை அறியக்கூடியதாக உள்ளது. ஏனெனில், இவர்கள் தமது அதிகார எல்லைக்குட்பட்ட கடைகளை பலவந்தமாக மூடச் சொன்னார்கள். சில முஸ்லிம் கடைகளும் மூடப்பட்டிருந்தன. அந்தக் கடைகள் தமிழ் சகோதரர்களின் பெயரிலுள்ள கடைகள்; rent மற்றும் குத்தகை அடைப்படையில் எடுக்கப் பட்ட கடைகள்! தமிழ் சகோதரர்களைப் பகைத்துக்கொள்ள முடியாமல் அல்லது தம்மால் தொடர்ந்தும் வியாபார நடவடிக்கையில் ஈடுபட முடியாது போய்விடுமோ என்ற பயத்தில் முஸ்லிம்கள் சிலர் கடைகளை மூடினார்கள். சில வர்த்தக சங்கங்களின் தலைவர்கள் இவர்களோடு challenge பண்ணினார்கள்.

ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் இந்த ஹர்த்தாலுக்கு ஆதரவு வழங்கியதாகக் கூறப்பட்டது. அவர்கள் இதற்கு ஏன் ஆதரவு கொடுத்தார்கள் என்பது எனக்கு விளங்கவில்லை. அதேபோன்று, கௌரவ மனோ கணேசன் அவர்களும் கௌரவ ஜீவன் தொண்டமான் அவர்களும் இதற்கு ஆதரவு கொடுத்தார்கள். இந்த ஹர்த்தால் ஒரு நல்ல நோக்கத்தோடு அல்லது இலங்கையிலுள்ள மக்களுக்கு நடந்த பாரிய அநியாயத்துக்கு எதிராகக் கொண்டுவரப்பட்டது என்று இவர்கள் நினைக்கிறார்களா? மக்கள் மிகத் தெளிவாக, புத்திசாலித்தனமாகச் செயற்பட்டார்கள். தமிழ் மக்கள் இலங்கை தமிழரசுக் கட்சியைப் புறக்கணித்தார்கள். முஸ்லிம் மக்கள் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸைப் புறக்கணித்தார்கள். அதேபோல், ஏனைய மக்கள் இதர கட்சிகளைப் புறக்கணித் தார்கள். இந்த ஹர்த்தால் பிழையானதொரு விடயம் என்பதில் தோழர் அர்ச்சுனா அவர்கள் மிகத் தெளிவாக இருந்ததை நான் அவருடைய voice-cut மூலம் அறிந்து கொண்டேன். நாங்கள் என்ன நோக்கத்துக்காக ஹர்த்தால் செய்ய வேண்டும்?

அன்புக்குரிய தமிழ் மக்களே, தேசிய மக்கள் சக்தி ஆட்சி அமைத்த பின்னர் உங்களால் சுதந்திர காற்றைச் சுவாசிக்க முடிகின்றது என்பதை நீங்கள் சற்று நினைத்துப் பாருங்கள்! நீங்கள் தேசிய மக்கள் சக்தியோடு இருப்பதனால்தான் இந்த ஹர்த்தால் தோல்வியுற்றது. இலங்கை தமிழரசுக் கட்சியானது, அரசியல் நோக்கத்துக்காகவே இந்த ஹர்த்தாலை திட்டமிட்டது. இவர்கள் சரியான தலைவர்கள் என்றால், வெயிலில் நின்று உண்ணாவிரதம் இருந்திருக்க வேண்டு மென்று ஓர் அம்மா சொன்னார். நாளாந்த சீவனோபாயத்தை இல்லாமற் செய்யும்படியாகத்தான் இவர்கள் இந்த ஹர்த்தாலைத் திட்டமிட்டார்கள். எமது அரசாங்கத்தில் முக்கிய அமைச்சராக இருக்கும் சகோதரர் பிமல் ரத்நாயக்க அவர்கள் ஆரம்பத்திலிருந்து இன்றுவரை இனவாதத்துக்கு எதிராகக் குரல்கொடுத்து வருகிறார்; இனவாதம் தலைதூக்க இடமளிக்க மாட்டோம் என்று பாராளுமன்றத்தில் உரத்த குரலில் சொல்கிறார். அதேபோன்றுதான் எமது ஏனைய அமைச்சர் களும் பாராளுமன்ற உறுப்பினர்களும் செயற்படுகின்றார்கள்.

இந்த அரசாங்கம் எந்தவோர் இடத்திலாவது தமிழ் மக்களுடைய உரிமையை அல்லது முஸ்லிம் மக்களுடைய உரிமையைத் திட்டமிட்டு இல்லாமல் செய்ததா? அதை உங்களால் நிரூபிக்க முடியுமா? அப்படி யாராலும் சொல்ல முடியாது. ஏனெனில், எமது மக்களுக்குச் சேவையாற்ற வேண்டும் என்ற மிகத் தூய்மையாக நோக்கத்தில்தான் இன்று நாங்கள் அரசியலில் ஈடுபடுகின்றோம். இந்த ஹர்த்தாலானது, ஏனைய பிரதேச மக்களுக்கும் நல்லதொரு முன்னுதாரணமாக இருக்கும் என்பதில் எந்தச் சந்தேகமும் இல்லை. "அரசாங்கத்துக்குச் சொந்தமான வாகனத்தில் வந்து எமக்கு நீங்கள் order போடுகின்றீர்கள்" என்று வர்த்தக சங்கத் தலைவர் ஒருவர் கூறினார். "கடைகளை மூடாவிட்டால், உங்களுடைய licence cancel பண்ணப்படும்" என்று சில மாநகர சபை முதல்வர்கள் அவர்களை பலவந்தப்படுத்தினார்கள்.

மிக முக்கியமாக ஒன்றைச் சொல்ல வேண்டும். எங்களுடைய கட்சி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய கட்சி போன்றது என்று முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள் கூறுகிறார். அன்று பிள்ளையான் அல்லது கருணா அம்மான் செயற்பட்டதுபோன்று, இன்று இலங்கை தமிழரசுக் கட்சி செயற்படுவதை நாங்கள் காண்கின்றோம். அதாவது, அவர்களுக்குத் தேவையென்றால் கடையடைப்புச் செய்யச் சொல்வார்கள். இதனை நாங்கள் தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும். இன்று சட்டம் ஒழுங்கான முறையில் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றது. அந்த குறிப்பிட்ட சம்பவத்துடன் தொடர்புடைய அனைவரும் கைதுசெய்யப்பட்டுள்ள நிலையிலேதான் இந்த ஹர்த்தாலுக்கு அழைப்பு விடுக்கப்பட்டுள்ளது. ஏன் இந்தப் போலி நாடகம்?

தேசிய மக்கள் சக்தியின் வளர்ச்சி காரணமாக இலங்கை தமிழரசுக் கட்சி, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் போன்ற பல கட்சிகள் தமது அரசியல் இருப்பை இன்று இழந்து வருகின்றன. ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் இந்த ஹர்த்தாலுக்கு ஆதரவு கொடுத்தது. எனினும், கௌரவ றிஸாட் பதியுதீன் அவர்களின் தலைமையிலான கட்சி இதற்கு ஆதரவு வழங்கவில்லை. அதேபோல், கௌரவ ஜீவன் தொண்டமான் அவர்களின் கட்சி இந்த ஹர்த்தாலுக்கு ஆதரவு கொடுத்தது. எனினும், பல மலையக கட்சிகள் இதற்கு ஆதரவு வழங்கவில்லை. இவ்வாறான ஒரு புதினமான நிலையையே இன்று நாங்கள் காண்கின்றோம். இவர்களுக்கு மக்கள் அழகிய முறையில் பதில் அளித்திருக்கிறார்கள் என்பது மிகத் தெளிவாகத் தெரிகின்றது.

மக்கள் பயப்படத் தேவையில்லை. ஏனெனில், இன்று இந்த அரசாங்கம் மிகத் தெளிவான பாதையில் செல்கின்றது. இன்று நாங்கள் பல்வேறுபட்ட சட்ட திருத்தங்களைச் செய்கின்றோம்; பல்வேறுபட்ட வேலைத்திட்டங்களை நடைமுறைப்படுத்து கின்றோம். யாழ்ப்பாணம் உட்பட வடக்கு, கிழக்குப் பிரதேசம் மிக வேகமாக முன்னேறிக்கொண்டு செல்கின்றது. இன்று மக்கள் சந்தோசமாக உள்ளார்கள்; பாதுகாப்பாக இருக்கிறார்கள். இதுபோன்ற ஒரு ஹர்த்தால் இனிமேல் இடம்பெறாது என்பதற்கு இது நல்லதோர் ஆதாரமாக இருக்கும். இந்த ஹர்த்தாலை ஏற்பாடு செய்த இலங்கை தமிழரசுக் கட்சிக்கும் ஏனைய கட்சிகளுக்கும் நாங்கள் நன்றி கூறக் கடமைப்பட்டுள்ளோம். ஏனெனில், இதன்மூலம் இன்று இந்த அரசாங்கத்தின் சக்தி வெளிப்படுத்தப்பட்டு இருக்கின்றது. நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.51]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විශේෂයෙන් සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව කිව යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ඉස්සෙල්ලාම අපි කියන්න ඕනෑ සූදු ක්‍රීඩාව පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ එදා තිබුණු විරෝධය ගැන. පසුගිය රජය මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන කොට ඒ අය ඒ පිළිබඳව කරපු විවේචන මට අදටත් මතක් වෙනවා. ඒ කාලයේ අනුර කුමාර දිසානායක මැතිතුමා මේ ගරු සභාවේ මම දැන් ඉන්න තැනට ඉස්සරහින් තමයි අසුන් ගෙන හිටියේ. අනුර කුමාර දිසානායක මැතිතුමා එදා ඒ කාරණය පිළිබඳව මේ රටට මවලා කියපු ආකාරය මට අදටත් සිහිපත් වෙනවා. "ඇයි, මේ රට සූදු පොළක් බවට පත් කරන්නේ?" කියලා එතුමා දිගින් දිගටම ඇහුවා; ලොකු විවේචනයක් ද දිගින් දිගටම කළා. ඒ කරපු විවේචන ඔක්කෝම අමතක කරලා දැන් ආණ්ඩු බලය ලබාගෙන එක පැත්තකින්, එවැන්නක් විවෘත කිරීමේ අවස්ථාවකටත් සහභාගි වුණා; අනෙක් පැත්තෙන්, එය තවදුරටත් ශක්තිමත් කරලා ඉදිරියටත් ගෙන යනවා. ඒ අතරතුරේ අපටත් බණිනවා.

අපි ඒ කටයුත්තට විරුද්ධ වුණේ නැහැ. අපි විශ්වාස කරනවා, මේ කියන සූදු පිළිබඳ නියාමනයක් තිබිය යුතුයි කියලා; ඒකට අධිකාරියක් තිබිය යුතුයි කියලා. ඒ වාගේම තමයි ඒ අධිකාරිය ස්වාධීන විය යුතුයි. ස්වාධීන අධිකාරියක් නැතුව අමාත්‍යවරයාට සම්පූර්ණ බලය ලබා දීම තුළින් මෙය වඩාත් දූෂිත මට්ටමකට පත් වෙනවා. එම නිසා මෙහි ප්‍රධාන තනතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත් කරලා එහි ස්වාධීනත්වය ආරක්ෂාව කිරීම වැදගත් කියලා අපි විශ්වාස කරනවා.

Whatever said and done, I must congratulate the Government for having decided to take the bitter pill. මම කලිනුත් කිව්වා වාගේ, මෙය උගුරට හොරා බෙහෙත් බොන ආණ්ඩුවක් බව නැවත වාරයක් මේ ආණ්ඩුවම ඔප්පු කරලා තිබුණා. තමන් කලින් කියපු දේවල් දැන් සැලකිල්ලට ගන්නේ නැතිව මේ ආණ්ඩුව කියනවා, "අපි කරන්නේ වගකීම් සහිත සූදු කෙළීම්" කියලා. ඒ හින්දා සූදු කෙළීම් හොඳයි ලු. එච්චරයි.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.56]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විදේශ විනිමය පනත යටතේ ගෙනෙන නියමය, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග සහ සූදු නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක් වී කථා කිරීමට මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දින කිහිපයක් තිස්සේ මාධ්‍ය සහ සමහර උදවිය අපෙන් අහපු ප්‍රශ්නයක් තමයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව බෙදීමකට ලක් වෙලා, අද පනස්දෙදෙනෙක් විපක්ෂයේ වාඩි වෙනවාද කියන එක. එවැනි ප්‍රවෘත්තියක් සමාජ මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍යවල පළ වුණා. සමහර අවස්ථාවල මාධ්‍ය සාකච්ඡාවලදීත් ඒ ප්‍රශ්නය අපෙන් ඇහුවා. මම දීපු උත්තරය තමයි, ඒ ගණනයේ පොඩි වැරැද්දක් තිබෙනවා, ආණ්ඩුව ලබා ගත් දවසේ ඉඳලා දිගටම අපේ හතළිස්තුන්දෙනෙක් විපක්ෂයේ වාඩි වෙලා ඉන්නවාය කියන එක.

විපක්ෂයේ අයට අද සටන් පාඨයක් නැති වුණාම, දේශපාලනය කර ගන්න බැරි වුණාම නැති දේවල් ඇති කරමින්, සමාජය තුළ බොරු මතවාද ඇති කරමින් ඉන්නවා. දේශපාලනය තුළ උගුරට හොරා බෙහෙත් බීපු සමහර නායකයෝ අපේ ආණ්ඩුවට නොයෙක් චෝදනා කරනවා. කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා, මේ දේශපාලන ජීවිතය තුළ -අවුරුදු 40ක් වෙන්න පුළුවන්- මොන තරම් අවස්ථාවල එතුමන්ලා උගුරට හොරා, සමාජයට හොරා බෙහෙත් බීලා ඇතිද කියන එක මතක් කරගන්න කියලා මම කියන්න කැමැතියි.

මේ විවාදයේදී අද උදේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කරමින් විවිධ මාෆියා පිළිබඳව අදහස් දැක්වූවා. මේ රටේ විවිධ ක්ෂේත්‍ර තුළ ඇති වී තිබෙන මාෆියා පිළිබඳව අදහස් දැක්වූවා. හැබැයි, ඒගොල්ලෝ අමතක කරනවා, ඒ සියලු මාෆියා ගොඩ නැඟුවේ තමන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන්, තමන්ගේ දේශපාලන ගමන වෙනුවෙන් කියන එක. ඒ මාෆියාව පෝෂණය කරමින්, වර්ධනය කරමින් ඒ ඔස්සේ ගමන් කරපු අය ඇවිල්ලා රට තුළ තිබෙන සමහර මාෆියා පිළිබඳව දැන් කථා කරනවා.

විශේෂයෙන් තවත් දෙයක් මතක් කරන්න ඕනෑ. ඒ, අපේ රටේ කාලාන්තරයක් තිස්සේ පවතින හර්තාල ගැන. "හර්තාල්" කිව්වාම දකුණට දැනුණේ නැති වුණත් උතුරටයි, නැඟෙනහිරටයි ඉතාම ප්‍රබල දෙයක්. "හර්තාල්" කියන වචනය උතුර, නැඟෙනහිර තුළ ප්‍රබල වචනයක්. සමාජය තුළ විශාල ආකර්ෂණයක් ඒකට තිබුණා. ඊයේ දේශපාලන පක්ෂ කීපයක්, එනම් තමන්ට දේශපාලනය කර ගන්න බැරි වුණාම, පරාජිත, ජනතාව ඉදිරියේ බංකොලොත් වෙච්ච, ජනතාව ප්‍රතික්ෂේප කරපු දේශපාලන පක්ෂ කීපයක් එකතු වෙලා හර්තාලයක් සඳහා ජනතාව කැඳවනු ලැබූ බව අපි දන්නවා. උතුර නියෝජනය කරන සමහර මන්ත්‍රීවරුත් පිළිගනියි, උතුරු නැඟෙනහිර ජනතාවත් පිළිගනියි ඒක අසාර්ථකයි කියලා. ඊයේත්, අද උදේ පාන්දරත් ඒ හර්තාලයේ සාර්ථකත්වය පිළිබඳව කථා කරන කොටම අපට දැනුණා, ඒක කොතරම් අසාර්ථක එකක්ද කියලා. මැතිවරණයෙන් පරාජයට පත් වෙලා,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න. ඊයේ හර්තාලයක් තිබුණේ නැහැ. කඩ 6.00ට ඇරියා. ඔයගොල්ලෝ මෙහෙම දිගින් දිගටම කියනකොට මිනිස්සු විශ්වාස කරනවා, හර්තාලයක් තිබුණා කියලා.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
ස්තුතියි. හර්තාලයක් ඊයේ ,- *[බාධා කිරීමක්]* විශේෂයෙන්ම මට කියන්න වුවමනා වුණේ, දේශපාලන පිටිය තුළත්, ජන සමාජය තුළත් ඔවුන් පරාජයට පත් වෙලා තිබෙනවා වාගේම, ජනතාව ඔවුන් විශ්වාස කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙන බවයි. කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් කොංග්‍රසයේ උපනායකයා ඉන්නවා. හැබැයි, ඒ ප්‍රදේශයේත් සියලු කඩ ඇරලා තිබුණා.

ඒ නිසා ඊයේ ඒ මුළු පළාතම සාමාන්‍ය දවසක් බවට පත් වෙලා තිබුණා. මේ තුළ අපට පෙන්වන දේ මොකක්ද? ඒ තමයි, මේ රටේ ජනතාවට අවශ්‍ය තවදුරටත් ජාති වශයෙන්, ආගම් වශයෙන් හෝ වෙනත් සාධක මත බෙදිලා දේශපාලනය කරනවාට වඩා අපි හැමකෙනාගේම පොදු සතුරා, පොදු අරමුණ හරියට හඳුනාගෙන ඒ වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක් අවශ්‍යයි කියන එක. එතැන තමයි අද ඒ සමස්ත ජනතාවම ඉන්නේ. ඒ නිසා තමයි මැතිවරණයෙනුත් පරාජයට පත් කරලා ඊයේ ඔවුන්ගේ හර්තාල් ඉල්ලීමත් ජනතාව ප්‍රතික්ෂේප කළේ. ජනතාව ඔවුන්ගේ කැඳවීම ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කරලා තිබුණා. ඒක දිස්ත්‍රික්කය පුරාම තිබුණු දෙයක්.

තව එක කාරණාවක් මතක් කළ යුතුයි. විශේෂයෙන් මට පෙර කථා කරපු ඒ දේශපාලන නායකයාට දේශපාලනය කර ගන්න මාතෘකා නැති වුණාම සමාජය තුළ විවිධ මාතෘකා හදමින් ඉන්නවා. එතුමා අරුගම්බේ පිළිබඳව එක්තරා ස්ථාවරයක් ගන්නකොට, එතුමාගේම දේශපාලන කඳවුර නියෝජනය කරන පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඒකට වෙනම අර්ථකථනයක් ලබා දෙමින් කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා

[ගරු මුනීර් මුලාෆර් මහතා]

මම එතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, ජනතාව කුපිත කරන්න කලින්, වැරදි ප්‍රවෘත්ති සමාජගත කරන්න කලින් තමන්ගේ පක්ෂය මොන ස්ථාවරය තුළද ඉන්නේ කියන කාරණය පැහැදිලි කර ගන්න කියලා.

විශේෂයෙන්ම සූදු කෙළීම පිළිබඳව මුස්ලිම් ජාතිකයන් හැටියට අපට ප්‍රතිපත්තිමය ස්ථාවරයක් තිබෙනවා.

මම අවසාන වශයෙන් තව කාරණයක් කියනවා. දේශපාලන පොරපිටිය තුළ ආගම වැරදි විධියට පාවිච්චි කරන්න එපා කියන ඉල්ලීම මම එතුමාගෙන් කරනවා. ඒකට හේතුවක් තිබෙනවා. පොතුවිල් ප්‍රදේශය තුළ මුස්ලිම් කොංග්‍රසයේ රැස්වීමක් තිබුණා. පොතුවිල් ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ කාරණයක් තිබෙනවා. ඒ තමයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ ආණ්ඩු කාලය තුළ ඒ ප්‍රදේශයට ලැබුණු බාර් ලයිසන් තුනක් ගැන එක්තරා මන්ත්‍රීවරයකුට විශාල චෝදනාවක් තිබෙන එක. රවුෆ් හකීම් මන්ත්‍රීවරයා එදා පොතුවිල් ගිහිල්ලා කියනවා එතුමා සහ ඒ ප්‍රදේශයේ ඉන්න දේශපාලනඥයා එකතුවීම "මක්කා" ජයග්‍රහණය හා සමානයි කියලා. මම ආරාධනා කරනවා එතුමාට මක්කා ජයග්‍රහණය පිළිබඳ ඉතිහාසය හරියට කියවන්න කියලා. ඒ තුළ තුබුණු අවංකත්වය, කැපවීම, ඒ වෙනුවෙන් ලබා දීපු ඒ පරිත්‍යාගශීලි බව පිළිබඳව කියවලා තේරුම් ගෙන, එවැනි උසස් දේවල් මේ තුච්ඡ, කුණුවෙච්ච, කැත දේශපාලනය සඳහා යොදා ගන්න එපා කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.04]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී අපි සාකච්ඡා කරන්නේ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග සහ විදේශ විනිමය පනත යටතේ ගෙනෙන නියමය ගැනයි.

අපි අද දවස තුළ විවිධ ආකාරයට මේ සාකච්ඡාවට මුහුණ දෙමින් සිටිනවා. විශේෂයෙන්ම අපි කථා කරන්නේ සූදු ක්‍රීඩාවේ නියාමනයක් පිළිබඳව. හැබැයි විපක්ෂයේ අපේ මන්ත්‍රීවරු අද දවස පුරාම උත්සාහ කළේ නියාමන අධිකාරියෙන් කරන්න බලාපොරොත්තු වන දේ හරියාකාරව සිදු වේදැයි කියලා සැක පහළ කරන එක. එහෙම නැත්නම්, මේ පනත් කෙටුම්පතේ තිබෙන වගන්ති විවිධ ආකාරයට නිර්වචනය කිරීම. මෙච්චර කාලයක් දේශපාලනය කරපු අය මේ පිළිබඳව සැලකිල්ලක් දැක්වුවේ නැහැ. සූදුව, සූදු ක්‍රීඩාව අනාදිමත් කාලයක සිට සමාජයේ තිබුණා. හැබැයි, අවුරුදු ගාණක් තිස්සේ මේ රට පාලනය කරපු පාලකයෝ ඒවා නියාමනය කරන්න උත්සාහ කළේ නැහැ.

එහෙම උත්සාහ කරන්නේ නැතුව ඉඳලා දැන් හදිසියේ නින්දෙන් අවදි වෙලා වාගේ කල්පනා කරනවා, මේ පනත ගෙන එන එක පමා කරන්නේ කොහොමද, එහෙම නැත්නම් මේ පනතේ පෙන්වලා දෙන්න ඕනෑ අඩුපාඩු මොනවාද කියලා. ඒ කියන්නේ මේ පනත ගෙන ඒම පිළිබඳව ඒගොල්ලන්ට ගැටලු රාශියක් පැනනැඟිලා තිබෙනවා. මොකද, සමහර විට මේ වෙනකොට මේ සූදු ක්‍රීඩාවේ යෙදෙන්නේ ඒ අය එක්ක පසුගිය කාලයක් තිස්සේ ආණ්ඩු පාලනයේදී ගනුදෙනු කරපු අය වෙන්න පුළුවන් නිසා.

ලොතරැයි මණ්ඩලය නියාමනය කිරීම මේ පනතට ඇතුළත් නොවීම පිළිබඳව නොයෙක් මත ප්‍රකාශ කළා. නමුත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ ජාතික ලොතරැයි මණ්ඩලය නියාමනය කිරීම සඳහා වෙනම පනත් තිබෙනවා. ඒ නිසා එය මේ පනතට ඇතුළත කිරීමේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ. ඒ වාගේම, මේ පත් කරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය ස්වාධීන විය යුතුයි කියලා තර්ක කරනවා. ඇත්තටම එය ස්වාධීන විය යුතුයි කියන එක අපට වැදගත් වෙන්නේ පනත ක්‍රියාත්මක කිරීමේදී. අපි මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරියක් පත් කරනවා. ඒ අධිකාරියට අවශ්‍ය අධිකාරි බලය පවරලා අවශ්‍ය නිලධාරීන් පත් කරනවා. ඒ නිලධාරීන් විසින් තමයි මේ පනත ක්‍රියාත්මක කරනකොට මේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න ඕනෑ. ආණ්ඩුවක් හැටියට ඒ වගවීම, වගකීම අපි ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අපි පත් කරන නිලධාරීන් ඒ වගකීම ඉෂ්ට කළේ නැත්නම් අපි මේ වෙනකොටත් ඔප්පු කරලා තිබෙනවා, එහෙම නිලධාරීන්ට අපේ ආණ්ඩුවේ ඉන්න බැහැ කියලා.

ඒ වාගේම, මෙම පනත් කෙටුම්පතේ 55වැනි පිටුවේ තිබෙන කාරණා පිළිබඳවත් නිර්වචනය කරන්න උත්සාහ කළා, විවිධ ආකාරයට. ඇත්තටම 79වැනි වගන්තියට අදාළව 55වැනි පිටුවේ තිබෙන නිර්වචනයේ තිබෙන්නේ විවිධ ආකාරයෙන් කෙරෙන සූදු ක්‍රීඩා පිළිබඳවයි. හැබැයි ඒ ගරු මන්ත්‍රීතුමා උත්සාහ කළේ, අපි මේ විවිධ සූදු ක්‍රීඩාවලට යම්කිසි කැඳවීමක් කරන්න, ඒ සූදු ක්‍රීඩා පවත්වාගෙන යන්න, එහෙමත් නැත්නම් මේ සූදු ක්‍රීඩාවලට බලපත්‍ර නිකුත් කරන්න උත්සාහ කරනවා කියලා පෙන්වන්නයි. ඇත්තටම එහෙම එකක් නොවෙයි එහි තිබෙන්නේ. අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව සමාජයේ සිදු වෙන සූදු ක්‍රීඩා පිළිබඳව නිර්වචනය කිරීමක් ඒකේ තිබෙන්නේ. ඒ නිර්වචනය කිරීමේදී විවිධ ආකාරයෙන් ලෝකයේ මේ වෙනකොට සිදු වෙන සූදු ක්‍රීඩා පිළිබඳව මෙතැන සඳහන් කරලා තිබෙනවා. එතකොට මේ නියාමන අධිකාරියට හැකි වෙනවා, ඒ පිළිබඳව ක්‍රියා කරන්න. ඒ කියන්නේ බලපත්‍රයක් ලබා දීමේදී ඒ සූදු ක්‍රීඩාව පිළිබඳව ක්‍රියා කරන්න හැකියාවක් තිබෙනවා. නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, ඕනෑම සූදු ක්‍රීඩාවකට මේ නියාමන අධිකාරිය විසින් බලපත්‍ර ලබා දෙනවා කියලා.

ඒ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරු මතු කරන අනෙක් කාරණය තමයි, ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුත් මීට පෙර මේ සූදු ක්‍රීඩාව පිළිබඳව මතු කරපු අදහස්. සාරධර්ම පැත්තෙන් ගත්තොත්, එහෙම නැත්නම් රටේ ජනතාවගේ යහ පැවැත්ම පැත්තෙන් ගත්තොත්, ඒ අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. නමුත් දැන් අපි, ජාතික ජන බලවේගය මේ ආණ්ඩුව භාරගෙන ඉන්නේ. මේ ආණ්ඩුව භාරගෙන නම් අපට මේ යථාර්ථයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා නේ. අපි කැමති වුණත්, නැති වුණත් මේ රටේ මේ සූදු ක්‍රීඩා තිබෙනවා. එතකොට ඒ තිබෙන සූදු ක්‍රීඩා නිවැරදිව නියාමනය කරලා, ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන එක ආණ්ඩුවේ වගකීම. ඒ නිසා රටේ ජනතාව වෙනුවෙන් අපි අකමැති වුණත් තිබෙන සූදු ක්‍රීඩා නියාමනය කරන්න අවශ්‍ය කරන ඒ වැඩ පිළිවෙළ තමයි මේ ක්‍රියාත්මක කරමින් ඉන්නේ.

අපේ රට බංකොලොත් රටක්; බංකොලොත් කළ රටක්. අපි ඒ බංකොලොත්භාවයෙන් මිදිලා, ණය ප්‍රතිව්‍යුහගත කර ගනිමින්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරමින්, ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කරමින්, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව සියයට

25කට ආසන්න ප්‍රමාණයකගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කරමින් පාලනය යථාවත් කරගෙන එන වෙලාවේ තමයි අපට මේ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ නිසා ඇත්තටම මේ ආර්ථික හැකියාව වැඩිදියුණු කර ගත යුතු නිසාත්, අපි ඉන්නේ බංකොලොත් තත්ත්වයක නිසාත් තමයි අපට මේ සූදු ක්‍රීඩාවේ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම විශේෂයෙන් වැදගත් වෙන්නේ. මේ සූදු ක්‍රීඩාවෙන් ලැබෙන ආදායම ජනතාවගේ යහපතට යොදවා ගන්න අවශ්‍ය නිසා තමයි මෙතෙක් නියාමනය නොකළ මේ සූදු ක්‍රීඩා දැන් නියාමනය කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ.

මේ වෙනකොට ආණ්ඩුව යටිතල පහසුකම් දියුණු කරලා, ආයෝජන කැඳවලා, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න උත්සාහ කරමින් ඉන්නවා. ඒ නිසාම තමයි මේ සූදු ක්‍රීඩා නියාමනය කිරීම අපට වැදගත් වෙන්නේ. මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ සූදු ක්‍රීඩා හරහා ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සමාජ ආරක්ෂණය සහ මහජන විශ්වාසය අතර සමබරතාවකින් පවත්වා ගෙන යන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්නයි. ආදායම් උත්පාදනයේදී මේ නියාමනය අපට වැදගත් වෙන්නේ කොහොමද? විශේෂයෙන්ම නිවැරදි ලෙස සූදු ක්‍රීඩාවේ යෙදෙන්නන් ලියාපදිංචි කිරීමට, සූදු ක්‍රීඩාවේ යෙදෙන්නන් නිසා එකතු වන ධනය හරහා බදු එකතු කිරීමට, සාධාරණ ලෙස ප්‍රාදේශීය සහ ජාතික වශයෙන් ආදායම් එකතු කර ගැනීමට, සූදු ක්‍රීඩාව තුළ ඒකාධිකාරයක් ඇතිවීම වැළැක්වීමට, සාධාරණ තරගයක් ඇති කිරීමට, වග කිවයුතු විදේශ ආයෝජන ගෙන ඒමට, සූදු ක්‍රීඩාව තුළ විනිවිදභාවය ආරක්ෂා කිරීමට, ආදායම් අඩු කර පෙන්වීම වැළැක්වීමට, බදු පැහැර හැරීම් වැළැක්වීමට නියාමනයක් අවශ්‍යයි. විවිධ පුද්ගලයන් මේ බදු පැහැර හැරීම් කරනවා කියලා අපි දන්නවා. මේ සූදු ක්‍රීඩා තුළත් ඒ ආකාරයටම බදු පැහැර හැරීම් කරනවා. අද මේ සාකච්ඡාවේදී ප්‍රකාශ වුණා, සූදු ක්‍රීඩාවේදී ජයග්‍රහණය කළ කිසිම කෙනෙක් රජයට ගෙවිය යුතු බද්ද මේ තාක් ගෙවලා නැහැ කියලා. ඒ නිසා රජයට අයිති විය යුතු, ආණ්ඩුවට අයිති විය යුතු, ජනතාවගේ යහපත සඳහා යෙදවිය හැකි ඒ බදු මුදල් අය කර ගන්න මේ නියාමනය අපට අවශ්‍ය වෙනවා. ඒ වාගේම, සූදු ක්‍රීඩාව හරහා ඇති විය හැකි අපරාධ සහ දූෂණය වැළැක්වීමටත් අපට ඒ නියාමන කටයුතු අවශ්‍ය වෙනවා.

අපි මේ සූදු ක්‍රීඩා කරන්නන්, බලපත්‍රලාභීන් හඳුනා ගන්නවා. ඒ හඳුනා ගන්නා අය පිළිබඳව අපට නියාමනයක් කළ හැකියි. එවිට money laundering වැළැක්වීමට අපට කටයුතු කළ හැකියි. සැක කටයුතු මුදල් ගනුදෙනු හඳුනා ගැනීමට, අපරාධකරුවන් මේ ව්‍යාපාරයට ඇතුළත්වීම වැළැක්වීමට, අයිතිය ලබා ගැනීම වැළැක්වීමට, කැසිනෝ ක්‍රියාකරුවන් වීම වැළැක්වීමට, අල්ලස් දූෂණ සහ දේශපාලන මැදිහත්වීම් වැළැක්වීමට, සමාජ ආරක්ෂණයට හානි කරන වැඩසටහන් ඉවත් කිරීමට අපට මේ හරහා හැකි වෙනවා. ඒ වාගේම මේවාට ඇබ්බැහිවූවන්ට උපදේශනය ලබාදීමට, ඔට්ටු සඳහා සීමා පැනවීමට, අවදානම් කණ්ඩායම්වල ආරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීමට, විශේෂයෙන්ම වයස් සීමා හඳුනාගෙන වයස අඩු අය සූදු ක්‍රීඩාවට ඇතුළත් වීම වැළැක්වීමට, මේ පිළිබඳව වැරදි ප්‍රචාරණය ඇතිවීම වැළැක්වීමට හැකි වෙනවා. සමාජයේ දැනුවත්භාවය වැඩි කිරීම හරහා මේකේ ආදීනව තේරුම් කර දෙමින්, වැඩිහිටියන්ට පමණක්, දැනුම් තේරුම් ඇති අයට පමණක් මේ සූදු ක්‍රීඩාවලට ඇතුළත් වීමට ඉඩකඩ සකස් කරලා ඒ ක්‍රීඩාව කරගෙන යන්න ඉඩදීමත්, ඒකෙන් ලැබෙන ආදායම රටේ යහපත සඳහා උපයෝගී කර ගැනීමත් තමයි මේ නියාමන ක්‍රියාවලියෙන් ඇත්තටම බලාපොරොත්තු වන්නේ. ඒ නිසා මේ තුළින් සමාජයට ඇති බලපෑම නියාමනය වෙනවා වාගේම, මේකෙන් social cost එක, පවුල්වල ණයගැතිභාවය ඇතිවීම පාලනයට, අපරාධ සහ ඇබ්බැහිවීම පාලනයට මේ නියාමනයෙන් ලබා ගන්නා තොරතුරු අපට උදව් වෙනවා. එම නිසා අපි කැමැති වුණත්, අකමැති වුණත් රටේ ආර්ථිකයට අවශ්‍ය සම්පත් ලබා ගැනීමටත්, ඒ වාගේම එයින් ඇතිවිය හැකි අනතුරු වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් මේ සූදු ක්‍රීඩාව නියාමන ක්‍රියාවලිය හේතු වේවි කියලා වග කිවයුතු රජයක් හැටියට අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[4.16 p.m.]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, I would have appreciated if the Hon. Deputy Minister of Finance had been here so that we could have corresponded because when I asked a Question in the morning, he gave a contrary Answer. Anyway, let it be answered properly subsequently.

Sir, we have three Items being debated today. One of them is the Regulations under the Public Debt Management Act, which has hitherto been under the Central Bank and is going to be officially transferred to be under the Ministry of Finance from 26th January, 2026. At this particular moment, it is undergoing a period of observation. The most critical factor that we came up with while interrogating the Central Bank officials when they came before the Committee on Public Finance of the Parliament was that the competent people who are expected to transfer to the Ministry of Finance from that particular institution have not yet been recruited. When we asked a question about the professionality of the people who are there, the answer that came forward was that they have not got the approval to recruit competent Chartered Financial Analysts - CFAs; none have been allowed to be recruited! Since that is one of the most critical factors, I call upon the Government to ensure that we have the best of people there so that they could administer this Public Debt Management Act and to execute the functions coming under that, which would be bestowed on the Ministry of Finance in future. The reason why we asked that question was, there were certain technical matters which have been brought about under the Public Debt Management Act as well as the Fiscal Management (Responsibility) Act with regard to the viability of a loan that is taken, the ability to repay that by an institution, and it has been moving forward from the point of view of a national balance sheet, including the ability of government institutions to pay back. With bankruptcy taking place in April, 2022, I think the Government took necessary precautions; it was the Ranil Wickremesinghe Government which basically took those additional precautions. Those precautions had been specified in the Act so that protection and remedial action would be provided.

[ගරු රවි කරුණානායක මහතා]

Now, in the process, let us take a government institution such as the RDA. ජනාධිපතිතුමා කියා තිබුණා, දේශීය ණය ගන්නවාට වඩා පිට රටින් ණයක් අරගෙන කඩවත - මීරිගම පාර හදන්න ඕනෑ කියලා. නමුත් RDA එක ඒ සඳහා ණයක් ගන්න ගියාම, Public Debt Management Act එකට අනුව මුදල් අමාත්‍යාංශයේ තිබෙන Division එකේ අය risk premium එකක් දාලා තිබුණා. Risk premium එක දැම්මාම, සාමාන්‍යයෙන් අපි සියයට තුනක, හතරක පොලියට ගන්න ADB loan එකකට තවත් සියයට තුනක් හතරක් එකතු කළාම ඒක ගෙවන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය ඇති වෙනවා.

At this moment, it is not only the expenditure, but also the cost benefit analysis that has got to be looked at. So, these are matters that have got to be looked at and also, the required professional staff have to be given.

If you look at the SriLankan Airlines, you would notice that it is the same problem that exists there. When the first Budget of this Government was presented, there was an intention to allocate Rs. 20 billion to service the interest charges and it was said that there would not be any further allocation of funds. We mentioned that Rs. 20 billion is hardly sufficient to resurrect the dying airline. Even though its operations have been functional for the last two years, it is the overall debt sustainability of the airline that has been in question. So, now, when there is liability to mop up, you could see that that has got to be addressed. And, the IMF is very concerned about this particular matter and they are basically saying that it needs to be commercialized. So, the Government must come up with a policy because if, by chance, the Government does not come up with a policy, it would certainly have an impact on the IMF's fifth tranche, which has to be negotiated somewhere in September.

Sir, the main reason why we are mentioning all this is because we are very mindful of the fact that from April, 2028, the Government has to start paying its debts. Payment of debt is something substantial and for that, we need to have a robust economy going forward. If the economy does not go forward, you would not be able to meet the revenue targets that have been set.

Today, you could see that there was a high debate on money printing. Why I took up the Public Debt Management Act, the Regulations under which are being debated today, was because of the debate on how much money has been printed. Money printing is absolutely essential.

රජයකට සල්ලි print කරන එක අත්‍යවශ්‍යයි. හැබැයි ඒක කරන්න අවශ්‍ය වන්නේ, වත්කමක් සමඟ. ඉතින් මේ ප්‍රශ්නය ඇහුවාම කියලා තිබෙනවා, ආණ්ඩුව සල්ලි print කරන්නේ නැහැ කියලා. නැහැ, print කරනවා. Print කළේ නැත්නම් ආර්ථිකය contract වෙනවා. ඒ කියන්නේ, ආර්ථිකය සංකෝචනය වෙනවා. ඉතින් ඒ නිසා අපි බලන්න ඕනෑ මේ මුදල් පාවිච්චි කරලා තිබෙන්නේ මොන සංවර්ධනයටද කියලායි. Supply-side management එක වැඩි වුණාට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ මුදල් පුනරාවර්තන වියදම්වලට පාවිච්චි කළොත් තමයි ප්‍රශ්නයක් වෙන්නේ. ඉතින් ඒ ප්‍රශ්නය අහන්න තමයි උදේ අපට ඉඩ ප්‍රස්ථාව ලබා නොදුන්නේ. අපේ රටේ ආර්ථිකය ගැන කථා කරනකොට මම ඉතාම ඕනෑකමින් තමයි මේ දේවල් අහන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තවත් මිනිත්තු තුනක් අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මට මිනිත්තු 11ක් දීලා තිබුණා. මම දන්නේ නැහැ, ඒක අඩු වෙලා තිබෙනවා මිනිත්තු 8කට. මම හිතන විධියට, ඒ කාලය අපි ලබා ගන්න අවශ්‍යයි, හරියාකාරව.

2024 ඔක්තෝබර් මාසයේ රුපියල් බිලියන 58.7ක් print කරලා තිබෙනවා, නොවැම්බර් මාසයේ රුපියල් බිලියන 78.30ක්, දෙසැම්බර් මාසයේ රුපියල් බිලියන 234.8ක්, 2025 ජනවාරි මාසයේ රුපියල් බිලියන 117ක්, February මාසයේ රුපියල් බිලියන 104ක්, මාර්තු මාසයේ රුපියල් බිලියන 233ක්, අප්‍රේල් මාසයේ රුපියල් බිලියන 154ක්, මැයි මාසයේ රුපියල් බිලියන 33ක්, ජූනි මාසයේ රුපියල් බිලියන 210ක්, July මාසයේ රුපියල් බිලියන 125ක්, අගෝස්තුවල දැනට රුපියල් බිලියන 50ක් print කරලා තිබෙනවා. ඉතින් ඒ ඔක්කෝම බැලුවාම රුපියල් බිලියන 1,410ක් පමණ වනවා. අපට දැනගන්න අවශ්‍ය වෙනවා, වත්කමක් විධියට කොහොමද මේ මුදල් ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කියලා.

Then, the total debt has increased from the time the Hon. Ranil Wickremesingh left office in September, 2024 from Rs. 17.595 trillion to Rs 30 trillion. On that particular basis, what we have to look at is foreign reserves. The foreign reserves when President Wickremesinghe left office in September, 2024 were US Dollars 5,900 million. But, in July, 2025, they were US Dollars 6,080 million. So, roughly, within 11 months, the reserves have gone up by US Dollars 180 million. But, the Central Bank makes a big noise saying that they have intervened in the market and that US Dollars 1,100 billion were brought into the open market. But, what is the net increase? The net increase is the most important factor. For debt sustainability, basically, you have to add US Dollars 250 million a month; US Dollars 250 million මාසයකට එකතු කරන්න අවශ්‍යයි. එහෙම බැලුවාම මේ අවුරුද්දේ අග වෙනකොට US Dollars 7.2 billion to US Dollars 7.3 billion විතර තිබෙන්න ඕනෑ. ඉතින් මේ මාස හතර පහ තුළ අපට US Dollars 1,100 million එකතු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී ඉස්මතු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩියක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. කාලය ඉතාම සීමිතයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි.

Now, I will move on to the casino industry. It is very important that the Gambling Regulatory Authority Bill has been brought in, but we were very circumspect when it came before the Committee on Public Finance. We were trying to say that there is no point in bringing in laws, if its operation becomes hampered. When it comes to authorization of transactions relating to gambling, how do you bring in money? Would it be cash only, would modern technology be used for that or how you tax the sources, none of them have been explained. The Gambling Regulatory Authority Bill is something that we have been waiting for, for the last 10 to15 years. So, it is good that it has been brought in. But, if we take the legislation, if somebody wins and he is unable to take that money out of this country, then that would create a problem and it would give out a sour picture to the world. We have two to three domestic gambling companies operating. Then, you have Melco Resorts and Entertainment which has come in. So, on that basis, you should have not only cash, but other modern technology used for transactions relating to gambling. Then, record keeping. Now, they say that every transaction must be recorded.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, give me just a few seconds.

How can you record every single transaction? So, it has to be modernized, keeping the materialness.

The other one is, digital gambling. Digital gambling is basically outside. Even though the Gambling Regulatory Authority Bill talks about gambling, the ambit of digital gambling is so wide that it could be anything and everything. So, it has to be brought to a meaningful operation. Then, gambling software. "Gambling software" is not defined properly, it is not termed properly. So, these vague terms are used in the Gambling Regulatory Authority Bill. That is the problem in our country; we do not allow the professionals to do the job, to draft the legislation. So, we bring in half-baked legislation and that means you have to perpetually be in court. Then, rules of gambling, list of gambling, the number of stakes and junket operations must be meaningfully explained so that we know what those operational activities are.

මම වැඩිපුර කාලය අරගෙන තිබෙන නිසා ඉක්මනින් කථාව අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම කාරුණිකව ඉල්ලීමක් කරන්න කැමැතියි. අපි න්‍යායාත්මක මට්ටමට නීති ගෙනැල්ලා වැඩක් නැහැ, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන් නීති ගෙනෙන්න අවශ්‍යයි. මෙය සංචාරක කර්මාන්තයට බලපාන නිසා අපි ගෙනෙන්න අවශ්‍ය වෙන්නේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන් නීතියක් කියන එක මම මේ අවස්ථාවේ කියනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.27]

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ වන නියමයත්, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග සහ සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පතත් අද දින සාකච්ඡාවට භාජන වෙනවා.

සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගත්තාම, එම පනත් කෙටුම්පත බලාත්මක වීමත් එක්කම සූදු ක්‍රීඩා නියාමන අධිකාරියක් ස්ථාපනය වෙනවා. ඒත් එක්කම මෙතෙක් පැවැති (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥාපනත, (46 වන අධිකාරය වූ) සූදු ආඥාපනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත භාවිතයෙන් ඉවත් වෙනවා. විශේෂයෙන් කියන්න ඕනෑ, මෙතැනදී ස්වාධීන අධිකාරියක් ස්ථාපනය වෙනවා වාගේම, සූදු ක්‍රීඩාව කියන්නේ මොකක්ද කියලා මෙහි අර්ථකථනය කර තිබෙන බව. සූදු ක්‍රීඩාව කියන්නේ කුමක්ද යන්න අර්ථකථනයේදී ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය අයත් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම විපක්ෂය පැත්තෙන් මතු වුණා, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරකම් මේ පනත යටතට ගන්න ඕනෑ කියලා. නමුත්, ඒවා මේ පනත් කෙටුම්පතෙන් ඉවත් කරලා තිබෙන්නේ, ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය යටතේ වන ක්‍රියාකාරකම් විශේෂ පනතක් මඟින් ඉතාම නිවැරදි අධීක්ෂණයකට ලක් වන නිසායි. ඒවා පාර්ලිමේන්තුවේ සහ Auditor-Generalගේ විමර්ශනයටත් ලක් වෙනවා. ඒ වාගේම අපට අවශ්‍ය නියමිත බදු මුදල් එම ආයතනවලින් අය වෙනවා. ඒ හින්දා ඒවා මේ පනත ඇතුළට ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ඒ වාගේම මේ පනතේ ඇති අර්ථකථනය අනුව සූදු ක්‍රීඩා යටතට අපි මේ වෙනකොට හඳුනාගෙන තිබෙන සියලු සූදු ක්‍රීඩා ඇතුළත් කරන ගමන්, ඊටත් අමතරව මේ පනත ක්‍රියාත්මක වෙලා -බලාත්මක වෙලා - අධිකාරිය ක්‍රියාත්මක වෙනකොට, අලුතින් මොකක් හෝ සූදු ක්‍රීඩාවක් එනවා නම්, ඒ සූදු ක්‍රීඩාවත් මේ විෂය පථය යටතට අරගෙන, නියාමන අධිකාරියේ බලතල යටතට ගන්න අවශ්‍ය ප්‍රතිපාදන සහ බලය මෙහි 19වන වගන්තිය යටතේ අමාත්‍යවරයාට දීලා තිබෙනවා.

ඒත් එක්කම, මේ පනත් කෙටුම්පතේ අරමුණු ඉතාම පැහැදිලිවම දක්වා තිබෙනවා. ඊට අමතරව ඒ අරමුණු ක්‍රියාත්මක කරන්න අවශ්‍ය බලතලත් එතැනින් ලබා දීලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය විධියට මණ්ඩලයක් පත් වෙනවා සහ ඊට පස්සේ නියාමන හා පාලන නීති රීති මේකට ඇතුළත් වෙනවා. ඒත් එක්කම මේ සම්බන්ධ වැරදි සහ ඒවාට අදාළ දණ්ඩන මොනවාද කියන එකත් මෙහි ඇතුළත් වෙනවා.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

අපි මෙහි තිබෙන ප්‍රධාන අරමුණු ගත්තොත්, සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම මෙහි ප්‍රධාන අරමුණක් වනවා. මේ පනත් කෙටුම්පත බලාත්මක වෙලා සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය ස්ථාපනය වුණාට පස්සේ ලංකාව තුළ පවතින සියලු සූදු ක්‍රීඩා මෙන්න මේ අධිකාරියේ ලියාපදිංචි කරන්න වෙනවා. සියලු සූදු ක්‍රීඩා කිච්චාම, online සූදු ක්‍රීඩා, අක්වෙරළ සූදු ක්‍රීඩා, ඒ කියන්නේ මුහුදු වෙරළ ආසන්නයේ නැව් තුළ සිදු කරන සූදු ක්‍රීඩාත් ඇතුළත් වනවා. එම සූදු ක්‍රීඩා පවත්වාගෙන යනවා නම්, මේ පනත යටතේ වන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගන්න වෙනවා. එහෙම ලියාපදිංචිය ලබා ගැනීමකින් තොරව දිගින් දිගටම සූදු ක්‍රීඩාවක් කරගෙන යනවා නම්, ඒක නීති විරෝධී වෙනවා. ඒ වෙනුවෙන් වන දණ්ඩන මොනවාද කියලාත් මේ පනතේ විශේෂයෙන් දක්වා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 10ක් හෝ අවුරුදු දෙකකට නොඅඩු සිර දඬුවමක් පැනවිය හැකියි. අන්න ඒ වාගේ දණ්ඩනවලට එහිදී යටත් වෙනවා. දැන් online සූදු ක්‍රීඩා තිබෙනවා, මෘදුකාංග - software - පාවිච්චි කරමින් සිදු කරන. අන්න ඒ වාගේ අවස්ථාවක අදාළ මෘදුකාංගය මෙම අධිකාරියට ඉදිරිපත් කරලා විශේෂ බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව එම සූදු ක්‍රීඩාව පවත්වාගෙන යෑමේ හැකියාවක් නැහැ. ඒ විධියට අධිකාරියට ඉදිරිපත් කරලා නිසි අවසරය ලබා නොගත්තොත්, ඒක මෙම පනත යටතේ වරදක් වෙනවා. ඒ වරදට අදාළ දණ්ඩන මොනවාද කියන එකත් මෙහි ඇතුළත් කරලා තිබෙනවා.

ඊට අමතරව මේ පනතේ ඇති ප්‍රධාන අරමුණු අතර, සූදු ක්‍රීඩාවට අදාළ ආදායම් එකතු කිරීමේ යාන්ත්‍රණයත් තිබෙනවා. දැන් විපක්ෂය පැත්තෙන් මතු කළා, අපට මෙතෙක් එම ආදායම රැස් කර ගන්න නොහැකි වෙලා තිබෙනවා නේද කියලා. ඔව්, නොහැකි වෙලා තිබෙනවා තමයි. එසේ නොහැකි වෙලා තිබෙන නිසා තමයි මේ විධියට අලුතින් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සියලු සූදු ක්‍රීඩා නියාමනයකට ලක් කරලා ආදායම් රැස් කර ගැනීමේ යාන්ත්‍රණය විධිමත් කරගන්න අපි උත්සාහ කරන්නේ. ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ, වාර්තා තබා ගැනීමේ නියමයක් සඳහන් කරලා තිබෙනවා. ඒ නියමය යටතේ සූදු ක්‍රීඩා කරන මධ්‍යස්ථානයක් බැඳෙනවා, ක්‍රීඩා දිනයක් තුළදී මුදල් ලැබීම්, මුදල් ගෙවීම, ව්‍යවහාර මුදල්වලින් සිදු කරන එක් එක් ගනුදෙනු, ඒත් එක්කම සැකකටයුතු ගනුදෙනු මොනවා හෝ තිබෙනවා නම් ඒවා පිළිබඳව දැනුම් දීමට.

ඊටත් අමතරව විශාල ප්‍රමාණයෙන් මුදල් ගනුදෙනු සිදු වෙනවා නම් ඒවා මොනවාද, ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කිරීම් ප්‍රමාණය කොපමණද, ඒවා මොනවාද සහ නියම කරනු ලබන වෙනත් ගනුදෙනු විධිමත් ආකාරයෙන් වාර්තාගත කරන්න නියමයක් විධියට වගන්තියක් මේ පනතට ඇතුළත් කර තිබෙනවා. මෙන්න මේ විධියට ගනුදෙනු නිසි ආකාරයෙන් වාර්තාගත කිරීම තුළ දැනට පවතින බදු ආදායම අහිමි වීම කියන එක නැතුව ගිහිල්ලා, නිවැරැදි බදු ආදායම ලබා ගැනීමේ හැකියාව ඇති වනවා.

මෙහිදී මතු වූ තවත් කාරණයක් තමයි, බදු අය කර ගැනීමට අවශ්‍ය නීති රීති මේ පනතේ දාලා නැහැ කියන එක. බදු අය කර ගැනීමට අවශ්‍ය නීති රීති මේ පනතෙන් එන්න ඕනෑ නැහැ. බදු අය කර ගන්න අවශ්‍ය නීති රීති ප්‍රධාන වශයෙන් දේශීය ආදායම් පනතේ සඳහන් වෙනවා. ඊට අමතරව ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතක් තිබෙනවා. ඒ පනත් මඟින් ඒ බදු අය කර ගැනීමේ නීති රීති පනවා තිබෙනවා. ඒ පනත් මඟින් ඒ බදු අය කර ගැනීමේ නීති රීති පනවා තිබුණත්, මෙතෙක් කාලයක් නිසි බදු මුදල් අය කර ගැනීමට නොහැකි වෙලා තිබුණේ විධිමත් නියාමනයකට මේවා ලක් වෙලා නොතිබුණු නිසාදායි. විධිමත් නියාමනයකට ලක් වීම තුළ පැහැදිලිවම ඒ බදු මුදල් නිවැරැදිව අය කර ගැනීමේ හැකියාව ලැබෙනවා.

නියාමනය කරන ලද සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් මෙහෙයුම් මඟින් සංචාරක කටයුතු, රැකියා සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, සූදු ක්‍රීඩා කර්මාන්තයේ අඛණ්ඩතාව සම්බන්ධයෙන් මහජනයාගේ විශ්වාසය ප්‍රවර්ධනය කිරීම, සූදු ක්‍රීඩාව සාධාරණ හා විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම සහතික කිරීම, සූදු ක්‍රීඩාවේ අඛණ්ඩතාව හා සාධාරණත්වය සහතික කිරීම සහ වගකීම් විරහිත සූදු ක්‍රීඩා නිෂ්පාදන පිළිවෙත් තහනම් කිරීම, අවම ප්‍රමිතියක් පවත්වාගෙන යෑම සඳහා සහ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා සූදු ක්‍රීඩාවලට පහසුකම් ලබා දීම, සූදු ක්‍රීඩාවෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා වගකීම්සහගත සූදු ක්‍රීඩා අභිවර්ධනය කිරීම, සූදු ක්‍රීඩාවට අදාළ නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම, සූදු ක්‍රීඩාව හා සම්බන්ධ සමාජ හානිය අවම කිරීම, සූදු ක්‍රීඩාව අපරාධයක හෝ ව්‍යාකූලතාවක ප්‍රභවයක් වීම වැළැක්වීම, සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් හෝ සූදු ක්‍රීඩාව හා සම්බන්ධ ක්‍රියාකාරකම්, අපරාධ මඟින් උපයා ගත් මුදල් විශුද්ධිකරණය කිරීම සඳහා අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සහ ළමුන් සූදු ක්‍රීඩාවෙන් ආරක්ෂා කර ගැනීම ආදී දේවල් තමයි මේ පනතේ අරමුණු වශයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ.

ඒ වාගේම මේ පනතින් විශේෂයෙන් විධිවිධාන සකස් කරලා තිබෙනවා, අවුරුදු 18ට අඩු ළමයෙකුට සූදු ක්‍රීඩාවේ නිරත වෙන්න බැහැ කියලා. කවුරු හරි කෙනෙක් අවුරුදු 18ට අඩු ළමයෙක් සූදු ක්‍රීඩාවේ නිරත කර ගත්තොත් ඒ වෙනුවෙන් පනවන දණ්ඩන මේ පනතේ පැහැදිලිව දක්වා තිබෙනවා. ඊට අමතරව, වයස අවුරුදු 21ට අඩු අයෙක් සූදු ක්‍රීඩා මධ්‍යස්ථානයක සේවයේ නියුක්ත කර ගන්න බැහැ. ඒ වාගේ ඉතාම විධිමත් වගන්ති කිහිපයක් මේ පනතට ඇතුළත් කරලා තිබෙනවා.

ඊටත් අමතරව මෙම පනත මඟින් ඇති කරනු ලබන අධිකාරියට බලය ලබා දීලා තිබෙනවා, විශේෂයෙන් මණ්ඩලයක් පත් කර ගන්න. ඒ මණ්ඩලයට පත් වෙනවා, මුදල් අමාත්‍යවරයා හෝ මුදල් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන නියෝජිතයෙක්, පොලිස්පතිවරයා හෝ නම් කරන නියෝජිතයෙක්, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා හෝ නම් කරන නියෝජිතයෙක් සහ ගණකාධිකරණය, තොරතුරු තාක්ෂණය, ආර්ථික විද්‍යාව වැනි ක්ෂේත්‍රවල ප්‍රවීණතාවක් සහිත සහ මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත විශේෂඥතාවක් තිබෙන පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන්දෙනෙක්. එලෙස පත් කරනු ලබන මණ්ඩලය මඟින් තමයි මෙන්න මේ සියලු නීති රීති නියාමනය කරනු ලබන්නේ. ඒ පත් කරන මණ්ඩලයට පුළුවන් මෙතෙක් අවිධිමත් විධියට පැවති සූදු ක්‍රීඩා ඉතා විධිමත් තැනකට ගෙනැල්ලා ලියාපදිංචියක් ඇති කරලා, මේ ක්‍රීඩාව ලියාපදිංචිය විධිමත් කරන්න. විශේෂයෙන්ම මේ සභාවේදී ගරු මන්ත්‍රීවරුන්ගෙන් චෝදනාවක් ආවා, මෙහිදී ඇමතිවරයාට අතිවිශේෂ බලයක් ලැබෙනවා කියලා. නමුත් අපි මෙතැන කලිනුත් කථා වූ පරිදි කලින් පැවති ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සහ කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත මඟින් අමාත්‍යවරයාට ලයිසන් දීමට විශාල බලයක් ලැබිලා තිබුණා. මේ පනත ක්‍රියාත්මක වීමත් එක්ක අමාත්‍යවරයාට තිබුණු ඒ බලතල විශාල ප්‍රමාණයක් අයින් වීමත් සමඟ ඒ සියලු බලතල යන්නේ අධිකාරිය යටතේ පිහිටුවන මණ්ඩලයට. ඒ මණ්ඩලය විසින් එය ක්‍රියාත්මක කරගෙන යනවා. මේ අවස්ථාවේදී මට විශේෂම කාරණයක් කියන්න තිබෙනවා. මේ සභාවේදී නිතරම මතු වෙනවා, රජය විසින් දැඩි විධියට ජනතාව මත බදු බර පටවනවාය කියන එක. ඇත්තටම බදු බර ගැන කථා කළොත්, මේ රජය බලයට පත් වුණාට පසු නව අය වැය ඉදිරිපත් කිරීමත් එක්ක, ඊට කලින් රජයන් පවත්වාගෙන ගිය බදු වර්ග තුනක් අපි අහෝසි කර සහන ලබා දුන්නා.

අපි ලබා දුන් සහන මොනවාද කිව්වොත්, විශේෂයෙන් පුද්ගල ආදායම් බද්දට යටත් වන සීමාව වශයෙන් වර්ෂයකට රුපියල් ලක්ෂ 12ක්ව තිබුණු එක රුපියල් ලක්ෂ 18ක නිදහස් සීමාවකට ගෙන ගියා. ඊටත් අමතරව උපයන විට ගෙවීම කරන සේවා නියුක්ති ආදායමක් තිබෙන අය ලබා ගන්නා ආදායමේ සීමාව ඉහළ තලයකට ගෙන ගියා. ඒගොල්ලන්ගෙන් අය කර ගන්නා බදු අනුපාත අඩු කළා. බැංකුවකින් කාට හෝ පොලී මුදල් ලැබෙනවා නම් ඒ පොලී මුදලින් සියයට 5ක මුදලක් රජය විසින් රඳවා ගැනීමේ බද්දක් විධියට අය කර ගැනීමේ ක්‍රමයක් කලින් තිබුණා. ඒවා අහෝසි කළා. ඒ වාගේම යම් යම් කිරි ආහාර නිෂ්පාදන සඳහා වූ එකතු කළ අගය මත බදු ඉවත් කළා; සහන දුන්නා. මෙන්න මේ සහන ලබා දීම තුළින් රජය ඇත්තටම බදු ආදායම රුපියල් බිලියන 100ක විතර ප්‍රමාණයක් අහිමි කර ගනිමින්ම තමයි රජයේ බදු ආදායම වැඩි වෙලා තිබෙන්නේත්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව ගත්තොත්, ඒ ආයතන ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා හැම මාසයකම තමන්ට හිමි ඉලක්කයට වැඩිය යම් ප්‍රමාණයක් ඉහළින් බදු ආදායම් පවත්වා ගන්න සමත් වෙලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 100ක විතර බදු ආදායමක් අහිමි කර ගනිමින්ම තමයි මේ ආදායම් ඉලක්ක ළඟා කර ගන්නට සමත් වෙලා තිබෙන්නේ.

බදු බර වැඩි කරනවා කියලා විපක්ෂය පැත්තෙන් චෝදනා කළාට, ජාතික ජන බලවේග රජයේ ප්‍රතිපත්තිය වෙන්නේ බදු ගෙවන පුද්ගලයන් මත බදු ආදායම වැඩි කිරීම නොවෙයි, බදු පදනම පුළුල් කිරීම තුළින් බදු ආදායම වැඩි කර ගනිමින් බදු අනුපාත අඩු කිරීමයි. එවැනි ගමනක් තමයි අපි මේ යන්නේ.

ඊත් එක්කම මම කියන්න ඕනෑ, විදේශ විනිමය පනත යටතේ කරනු ලබන නිදහස් කිරීම් යටතේ නිල ලැයිස්තුගත සමාගම් සහ නිල ලැයිස්තුගත නොවන සමාගම් වෙනුවෙන් විදේශයකට ගෙනියන්න පුළුවන් මුදල් ප්‍රමාණයන් වැඩි කරලා තිබෙන බව. මේ සියලු කාරණා මඟින් ඒ අවස්ථා ලබා දෙන්නේ අපේ රටේ ආර්ථිකය එන්න එන්නම තිරසර, ඉතාම හොඳ ස්ථාවර මට්ටමකට ළඟා වීම තුළයි.

විශේෂයෙන්ම අද දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ වන නියමය සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වන නියෝග අපේ ආර්ථිකය වඩාත් තිරසාර, ස්ථාවර මට්ටමකට ගෙනියන්න ඉවහල් වෙනවා කියන එකයි මට කියන්න තිබෙන්නේ. ඒ වෙනුවෙන් ඔබ සියලුදෙනාගේම දායකත්වය ලබා දෙන මෙන් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.40]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම සූදු ක්‍රීඩාව නියාමනය කිරීම වැදගත්. මොකද, මේ සභාවේදී කථා වුණා වාගේම අපි දන්නවා, අපේ රටේ කාඩ් සෙල්ලම් කරන බව. එමෙන්ම අනිකුත් සූදු ක්‍රීඩා වාගේම කැසිනෝ ව්‍යාපාරයත් ක්‍රියාත්මක වෙනවා. මේ ආකාරයට රටේ සූදු ක්‍රීඩා සිදු වෙනවා. මේ සූදු ක්‍රීඩා ඉතිහාසයේ සිට සිදු වෙනවා. මෙවැනි ව්‍යාපාරයක් නියාමනය කිරීම කාලෝචිතයි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි මේ කාරණය කියන්න ඕනෑ. රටේ ජනතාවත් මේ ගැන දැනගන්න ඕනෑ. මේ රටේ වගකීම භාර ගන්න කලින් වර්තමාන රජය විපක්ෂයේ සිටි කාල සීමාව තුළ මේ රටේ ජනතාවට බිල්ලෝ මැව්වා; බොරු කිව්වා; ජනතාව නොමඟ ඇරියා. මේ රටේ ආර්ථිකය කඩා වට්ටන්නට පුළුවන් තරම් බොරු කියලා, ඒ හරහා රටේ ජනතාව තුළ යම් යම් සංවර්ධන ව්‍යාපෘති සහ ව්‍යාපාර ගැන, එහෙම නැත්නම් එක එක අධිකාර පිළිබඳව දැඩි වෛරයක් ගොඩනැඟුවා. එයින් එකක් තමයි, මේ සූදු ක්‍රීඩාව. අපට මතකයි, කැසිනෝ ව්‍යාපාර ගැන කථා කරනකොට ජේම්ස් පැකර්ලා ගැන කථා කළා. ඒ අය මේ රටට ඇවිල්ලා මේ රටේ සූදු ව්‍යාපාරය ඔස්සේ කෝටි ගණන් හම්බ කරයි, මේ රටේ මිනිස්සු කැසිනෝ ගහලා, අපේ රට විනාශ වෙයි කියන බොරුව එදා මේ අය සමාජය තුළ පැළ කළා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒ අය ආණ්ඩුවට ආවාම එදා කියපු බොරු වෙනස් වෙලා තිබෙනවා. හාල් මාෆියාව පැය 24න්, එක පැන් පාරෙන්, බෙල්ලෙන් අල්ලලා අවසන් කරනවා, ජාතික ආරක්ෂාව පිළිබඳව උගන්වන්න බංකු අරගෙන එන්න, මේ රටේ පාතාලය පෝය දෙකෙන් ඉවර කරනවා, චෝදනාවට ලක් වෙලා සිංගප්පූරුවේ ඉන්න හිටපු මහ බැංකු අධිපතිවරයා පැය 24න් මේ රටට ගේනවා, උගන්ඩාවේ සල්ලි ජ්ලේන් පිටින් ගේනවා ආදී වශයෙන් ඒ අය කියපු බොරු අද වනකොට මේ රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා.

ඒ කියපු බොරු පුරවන්න නැවක් ගෙනාවත් මදි. ඒ තරමට මේ රටේ ජනතාවට බොරු කිව්වා. ඒ බොරු තමයි අද අපි දිරවන්නේ. හැබැයි, ප්‍රශ්නයක් නැහැ. විපක්ෂය හැටියට අපි කුහක වෙන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ අය එදා ගංජා ගැන කියපු කථාව මොකක්ද? මේ රටේ ගංජා වගා කරලා, ගංජා විකුණලා සල්ලි හම්බ කරන්න පුළුවන්ද කියලා වර්තමාන රජයේ -ආණ්ඩු පක්ෂයේ- ඉන්න අය එදා ඇහුවා. හැබැයි, අපි දන්නවා, අද ලෝකයේ ගංජා නියාමනය කර තිබෙන බව. ඒවා hemp cream, hemp oil, CBD හරහා ඖෂධයක් ලෙස අද ලෝකයේ ප්‍රචලිත වෙලා තිබෙනවා. ලෝකයේ දියුණු රටවල අද ඒ දේ ක්‍රියාත්මක වනවා. හැබැයි, එදා ඒ බොරුව කිව්වා. ඔබ දන්නවා, ගංජා ගත්තොත් THC ප්‍රභේදය තමයි සාමාන්‍යයෙන් මත් ද්‍රව්‍යයක් හැටියට යමෙකු භාවිත කරනවා නම් භාවිත කරන්නේ. හැබැයි, CBD කියන ප්‍රභේදය පාවිච්චි කරනවා, hemp හදන්න. එවැනි ආකාරයට අද ලෝකය වෙනත් තැනකට ගිහිල්ලා තිබෙන කොට මේ අය මේ රටේ මිනිස්සුන්ට කොයි තරම් බොරු කිව්වාද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. ඇයි මම මේක කියන්නේ? අනාගතයේත් මේ අය මේ ආකාරයෙන්ම බොරු කියන්න පුළුවන්. දැනුත් බොරු කියනවා. එහෙම බොරු කියනකොට මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ, රෑ වැටුණු වළේ දවල් නොවැටී ඉන්න.

සූදු ක්‍රීඩාව නියාමනය කරන්න එක්තරා හේතුවක් වෙන්නේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය නම්, අද සංචාරක ක්ෂේත්‍රයට මොකක්ද වෙලා තිබෙන්නේ? අපි දන්නවා, ලංකාවේ පුද්ගලයකුට කැසිනෝ ගහන්න බැහැ කියලා. නීත්‍යනුකූලව බැහැ. හැබැයි, නීති විරෝධීව කරනවාද දන්නේ නැහැ. අද මේ රටට මිලියනයක් දෙකක් සංචාරකයන් එන්නේ මොකටද? මේ රට බලන්න, මේ රටේ සුන්දරත්වය විඳින්න, ඒ වාගේම යම් යම් ක්‍රීඩාවල නියැළෙන්න. බේරුවල ප්‍රදේශය ගත්තොත්, paramotorsවලට සම්පූර්ණයෙන්ම අද ඉඩ දෙන්නේ නැහැ. සංචාරක ක්ෂේත්‍රයේ watersportsවලට ලංකාව හරි ප්‍රචලිතයි. අරුගම්බේ ගත්තොත්, ලෝකයේ surfing beachesවලින් top ten අතර තිබෙන beach එකක්. එක පැත්තකින් මේ රටට එන

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

සංචාරකයන්ට විනෝද වෙන්න තිබෙන අවස්ථාව තමයි දැන් නැති කරලා තිබෙන්නේ. මේ paramotoring කියන්නේ, තායිලන්තයේ ෆුකෙට්වලට ගියොත් සතුටු වෙන්න තිබෙන ක්‍රීඩාවක්. මම ගිහිල්ලා තිබෙනවා, paramotorsවලින්. හැබැයි, අද තහනම් කර තිබෙනවා. අද සංචාරකයෝ මොනවාද කරන්නේ? මේ රටට ආවොත් සංචාරකයන්ට කරන්න දෙයක් නැහැ. රෑ 10.00 වෙනකොට තිබෙන උත්සව, beach parties, අරවා මේවා ඔක්කොම නතර කරන්න ඕනෑ. එක පැත්තකින් සංචාරකයන් මේ රටේ ලස්සන විඳිනවා වාගේම, රාත්‍රී කාලයේ ඒ අයට සතුටු වෙන්න අවශ්‍ය පරිසරයත් අපි නිර්මාණය කරන්න ඕනෑ. නමුත්, එහෙම පරිසරයක් අපි නිර්මාණය කරලා නැහැ.

රෑ එළිවෙනකල් කැසිනෝ ගහන එක අපි නියාමනය කරනවා. පවුල් පිටින් එන සංචාරකයන්ට තමන්ගේ පවුලත් එක්ක විනෝද වෙන්න තිබෙන අවකාශය, අවස්ථාව තමයි මේ රජය වර්තමානයේ අවහිර කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තබා ගන්න, සංචාරක ක්ෂේත්‍රය තමයි කොවිඩ් සමයේ විශාල වශයෙන්ම පීඩාවට ලක් වුණේ. මගේ ආසනය මීගමුව ආසනය. ඒ ආසනයේ ජනතාවගෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් සංචාරක ක්ෂේත්‍රයයි, ධීවර ක්ෂේත්‍රයයි කරට කර කරගෙන යනකොට සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ව්‍යාපාරිකයන් ණය අරගෙන ගොඩ නඟපු ව්‍යාපාර පාස්කු ප්‍රහාරයෙන් පස්සේ පැවති කොවිඩ් වසංගතයත් එක්ක සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. Moratoriums දීලා, ණය පිට ණය ලබා ගත්ත සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර කරගෙන යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දැන් මේ ව්‍යාපාර විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එක පැත්තකින් අපි සංචාරකයෝ රටට ගෙනෙනවා. හැබැයි, ඒ ගෙනෙන සංචාරකයන්ට නවාතැන් පහසුකම් දෙන්න, ප්‍රවාහන පහසුකම් දෙන්න, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ව්‍යාපාරිකයන්ට අවස්ථාව දීලා නැහැ. අද ලෝකයේ වෙනත් රටවල්වල සංචාරකයන් මෙරටට ඇවිල්ලා හෝටල් කාමර දෙනවා, ටැක්සි එළවනවා. ගුවන් තොටුපළෙන් රියදුරු බලපත්‍රය දුන්නාම, ඒ අය වෙනත් සංචාරකයන් අරගෙන රට වටේ යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුව මේ රටේ සංචාරක ක්ෂේත්‍රය එහෙම තත්ත්වයකින් තමයි අද ගොඩ නඟමින් තිබෙන්නේ. එහෙම නම්, ආණ්ඩුව අද fail වෙලා.

අද බලන්න, ගොවියෝ මහ පාරේ; තැපැල් සේවකයෝ මහ පාරේ; උතුරේ හර්තාල්; ගුරුවරු මහ පාරේ. එක පුද්ගලයෙක් ජනාධිපති ලේකම් කාර්යාලය අසල තිබෙන ලයිට් කණුවක නැඟලා ඉන්නවා මම ඊයේ දැක්කා. ඊයේත් මම දැක්කා, ගුරුවරුන් ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා උද්ඝෝෂණ කරනවා. මීට සතියකට කලින් අපි දැක්කා, උතුරේ තරුණ පිරිස් ඇවිල්ලා ඉඩම් ප්‍රශ්නයකට ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණ කරනවා. එදා ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වෙලා අවුරුද්දක්, එකහමාරක් ගත වුණා ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට ඇවිල්ලා උද්ඝෝෂණය කරන්න. නමුත්, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුද්දක් යන්න කලින්ම මේ රටේ ජනතාව දේශපාලන නායකත්වයකින් තොරව අද පාරට බැහැලා ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිටට එන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. යෞවන සමාජවල තරුණ තරුණියෝ අද පාරේ. විදුලිබල මණ්ඩලයේ නිලධාරින් අද පාරේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින් අද පාරේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් කථා කරනකොට බොහොම උජාරුවෙන් කියනවා මම දැක්කා, රජයේ ආදායම වැඩි වෙලා තිබෙනවා කියලා. රජයේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ ව්‍යාපෘති ඇවිල්ලාවත්, ආයෝජන ඇවිල්ලාවත්, සංවර්ධන ව්‍යාපෘති කරලාවත්, එහෙමත් නැත්නම් මේ රටට ප්‍රදාන ලැබිලාවත් නොවෙයි. මේ රජයේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ මේ රටේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල් නිසා. මේ රටේ මිනිස්සු බදු ගෙව්වාට රෝහල්වල ඖෂධ හිඟ බව මතක තබාගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා රෝහලකට ගිහින් ඒ තත්ත්වය බලන්න. අද ඩොලර් බිලියනයක වාහන ආනයනය කරලා තිබෙනවා. හැබැයි, රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්ට vehicle permits දීලා නැහැ. අනෙක් මිනිසුන්ට වාහන ගෙන්වන්න දෙන්න පුළුවන් නම්, මේ වනකොට ඩොලර් බිලියනයක වාහන ගෙන්වා තිබෙනවා නම්, මේ රටේ දුක් විඳලා සේවය කරන, ලෝකයේ වෙනත් රටවලට යන්නේ නැතිව අපේ රටේ අහිංසක මිනිසුන්ට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන්ගේ vehicle permits ටික දෙන්නේ නැත්තේ ඇයි, වාහන ගෙන්වන්න? රජයේ සේවකයෝ 25,000කට තමයි vehicle permitsවලට අදාළ වාහන ගෙන්වන්න තිබෙන්නේ. ඒ අයට vehicle permits issue කරලා තිබෙන්නේ. නමුත්, ඒ වාහන ගෙන්වන්න අවස්ථාව දෙන්නේ නැත්තේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ ආණ්ඩුවට වැඩි හරියක්ම ඡන්දය දුන්නේ මේ රටේ වෛද්‍යවරු ඇතුළු රජයේ සේවකයෝ. අද වෛද්‍යවරුන් පැත්තකට දාලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, මේ රටට ඩොලර් එන ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි ධීවර කර්මාන්තය කියන්නේ. උදාහරණයකට, අපේ මීගමුව ආසනය ගනිමු. අද වනකොට මාදැල් කර්මාන්තය සහමුලින් කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා. අපේ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා -සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ සංගමයේ සභාපතිතුමා- අද බොහොම කනස්සල්ලෙන් ඉන්නේ. ඒ ඇයි? මේ ආණ්ඩුව අපේ මාදැල් කර්මාන්තයට තිත තියන්නයි කටයුතු කරමින් ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක පැත්තකින් winching තහනම් කරන්න හදනවා. මේ තුළින් ලොකු ප්‍රශ්නයක් තමයි ඇති වෙන්නේ. මේ රටට නව තාක්ෂණය හඳුන්වා දෙනවා කියලායි ජනාධිපතිතුමා එදා කිව්වේ. මාළු ඉන්න තැන satellite එකෙන් පෙන්වා දෙනවා කියලා බලය අරගෙන නව තාක්ෂණය නොවෙයි ගමේ ගොඩේ තිබෙන තාක්ෂණයත් අහෝසි කරලා ධීවරයාගේ බඩට ගහන ක්‍රමෝපායක් තමයි අද මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් යන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරලා රජයේ ආදායම වැඩි කරගෙන රජය පොහොසත් වුණාට වැඩක් නැහැ, මේ රටේ මිනිස්සු දුප්පත් වෙලා නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහ පාරේ බඩගින්නේ දුක් විඳින ජනතාවක් ඉන්නවා නම් ආණ්ඩුව පොහොසත් වෙලා වැඩක් නැහැ කියන එක සඳහන් කරමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and THE HON. DEPUTY SPEAKER took the Chair.*

[අ.භා. 4.52]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන කාරණා තුනකට අදාළ විවාදය තමයි අද මේ සභා ගර්භය තුළ ආරම්භ වුණේ. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ වන නියමය වාගේම 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳව මේ සාකච්ඡාවේදී අපේ අවධානය යොමු වුණා.

මේ දක්වා මෙම පනත් කෙටුම්පත වාගේම මේ නියෝග සහ නියමය පිළිබඳ අදහස් දක්වමින් ඒවායේ වටිනාකම්, ඒවායෙන් මේ රටට ලබා ගන්න පුළුවන් ජයග්‍රහණ සහ මේ රටේ දියුණුව හා අභිවෘද්ධිය සඳහා මේවා කිනම් ආකාරයකට බලපානවාද යන්න ගැන පක්ෂ, විපක්ෂ වශයෙන් සාකච්ඡා කෙරුණා. ඒ බොහෝ අවස්ථාවලදී මා දුටු දේ තමයි විපක්ෂය ඒ ප්‍රධාන මාතෘකාව පසෙකලා වෙනත් විවිධ මාතෘකා ඔස්සේ කථා කිරීම. ඒ අයට අත් වෙලා තිබෙන දේශපාලන පරාජය දරාගන්න බැරි තත්ත්වය තුළ ඔවුන් විවිධ කථා නිර්මාණය කරමින් සිටියා. එවැනි කථාවක් අද විපක්ෂයේ අවසන් කථිකයාගෙනුත් අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා ඡන්දයෙන් බලයට පත් වෙලා මේ රටේ තීන්දු තීරණ ගන්න ආයතනය වන පාර්ලිමේන්තුවට ආවාම අපි උත්සාහ කරන්නේ අරමුණුසහගතව සාකච්ඡා කරමින්, සුදුසු යෝජනා සුදුසු අවස්ථාවේ අරගෙන ඇවිත්, මේ රටට ඉතිහාසයේ අයහපතක් සිද්ධ වුණා නම් එය නැවත වතාවක් සිදු වෙන්න ඉඩ නොදී මේ රටේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න, මේ රට දියුණු තත්ත්වයට පත් කරන්න අවශ්‍ය මැදිහත් වීම කරන්නයි. ඒ සම්බන්ධයෙන් සොයා බලන විට අද මේ සම්මත වන පනත් කෙටුම්පත, නියෝග සහ නියමය කියන තුනෙන්ම කෙරෙන්නේ එකම ආකාරයක සාකච්ඡාවකට යොමු වීමක් වාගේම, ඒ තුළින් යම් අභිවෘද්ධියක් මේ රට තුළ ඇති කිරීමයි.

විශේෂයෙන්ම සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත බොහෝ විවේචනයට ලක් වනවා. ඉතිහාසයේ කිසිදු නියාමනයක් නැතුව මේ රට තුළ සූදු ක්‍රීඩා සිදු වුණා. අපි එය බය නැතුව කියනවා. කැසිනෝ ක්‍රීඩාව වාගේම, ඔබට මතක ඇති, එදා ගමක් ගමක් පාසා ආන්දෝලනයට ලක් වුණු ජැක්පොට් වාගේ ක්‍රීඩා මේ සමාජයේ ව්‍යසනයක් ඇති කරපු තත්ත්වයක් තිබුණු බව. ඒ මන්ද, ඒවා හඳුන්වා දුන්නාට, ඒවායෙන් ව්‍යාපාරික වශයෙන් යම් යම් ආකාරයේ ප්‍රතිලාභ ලැබුවාට, ඒවා වෙනුවෙන් ඉදිරිපත් වූ පිරිස්, ඒවාට ආයෝජනය කරපු පිරිස්, ඒවා තුළින් සමාජයට වුණු අගතිය ගැන සිතුවේ නැහැ. ඒ ගැන කථා කරන්න කවුරුවත් හිටියේත් නැහැ. සමාජය ඕනෑම අගාධයකට ඇද වට්ටලා තමන් සතුටු වීම පමණයි එදා ඔවුන් අපේක්ෂා කළේ. අපි එදා ඒවාට විරුද්ධ වෙන්න හේතුවත් ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ආණ්ඩුව භාරගෙන මාස 10ක් ගෙවෙන මේ මොහොත වනකොට අපට මේ රටේ සියලු ප්‍රශ්න නිරාකරණය කරන්න තරම් කාලය ප්‍රමාණවත් නැහැ. ඒ වාගේම තමයි මේ රටේ ඇති කරලා තිබෙන ප්‍රශ්නවල, එහෙම නැත්නම් මේ රටට දායාද කරලා තිබෙන ප්‍රශ්නවල නිමාවකුත් නැහැ. මොන ක්ෂේත්‍රයක් ගත්තත්, ඒ හැම ක්ෂේත්‍රයක් පුරාම දිගින් දිගට තිබෙන්නේ නිර්මාණය කරපු ප්‍රශ්න. ඉතින්, අපි උත්සාහවන්ත වන්නේ මේ සියලු ප්‍රශ්න ක්‍රමිකව කාලයත් සමඟ විසඳමින් මේ රටට අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ජනතාවගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීමටයි.

විශේෂයෙන් සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන කථා කරන විට මෙන්න මේ කියන තත්ත්වය මේ ගරු සභාව හමුවේ විශේෂයෙන් මතු කර දක්වන්න මා කැමැතියි. සූදු ක්‍රීඩාව කියන්නේ ඇත්තටම ව්‍යාපාරයක්. ඒක ව්‍යාපාරයක් නම්, එම ව්‍යාපාරය නියාමනය කිරීම අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Permission of this House is sought to extend the time till the Business is concluded. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You may continue, Hon. Member.

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූදු ක්‍රීඩාව අද ලෝකයේ ව්‍යාපාරයක් විධියට හඳුනාගෙන තිබෙනවා. අපේ රට තුළත් එකී ක්‍රීඩා සිදු කරමින් තිබෙන තත්ත්වයක් යටතේ ඒවා නියාමනය කිරීමට, පාලනය කිරීමට, එහෙමත් නැත්නම් යම් ආකාරයකට කළමනාකරණය කිරීමට රජය මැදිහත් විය යුතුමයි. ඒ සඳහා වන අධිකාරියක් නිර්මාණය කිරීම අද මෙම පනත් කෙටුම්පතින් අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම යම් විධියකින් මේ ක්‍රීඩා නිසා අගතියට පත් වන යම් පාර්ශ්වයක් වෙතොත් ඔවුන් ආරක්ෂා කිරීම වාගේම, සූදු ක්‍රීඩාව ව්‍යාපාරයක් විධියට පවත්වාගෙන යන ආයෝජකයන්ට අවශ්‍ය නියාමනය ලබා දීම සහ ඔවුන්ට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම සඳහා යොමු වීමත් රජයේ වගකීමක්.

ඒ අනුව අපි අපේක්ෂා කරනවා ඔවුන්ට බලපත්‍රයක් ලබා දීම වාගේම, ඒ බලපත්‍රය තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා වන කොන්දේසි ඉටු කරමින් කටයුතු කරයි කියන වග. එසේ කටයුතු නොකරන්නේ නම් ඒ බලපත්‍ර අවලංගු කිරීමත් මේ නියාමන අධිකාරිය යටතේ සිද්ධ වෙනවා. එහෙම නම්, කාටවත් මේ සඳහා විරුද්ධ වීමේ හැකියාවක් නැහැ. අප මේ පනතින් අපේක්ෂා කරන මූලික අරමුණ තුළ තවදුරටත් ඉස්සරහට යනකොට, ව්‍යාපාරයක් වශයෙන් මේ සූදු ක්‍රීඩාව ඇතුළේ සිද්ධ වන ගනුදෙනු නිසියාකාරව වාර්තා කිරීම කියන්නේ ම ඔවුන්ගේ ආදායම් මූලාශ්‍ර අපි හඳුනා ගැනීමයි. අපි රජයක් විධියට ආදායම් ලබන එක්තරා මූලාශ්‍රයක් තමයි බදු. රජයේ ව්‍යාපාර සියල්ල අඩපණ කරලා, කඩාවට්ටලා භාර දීපු රටක ව්‍යාපාර නඟාසිටුවන්න අපි උත්සාහවන්ත වෙන ගමන්ම, මේ සූදු ක්ෂේත්‍රය සඳහා ප්‍රවේශ වෙලා ඉන්න ආයෝජකයන්ගේ, ව්‍යාපාරිකයන්ගේ ආදායම් හරහා බදු පදනම පුළුල් කිරීමේ අර්ථයෙන් බදු එකතු කරගන්න රජය කටයුතු කරන එකේ වැරැද්දක් නැහැ. ඒකෙන් වෙන්නේ තවදුරටත් මේ රටේ පොදු ජනතාවට සහන සලසන්න තිබෙන අවස්ථා, අවකාශ වැඩිවෙන එක. ඉතින්, ඒ පිළිබඳ කවුරුත් සොයා බලා කටයුතු කිරීම සහ සහයෝගය දීම විනා, මේ කටයුතු විවේචනය කරමින් ආපස්සට ඇදීම නොවෙයි කළ යුතු වන්නේ. ඒ වාගේම, අපි පොරොන්දු වූ ආකාරයට මේ සමාජයේ පැවැති ක්‍රමය වෙනස් කිරීම සඳහා යද්දී සමහර දේවල් තුළ ඉඳගෙනම තමයි අපට ඒ වෙනස කරන්න වෙන්නේ. ඒ සඳහා යැමේදී මේ තිබෙන සියලු තත්ත්ව එකවර නතර කිරීමේ හැකියාවක් නැහැ. තාක්ෂණයේ

[ගරු නිමල් පලිහේන මහතා]

දියුණුවත් සමඟ අද මේ රට තුළට ඇවිල්ලා තිබෙන සූදු ක්‍රීඩා, විශේෂයෙන්ම මාර්ගගත -online- සූදු ක්‍රීඩා නිතැතින්ම සිද්ධ වෙනවා. ඒ ක්‍රීඩා සඳහා දරුවන් යොමුවීම වැළැක්විය නොහැකි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. අපි අපේක්ෂා කරනවා, මේ නියාමනය යටතේ ඒ සියලු ආයතන ලියාපදිංචි වීම අනිවාර්ය කරන්න. ඒ ලියාපදිංචිය තුළින් යම් ආකාරයකට ඒක ව්‍යාපාරික ස්වභාවයක් වශයෙන් අපි හඳුනා ගන්නවා වාගේම, ඒ තුළින් අනිවාර්යයෙන්ම අපට සමාජ ආරක්ෂණය ලබා දීමේ හැකියාවක් තිබෙනවා. අපි අපේක්ෂා කරන්නේ මේ සමාජයට ආරක්ෂාව සපයමින් මේ සූදු ක්‍රීඩාව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ඒ පහසුකම් සැලසීමයි.

ඒ වාගේම, විදේශ විනිමය පනත යටතේ සාකච්ඡා කරද්දී මේ අවස්ථාවේදී අපි ගෙනැවිත් තිබෙන නියමය තුළින් විශේෂයෙන්ම ලැයිස්තුගත සමාගම් සහ ලැයිස්තුගත නොවන සමාගම් දිරිමත් කිරීම, උනන්දු කිරීම, විදේශවල ආයෝජනය කිරීම සඳහා අවස්ථාව සැලසීම තමයි අපි අපේක්ෂා කරන්නේ. ඒ අනුව දැනට ඩොලර් 150,000ක පමණ සීමාවක පවතින ලැයිස්තුගත නොවන සමාගම් සඳහා වන විදේශවල ආයෝජන අවස්ථාව ඩොලර් 200,000 දක්වා වැඩි කිරීමටත්, ලැයිස්තුගත සමාගම්වලට ඒ අවස්ථාව ඩොලර් 500,000 සිට ඩොලර් 750,000 දක්වා වැඩි කිරීමටත් තීරණය කර තිබෙනවා. අප විදේශවලින් ගෙන්වාගනු ලබන ඩොලර්, නැත්නම් මේ රටට ලැබෙන ඩොලර් ආදායම, විශේෂයෙන්ම සේවා ආදායම පදනම් වෙච්ච ප්‍රේෂණ තමයි මේවායේ වැඩිපුර තිබෙන්නේ. අපි ණය ගන්නවා නම්, ආධාර ගන්නවා නම්, ඒ එන ඩොලර් ප්‍රමාණයක් හැර, ශ්‍රී ලාංකිකයන් වශයෙන් විදේශවල ආයෝජනය කර උපයන තත්ත්වයක් තවම හරියට අපි හඳුනාගෙන නැහැ. මම විශ්වාස කරනවා මේ නියමය අනුව අපේ රටේ සමාගම්වලට විදේශවල ආයෝජනය කරමින් නැවත වටයකින් ඩොලර් උපයා ගැනීමට ශක්තියක් වෙනවා කියලා. ඒ තුළින් අපට මේ රටේ අවස්ථා දෙකක් නිර්මාණය වෙනවා. එකක්, අපේ ඩොලර් සංචිත ප්‍රමාණය ඉහළ දමා ගැනීමට හැකිවීම. ඒ වාගේම, අපි දිගින් දිගටම මුහුණ දීපු ප්‍රශ්නයක් වන රුපියල් සහ ඩොලරය අතර අනුපාතය හෙවත් විදේශ විනිමය අනුපාතය යම් ආකාරයකට කළමනාකරණය කර ගනිමින් රුපියලේ අගය appreciate කරගන්න, එහෙම නැත්නම් අපි රුපියල් වශයෙන් ඩොලරයට ගෙවන ප්‍රමාණය අඩු කරගන්න හැකියාව ලැබෙනවා. ඉතින් මේ සංශෝධන තුළ අපේ උත්සාහය වන්නේ හැම තිස්සේම මේ රටට යහපතක් වෙන, අපි අපේක්ෂා කරන දියුණුව, යහපත ළඟා කර ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන එක්තරා ක්ෂේත්‍රයක් තමයි, ණය කියන්නේ. ණය සම්බන්ධයෙන් ඉතිහාසය තුළ හරි නියාමනයක් නොකළ නිසා මේ රට මොන තරම් අගාධයකට වැටුණාද කියන එක 2022 අප්‍රේල් 12වැනි දා මහ බැංකුවේ අධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයට අනුව අපට හිතා ගන්න පුළුවන්. ඔහු එදා ප්‍රකාශ කළේ, රට ණය ගෙවා ගත නොහැකි තත්ත්වයට පත් වූ, බුන් වත් වූ රටක් බවයි. එහෙම නම්, නියාමනයක් නැතුව, පාලනයක් නැතුව ණය ගන්නා අවස්ථා සෑදීම ම මේ රට තවදුරටත් අගාධයට ගෙනියන්න හේතුවක්. ඒ නිසා මේ නියමය සම්මත කර ගැනීම හරහා අද අපි අපේක්ෂා කරන්නේ යම් ආකාරයකට මේ රටට ලබා ගන්නා ණය සඳහා ඇපකර නිකුත් කිරීම, උපණය ලබා දීම, කල්බදු සඳහා වන ඒ අවස්ථා, අවකාශ යම් ආකාරයකින් සීමාන්තිකව ලබා දෙමින් ඒ කටයුතු නියාමනය කරමින් මේ රටේ යහපතට ඒ ණය යොදා ගැනීම සඳහා වන අවස්ථා, අවකාශ සැලසීමයි.

අද අපි කථා කරන්න යෙදුණා, විදේශ විනිමය පනත යටතේ ගෙනෙන නියමය, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සහ රාජ්‍ය ණය කළමනාකරණය පනතේ යටතේ ගෙනෙන නියෝග පිළිබඳව. ඒවා ගැන මෙතැන සාකච්ඡා කිරීමෙන් සහ ඒ පිළිබඳ කරුණු දැක්වීමෙන් අපි අපේක්ෂා කරන ඉලක්ක සාක්ෂාත් කරගන්න ඉදිරියේදී අපට හැකියාව ලැබෙයි කියන විශ්වාසයෙන් යුතුව මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக."- [மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Prof.) A.H.M.H. Abayarathna]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (අධිකාරියේ බලතල)

වாசகம் 5.- (அதிகாரசபையின் தத்துவங்கள்)
CLAUSE 5.- (*Powers of the Authority*)

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු සභාපතිතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "4 වන පිටුවේ, 18 වන සහ 19 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම, 2017 අංක 24 දරන දේශීය' "

(2) "4 වන පිටුවේ, 25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සම්බන්ධයෙන් රීති සෑදීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 5, as amended, ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය)
## வாசகம் 6.- (அதிகாரசபையின் கடமைகளும் பணிகளும்)
CLAUSE 6.- (*Duties and functions of the Authority*)

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන අවදානම් අනාවරණය' "

(2) "7 වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සුදු ක්‍රීඩාව සම්බන්ධයෙන් එම අවදානම් අවම කිරීම, කළමනාකරණය කිරීම; සහ ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සිට 76 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகத்திலிருந்து 76ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 7 to 76 ordered to stand part of the Bill.*

## 77 වන වගන්තිය.- (රීති)
## வாசகம் 77.- (விதிகள்)
CLAUSE 77. - (*Rules*)

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "52 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'77. (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ රීති සෑදීමට බලය ලබා දී ඇති හෝ නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් (1) වන උපවගන්තිය මඟින් පවරා ඇති බලතලවල සාමාන්‍යභාවයට අගතියක් නොවන පරිදි, අධිකාරිය විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.' "

(2) "52 වන පිටුවේ, 26 වන පේළිය ඉවත් කරන්න."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***77 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*77ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 77, as amended, ordered to stand part of the Bill.*

***78 සිට 80 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*78ஆம் வாசகத்திலிருந்து 80ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 78 to 80 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## රාජ්‍ය ණය කළමනාකරණ පනත: නියෝග
## பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம்: ஒழுங்குவிதிகள்
## PUBLIC DEBT MANAGEMENT ACT: REGULATIONS

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යතිරේකය සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 19, 20, 21, 22 සහ 23 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2025 ජුනි 30 දිනැති අංක 2443/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විදේශ විනිමය පනත: නියමය
## வெளிநாட்டுச் செலவாணிச் சட்டம்: கட்டளை
## FOREIGN EXCHANGE ACT: ORDER

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජුනි 18 දිනැති අංක 2441/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ධනුෂ්ක රංගනාත් මැතිතුමා.

ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

## ආර්ථිකයට සක්‍රිය දායකත්වයක් ලබා දීම සඳහා තරුණ ප්‍රජාව සවිබලගැන්වීම
## பொருளாதாரத்துக்கு உயிர்ப்புள்ள பங்களிப்பை நல்குவதற்காக இளைஞர்களை வலுவூட்டல்
## EMPOWERMENT OF YOUTH FOR ACTIVE CONTRIBUTION TO THE ECONOMY

[අ.භා. 5.14]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා මට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 'තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙනුවෙන් දේශීය තරුණ ක්‍රියාකාරිත්වය දායක කරමු' යන තේමාව පෙරටුව අප 2025 ජාත්‍යන්තර තරුණ දිනය 2025.08.12 දින සමරන ලද්දේ සිය දහස් ගණනක ලාංකීය තරුණ හදවත්වල සිය අනාගතය පිළිබඳව බලාපොරොත්තුවක් ඇතිවී තිබෙන පසුබිමකය.

ඕනෑම රටක දියුණුව සඳහා තරුණ පිරිස් වඩා සක්‍රියව ආර්ථික ක්‍රමයට දායක කර ගැනීමටත්, ආර්ථික සංවර්ධනයේ සැබෑ ප්‍රතිලාභ ඔවුන් වෙත ලබා ගැනීමටත් හැකි විය යුතුය. ඒ සඳහා තරුණ ප්‍රජාව ආර්ථික ක්‍රියාවලියේ පංගුකරුවන් කරගනිමින්, මෙන්ම පීඩිතයන් සුරාකෑම සහ වෙනස්කොට සැලකීම්වලින් තොරවීම යන මූලධර්මයන් සහිතව තම සිතුම් පැතුම් ඉටු කරගනිමින්, සිය නිදහස් ජීවිතය රටටත්, තමන්ටත් අර්ථාන්විතව ගත කිරීමට හැකි වන පරිදි තරුණයාගේ හෙට දවස ශක්තිමත් සහ ස්ථිරසාර එකක් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මම මේ ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් විධියට ගත්තාම අපට ඉතිහාසයේ දශක ගණනාවක් තිස්සේ දකින්නට ලැබුණා, මේ රටේ තරුණ පරම්පරාවගේ අරමුණු, අභිලාෂ යන සියල්ල තරුණයන්ගෙන් උදුරාගත්ත කාල පරිච්ඡේදයක්. ඒ නිසා පසුගිය දශක ගණනාව පියමං කරලා මේ රටේ තරුණයන්ගේ අරමුණු, අභිලාෂ මුදුන්පත් කරන්න පුළුවන් ආණ්ඩුවක් මේ රටේ සියලු ජනතාව එකතු වෙලා ගොඩනඟා ගත්තා. අපට මතකයි, දශක ගණනාවක් ඒ තරුණයන්ගේ අභිලාෂ යටපත් කරගෙන විවිධ කාල පරිච්ඡේදවල පත්වුණු දේශපාලකයන්ගේ බල වුවමනාව වෙනුවෙන් මේ රටේ දහස් ගණනක් තරුණයන්ගේ ජීවිත පවා උදුරා ගනිමින් කටයුතු කළ බව. තරුණයන්ගේ ජීවිතවලට ඇහුම්කන් දීම මේ රටේ ඉතිහාසයේ හිටපු පාලකයන් ප්‍රතික්ෂේප කළා. එවැනි මොහොතක තමයි අපේ ආණ්ඩුව විසින් තරුණයන් වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ තරුණයන්හට සක්‍රිය ලෙස ආර්ථිකයට දායක වීමේ හැකියාව අවම මට්ටමක පැවැතීමත් මේ රටේ විරැකියා අනුපාතය ක්‍රමයෙන් ඉහළ යන්න හේතු වුණා.

අපට මතකයි, පසුගිය පාලන ක්‍රම තුළ මේ තත්ත්වය වැඩි වුණු බව. තරුණයන් විරැකියාවෙන් පෙළීමත් පසුගිය පාලන බිඳ වැටීමට එක හේතුවක් වුණා. පසුගිය පාලන තුළ තරුණයන් සඳහා නිසි මඟ පෙන්වීමක් නොවූ බවද, රජයන් විසින් ඔවුනට ලබා දිය යුතු පහසුකම් අවශ්‍ය අයුරින් සපයන්නට නොයෙදුණු බවද, ඔවුනට විධිමත් වෘත්තීය අධ්‍යාපනයක් ලබා නොදුන් බවද, කොටසක් පාසල් අධ්‍යාපන ක්‍රමයෙන් බැහැර කළ බවද කනගාටුවෙන් වුණත් පවසන්න ඕනෑ. ඒ නිසා විවිධ ක්ෂේත්‍රවල

තරුණයන්ට තිබුණු අවස්ථා මහ හැරීම හේතුකොටගෙන මේ රටේ තරුණයන් පීඩාවට පත් වුණා. ශක්තිමත් ආර්ථිකයක් ළඟා කර ගැනීම උදෙසා වඩාත් සාධනීය ලෙස සක්‍රිය දායකත්වයක් සැපයිය හැකි තරුණ ජවය ආර්ථිකයෙන් ඈත් කිරීම වඩාත් ඛේදනීය තත්ත්වයක්. පැවති පාලනයන් මේ රටේ තරුණ ජවය ආර්ථිකයෙන් ඈත් කොට තබා ගැනීම නිසාම මේ රටේ ආර්ථිකයට විශාල වශයෙන් බලපෑම් එල්ල වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණයා යනු, රටක අනාගතය වාගේම නව දැනුම වේගයෙන් උකහා ගන්නා පිරිසක්. එම තරුණ ප්‍රජාව තවතවත් ශක්තිමත් කොට රැක බලා ගනිමින්, නව දැනුම සොයා යෑමට ඔවුන්ට අවශ්‍ය පහසුකම් අපි සැලසිය යුතුයි. ඒ වාගේම සහකම්පනයක් සහිත තරුණ ප්‍රජාවක් බිහි කිරීමට රජය කටයුතු කළ යුතුයි. ඒ සඳහා යහපත් කැප කිරීමක් සහිත දේශපාලන ක්‍රමයක් තිබිය යුතුයි. දැන් අපි ඒ ක්‍රමය නිර්මාණය කරමින් පවතිනවා. තරුණයන්ට යහපත් සමාජයක් ගොඩනඟා ගැනීම වෙනුවෙන් කැප කිරීම් කරන්න පුළුවන් දේශපාලනයක් තිබෙන්න ඕනෑ. අන්න ඒ දේශපාලනයත් අපි ගොඩනඟමින් පවතිනවා. පැවති පාලනයන් එම කරුණු කෙරෙහි අවබෝධයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් වර්තමාන තරුණ ප්‍රජාවට දැඩි ලෙස අහිතකර බලපෑම් එල්ල වී තිබෙනවා. ඒ නිසා විරැකියාව, දිළිඳුභාවය වර්ධනය වී තිබෙනවා. තරුණ ප්‍රජාව රට හැර යෑමේ වර්ධනයක් පසුගිය කාලය පුරා දකින්න ලැබුණා. නමුත්, අපේ ආණ්ඩුව පැමිණීමත් සමඟ ඒ තරුණයන්ට මේ රට පිළිබඳ සුබවාදී බලාපොරොත්තු ඇති කර ගන්න පුළුවන් වුණා. තරුණයන්ගේ හෙට දවස ගැන බිය නොවිය යුතු කාලපරිච්ඡේදයක් තමයි දැන් එළැඹ තිබෙන්නේ. ඒ නිසා මේ සභාව කල්තැබීමේ යෝජනාව මේ විධියට මම ඉදිරිපත් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Arkam Ilyas to second the Motion. You have four minutes

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRPERSON OF COMMITTEES *took the Chair.*

[අ.භා. 5.21]

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

මේ යෝජනාව කාලීන, රටට ඉතාම වැදගත් යෝජනාවක්. රටක යන්ත්‍රණය සම්පූර්ණයෙන්ම වාගේ රඳා පවතින්නේ, රටේ යන්ත්‍රණයේ කශේරුකාව වන්නේ, ඒ රටේ වත්මන් තරුණ පරපුරයි. නමුත්, පසුගිය කාලයේ අපේ රටේ තරුණයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබුණේ ඔවුන්ගේ අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාවකට. අනෙක් පැත්තෙන්, විරැකියාව පිළිබඳ ප්‍රශ්නයකට. ඔවුන් මොකක්ද කරන්න ඕනෑ කියන ප්‍රශ්නය තමයි අපේ තරුණයන්ට තිබුණේ. ගොඩක් වෙලාවට තරුණයන් පාස්පෝට් පෝලිම්වල හිටියා. වීසා ගන්න embassiesවල පෝලිම්වල හිටියා. ඔවුන් රට අතහැර යන තත්ත්වයකට පත් වෙලා තිබුණා. සාමාන්‍යයෙන් ලංකාවේ විරැකියාවේ ප්‍රතිශතය සියයට 5යි. තරුණයන් අතර ඒක සියයට 25යි. ඒ කියන්නේ, ලංකාවේ තරුණයන් හතරෙන් එකක් වාගේ ප්‍රමාණයක් විරැකියාවෙන් පෙළෙනවා. 2024 වර්ෂය තුළ 312,836ක් රට අතහැර ගිහින් තිබෙනවා, විවිධ රැකියා සඳහා. එයිනුත් අතිබහුතරයක් තරුණයන් වෙන්න ඕනෑ. අපි අද එ් නිසා විශාල වශයෙන් පාඩු ලබමින් ඉන්නවා. මොකද, රටේ තිබුණු හොඳම මානව සම්පත්, හොඳම ශ්‍රම සම්පත් රට අතහැර ගිහිල්ලා. ආණ්ඩුවක් වශයෙන් අපි -ජාතික ජන බලවේගය- රට දියුණු කරන්න විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ගේනකොට, විශාල කාර්යයන් ප්‍රමාණයක් කරන්න සූදානම් වෙනකොට ඒ අයගේ අඩුපාඩුව අද අපට දැනෙමින් පවතිනවා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව වශයෙන් අපි, නැවතිලා තිබුණු රට ඉස්සරහට අරගෙන යෑමේ කටයුත්ත නැවතත් ආරම්භ කර තිබෙනවා. නමුත්, එතැනදී අපට ලොකු ප්‍රශ්නයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා, ඒ ව්‍යාපෘතිවලට, ඒ කාර්යයන්වලට අවශ්‍ය ශ්‍රම සම්පත, මානව සම්පත හොයාගන්න බැරිව. මේකට ලොකුම හේතුව තමයි, පසුගිය කාලයේ සිද්ධ වෙච්ච විශාල ප්‍රශ්න.

අපි හිතනවා, අපි ගෙනා මේ යෝජනාත් එක්ක, ව්‍යාපෘතිත් එක්ක අප රට තුළ විශාල වෙනසක් ඇති කරන්න පුළුවන් වෙයි කියලා. අපි බලාපොරොත්තු වෙනවා, තරුණ තරුණියනුත් අපිත් එක්ක එකතුවෙලා ගොඩක් ඉස්සරහට යන්න අවස්ථාව ලබා ගනීවි කියලා. ජාතික ජන බලවේග ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව අද යෝජනා දෙකක් සම්මත වෙලා තිබෙනවා. අද තරුණ තරුණියන් සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. කෘෂි කර්මාන්තයේ යෙදෙන තරුණ තරුණියන් අද හොයාගන්න බැරි වෙලා තිබෙනවා. නමුත්, දෙමව්පියන් ඒක කරනවා. හැබැයි, ඊට පස්සේ ඒක කරගෙන යන්න ඊළඟ පරම්පරාව ලැස්ති නැහැ. කෘෂි කර්මාන්තයේ අස්වනුවල කිසිම වර්ධනයක් දකින්න නැහැ. ගොඩක් වෙලාවට අලුත් තාක්ෂණය යොදා ගන්නේ නැහැ. ඒකට ලොකුම හේතුව තමයි, තරුණ තරුණියන් ඒ සඳහා යොමු නොවීම. ඒකට විසඳුමක් වශයෙන් තරුණ තරුණියන් 50,000ක් වෙනුවෙන් සියයට 4ක් වාගේ ඉතාම සුළු වාර්ෂික පොලියකට ණය ලබා දීමේ වැඩසටහනකට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තමයි, තරුණ තරුණියන් විශාල වශයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සහ විවිධ අපරාධවලට යොමු වීම. ඒකට ලොකුම හේතුව තමයි විරැකියාව. මේ විරැකියාවත් එක්ක ඇති වෙච්ච මෙන්න මේ තත්ත්වයටත් අපි පිළිතුරු සොයමින් ඉන්නවා. ඒකටත් අද අපට සුළු වශයෙන් හෝ විසඳුමක් ලැබිලා තිබෙනවා. අවුරුදු 18 සම්පූර්ණ වූ සහ විවිධ ආයතනගතව සිටි තරුණ තරුණියන්ට ස්ථිර නිවාසයක් ලබා ගැනීම සඳහා -පසුගිය වසර 10 ඇතුළත ඒ අදාළ ආයතනවලින් පිට වූ අයට- රුපියල් මිලියනයක් දක්වා වූ නිවාස ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළ සම්බන්ධ යෝජනාවකුත් අපට සම්මත කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආවාට පස්සේ අපි රටක් වශයෙන් ඉදිරියට එන්න ලොකු වැඩ පිළිවෙළක් පවත්වාගෙන යනවා. නීතියේ ආධිපත්‍යය රැකගෙන, විරැකියාව සඳහා විසඳුම් ලබා දෙමින් යන මේ ගමනේදී අපි තරුණ තරුණියන්ට ආරාධනා කරනවා, අපේ රටේ තිබෙන සංවර්ධනයත් එක්ක එකතුවෙලා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගත කරන්න අවශ්‍ය වූ ඒ ගමනට එකතු වෙන්න කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.25]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்றைய தினம் கௌரவ பாராளுமன்ற உறுப்பினர் தனுஷ்க ரங்கநாத் அவர்களால் கொண்டுவரப்பட்ட இளைஞர்களின் எதிர்காலம் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை வரவேற்கின்ற அதேநேரம், அவருக்கு எனது நன்றியையும் கூறிக்கொள்கின்றேன். நான் இங்கு சில விடயங்களைக் கவலையோடு சொல்ல விரும்புகின்றேன். 1985.08.18ஆம் திகதி முதன்முதலாக எங்களுடைய பெண்கள் படை ஆரம்பிக்கப்பட்டது. அந்தக் காலத்திலிருந்து கிட்டத்தட்ட 40 வருடங்கள் தமிழ், சிங்கள, முஸ்லிம் இளைஞர்களுடைய எதிர்காலம் இல்லாமல் போயிருக்கிறது.

நான் உங்களுக்கு முக்கியமானதொரு விடயத்தை ஞாபகப்படுத்த வேண்டும். 2019ஆம் ஆண்டு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய பதவிக் காலத்தில் வடக்கு, கிழக்கு உட்பட நாடு முழுவதும் 16,800 பட்டதாரிகளுக்கு Development Officers - அபிவிருத்தி உத்தியோகத்தர் - நியமனம் வழங்கப்பட்டது. இது அரசியல் ரீதியான நியமனம் என்பது உங்களுக்கும் தெரியும்; எங்களுக்கும் தெரியும்! இதற்கு நான் உங்களுடைய அரசாங்கத்தை குற்றஞ்சாட்டவில்லை. அந்த அபிவிருத்தி உத்தியோகத்தர் நியமனமானது, 2022ஆம் ஆண்டு ஆசிரியர் நியமனமாக மாற்றிக் கொடுக்கப்பட்டாலும், அவர்கள் 2021-2025 வரை 5 வருடங்கள் பாடசாலைகளில் ஆசிரியர்களாகப் பணியாற்றி இருக்கிறார்கள்.

தற்போதைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள், நான் இருக்கும் இதே கதிரையில் இருந்துகொண்டு சொன்னார், இளைஞர்களுடைய எதிர்காலத்தை நாசமாக்கக் கூடாது என்றும் ஆசிரியர்களுக்குத் தேவை இருப்பதால், Development Officers நியமனத்தை ஆசிரியர் நியமனமாக மாற்ற வேண்டும் என்றும் அப்போது கூறினார். உங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்ததற்குப் பிறகு, அன்று ஆசிரியர் களாக இணைக்கப்பட்டவர்கள் மறுபடியும் அபிவிருத்தி உத்தியோகத்தர்களாக மாற்றப்பட இருப்பதாகவும், அவர்கள் அரசாங்க சேவையில் பின்வாங்கப்படுவதாகவும் எனக்கு நேற்று முன்தினம் அறியக் கிடைத்தது. ஒரு காலத்தில் உங்களுடைய JVP அல்லது NPP என்ற அமைப்பு தொழிற்சங்கங்கள் ஊடாகத்தான் வளர்ந்தது. இது உங்களுக்கு நன்றாகவே தெரியும்! அவ்வாறு வளர்ச்சியடைந்து இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களை நீங்கள் கொண்டிருக் கின்றீர்கள். இந்நிலையில், நீங்கள் மறுபடியும் அதே இளைஞர் களின் எதிர்காலத்தை இல்லாமல் பண்ணியிருக்கிறீர்கள்.

அடுத்து, தபால் ஊழியர்களின் fingerprint தொடர்பான பிரச்சினை பற்றி சொல்கின்றேன். அலுவலக நடைமுறையில் fingerprint முறைமையைக் கொண்டுவருவதில் நானும் நீங்களும் ஒரே நிலைப்பாட்டில் இருக்கின்றோம். அது கட்டாயம் கொண்டுவரப்பட வேண்டும். உங்களால் வைத்தியர்கள் விடயத்தில் fingerprint முறைமையைக் கொண்டுவர முடியுமா என்றால், முடியாது! நான் நேரடியாகவே சொல்கிறேன். நான் உட்பட எங்களுடைய வைத்தியர்கள் அனைவரும் privateஇல் இருந்துகொண்டு 4 அல்லது 6 மணித்தியாலங்கள் overtime செய்கிறோம். உங்களுக்கு முதுகெலும்பு இருந்தால் அதை மாற்ற முடியும். உங்களுடைய கட்சி சார்பில் இந்தச் சபையில் 159 பேர் இருக்கிறார்கள். அது தொடர்பான சட்டமூலத்தை நீங்கள் கொண்டுவந்தால் உங்களுடைய அரசாங்கம் பாதிக்கப்படும். ஆகையால், நான் அது சம்பந்தமான ஒரு சட்டமூலத்தைக் கொண்டு வருகின்றேன். வைத்தியர்கள், தபால் ஊழியர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் என அனைத்துமட்ட உத்தியோகத்தர்கள் விடயத்திலும் fingerprint முறைமை கொண்டுவரப்பட வேண்டுமென நான் நினைக்கின்றேன். ஏனென்றால், உங்களுக்கு நன்றாகவே தெரியும்!

මම මේක සිංහලෙන් කියන්නම්. Development officersලාට කියලා තිබෙනවා, ඒගොල්ලන් ආපහු පත් කරනවා කියලා. 2021-2022 කාලයේ තිබුණු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව ඒගොල්ලන් පාවිච්චි කළා, දේශපාලනයට. ඒගොල්ලන් development officerලා විධියට පත් කරලා, ඒගොල්ලන්ට exam එකක් පවත්වලා teachersලා විධියට appoint කරලා අවුරුදු 5ක් සේවය කළාට පස්සේ politicsවලට අරගෙන, දැන් ආපහු ඒගොල්ලන් development officersලා විධියට දමනවා කියලා ආරංචි වුණා.

මම මේ අවස්ථාවේදී අභියෝග කරනවා, මේ සභාව කල්තබන ලද අවස්ථාවේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට හරි ආණ්ඩු පක්ෂයේ කවුරු හරි එක් කෙනෙකුට පුළුවන් නම් නැඟිටලා කියන්න කියලා, Payoneer කියන්නේ මොකක්ද, PayPal කියන්නේ මොකක්ද කියලා. පුළුවන් නම් කවුරු හරි කියන්න, මගේ වෙලාව හරි දෙන්නම්. අඩුම ගණනේ ExiPay කියන්නේ මොකක්ද කියන්න. ඔබතුමන්ලා eBay දැකලා ඇති නේ. කවුරු හරි දන්නවාද, අපේ රටට online payments ගෙනෙන්නේ කොහොමද කියලා? මම අභියෝග කරනවා, කවුරු හරි මේ ගැන කියන්න කියලා. 159ක් PhD holdersලා ඉන්නවා. මට දුකයි. මොකද, ඔබතුමන්ලා එක් කෙනෙක්වත් ඒවා දන්නේ නැහැ. මම 2017 සිට අපේ රටේ ඉඳලා භාණ්ඩ යැව්වා. අපේ රටට සල්ලි ගේන්න විධියක් නැහැ. PayPal එක වහලා. PayPal එක අපේ රටට හදන්න බැහැ. Payoneer account එක හදන්න බැහැ. Payoneer account එක කොහොමත් block වෙලා තිබෙන්නේ. එතකොට අපේ රටේ තරුණ තරුණියන් පිටරටට භාණ්ඩ යවන්නේ කොහොමද?

ඔබතුමන්ලා කවුරු හරි පුළුවන් නම් නැඟිටලා කියන්නකෝ, PayPal account එකක් හදන විධිය. පිලිපීන රටට PayPal account එක හදලා, බොරුවට අපි සල්ලි ගෙන්වනවා රටට. ඒවා හදා ගන්න ඔබතුමන්ලා 159දෙනාට පුළුවන්ද කියන්නකෝ. ඒවා දන්නේත් නැහැ. එදා අපේ ජනාධිපතිතුමා උත්තර දුන්නා පාර්ලිමේන්තුවේදී අපි කියන්නේ නම් ඔක්කෝම බොරු කියලා. මට ඒ ගැන දුකයි. අපේ Parliament (Powers and Privileges) Act එක බලන්න. මේ සභාව ඇතුළේ යම්කිසි පුද්ගලයෙක් බොරුවක් කරනවා නම්, Parliament (Powers and Privileges) Act එකේ පැහැදිලිවම තිබෙනවා, ඒක අවුරුදු 7ක් දඬුවම් ලබා දෙන්න පුළුවන් වරදක් කියලා. එතකොට අපි ජනාධිපතිතුමාට අවුරුදු 20ක් දඬුවම් දෙන්න වෙනවා. අපි කවදාවත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ බොරු කියන්නේ නැහැ. පාර්ලිමේන්තුවෙන් පිටතදීත් බොරු කියන්නේ නැහැ.

බලන්න, එදා හර්තාලයක් දාලා තිබුණා. ඔබතුමන්ලා හොඳටම දන්නවා, මම ඒකට විරුද්ධ වූ බව. සුමන්තිරන් වාගේ පුද්ගලයෝ තමන්ගේ දේශපාලන ජාවාරමට හර්තාලයක් හදලා

තිබුණා. හැබැයි, මම ඔබතුමන්ලාට support එකක් දුන්නා. ඇයි, support එක දුන්නේ? මොකද, බොරුවට මේ රටේ හර්තාලයක් හදන්න වුවමනාවක් තිබුණේ නැහැ. අපට ප්‍රශ්න තිබෙනවා නම් අපි මේ සභාව ඇතුළට ඇවිල්ලා ඒ ගැන කථා කරනවා. ඒකට හර්තාල් දාන්න ඕනෑ නැහැ. අපි උදේ 7.00ට දැක්කා, කඩවල් ඔක්කෝම ඇරලා තිබෙනවා. හැබැයි, ඒකට back කරන්න ඉන්නේ ඔබතුමන්ලා. NPP එක තමයි සුමන්තිරන් මෙච්චර කාලයක් බේරාගෙන ඉන්නේ. MSD එකෙන් දෙදෙනෙක් දීලා තිබෙනවා; STF ආරක්ෂාව දීලා තිබෙනවා. අපි ද ඒවා දුන්නේ? අපි ලබා ගත්තා ද, ඔබතුමන්ලාගෙන් ආරක්ෂාව? අපි අඩුම ගානේ ගිනි අවියක් ඉල්ලුවා, පුළුවන් නම් දෙන්න අපි තියා ගන්නම් කියලා. මොකද, අපි පාරවල්වල හය නැතුව යන්න ඕනෑ. හැබැයි, ඔබතුමන්ලා බස්වල යනවා. ජනාධිපතිතුමා එක දවසක් කියනවා මම අහගෙන හිටියා, පිට රටින් ණයක් අරගෙන Airport එක හදන එක ලොකු සීන් එකක් නොවෙයි කියලා. හැබැයි ගරු මන්ත්‍රීවරුනි, අපි දැක්කා මල් මාලයක් දමාගෙන බස් එකෙන් බැහැලා එනවා. ඒ ගැන මාර දුකයි. මේ ආණ්ඩුව ගැන ලොකු විශ්වාසයක් අපට තිබුණා. අපිත් කඩේ ගියා, ඔබතුමන්ලාට. අපිත් ඔබතුමන්ලාට ආරාධනා කළා, Jaffnaවලට. ඔබතුමන්ලාට ඡන්දය දාන්න කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මට හම්බ වුණේ ඡන්ද 27,000යි. ජනාධිපතිතුමාටත් Jaffnaවලින් හම්බ වුණේ ඡන්ද 27,000යි. එතකොට, අපි ඔබතුමන්ලාට කඩේ ගියා. අන්තිමට වෙලා තිබෙන්නේ මේකයි. ත්‍රී වීලර් පදවන මිනිස්සුත්, අනෙක් මිනිස්සුත් ඔබතුමන්ලාට ගහලා පන්නන්න ලෑස්ති වෙලා ඉන්නවා. ඒ නිසා පුළුවන් නම් හොඳ දේවල් කරලා ඔබතුමන්ලා මේ රටට දීපු promises ටික ඉටු කරන්න බලන්න.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.32]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! உண்மையில், the Hon. (Dr.) Ramanathan Archchuna அவர்கள் பேசியதற்கு பிற்பாடு நான் கதைப்பது ஒருவகையில் வரப்பிரசாதம்தான். முக்கியமாக, இளைஞர்கள் சம்பந்தமாகப் பேசும்போது அவர் இந்தச் சபைக்குக் கொண்டுவந்த விடயம் மிகவும் பொருத்தமானதும் முக்கியமானதுமாகும். அதாவது, Development Officersஆக, ஆசிரியர்களாக நியமிக்கப்பட்ட இளைஞர்கள், யுவதிகள் தற்பொழுது அனாதைகளாக்கப்பட்டு நடுத்தெருவில் நிற்கின்றார்கள். I am not trying to raise this based on nationality and race. இளைஞர்கள், யுவதிகள் என்று பேசும்போது, வடக்கு, கிழக்கைப் பொறுத்தவரையிலும் மலைநாட்டுத் தமிழர்களைப் பொறுத்தவரையிலும் பாரிய ஒரு பின்னடைவு இருப்பதை நீங்கள் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். நீங்கள் மஹரகமவில் பாரியதொரு கூட்டத்தை நடத்தியிருந்தீர்கள். அந்தக் கூட்டத்திற்கு நாட்டிலுள்ள தமிழ் பேசும் இளைஞர்கள், யுவதிகள் எத்தனை பேர் வந்திருந்தார்கள்; அந்தக் கூட்டத்தில் எப்படி அவர்கள் தங்கள் பங்களிப்பைச் செய்து கொண்டார்கள் என்ற விடயத்தை அங்கு சென்று கணக்கெடுத்துப் பார்த்திருந்தால் விளங்கியிருக்கும்.

வடக்கு, கிழக்கைப் பொறுத்தவரையில், இளைஞர்கள் சம்பந்தமான விடயங்களில் பாரிய ஒரு பின்னடைவு காணப்படுகிறது. இது இந்த அரசாங்கத்தின் காலத்தில் மாத்திரமல்ல, முன்னைய அரசாங்கத்திலும் இருந்தது. தேசிய இளைஞர் மன்றங்கள் எல்லாம் பெரும்பான்மைச் சமூகத்துக்கு மாத்திரமே உருவாக்கப்பட்டது போன்றே அன்றும் செயற்பட்டார்கள். முக்கியமாகப் பதவி உயர்வு வழங்கும் விடயங்களில் பாரிய பாகுபாடுகள் நடந்துகொண்டிருக் கின்றன. வழமையாக நான் இதைக் கூறுவதில்லை; ஆனால், பாரிய பாகுபாடுகள் நடந்துகொண்டிருக்கின்றன.

அதுமாத்திரமல்ல, சாய்ந்தமருது இளைஞர் மன்றக் கட்டடத்துக்கு போய்ப் பார்த்தீர்கள் என்றால், ஐயோ, பரிதாபம்! இளைஞர்களுடைய பயிற்சி முகாம்கள், பாசறைகள் அங்கேதான் நடக்கின்றனவா? என்று யோசிப்பீர்கள். තරුණ සේවා මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ඊතරම් අබලන්. ඒ ගැන බලන්න කවුරුවත් නැහැ. அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற உரிய உத்தியோகத்தர்கள் அதனைப் பார்வை யிட்டு அதற்குரிய தேவைகளைச் செய்து கொடுப்பதில்லை. ஆகவே, இளைஞர்கள் சம்பந்தமாகச் சொல்லும்பொழுது, நீங்கள் இந்த நாட்டில் இருக்கின்ற அனைவரையும் சேர்த்துத்தான் பேச வேண்டும். National Youth Services Council சம்பந்தமாகவும் சில விடயங்களை நான் சொல்ல வேண்டும். இப்பொழுது இலங்கையைப் பொறுத்தவரையில் 15க்கும் 29க்கும் இடைப்பட்ட வயதுடையவர்கள் 23.6 சதவீதமாக இருக்கின்றார்கள்.

About 23.6 per cent of the population is between the ages of 15 and 29. It is a population of more than five million. The highest unemployment rate is within that age category with about 28 per cent of youth being jobless. As you know, there are about 700,000 youth in the category of NEET - Not in Education, Employment or Training. So, that is a very serious matter. I do not know to what extent this Government has made plans, except for paying lip service, to rectify these issues.

Even the World Bank, in 2025, has given US Dollars 1 billion towards job creation and private sector stimulations. But, what are the plans the Government has for the jobless youth in the North and the East? முக்கியமாக வடக்கு, கிழக்கு மாகாணங்கள் சம்பந்தமான விடயங்களில் இந்த அரசாங்கம் பாரபட்சத்துடன் நடந்து கொண்டிருக்கின்றது என்பதை நான் தைரியமாகச் சொல்லவேண்டும். கிழக்கு மாகாணத்தில் செய்யப்பட்ட அபிவிருத்தி வேலைத்திட்டங்களைப் பற்றி நான் ஏற்கனவே கேட்டிருந்தேன். இந்தியாவின் உதவியுடன் கிடைக்கின்ற அந்த projectsதான் எங்களுக்கு 2024-2025ஆம் ஆண்டுக்குரிய Budget இல் ஒதுக்கப்பட்ட விடயம். ஆனால், அடையாளப் படுத்தப்பட்ட எந்தவொரு projectsஉம் நடைமுறைப்படுத்தக் கூடிய நிலைமையில் இல்லை.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

They are just projects; they are not yet being implemented. But, funds have been allocated for us from the Budget for 2024-2025 and we were also supposed to get aid from India. Now, it is August, and the projects are only on paper; they are not being implemented. US Dollars 1 billion has been given by the World Bank towards youth training programmes. However, we do not know what projects are going to come up for the East. We have been neglected and it is a very serious matter. We have to prepare the Budget for 2026 by the end of September or October, but, so far, nothing has been allocated for the East.

கிழக்கு மாகாணம் சம்பந்தமாகத் தொடர்ச்சியாக இவ்வாறுதான் நடக்கின்றது. நான் நம்புகின்றேன், வடக்கிலும் மலைநாட்டிலும்கூட அதே பிரச்சினைதான் இருக்கின்ற தென்று. வெறும் வார்த்தைகளால் பேசுகின்ற பேச்சுக்களைத் தவிர, அங்கேயிருக்கின்ற இளைஞர்கள், யுவதிகள் தொழில் வாய்ப்பைப் பெறுவதற்கான எந்த நடவடிக்கையும் எடுக்கப்பட்டிருப்பதாக நாங்கள் காணவில்லை. இளைஞர் சபை சம்பந்தமாக ஏற்பட்ட பிரச்சினையைத் தீர்ப்பதற்காக அல்லது அதை மறைப்பதற்காக மாண்புமிகு ஜனாதிபதி அவர்கள், மஹரகமவில் நடைபெற்ற கூட்டத்தில் பல்லாயிரக் கணக்கான மக்களை வைத்துக்கொண்டு வெறுமனே ஒரு drama அல்லது show ஒன்றைக் காட்டிவிட்டுப் போய்விட்டார். ஆனால், அடிப்படையான விடயங்கள் சம்பந்தமாக, அதைத் தீர்த்து வைக்கக்கூடிய எந்தவோர் ஆக்கபூர்வமான நடவடிக்கையையும் இந்த அரசாங்கம் எடுத்ததாகத் தெரியவில்லை. ஆகவேதான், இதனைக் கூற இந்தச் சந்தர்ப்பத்தை நான் பயன்படுத்திக் கொண்டேன்.

Thank you for bringing in this Motion to pinpoint the lack of proper youth training programmes in the North, the East, the up-country and especially in areas of Tamil-speaking people. There seems to be an attitude, not particularly of this Government, but throughout successive regimes, that National Youth Councils are only for the majority community. It is wrong! You can just go and check, as I have just said, how youth training programmes have been implemented in the Districts of Ampara, Batticaloa, Trincomalee and across the Northern Province. You compare them with the programmes implemented in any other district or any other part of the country and you would see that there is absolute discrimination. It does not make any sense whatsoever. Even when giving promotions, there has been discrimination. For once, there had been discrimination in making appointments to the National Youth Councils. Also, the officers are slow and reluctant in providing encouragement to the youth in the North and the East.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

I am winding up, Madam.

Therefore, I call upon this Government to look into that matter. முக்கியமாக, கிழக்கு மாகாணத்தில் அமைந்துள்ள சாய்ந்தமருது Youth Training Centreக்குச் சென்று பார்வையிட்டு, அங்குள்ள குறைபாடுகளை நிவர்த்தி செய்வதற்குரிய நடவடிக்கை எடுக்கவேண்டு மென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.39]

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ප්‍රශ්න කිහිපයක්ම තිබෙන නිසා විනාඩි පහකින් උත්තර දීම පිළිබඳ ගැටලුවක් තිබෙනවා. නමුත් මම කොහොම හරි වේලාව කළමනාකරණය කර ගන්න උත්සාහ කරන්නම්. අම්මලා, තාත්තලා පොඩි ළමයි ගැන අවධානයක් යොමු කරන්නේ නැති වුණාම, ඒ අය අම්මාගේ ඇඟේ එල්ලෙනවා. නැත්නම් හයියෙන් කෑ ගහනවා, බඩු පොළොවේ ගහනවා, වීදුරු පොළොවේ ගහනවා. එහෙම කථා අපි අහලා තිබෙනවා. අපේ විපක්ෂයේ එක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙක් ඉන්නවා, එහෙම වීදුරු බිඳිනවා වාගේ දේවල් කරන. ඒ නිසා මම හිතනවා, ඇත්තටම එතුමාත් එක්ක මේ සංවාදය පටලවා ගන්න එකේ තේරුමක් නැහැ කියලා. මොකද, ඉදිරිපත් කළ මාතෘකාව මොකක්ද, ඒකට දැක්විය යුතු කරුණු දැක්වීම් මොනවාද කියලා තේරුමක් නැහැ වාගේ දෙයක් මෙතැන තිබෙන්නේ. සමහර විට එතුමාට කථා කරන්න අවස්ථාව ලැබෙන්නේ නැති නිසා එතුමා මේ අවස්ථාව ඒ වෙනුවෙන් පාවිච්චි කරනවා ඇති. ඒකට කමක් නැහැ. ඒ නිසා එතුමාට, එතුමාගේ වැඩේ කරගෙන යන්න ඉඩ දෙමු.

හැබැයි, නැඟෙනහිර පළාතේ අපේ මුස්ලිම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අදහස ගැන මීට වඩා පොඩ්ඩක් හිතුවා නම් හොඳයි කියලා මට හිතෙනවා. ඔබතුමා වුණත් හදවතට තට්ටු කරලා බැලුවොත් තේරෙනවා නේ, අපි ආණ්ඩුවක් විධියට වැඩ කරගෙන යන්නේ කොහොමද කියලා. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියලා අපි අතර කිසිදු බෙදීමක් නැහැ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මට කථා කරන්න අවස්ථාව දෙන්න. මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි පහයි නේ ලැබිලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අපි එහෙම කරන්නේ නැහැ.

දැන් නැඟිටලා කියනවා, නැඟෙනහිරට මෙහෙම වෙලා තිබෙනවා, නැඟෙනහිර තරුණයන්ට මෙහෙම වෙලා තිබෙනවා කියලා. අපි මොකක්ද මේ කරමින් තිබෙන්නේ? දැන් එතුමාගේ

කරුණු දැක්වීම ඇතුළේ කියනවා, මහරගම සමුළුවක් ගැන. මහරගම නොවෙයි සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ඒක තිබුණේ. ඒක පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් ඒ මොකක්ද? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හොයලා බලන්න, ලංකාවේ මේ ජාතික මණ්ඩලයට අවුරුදු 32කට පස්සේ විධිමත්ව තරුණ තරුණියන් පත් වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරි වසම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ඊළඟට ජාතික මණ්ඩලය. අවුරුදු 32කට පසුව තමයි මේ ජාතික මණ්ඩලයට මේ රටේ තරුණ තරුණියන් පත් වුණේ. එහි සිංහල අයත් ඉන්නවා, දෙමළ අයත් ඉන්නවා, මුස්ලිම් අයත් ඉන්නවා. ඒ සියලුදෙනාම වගකීම් අරගෙන තිබෙනවා. ඒ වගකීම් දෙද්දී එහෙම කිසිම ප්‍රශ්නයක් අපේ ඔළුවල නැහැ. හැබැයි, මම හිතන විධියට ඔබතුමන්ලා තවම හිතනවා -මම දන්නේ නැහැ ඒක සාධාරණද, අසාධාරණද කියලා- මුස්ලිම්, දෙමළ මොකක් හරි භාෂාමය ප්‍රශ්නයක් පිළිබඳව කථා කළාට පස්සේ ඔබතුමන්ලාට අවස්ථාව හම්බ වෙයි කියලා. මම හිතන්නේ එහෙමයි. විශේෂයෙන් ඊයේ උතුරු, නැඟෙනහිර හර්තාලය පිළිබඳ ආපු සංවාදයත් එහෙමයි. ඒ නායකයෝ එහෙම හිතනවා. ඒ අයගේ මැතිවරණ සඳහා, පළාත් සභාවේ මහ ඇමති ධුර සඳහා campaign කරනවා. හැබැයි මොකද වෙලා තිබෙන්නේ? අද සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ සියලුදෙනාම එකට එකතු වෙමින් ඉන්නවා මේ රට ගොඩනඟන්න. ඒ නිසා ඔබතුමන්ලාගේ භාවිතාව තිබෙන්නේ කථාව ඇතුළේ, සංවාදය අතුළේ කොහොම හරි අර ගුහාවට අරගෙන යන්නයි. අපේ රටේ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම් තරුණ තරුණියෝ ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක් මේ ව්‍යුහයත් එක්ක එකතු වෙලා තිබෙනවා, වගකීම් අරගෙන තිබෙනවා වැඩ කරන්න. ඒ ගැන අපි සතුටු වෙනවා. ඔබතුමන්ලා ඒ වාර්තා හොයලා බලන්න. ඉතින් සතුටු වෙන්න ඔබතුමන්ලාත්. ඒකට තමයි අපි අවස්ථාව හදමින් තිබෙන්නේ. එහෙම නැතිව මේක ඇතුළේ වෙන ගැටලුවක් නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැන කල්පනා කළ යුතුයි කියලා මම හිතනවා.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ගැන වෙලාව තිබෙන විධියට මම අපේ පැත්තෙන් කරුණු දැක්වීම කරන්නම්. අපි මේ මොකක්ද කරමින් යන්නේ? අපි විශේෂයෙන්ම ජාතික ජන බලවේගය විධියට තරුණ ප්‍රඥප්තියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අතුළේ විෂය කරුණු 10ක් පදනම් කරගෙන අපි සාකච්ඡා කරලා තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි හිතනවා ඒක මත විතරක් අපට වැඩ පිළිවෙළක් හදන්න බැහැ කියලා. මේ මොහොත වෙද්දීත් විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක, ඒ වාගේම අපේ අමාත්‍යාංශයත් එක්ක දැන් වැඩ පිළිවෙළක් සාකච්ඡා කරමින් යනවා. මම කියන්න ඕනෑ, මීට පෙරත් ලංකාවේ තරුණ ප්‍රඥප්තියක් හදලා තිබුණු බව. ඒකේ සමහර සාධනීය කරුණුත් පදනම් කරගෙන අපි දැන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා මූලික රාමුවක් හදන්න. ඒක හදන්නේ ශ්‍රී ලාංකීය තරුණයා ගොඩනඟන්නයි. එහෙම නැතුව මුස්ලිම් හෝ දෙමළ හෝ පිළිබඳ කථාවකට නොවෙයි, ශ්‍රී ලාංකීය තරුණයා ගොඩනඟන්නයි. ඒකට වෙනම ප්‍රඥප්තියක් අපි ගොඩනඟනවා. ඒ වෙනුවෙන් මඟ පෙන්වීම් යනවා, වැඩ පිළිවෙළ යනවා. ලබන අවුරුද්ද වෙද්දී ඒ වැඩ කටයුතු කරන්න අපි මැදිහත් වෙමින් ඉන්නවා.

විශේෂයෙන් අපේ රටේ තරුණ තරුණියන් වෙනුවෙන්ම වැඩ කරන ආයතන දෙකක් තිබෙනවා. ඒ තමයි ජාතික තරුණ සේවා සභාව සහ යොවුන් සේනාංකය. ඒ දෙක තුළ අපි ක්‍රියාත්මක වෙමින් ඉන්නවා, අපේ රටේ තරුණ පරම්පරාව ඒවා තුළට ගේන්න.

ගරු මන්ත්‍රීතුමනි, ගමේ ඉන්න තරුණ තරුණියෝ හැම කෙනෙකුටම අපි වගකීම් දෙන්න සූදානම්. ඒ නිසා තමයි සැලකිය යුතු කාලයකට පස්සේ ඒ පත් වෙච්ච නායක නායිකාවන් අද මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අපි ඔවුන්ට ගෞරවය ලබා දුන්නේ. ඒ විතරක් නොවෙයි. අපි දැන් යෝජනා කරමින් යනවා, ගමේ ග්‍රාම නිලධාරි වසමේ ඉන්න, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්න ඒ හැම තරුණ තරුණියකටම ප්‍රාදේශීය සභාවත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න අවස්ථාව හදලා දෙන්න. ඒක හොඳද, නැද්ද? හොඳයි. ඒ විතරක් නොවෙයි, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඔවුන් සම්බන්ධ කරලා ඔවුන්ගේ යෝජනා, අදහස් ගන්න වැඩ පිළිවෙළක් අපි ගේනවා. ඒ විතරක් නොවෙයි, ඒ අය දිස්ත්‍රික් සංවර්ධන කමිටුවටත් ගේනවා. ඒ එක්කම, අපි ලබන අවුරුද්දේ අය වැය ඇතුළේ බලාපොරොත්තු වෙනවා, ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරන පරිදි තරුණ පාර්ලිමේන්තුව ගොඩනඟන්න; නව්‍යකරණයක් ඇතුළේ ගොඩනඟන්න. ඒ පාර්ලිමේන්තුව ගොඩනඟද්දී, ඒ තරුණ පාර්ලිමේන්තුවට පත් වෙන හැම ඇමතිවරයකු සමඟම, මේ රජයේ දැනට තිබෙන අමාත්‍යාංශ 24ක් එක්ක සමපාතීව වැඩ කරන්න අප සූදානම්. අද කථානායකතුමාත් ඒකට එකඟ වුණා. ඒ වාගේම, අග්‍රාමාත්‍යතුමියත් ඒ පිළිබඳ සාකච්ඡාවක් කර තිබෙනවා. ඔවුන්ට වගකීම් දෙනවා, අවස්ථාව දෙනවා. ඒක අපි කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, තවත් යෝජනා රැසක් තිබෙනවා. විරැකියාව පිළිබඳ, සංවර්ධන නිලධාරින් පිළිබඳ ගැටලුව තිබෙනවා. ඔව්, ඇත්ත. ඇයි? මීට පෙර හැමදාම තිබුණු දේ තමයි ඒගොල්ලන් වැඩ කරන්නේ කොහොමද, ඒගොල්ලන්ගේ කාර්යභාරය මොකක්ද යනාදී මොකක්වත් අදාළ කර නොගෙන, දේශපාලනික වශයෙන් ඒ පත්වීම් දීපු එක. ඒ නිසා අපි එය සමාලෝචනය කරමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ අපට උසාවියේ නඩුවක් තිබෙනවා. නමුත් ඒ නඩුව දැන් නිදහස් කරගෙන තිබෙනවා. ඒකට අනුව අපි විශේෂයෙන්ම ගුරු සේවයේ ගැටලු, අනෙකුත් සංවර්ධන නිලධාරින්ගේ ගැටලු විසඳන්න මැදිහත් වෙමින් තිබෙනවා. අපි සූදානම්, මේ රටේ තරුණයන් වෙනුවෙන් ක්‍රමානුකූලව කටයුතු කරන්න. හැමදාම අපි කියන වාක්‍යයක් තමයි, තරුණයෝ තමයි අපේ රටේ අනාගතය කියන එක.

අපි අනාගතය වෙනුවෙන් තරුණයෝ ගොඩනඟන්න ඕනෑ. ඔබත්, අපත් සියලුදෙනා එකතු වෙලා අපි ඔවුන්ට අවස්ථාව දෙමු. අපි බලාපොරොත්තුවෙන් ඉන්නේ අප පසු කරමින් ගිහිල්ලා මේ රට පොහොසත් රටක් බවට පත් කරන තරුණ පරම්පරාවක්. ඒ තරුණ පරපුර මේ භූමියේ, රටේ හැම ක්ෂේත්‍රයක්ම අත්පත් කර ගැනීමේ සිහිනය වෙනුවෙන් අපි වැඩ කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.46ට, 2025 අගෝස්තු 20 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது நேரம் பி. ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி. ப. 5.46க்கு, பாராளுமன்றம் 2025 ஓகஸ்ட் 20, புதன்கிழமை மு. ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.46 p.m. until 9.30 a.m. on Wednesday, 20th August, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ **5**, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක **163** දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව **www.parliament.lk** වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.